59 වන කාණ්ඩය
6 වන කලාපය

බ්‍රහස්පතින්ද
1964 දෙසැම්බර් 3

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

පෞද්ගලික මන්ත්‍රීගේ කෙටුම්පත් පණත [තී. 471] :

The Christian Fellowship Centre (Incorporation) Bill—
[ආර්. එස්. වී. පෝලියර් මයා.]

පළමුවන වර කියවන ලදි.

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව [තී. 472] :

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය [පස්වන දින]

විවාදය අවසන් කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 59
இல. 6

வியாழக்கிழமை,
3 டிசம்பர், 1964

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

தனி அங்கத்தவர் மசோதா [ப. 471] :
The Christian Fellowship Centre (Incorporation) Bill—
[திரு. ஆர். எஸ். வீ. போலியர்]
முதன்முறை மதிப்பிடப்பெற்றது

மகா தேசாதிபதியினது உரை [ப. 472] :
உரைமீதான விவாதம்—[ஐந்தாம் நாள்]
விவாதம் முடிவுற்றது.

---

Volume 59
No. 6

Thursday,
3rd December, 1964

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

PRIVATE MEMBER'S BILL [c. 471] :
The Christian Fellowship Centre (Incorporation) Bill—[Mr. R. S. V. Poulier]
Read the First time

GOVERNOR-GENERAL'S SPEECH [c. 472] :
Debate on the Address [Fifth Day]
Debate concluded.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

---

## 1964 දෙසැම්බර් 3 වන බ්‍රහස්පතින්දා

1964, டிசம்பர் 3, வியாழக்கிழமை

Thursday, 3rd December 1964

---

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ඩී. ඒ. රාජපක්ෂ මයා.] මූලාසනාරූඪ විය.

சபை, மு.ப. 10 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [திரு. டீ. ஏ. ராஜபக்ஷ] தலைமை தாங்கினர்.

*The House met at 10 a.m.; MR. DEPUTY SPEAKER [MR. D. A. RAJAPAKSA] in the Chair.*

## පෞද්ගලික මන්ත්‍රීගේ කෙටුම්පත් පණත

தனியங்கத்தவர் மசோதா

PRIVATE MEMBER'S BILL

THE CHRISTIAN FELLOWSHIP CENTRE BILL

**ආර්. එස්. වී. පෝලියර් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)

(திரு. ஆர். எஸ். வி. போலியர்—நியமன அங்கத்தவர்)

(Mr. R. S. V. Poulier—Appointed Member)

I move,

"That leave be granted to introduce a Bill to incorporate The Christian Fellowship Centre.

**හෙන්රි ඩබ්ලිව්. දිසානායක මයා.** (හිනිදුම)

(திரு. ஹென்றி டப்ளியு. திஸநாயக்க—ஹினிதும)

(Mr. Henry W. Dissanayake—Hiniduma)

විසින් සථිර කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පණත සංස්කෘතික කටයුතු හා සමාජසේවා ඇමති වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

மசோதா நிலையற் கட்டளை இல. 51 (4) இன் கீழ் அறிக்கை செய்வதற்காக கலாச்சார, விவகார, சமூ சேவைகள் அமைச்சருக்குச் சாட்டப்பட்டது.

*Questioned put, and agreed to.*

*Bill accordingly read the First time and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Minister of Cultural Affairs and Social Services, for report.*

## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව
## ස්තුති යෝජනාව පිළිබඳ විවාදය
## [පස්වන දිනය]

மகாதேசாதிபதியினது உரை

உரை மீதான விவாதம்

[ஐந்தாம் நாள்]

GOVERNOR-GENERAL'S SPEECH

DEBATE ON THE ADDRESS

[FIFTH DAY]

සංශෝධන [නොවැම්බර් 26, 27 සහ දෙසැම්බර් 2] පිළිබඳ විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [නොවැම්බර් 20]—

வினாவின் [நவம்பர் 20] திருத்தத்தின் மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் [நவம்பர், 26, 27 டிசம்பர் 2] மீள ஆரம்பிக்கப்பட வேண்டுமெனும் ஆணை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Amendments [26th and 27th November and 2nd December] to Question [20th November.]*

"අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය විසින් පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය:

'අතිගරු උතුමාණනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට සථිර ලෙස ප්‍රකාශ කරමු.' "—[වී. විලියම් ප්‍රනාන්දු මයා.]



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**යෝජිත සංශෝධන, ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :**

" එතෙකුදුවුවත්,

රැකීරක්ෂා හිඟය, අධික ජීවන වියදම සහ නිවාස හිඟය වැනි බලගතු මහජන ප්‍රශ්න විසඳීමට ආණ්ඩුව ඉතා දීන ලෙස අපොහොසත් වී ඇති නිසා මෙම ආණ්ඩුව කෙරෙහි මහජනයා තුළ විශ්වාසයක් නොමැතිවීම ගැන කණගාටුවෙමි. "—[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

II

" එතෙකුදුවුවත්,

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී මාර්ගය ඔස්සේ රට ගෙන යාම මුළුමනින්ම පසෙක තිබියදී, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තුළට ලංකා සම සමාජ පක්ෂය (ප්‍රතිසංස්කරණවාදීන්) ප්‍රවිෂ්ට වීමෙන් පසු තාවකාලික අවිනිශ්චිත තත්ත්වයට වැටුණු මාක්ස්වාදී සහ කම්කරු පන්ති ව්‍යාපාරයට විරුද්ධව සටන් කිරීම සඳහා බැම්වලින් මිදී සියළුම ජාතිවාදී සහ පූජ්‍යවාදී බලවේගයන්ට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය යටතේ සමගි වීමට ඉඩ ලැබෙන අයුරින් සභාග ආණ්ඩුව අඩියෙන් අඩිය ප්‍රතිගාමී බලවේගයන්ට වාසි සලසා ඇති හෙයින් ද;

(අ) දැනට රැකියා ඇති කොටස්වලත්, ගම්බද සහ නගරබද උගත් තරුණ පෙල අතරත් වැඩෙමින් පවතින රැකීරක්ෂා විරහිත භාවය ;

(ආ) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඇඳුම්, පෞද්ගලික සහ ගෘහ්‍ය අවශ්‍යතාවන් සම්බන්ධයෙන් දිගින් දිගටම පවතින හිඟය සහ මෙම ද්‍රව්‍යවල මිල කිසි බාධාවක් නොමැතිව ඉහළ යාම ;

(ඉ) නගරබද සහ ගම්බද පෙදෙස්වල උග්‍ර නිවාස හිඟය ;

වැනි වැදගත් සහ බරපතල ප්‍රශ්න ගැන සඳහන් කිරීමට පවා උතුමාණන් වහන්සේගේ කථාවෙන් අපොහොසත් වී ඇති හෙයින් ද ;

මේ ප්‍රශ්නයන්ට කුමන විසඳුමක් හෝ සොයන්නට උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව අපොහොසත් වීම මහජනයාට වැඩි වැඩියෙන් පීඩා කර උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි අප්‍රසාදය උපදවන හෙයින් ද ;

තවද, උතුමාණන් වහන්සේගේ කථාවෙන්, කම්කරු පන්තියේ ප්‍රශ්න නොසලකා හැර ඇති අතර ඉල්ලීම් 21 ගැන, එනම් විශේෂයෙන්ම—

(අ) ඊනියා වෙළඳාම ලාංකික කිරීම සහ අප නයන සීමා කිරීම පිළිබඳව උතුමාණන් වහන්සේගේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති නිසා සිදුවන සේවක සංඛ්‍යාව අඩුකිරීම පිණිස සේවකයන් අස් කිරීම සහ සේවයෙන් පහකිරීම ;

(ආ) වේතන ඇවිරීම එසේම දිගටම පැවතීම ;

(ඉ) ආණ්ඩුවේ ව්‍යාපාරවල සහ රජයේ සංයුක්ත මණ්ඩලවල පවත්නා නිලධාරි පැලැන්තියේ අනිසි පාලනය ;

ගැන කිසිම සඳහනක් කරන්නට අපොහොසත් වී ඇති හෙයින් ද ; තවද,

(1) වෘත්තීය සංගම් කටයුතුවල යෙදෙන නිසා පළිගැනීම්වලට භාජන වන කම්කරුවන් ආරක්ෂා කිරීම සඳහා කිසිම වැඩ පිළිවෙලක් ගැන උතුමාණන් වහන්සේගේ කථාවේ සඳහන් වී නැති හෙයින් හා විශේෂයෙන්ම, රටේ කම්කරු නීති එළිපිට උල්ලංඝනය කරමින්, තමන්ගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් සඳහා සටන් කරන කම්කරුවන්ට විරුද්ධව අපරාධ සාහසික ක්‍රියා පවා චිරස්ථායි කරන වෙලෝනා කර්මාන්තශාලා හිමියා වැනි සේව්‍යයන්ගේ දේපොල තහනම් කිරීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් නිහඬව සිටින හෙයින් ද ;

(2) උග්‍ර ඉඩම් හිඟය වැනි ගැමි ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව උතුමාණන් වහන්සේගේ කථාවේ කිසිම සඳහනක් කර නැති හෙයින් ද ;

(3) ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී මාවත ඔස්සේ උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව ගමන් කරන බව පවසතත්, ප්‍රජාතන්ත්‍රවාදි හා සමාජවාදි වීම වෙනුවට ප්‍රජාතන්ත්‍ර විරෝධි ක්‍රම මගින් පාලනය කිරීමට ඔබතුමාණන්ගේ ආණ්ඩුව බලාපොරොත්තුවන බව පෙන්නුම් කරමින් දැනට පවත්නා පෞද්ගලික මුද්‍රණායතන උතුමාණන් වහන්සේගේ සැපකාමි ආණ්ඩුවේ ප්‍රචාරක යන්ත්‍රයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට අදහස් කරන අතර, අහිංසක මිනිසුන්ට හිරිහැර කිරීමට සහ තැලීමට ඔබතුමාණන්ගේ ආණ්ඩුව පොලීසිය යෙදවීමෙන් ද, සාහසික ක්‍රියා මගින් වැඩ වර්ජන බිඳ දමා, භාෂා සහ ආගම් පිළිබඳ සුළු කොටස්වලට හිමි අයිතිවාසිකම් පාගා දැමීමෙන් ද, පුවත්පත්වලට මුකවාඩම් බැඳීමටත්, කම්කරු පන්ති ව්‍යාපාරයට සහ මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට පහර ගැසීමටත් ඔබතුමාණන්ගේ ආණ්ඩුව නීති කෙටුම්පත් ඉදිරිපත් කිරීමෙන් ද, එළිපිටම ප්‍රජාතන්ත්‍ර විරෝධි සහ කම්කරු පන්ති විරෝධි බව ඔබතුමාණන්ගේ ආණ්ඩුව ඔප්පු කර ඇති හෙයින් ද ;

(4) ඔබතුමාණන් වහන්සේගේ ආණ්ඩුව මූලික වශයෙන් කම්කරු පන්ති විරෝධි වූත්, උග්‍රතම ලෙස ජාතිවාදිවූත් ස්වකීය ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියා කරමින්, ඉන්දියානුන්ගෙන් පැවත එන ඊනියා නිර්රාජ්‍ය පුද්ගලයන් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන්, එම ප්‍රශ්නයට සම්බන්ධ මිනිසුන් සමග කිසිම සාකච්ඡාවක් නොකර, ඉන්දියානු ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වී ඇති හෙයින් සහ ඊනියා නිර්රාජ්‍ය පුද්ගලයන් පිළිබඳ ප්‍රශ්නයට නිසි විසඳුමක් ඇති කිරීමේදී ඔවුන් අතුරෙන් ලංකාව සිය ස්ථිර වාසස්ථානය කර ගැනීමේ අභිලාෂයක් ඇතියවුනට පුරවැසිභාවය ප්‍රදානය කිරීම අවශ්‍ය වන බැවින් මෙවැනි ගිවිසුමකට එළඹීම ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කිරීමක් වන හෙයින් ද ;

(5) උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව ද්‍රවිඩ භාෂාවත් රාජ්‍ය භාෂාවක් කර සුළු ජාතික පිරිසක් වන ද්‍රවිඩයින්ට සාධාරණ අයිතිවාසිකම් දීම කෙසේ වෙතත් ඒ වෙනුවට උග්‍ර ජාතිවාදී කොටස්වලට වාසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සලසා දීමෙන් ද්‍රවිඩයන්ට එරෙහිව ඕනෑකමින්ම වෙනස්කම් කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන හෙයින්ද ; තවද,

(6) උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව රජය මගින් යම්කිසි ආගමකට විශේෂ වරප්‍රසාද නොදීමේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය ඉවත ලා, බෞඩාගමට ඊනියා නිසි තැන ලබාදීම සඳහා නීති සකස් කරන බවට ප්‍රතිඥා දීමෙන් මේ රටේ බෞඩ ජනතාවගේ ආගමික හැඟීම්වලින් ප්‍රයෝජනය ගැනීමට තීරණය කර ඇති හෙයින්ද ;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසය නොමැති බව කනගාටුවෙන් ප්‍රකාශ කරමු."—[මෙරිල් ප්‍රනාන්දු මයා.]

III

" එතෙකුදුවුවත්,

ශාස්ත්‍රී-සිරිමාවෝ බණ්ඩාරනායක ගිවිසුම, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්ති ගැන නොතකා මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියටද නිගරු කරන අතර, දෙමළ භාෂාවේ ඓතිහාසික තත්ත්වය හා මේ දිවයිනේ එම භාෂාවට හිමිතැන ආපසු ලබාදීම උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව දිගින් දිගටම ප්‍රතික්ෂෙප කිරීමෙන්ද ; රජයේ සේවයෙහි නියුතු දෙමළ ජාතිකයින්ට අයුතු අසාධාරණකම් කිරීමෙන්ද ; එමෙන්ම ජනපද ව්‍යාපාර, ඉඩම්වල පදිංචි කරවීම, ආනයන හා අපනයන වෙළඳාම හා කාර්මික පුහුණුව යනාදී කරුණු සම්බන්ධයෙන් දෙමළ කථා කරන පුරවැසියන්ට විරුද්ධවත්, ජාතික සංවර්ධන ව්‍යාපාර හා ප්‍රාග්ධන මුදල් යෙදවීම් අතින් දෙමළ භාෂාව කථා කරන ප්‍රදේශවලට විරුද්ධවත් පක්ෂග්‍රාහීව ක්‍රියා කිරීමෙන්ද උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව පැහැදිලිවම පෙන්වා දී තිබෙන පරිදි, මේ රටේ භාෂා වශයෙන් හා ආගම් වශයෙන් සුළු කොටස්වන්නාවූ පිරිස්වලට විරුද්ධව එල්ල කිරීමට සකස් කර ඇති හිංසාකාරී ජාතිවාදී ප්‍රතිපත්තිය හා ප්‍රතිගාමී නව යටත්විජිතවාදී ප්‍රතිපත්තිය තවදුරටත් උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව ගෙන යන බව එකී ශාස්ත්‍රී-සිරිමාවෝ බණ්ඩාරනායක ගිවිසුමෙන් හෙළිදරව්වීම ගැන අපි කනගාටුවෙමු. තවද, ඊනියා නිර්රාජ්‍ය ජනයින් පිළිබඳ ප්‍රශ්නයට ශාස්ත්‍රී-සිරිමාවෝ බණ්ඩාරනායක ගිවිසුමෙන් දුන් විසඳුම නිසා මෙරට ජාතීන් අතරේ පවතින ක්‍රෝධය හා අසමගිය වැඩිවන බවත්, එමගින් මේ රටට විනාශකාරී ප්‍රතිඵල ගෙනදෙන අයුරින් ජාතික ආර්ථික ක්‍රමයට බරපතල ලෙස බාධා ඇති කරන බවත්, මෙම මන්ත්‍රීමණ්ඩලයේ අදහස බැවින් උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි අප තුළ කිසිම විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කර සිටිමු—[වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන්]

IV

" එතෙකුදුවුවත්,

(1) උතුමාණන්වහන්සේගේ ආණ්ඩුවේ සුරා ප්‍රතිපත්ති හේතුකොට ගෙනද ; සීමා රහිතව අරක්කු බලපත්‍ර නිකුත්කිරීම, ලංකා ගුවන් විදුලි සේවය අයථා ලෙස යෙදවීම සහ ප්‍රවෘත්ති පත්‍රවලට මුකවාඩම් දමා එමගින් මූලික මිනිස් අයිතිවාසිකම් වන සිතීමේ, කථාකිරීමේ හා අදහස් පළකිරීමේ නිදහස පැහැර ගැනීමට තැත් කිරීම හේතුකොට ගෙනද ; ජාතික වෙළෙන්දා හා කාර්මිකයා නසා සුළු තේ හා රබර් වතු හිමියන් තුරන් කිරීමේ අදහස් ඇති යෝජනා ප්‍රකාශ කර ප්‍රචාරය කිරීම හේතුකොට ගෙනද ; මිනිසාට අවශ්‍ය බඩුවල මිල අධික ලෙස ඉහළ යාමටත්, ජීවන වියදම ඉහළ යාමටත්, රැකියාවල නියුක්තවූවන්ගේ නියමාකාර වැටුප් අඩුවීමටත්, ගොවි ජනයා විනාශයට පත් කිරීමටත්, ආර්ථික තත්ත්වය පටුවීම හා රැකීරක්ෂා හිඟය උග්‍රවීමටත් හේතු වූ ආණ්ඩුවේ වැඩපිළිවෙලවල් නිසාද ; පාර්ලිමේන්තු ජනසම්මත වාදය අහෝසිකර දැමීම සඳහා කුමන්ත්‍රණය කිරීමත්, මහා සංඝ රත්නයේ අවවාදවලට හා මහජන මතයට කන් නොදීමත් හේතු කොට ගෙනද මේ රට ජනසම්මතවාදී වූද සමාජවාදී වූද පිළිවෙත් ඔස්සේ ගමන් කරනු වෙනුවට, ඉහතකී හැම දෙයක්ම හේතුකොටගෙන අපේ සංස්කෘතික හා ජාතික නිදහස වැනසී, වැඩවසම් ක්‍රමය, ධනපතිවාදය සහ අධිරාජ්‍ය වාදය තහවුරුවී, ශක්තිසම්පන්න වී, ආරක්ෂාවන පැසිස්ට්වාදී පාලන ක්‍රමයක් ඔස්සේ මේ රට ගෙනයාමට හේතුවී ඇති නිසාද ;

(2) මේ රටේ ඓතිහාසිකවූද, සංස්කෘතිකවූද අවශ්‍යතාවයන්ට ගැලපෙන අන්දමේ සමූහ ආණ්ඩුවක් ඇතිකිරීම පිණිස ලංකා ආණ්ඩු ක්‍රම රාජසභා ආඥාව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය සහ වැදගත්කම ගැන කිසිම සඳහනක් හෝ උතුමාණන් වහන්සේගේ කථාවේ නැති නිසාද ;

(3) ලංකාවේ සිටින ඉන්දියානුන් පිළිබඳ ප්‍රශ්නය ගැන උතුමාණන්වහන්සේගේ අගමැතිණියත් ඉන්දිය අගමැතිවරයාත් විසින් අත්සන් තබනලද ගිවිසුමෙන් ලංකා අගමැතිණිය මෙරට වෙසෙන ඉන්දියානුවන්ගෙන් 3,00,000 කට පුරවැසි හා දේශපාලන අයිතිය දීමටත්, තවත් 1,50,000ක් ගැන සලකා බැලීමටත් ගිවිසගෙන තිබෙන හෙයින්, එම ගිවිසුම අනුව අපේ රටවැසියාගේ අයිතිය සම්පූර්ණයෙන්ම ඉන්දියානුන්ට පාවාදීමක් වන නිසාද ;

(4) බෞද්ධාගමට හිමි තැන ලබාදෙනුවස් ව්‍යවස්ථා ඉදිරිපත් කරන්නෙමු. යනුවෙන් උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව විසින් කරන ලද ප්‍රකාශය වූ කලී, අගමැතිණිය හා හවුල් රජයේ ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයින් විසින් මහා සංඝරත්නයටත් බෞද්ධ ජන නායකයන්ටත් කරන අවමාන, අපහාස හා නිගාකිරීම්වලට විරුද්ධවත්, ආණ්ඩුවේ බෞද්ධ සේවකයන්ට හා ත්‍රිවිධ හමුදාවල සිටින බෞද්ධ සේවකයන්ට කරන හිරිහැර වලට විරුද්ධවත්, අද මහා සංඝරත්නය හා බෞද්ධ ජනතාව විසින් පවත්වා ගෙන යනු ලබන බලවත් උද්ඝෝෂණය නිසා, මහා සංඝරත්නය හා බෞද්ධ ජනතාව රැවටීමට කරන ලද නිර්ලජ්ජිත. නින්දිත ප්‍රයත්නයක් නිසාද ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(5) අද රටේ මතුවී තිබෙන දේශපාලන සිද්ධීන් මැද්දේ උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව විසින් කරන ලද මේ ප්‍රකාශය වනාහි, ආණ්ඩුව විසින් ගෙනයෑමට අදහස් කරන ප්‍රජාතන්ත්‍රවාදි නොවන ඒකාධිපති වැඩ පිළිවෙළවල් කෙරෙහි යොමුවී ඇති ජනතාවගේ සිත අන් අතකට යොමු කොට, ආණ්ඩුවේ එවැනි වැඩ පිළිවෙලවල් හැංගි හොරා සම්මත කරවා ගැනීමට ඉදිරිපත් කරන ලද සියුම් උපක්‍රමයක් නිසාද;

(6) රාජ්‍ය භාෂා පණත (සිංහල පමණක් පණත) නිසා, දෙමළ හා සිංහල භාෂා වලට සම තැන් දීම පිණිස දීර්ඝ කාලයක සිට පැවත එන ලංකා සමසමාජ පක්ෂයේ ඇමතිවරුන් හා වෙනත් ඇතැම් ඇමතිවරුන්ගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඔවුන්ට ඉඩ නොදෙන බවට උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කිසිදු ප්‍රකාශයක් කර නැති නිසාද;

(7) ආණ්ඩුවේ ඇතැම් අපරීක්ෂාකාරී ක්‍රියාවන් නිසා ඉහළ නැග ඇති බඩු මිල අඩු කරන බව උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව සඳහන් කර නැති නිසාද;

අපේ කනගාටුව පළකරමු; තවද:—

(1) ලංකා හා ඉන්දියානු අගමැතිවරුන් විසින් අත්සන් තබන ලද ඉන්දු-ලංකා ගිවිසුම අහෝසි කොට ලංකාවේ වෙසෙන දහසය ලක්ෂයක් පමණවූ ඉන්දියානුවන් සියලු දෙනාම ඉන්දියාවට යැවීමට පියවර ගත යුතුයි ද;

(2) (අ) බෞද්ධාගම රජයේ ආගම බවට පත් කිරීමෙන් ද,

(ආ) ඉරිදා වැඩ කරන දිනයක් බවට පත් කොට ඒ වෙනුවට සතර පෝය නිවාඩු දින හැටියට ප්‍රකාශ කිරීමෙන් ද,

(ඇ) අග්‍රාණ්ඩුකාරතුමා, අගමැති, කැබිනට් ඇමතිවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, මාණ්ඩලික නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් හා පාසල් ප්‍රධානීන්, බෞද්ධයන් වියයුතුයයි නීති පැනවීමෙන් ද,

(ඈ) සුරාව තහනම් කිරීමේ නීති පැනවීමෙන් ද,

(ඉ) පාසල්වල බුද්ධ ධර්මය ඉගැන්විය යුත්තේ මහා සංඝයා විසින් පමණක් බවට නීති පැනවීමෙන් ද, බෞද්ධයන්ගේ පූජනීය සිද්ධස්ථාන නඩත්තු කිරීමෙන් හා මහා සංඝ රත්නයට දිනපතා අවශ්‍ය දේ සපයා දීමෙන් ද,

(ඊ) රජයේ සම්පූර්ණ මුදල් ආධාර දීමෙන් පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය දියුණු කර එය ජාතික අධ්‍යාපන ක්‍රමයේ අන්තර්ගත කොටසක් කිරීමෙන්ද,

(ඌ) ජාතික අධ්‍යාපන ක්‍රමය සම්පූර්ණ කිරිම පිණිස ගාස්තු අය කරන සහ අය නොකරන පාසල් සියල්ලම රජයට ගැනීමෙන් ද,

(එ) සියළුම සාංඝික දේපොළ බදු බරින් නිදහස් කිරීමෙන් ද,

බෞද්ධාගමට හිමි තැන දිය යුතුයයි සඳහන් කරන අතර, මේ ආණ්ඩුව කෙරෙහි අපේ කිසිම විශ්වාසයක් නොමැති බව ප්‍රකාශ කරමින් වහාම පාර්ලිමේන්තුව විසුරුවා හැර මහජනතාවට වුවමනා ආණ්ඩුවක් පිහිටුවා ගැනීම පිණිස නිදහස් මහා මැතිවරණයක් පැවැත්විය යුතු යයි ඉල්ලා සිටිමු."—[කේ. එම්. පී. රාජරත්න මයා.]

V

"එනෙකුදුවුවත්,

,(1) තම තමන්ගේ සේවයෙන් හා ඩහදිය මහන්සියෙන් මේ රටේ ආර්ථික තත්වයට වැදගත් සේවයක් කොට ලංකා පුරවැසිභාවය සඳහා සැක රහිත අයිතිවාසිකමක් ලබාගත්, එහෙත් අපේ හිංසාකාරී පුරවැසි පනත හා ඒවා ක්‍රියාත්මක කළ දරුණු අන්දම නිසා එසේ ලංකා පුරවැසි භාවය ලබාගත නොහැකිවූ, මේ රටේ කම්කරුවන්ගෙන් වැදගත් කොටසක තත්ත්වය හා අයිතිවාසිකම් පිළිබඳව, ඔබ තුමන්ගේ ආණ්ඩුව ඉන්දියානු ආණ්ඩුව සමග ඇතිකරගත් ගිවිසුම, එම කම්කරුවන් තෝරාගත් නියෝජිතයන්ගේ මාර්ගයෙන් ආණ්ඩු දෙකට කරුණු කියා සිටිමේ අයිතිය ඔවුනට දිය නොහැකි බව ලංකා ආණ්ඩුව පැහැදිලි ලෙසින්ම ප්‍රකාශ කලාට පසුව අත්සන් කරනු ලැබූ හෙයින්, එම ගිවිසුමේ මාර්ගයෙන් මූලික අයිතිවාසිකමක් අහිමි කර තිබෙන අතර, තමන්ට තදින්ම බලපාන දේ පිළිබඳව කරුණු කියා සිටීමේ අයිතිය හිමි මනුෂ්‍යයන් හැටියට නොව ආණ්ඩු දෙක කැමති පිළිවෙලට බෙදා වෙන්කරගත හැකි වෙළඳ භාණ්ඩ හැටියට ඒ කම්කරුවන් පිළිගෙන, ඔවුන්ගේ ඉරණම විසඳීමට එම ගිවිසුමේ මාර්ගයෙන් උත්සාහ ගෙන තිබෙන නිසා අපි කනගාටුවෙමු;

(2) එමෙන්ම කරුණු කියා සිටීම සඳහා එම කම්කරුවන්ට තිබෙන මූලික අයිතිවාසිකම මේ අවස්ථාවේදීවත් පිළිගනු ලැබුවහොත්, මෙම ගිවිසුමෙහි යෝග්‍ය පරිදි වෙනස්කම් ඇතිකොට, ආණ්ඩු දෙක එම කම්කරුවන්ගේ අදහස් ගැනද, මූලික මිනිස් අයිතිවාසිකම් ගැනද නිසිලෙස සැලකිලිමත් වෙමින්, ඉහතකී ලෙසින් වෙනස් කරනු ලැබූ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් වේ නම්, ලංකාවේ ඉන්දියානුන්ගෙන් පැවත එන නිර්රාජ්‍ය කම්කරුවන්ගේ ප්‍රශ්නය විසඳීමේ පදනම් හැටියට එම ගිවිසුම උපයෝගි කර ගැනීමට තවමත් ඉඩ තිබෙන බව අප පිළිගන්නා අතර, ඉන්දියානු හා පකිස්ථාන වාසී පුරවැසි පනත යටතේ පුරවැසිකම ලබාගත්, ඉන්දියානුන්ගෙන් පැවත එන සියලු දෙනාමෙන්ම, වර්තමාන ගිවිසුම යටතේ පුරවැසිකම ලබාගන්නා අනික් සියලු දෙනාද වෙනම ලේඛනයකට ඇතුළත් කරන බවට අගමැතිනිය විසින් කරන ලද ප්‍රකාශය අපි හෙළා දකිමු; මෙබඳු පුරවැසියන් ගණනාවක්ම ඉකුත් මැතිවරණයේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කීප දෙනකුටම ඡන්දය දීමෙන් එම මන්ත්‍රීවරුන් කෙරෙහි තැබූ විශ්වාසය කඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමක් ද, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව යථාර්ථයෙන් අනුගමනය කරන බවට නොයෙක් වාරයන්හි ප්‍රතිඥා දී තිබෙන, දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ පිළිගත් ප්‍රතිපත්ති කඩ කිරීමක්ද දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා විසින් ජවහර්ලාල් නේරුතුමාට සපයා දෙන ලද තොරතුරු පදනම්කොට ගෙන ඉන්දියානු ආණ්ඩුව විසින් තබන ලද විශ්වාසය කඩ කිරීමක්ද පමණක් නොව, මේ රාජ්‍ය දෙක අතර තිබිය යුතු අන්‍යෝන්‍ය විශ්වාසය බිඳ දමන සුලු පියවරක් බැවින් ද, ඒ හේතුවෙන්, යුක්ති යුක්ත විසඳුමක් ඇතිකර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා යටපත් වන බැවින්ද අගමැතිනියගේ යථෝක්ත ප්‍රකාශය අප හෙළා දකින අතර, තමන් විසින් දෙන ලද භාරදූර පොරොන්දු ඉටුකිරීමට තීරණය කරමින් වෙනම ලේඛනයක් පවත්වා ගැනීමේ අදහස අත්හැර දමා, තමන් කෙරෙහි බල පවත්වන කරුණු ගැන තම අදහස් ප්‍රකාශ කිරීමට මෙම කම්කරුවන්ට ඇති අයිතිය පිළිගෙන, මෙකී අදහස් වලට අනුකූල ලෙස ගිවිසුම වෙනස් කර, මූලික මානුෂික අයිතිවාසිකම් වලට නිසි සැලකිල්ල දක්වමින් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කටයුතු කරනු ඇතැයි අපි ප්‍රාර්ථනා කරමු.''—[එස්. තොන්ඩමන් මයා.]

VI

"එතෙකුදුවුවත් උතුමාණන් වහන්සේගේ කථාවෙන්,

(අ) මුදල් අර්බුදයෙන් රට මුදාලීමට පියවර ගෙන නොමැති හෙයින්ද, ජීවන වියදම ඉහළයාම හේතුකොටගෙන මහජනයාට විඳින්නට සිදුවී තිබෙන කරදර සහ රැකීරක්ෂා හිඟය විසඳාලීමට පියවර ගෙන නොමැති හෙයින්ද ;

(ආ) මහජන විරෝධය පළ කෙරුන පුවත්පත් පනත් යෝජනා නැවත ඉදිරිපත් කිරීම ගැන කනගාටුව පළ කරන අතර පාර්ලිමේන්තුව කල් තැබීමෙන් අහෝසි වුන ප්‍රජාතන්ත්‍රවාදී නිදහස මකා දමන ලංකා පුවත්පත් පනත සහ පුවත්පත් මණ්ඩල පනත නැවත වරක් ඉදිරිපත් කර තිබීම ගැන සභාග රජය හෙළා දකිමු"—ජේ. ආර්. ජයවර්ධන මයා.]

"එම වචන එතැනට එකතු කළ යුතුය", යන ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

"அந்த வசனங்கள் அங்கு சேர்க்கப்படவேண்டும்" எனும் வினா மீண்டும் எடுத்தியம்பப் பெற்றது.

*Question again proposed "That those words be there added".*

පූ. භා. 10.2

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගොමුව)
*(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)*
(Mr. P. B. Balasuriya—Galigomuwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මා විශේෂයෙන්ම කියා ගෙන ගියේ පත්‍ර පණත පිළිබඳව අපේ විරුද්ධ පාර්ශ්වය දක්වූ ඇතැම් කරුණු පිළිබඳවයි. අදත් මා ඒ කරුණු එකක් දෙකක් පිළිබඳව කථා කරන්නට අදහස් කරනව. පසුගිය ඉරිදා "ඔබ්සර්වර්" පත්‍රයේ ප්‍රසිද්ධ කර තිබුණා වැඩි ඡන්ද දහට අඩුව ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ නම් හා වැඩි ඡන්ද දෙදහකට අඩුව ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසනත්. ලබන මැතිවරණයේදී මෙම ආසන සෙලවෙන්නට නැත්නම් වෙනස් වෙන්නට පුළුවන්ය යන හැඟීම එහි දක්වා තිබුණා. මේ පත්‍ර අවංකව අදහස් ප්‍රකාශ කළා නම් වැඩි ඡන්ද දහට අඩුව ගත් දෙපක්ෂයේම මන්ත්‍රීන්ගේ නම් හා ඡන්ද දෙදහට අඩුව ගත් දෙපක්ෂයේම ආසනත් වෙන් වෙන් වශයෙන් පළ කිරීමට යුතුකමක් තිබුණා. නමුත් ඒ පත්‍රයේ දක්වා තිබුණේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීන්ගේ නම් පමණයි. අගතිගාමීව පත්‍රය දක්වූ මේ කාරණය සම්බන්ධයෙන් මා විශේෂයෙන්ම ඡන්ද දාහට හා දෙදාහට අඩුව ගත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීන්ගේ ආසන මොනවාද කියා පෙන්වනවා. වත්තල දිනුවෙ ඡන්ද 107 න්. කටාන 44 න්. කොට්ටාව දිනුවෙ ඡන්ද 334 න්. වත්තෙගම 357 න්. සෙංකඩගල 25 න්. තෙල්දෙණිය 205 න්. මිණිපෙ 438 න්. ගම්පොල 529 න්. යාපහුව 712 න්. [බාධාකිරීමක්] මා මේ ගණන් පෙන්නුම් කරන්නේ විශේෂයෙන්ම ලේක්හවුස් පත්‍ර මගින් ප්‍රසිද්ධ කොට ඇති සංඛ්‍යා ලේඛන අනුවයි. ඒ නිසා යම්කිසි වරදක් තිබෙනවා නම් එය ඒ පත්‍රවල වරදක් මිස මගේ වරදක් නොවෙයි. යාපහුව 712 න්. [බාධා කිරීමක්] හිරියාල 898 න්. දොඩන්ගස්ලන්ද 511 න්. හොරොව්පතාන 129 න්. මහියංගනය 676 න්. සොරණාතොට 209න් කොලොන්න 48 න්. ඊළඟට ඡන්ද දෙදහට අඩු කොටස් මෙසේයි. මාතලේ 1768න් හඟුරන්කෙත 1628 න්. පුත්තලම 1256 න්. නාත්තන්ඩිය 1709 න්. දැදිගම 1658 න්. රුවන්වැල්ල 1375 න්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාධාරණ යුතුකමක් හැටියට කල්පනා කර බලන විට, පත්‍ර නියම නිගමනයකට බැස්සා නම් දෙපක්ෂයේම සෙලවෙන්නට නැත්නම් වෙනස් වෙන්නට පුළුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]
මෙන්න මේ ආසනය කියා පළ කිරීමට පත්‍රයට යුතුකමක් තිබුණා. නමුත් ඒ පත්‍රයේ දක්වා තිබුණේ ඡන්දදායකට හා දෙදාහට අඩුව ගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීන්ගේ ආසන පමණයි. එක්සත් ජාතික පක්ෂයේත් අනික් පක්ෂවලත් එබඳු ආසන මේවාය කියා නොදැක්වීම බරපතළ වරදක්. ඔන්න ඔකයි ඔය පත්තරවල ප්‍රතිපත්තිය. ඒ නිසා එබඳු බොරු ඇද බාන පත්තර සංවර කිරීම අපේ යුතුකමක් වෙලා තිබෙනව.

ඊළඟට මා කථා කරන්න යන්නෙ බෞද්ධාගමට නීත්‍යානුකූලව තැනක් දෙන බවට රාජාසන කථාවෙන් දී තිබෙන ප්‍රතිඥාව ගැනයි. මේ සම්බන්ධයෙන් අද විරුද්ධ පාර්ශ්වය කියන්නෙ මොකක්ද? මේක බොරුවක් ලෙසත්, රට රවටන්න ඉදිරිපත් කළ දෙයක් ලෙසත් පෙන්වාදීමට විරුද්ධ පාර්ශ්වය දැන් තර්ක ඉදිරිපත් කරනව. අප යම් හොඳ වැඩක් කරන විට එය නරක වැඩක් හැටියට පෙන්වන අතර, අප එය නොකර ඉන්න විට එසේ සිටීම වැරැද්දක් ලෙස පෙන්වනව. හොඳ දෙයක් කළාම එය නරක දෙයක් ලෙස හඳුන්වනව. නොකර ඉන්න විට මෙය කරන්නෙ නැහැ කියා අපට දොස් පවරනව. ඒ කාරණය දැන් අපට හොඳින්ම පැහැදිලියි.

බෞද්ධාගමට තැනක් දෙනවය කියල ගරු අගමැතිනිය ප්‍රකාශ කළේ එසේ කිරීමේ පිරිසිදු අදහසිනුයි. හොඳ චේතනාවෙන් මිස වෙන කිසිම දෙයක් නිසා නොවෙයි. එක්සත් ජාතික පක්ෂය අවුරුදු අටක් තිස්සේ රට පාලනය කළ නමුත් කවදාවත් නොකළ දේවල් මේ ආණ්ඩුව කළා. බොහෝ දේවල් ඉදිරිපත් කළා ඒ වගේම බොහෝ දේවල් කර ප්‍රතිඵලත් පෙන්නුවා. එහෙත් මෙතෙක් කර තිබෙන දේ මදි බව පෙනී ගියා. ඒ නිසා නීතියෙන් එය කර තිබෙන බව පෙන්වන්න ඕනෑ. මීට පෙර එවැන්නක් කර තිබෙනවා නම් නැවත එවැන්නක් කරන්න වුවමනාවක් නැහැ. එසේ නම් ඒ බව පැහැදිලි කර පෙන්වන්න යුතුකමක් විරුද්ධ පාර්ශ්වයට තිබෙනව.

බෞද්ධාගමට නිසි තැන ලබා දීම ගැන කල්පනා කර බලමු. නිදර්ශනයක් ගනිමු. එක්සත් ජාතික පක්ෂය රට පාලනය කළ කාලයෙත් තිබුණා ඔය රාජධානි. ඒ කාලෙත් බෞද්ධ මධ්‍යස්ථාන තිබුණා. අනුරාධපුරයත් තිබුණා, නැති වෙලා තිබුණේ නැහැ. කැළණියත් තිබුණා ඒ කාලේ. එපමණක් නොවෙයි, කෝට්ටේ රාජධානියත් තිබුණා. ඒ වගේම දහතුන් අවුරුද්දක් ඒ අය යටතේ තිබුණා කැළණිය. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි ඔය ස්ථාන පූජනීය ස්ථාන බවට පත් කළේ. එක්සත් ජාතික පක්ෂයට එය කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. එපමණක් නොවෙයි, අපි භික්ෂූන් වහන්සේලාට උසස් අධ්‍යාපනයක් ලබා දීම පිණිස විශ්ව විද්‍යාල දෙකකුත් දුන්නා. එක්සත් ජාතික පක්ෂය එවැන්නක් කළේ නැහැ. කරන්න පුළුවන්කම තිබුණු නමුත් එය කළේ නැහැ. වැරදි ඉදිරිපත් කිරීම නම් බොහොම ලෙහෙසියි. ඒ නමුත් ඔය දේ අපේ පක්ෂයේ ආණ්ඩුව මගින් කර තිබෙනව. ඒවා පෙන්වන්න අමාරු ඇයි? එක්සත් ජාතික පක්ෂය හීනෙන්වත් හිතුවෙ නැහැ ඔබඳු දේවල් කරන්න. දැන් බලය ලබා ගැනීම සඳහා කරන ව්‍යායාමයේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෞද්ධ ප්‍රතිපත්ති අරන් ඉදිරිපත් කිරීම ගැන දැන් ඒ අය අඬනව.

ඒ උදවිය මේ රටේ බෞද්ධ ශිෂ්ටාචාරයටවත්, බෞද්ධ සභ්‍යත්වයටවත්, බෞද්ධ සංස්කෘතියටවත්, බෞද්ධ හැදීමටවත් කවදාවත් තැනක් දුන්නෙ නැහැ. අපි දන්නව සුසූ මොහමඩ් වැනි අය මේ රටට ගෙන්වා ආලිංගන නැටුම් නටාපු හැටි. බෙගම්පාරා ගෙන්නූ හැටිත් අපි දන්නව. සෝවාන්, සකෘදාගාමි පමණක් නොවෙයි අනාගාමි, අර්හත් වෙන්නත් පුළුවන් අය ඔය පැත්තෙ ඉන්නවා වෙන්න ඇති. ඒ වුණාට බෞඩ ශිෂ්ටාචාරයට, බෞඩ සංස්කෘතියට, බෞද්ධ හැදීමට තැනක් දුන්නෙ නැහැ. ඒ වෙනුවට ඔය උදවිය කතෝලික ශිෂ්ටාචාරයටත් ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයටත් තමයි තැනක් දුන්නෙ. ඒ සභ්‍යත්වයට, ඒ භාෂාවට, ඒ හැදියාවට, ඒ ශිෂ්ටාචාරයට තැනක් දුන්නා මිස අපේ භාෂාවට, අපේ සංස්කෘතියට, අපේ සභ්‍යත්වයට, අපේ හැදියාවට කවදාවත් තැනක් දුන්නෙ නැහැ. ඒ වුණාට අද නම් එක්සත් ජාතික පක්ෂය කෑ ගහනව හරියට ඒ උදවිය තමයි මේ රටේ ගැළවුම්කාරයා හැටියට ඉන්නෙ කියා පෙන්වමින්. මහජනයගෙ ඇස්වලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැලි ගහන්න බැරි බව වැඩි කල් නොගොස් ඔවුන්ට ප්‍රත්‍යක්ෂ වෙනවා ඇති. ඒ ගැන කිසිම සැකයක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කවදාවත් මහජනයා රවටන්නෙ නැහැ. බෞද්ධාගමට තැන දෙනවය කියන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරන්නෙ බොරුවක් හෝ වංචාවක් හෝ නොවන බවත් හැකි හැම ශක්තියම යොදා ඒ පොරොන්දුව ඉටු කිරීමට උත්සාහ කරන බවත් මතක් කරන්න සතුටුයි. ඒ ගැන ඊට වඩා කතා කරන්න අදහස් කරන්නෙ නැහැ.

ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) අපට විරුද්ධව කතා කරද්දී නොයෙකුත් අදහස් ඉදිරිපත් කළා. බෞද්ධ ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියා කරනවා නම්, සෞඛ්‍ය සංරක්ෂණ ක්‍රමයක්—health insurance—ඇති කරන්න ඕනෑය, මහලු වියට පත් වන අයට පෙන්ෂන් ක්‍රමයක්—old age pension—ඇති කරන්න ඕනෑය, රැකීරක්ෂා නැති අයට රැකීරක්ෂා ලැබෙන තුරු රක්ෂණ ක්‍රමයක්—unemployment insurance—ඇති කරන්න ඕනෑය, දරුවන් සිව් දෙනාට වැඩියෙන් ලැබෙනව නම් ඒ දරුවන් වෙනුවෙන් පරිත්‍යාග ක්‍රමයක්—children's allowance—ඇති කරන්න ඕනෑය, යනාදි වශයෙන් එතුම කීව. මේව බෞද්ධ ප්‍රතිපත්තිද? එහෙනම් බෞද්ධ ප්‍රතිපත්ති නොවන්නෙ මොනවද? ඒ විදියට බලන විට හැම දෙයක්ම බෞද්ධ ප්‍රතිපත්ති හැටියට ගණන් ගන්න පුළුවනි. බෞද්ධ ශිෂ්ටාචාරයට, බෞද්ධ හැදියාවට සහ බෞද්ධ සභ්‍යත්වයට තැන දීමයි, බෞද්ධ ප්‍රතිපත්තිවලට තැන දෙනවය කියන්නෙ. ඊට වැඩි යමක් නොවෙයි. උන්නැහෙල බලයට පත් වී සිටි කාලයෙ මේව ගැන හීනෙන්වත් හිතුවෙ නැහැ. මේව කරන්න එක පාරට බැරි බව කවුරුත් දන්නව. නමුත් පාරාජිකා වෙච්ච දේශපාලනඥයො බලයට පත් වෙන්න හොඳ ක්‍රමයක් හැටියට මේව ගැන කියනව. ඒ අය මෙවැනි දේ ඉදිරිපත් කර, ආණ්ඩුව ඒව කරන්නෙ නැත කියනව.

අද තිබෙන මුදල් තත්ත්වයෙ හැටියට අවුරුද්දකට අධ්‍යාපන අංශය සඳහා කෝටි 35 ක් පමණත්, සෞඛ්‍ය අංශය සඳහා කෝටි 29 ක් පමණත් වියදම් වෙන බව පේනව. ආහාර සඳහා වැඩිපුර ගෙවන මුදල 45 කෝටියකට කිට්ටුයි. දැන් පොත් පත් මුද්‍රණය කරන්න යනව. ඒ සඳහාත් කෝටි ගණනක් වෙන් කරන්න සිදු වේවි. පඩි නඩි ආදිය සඳහාත් විශාල කොටසක් වැය වෙනව. මෙවැනි වියදම් එකතු වූ විට 125 කෝටියකට වඩා වියදම් කරන්න සිදු වෙනව. මේ අය කියන හැටියට මුදල් වෙන් කළොත් සංවර්ධනයක් කරන්න ලැබෙන්නෙ නැහැ. රටේ දියුණුව ඇති කිරීමට නම් පළමුව සංවර්ධන කටයුතු කර ඊළඟට මෙබඳු දේ ගැන ක්‍රියා කරන්න ඕනැ. එවැනි දේ කරන්න වුවමනා බව අපිත් පිළිගන්නව. ඒව යථා කාලයෙදි කරනව. අපි ඒව ගැන නොදන්නව නොවෙයි. වෙන ඇතැම් රටවල එවැනි දේ ක්‍රියාත්මක වන බව අපි දන්නව. අපිත් ඒව ඉදිරි කාලයෙදි කරනව. ඒව කරන්නෙ, රටේ සංවර්ධන කටයුතු කළාට පසුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා කීව, මේ රටේ සෞඛ්‍ය තත්ත්වය බොහොම දරුණු අතට හැරී තිබෙනවය කියා. බෙහෙත් ද්‍රව්‍ය ගෙන්වන්නෙ නැත කියා එතුම කීව. මේ රටට අවුරුද්දකට හතර වතාවක් බෙහෙත් ගෙන්වනව. එය කරන්නෙ ටෙන්ඩර් ක්‍රමයටයි. ඉස්සර නම් එංගලන්තයෙ එක ස්ථානයකින් බෙහෙත් ගෙන්නුව. නමුත් දැන් ටෙන්ඩර් කැඳවා ඉතා අඩුම තැනින් ගෙන්වනව. හතර වතාවකට ගෙන්වීම නිසත්, නැව් ප්‍රමාදාදිය නිසත් තරමක හිඟයක් සිදු වෙන්න පුළුවනි. එය ස්වාභාවිකයි. නමුත් සම්පූර්ණ බෙහෙත් හිඟයක් ඇති වෙන්න හේතුවක් නැහැ. සිදු වී ඇති ප්‍රමාදත් තාවකාලිකයි. එය, ආණ්ඩුව විවේචනය කිරීමට තරම් හේතුවක්ද? මීට අවුරුදු 20 කට 25 කට පෙර මේ රටේ සාමාන්‍ය මිනිසාගෙ ජීවනය අවුරුදු 35 කට පමණ සීමා වෙලයි තිබුණෙ. මිනිසුන් 1,000 ක් මැරෙන විට සාමාන්‍ය වශයෙන් ගණන් බැලුවාම එක් අයකුට වයස ගිහින් තිබුණෙ අවුරුදු 25 යි, 27 යි, 35 යි. නමුත් අද මිනිහෙකුගේ සාමාන්‍ය ජීවිත කාලය අවුරුදු 66.6 ක් බවට පත් වී තිබෙනව. මේ රටේ සෞඛ්‍ය තත්ත්වය හොඳ බව එයින් පැහැදිලිවම පෙනෙනව. මේ රටේ සෞඛ්‍ය තත්ත්වය හොඳ නැත්නම් මිනිහෙකුගේ වයස් සීමාව අවුරුදු 66.6 කට නංවන්නට පුළුවන්ද? මෙයට අවුරුදු 20 කට පමණ කලින් ස්විට්සර්ලන්තය, ස්වීඩනය වැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]

රටවල තිබුණේ ඔය වයස් සීමාවයි. ඒ රටවල් දියුණු වෙන්න වෙන්න වයස් සීමාවත් නැඟී ගියා. තවත් අවුරුදු පහක් හයක් යන විට මේ රටේ වයස් සීමාවත් ඒ රටවල තත්ත්වයට එනවාට කිසිම අනුමානයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1961-62 අවුරුද්දේ අපේ රටේ ජනගහනය 1,01,68,000 යි. සාමාන්‍යයෙන් 1959 අවුරුද්දේ උපන් දරුවන්ගේ මරණ ගණන 1,000 කට 58 යි. 1961 අවුරුද්ද වන විට ඒ ගණන 1,000 කට 52 දක්වා අඩු කරන්න පුළුවන් වුණා. 1961 අවුරුද්දේදී ළමයින් 1,000 ක් උපදින විට මැරුණේ 52 යි. ලංකාවේ සෞඛ්‍ය තත්ත්වය දියුණු වී තිබෙන බව එයින්ම පෙනෙනවා. මව්වරුන්ගේ මරණ ගණන 1,000 කට 2.6 ට පත් වී තිබෙනවා. ඉස්සර ගැබිණියක් දරුවකු ලැබෙන්නට යන විට අඬ අඬායි යන්නෙ. තමන්ගේ ජීවිතය එයින්ම කෙළවර වේද කියන බියෙන් අඬ අඬායි යන්නෙ. බොහොම දුකිනුයි යන්නෙ. දරුවෙක් ලැබීම මවකට ඉතාම ප්‍රීතිදායක දෙයක්. මවකට ඊට වඩා උතුම් දෙයක් නැහැ. නමුත් දරුවෙක් ලැබෙන්න යන විට එයින්ම තමාගේ ජීවිතය කෙළවර වෙයිද කියා ලොකු බයකිනුයි යන්නෙ. අද එහෙම නොවෙයි. අද ඒ සඳහා යන්නේ ඉතාම ප්‍රීතියෙන්. මක්නිසාද? අද ඒ අවස්ථාවේදී මැරෙන්නේ ඉතාමත් කලාතුරකින් නිසයි. අද එහෙම මැරෙන ගණන 1,000කට 2.6කට පත්වී තිබෙනවා. මැලේරියා රෝගය අද නැත්තටම නැති වී තිබෙනවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) කෙසේ කීවත් මේවා ගැන බලන විට පෙනී යන දෙයක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය යටතේ ලංකාවේ සෞඛ්‍ය තත්ත්වය දියුණු වී තිබෙන බව. එය අපේ හතුරන් වුවත් පිළිගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට වැදගත්ම ප්‍රශ්නයට මා බහිනවා. අපේ වැදගත්ම ප්‍රශ්නය මොකක්ද? එය ඉන්දියානු ප්‍රශ්නයයි. අපේ ගරු අගමැතිනිය ඉන්දියාවේ ශාස්ත්‍රී අගමැතිතුමා සමග සාකච්ඡා කර මේ රටට හිසරදයක්ව තිබුණු, මේ රටේ කකුලේ හැදුණු බරවා රෝගයකට සමානව තිබුණු, මේ ඉන්දියානු ප්‍රශ්නය විසඳන්නට හැකිවීම ගැන අපි සන්තෝෂ වෙන්න ඕනෑ. නිදහස ලැබීමෙන් පසු, එනම්, 1948 න් පසු මේ රටේ මැතිවරණ 5 ක් ඇති වුණා. ඔය මැතිවරණ පහේදීම හැම මන්ත්‍රීවරයෙක්ම ප්‍රකාශ කළේත්, හැම දේශපාලන පක්ෂයක්ම ප්‍රකාශ කළේත්, තමන් බලයට පැමිණුණු හැටියේම ඉන්දියානු ප්‍රශ්නය විසඳනවාය කියලයි. එහෙත්, අගමැතිවරුන් 5 දෙනෙක් පත් වුණා; මේ රටේ ඉන්දියානු ප්‍රශ්නය විසඳන්නට ඒ 5 දෙනාටමත් බැරි වුණා. අපේ ගරු අගමැතිනිය විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා සමගත් වෙනත් පක්ෂ නායකයින් සමගත් සාකච්ඡා කර මේ ඉන්දියානු ප්‍රශ්නය අප දෙරටේම සුභ සිද්ධිය පිණිස, විශේෂයෙන්ම ලංකාවට වාසි ගෙන දෙන පරිදි, තීරණය කර ගෙන තිබෙනවා. ඒ නිසා කිසිම පක්ෂ බේදයක් නැතිව, ජාති බේදයක්, වංශ බේදයක් හෝ කුල බේදයක් නැතිව, විශේෂයෙන්ම එය රටට වාසියක් හැටියට සලකා සතුට ප්‍රකාශ කරන්නට ඕනෑ අවස්ථාවේ, මේ අය යන වාට අපේ එක කොටසක් පමණක් අඬනවා; වැලපෙනවා. උන්නැහෙලා කියන්නේ කථා කරන භාෂාව සමානලු. ඉන්දියානු කාරයන් කථා කරන භාෂාවත්, උතුරේ කථා කරන භාෂාවත් එකලු. ඒ සමානකම නිසාම උන්නැහෙලා කරන්න යන්නෙ මොකක්ද කියා අපි දන්නවා. "අපි දෙමළ" නමැති සංවිධානය අදහස් කරන්නේ දකුණු ඉන්දියාවත්, උතුරු ලංකාවත් දෙක එකට සම්බන්ධ කර ආණ්ඩුවක් ගෙන යන්නටයි. උන්නැහෙලාගේ පරමාර්ථයට අකුල් හෙළුණු නිසා අපේ උතුරේ සහෝදරයන් අද කනගාටු වෙනවා; අද අඬනවා; අද වැලපෙනවා. දෙරටේ අගමැතිවරුන්ම එකතු වී මේ ප්‍රශ්නය විසඳීම ගැන විශේෂයෙන්ම මේ රටට ආදරය ඇති හැම කෙනෙක්ම සතුටු වන්නට ඕනෑ. උන්නැහෙලාට මේ රට ගැන මොන ආදරයක්ද? උන්නැහෙලාට වුවමනා කර තිබෙන්නේ මේ රට මෙන් 63 ගුණයක් විශාල වූ ඉන්දියාවේ දමිළ ජනතාව මෙහි ගෙන්වාගෙන මේ රටේ අවුරුදු දහස් ගණනක සිට පරම්පරාගතව පැවතීගෙන එන ජාතියක් යට පත් කර ඒ උඩින් අර ජනතාව පදිංචි කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීමයි. උන්නැහෙලාගේ අන්න ඒ අදහසට ඉඩ නොලැබීම නිසා අද උන්නැහෙලා අඬනව. අගමැතිනිය මෝඩ තීරණයක් කළාය කියා උන්නැහෙලා කියනව. අගමැතිනිය කළ තීරණය මෝඩ තීරණයක්ද, නුවනක්කාර තීරණයක්ද යන්න වැටහෙන්නෙ ඒ ප්‍රශ්නය ගැන හිතන විධියට මිස වෙන විධියකට නොවෙයි. අප හිතනවා, අගමැතිනිය ඉතා ප්‍රඥාගෝචර විධියට මේ ප්‍රශ්නය විසඳුවාය කියා. නමුත් උන්නැහෙලා බලාපොරොත්තු වූ හැටියට මේ රට යට කර ගන්න බැරි වූ නිසා උන්නැහෙලාට පෙනෙනවා, මේ විසඳීම ප්‍රඥගෝචර නැති එකක් හැටියට.

ඉන්දියානුන් මේ රටට ආවේ අපේ ඉල්ලීමක් අනුව නොවෙයි. අපි ඒ අයට අඬ ගැසුවේ නැහැ. අපේ තේ වතු වවන්න උන්නැහෙලාට මෙහාට එන්නය කියා අපි කිව්වෙ නැහැ. උන්නැහෙලා මෙහාට ආවේ එංගලන්තයේ සුදු මිනිසුන්ගේ ඕනෑකමටයි. එංගලන්තයේ සුදු මිනිසුන්ගේ ඕනෑකම නිසා මෙරටට ඇවිත් එංගලන්තයේ සුදු මිනිසුන්ගේ තේ වතු වැවූ පලියට උන්නැහෙලා සියළු දෙනාටම මේ රටේ පුරවැසිකම දෙන්නට අපට පුළුවන්කමක් නැහැ. එංගලන්තයේ සුදු මිනිසුන් යන්නට ගියා. එසේ නම් උන්නැහෙලාගේ තේ වතුවල වැඩ කරන්නට ආ මිනිසුනුත් යන්නට ඕනෑ. නමුත් ඔවුන් යවන්නට මේ රටේ සිටින සමහර අය කැමති නැහැ. ඔවුන් නවත්වා ගන්නටයි, ඒ අය කැමති. පොලිස්පති වරයාගේ 1957 වාර්ෂික වාර්තාවෙන් පෙන්වා දී තිබෙනව, මේ රටට හොරෙන් සංක්‍රමණය වන ඉන්දියානුවන්ගේ ගණන දෙලක්ෂයකට වැඩි බව. ඒ අන්දමට දෙලක්ෂයකට වැඩි ගණනක් අවුරුද්දකට මේ රටට ආක්‍රමණය වෙනවා නම් අවුරුදු ගණනක් තුළ එමෙන් කී ගුණයක් මේ රටට සංක්‍රමණය වෙයිද? ඔවුන්ගෙන් එමෙන් තව කී ගුණයක් බෝ වෙයිද? ඒ තත්ත්වය නැති වීම ගැන අපේ උතුරේ මිත්‍රයන් අඬනවා ; දොඩනවා ; වැලපෙනවා.

මේ ප්‍රශ්නය මෙසේ රටවල් දෙකටම සාමකාමීව විසඳා ගැනීමට ලැබීම ගැන අපි බොහොම සන්තෝෂ වන්නට ඕනෑ. මේ රටේ සිටින ඉන්දියානුවන්ගේ ගණන සම්බන්ධයෙන් මම කිසිවක් කියන්නෙ නැහැ. මේ රටේ සිටින හැම ඉන්දියානුවෙක්ම තමන්ගේ මවු රට හැටියට සැලකුවේ මේ රට නොවෙයි, ඉන්දියාවයි. ඔවුන් තමන්ගේ නායකයන් හැටියට සැලකුවේ මේ රටේ නායකයන් නොවෙයි, ඉන්දියාවේ නායකයනුයි. අනෙකක් තබා මේ රටේ පුරවැසිකම ලැබූ අය පවා ඔවුන්ගේ මවු රට හැටියට සැලකුවේ මේ රට නොවෙයි, ඉන්දියාවයි. ඔවුන්ගේ නායකයන් හැටියට සැලකුවේ මේ රටේ අය නොවෙයි, ඉන්දියාවේ අයයි. ඔවුන්ගේ හැම උත්සවවලදිත්, හැම රැස්වීම්වලදීත් ඔවුන් කටයුතු කළේ ඒ ආකාරයටයි. ගම්පොළ පැවැත්වුණු රැස්වීම කදී ඔවුන් කෑගැසුවේ "නේරුකි ජේ, ගාන්ධිකි ජේ" කියායි. උන්නැහැලා තුළ මේ රටට ආදරයක් තිබෙනවාද යන්න එයින් අපට පැහැදිළි වෙනවා නේද? ඔවුන් "භාරත මාතාකි ජේ" කීවා මිස "ලංකා මාතාකි ජේ" කීවේ නැහැ. ඔවුන් තුළ මේ රටට ආදරයක් නැහැ ; මේ රට ගැන හැඟීමක් නැහැ. උන්නැහෙලා එහා පැත්තට ආවඩමින් මෙහෙන් යැපෙන්නයි හදන්නේ. යම් කිසි රටක ජීවත් වන සමාජ කොටසක් ඒ රටේ පුරවැසියන් නොවූවත්, ඒ රටේ ජාතික ජීවිතයට අනුරූප වන අන්දමින් ජාතික සංවර්ධනයට උදව් දෙමින් අනික් ජනතාවත් සමග සහෝදරකමින් සමගියෙන් ජීවත් වෙනවා නම් ඔවුන් ගැන අපේ කිසි කථාවක් ඇත්තේ නැහැ. නමුත් මේ රටේ සිටින ඉන්දියානුවන්ට එබඳු හැඟීමක් ඇත්තේ නැහැ.

චෞ එන්ලායි චීන අගමැතිතුමා බැංඩුං සම්මේලනයට සහභාගිවීම සඳහා ඉන්දුනීසියාවට ගිය අවස්ථාවේදී එරට ජනාධිපතිතුමා තම රටට හිස රදයක්ව තිබුණු චීන වැසියන් පිළිබඳ ප්‍රශ්නය චීන අගමැතිතුමාට ඉදිරිපත් කළ අවස්ථාවේදී චීන අගමැතිතුමා මෙන්න මේ විදියටයි, කිව්වේ :

"මේ රටේ ජීවත් වන චීන ජාතිකයින්ට තම මව් රටේ දොර ඇර තිබේ. වහාම මව් රටට යෑම චීන ජාතිකයන්ගේ යුතුකමයි. ඔබේ ශ්‍රමය ඔබ මව් බිමේ ශුභ සිද්ධිය තකා යෙදවීම ඔබ හැමගේ යුතුකම බව අමතක නොකළ යුතුයි. එහි නොගොස් මේ රටේ ජීවත් වන අය මේ රටේ සැබෑ පුරවැසියන් වන තෙක් මෙහි දේශපාලන ප්‍රශ්නවලට ඇඟිලි නොගැසිය යුතුයි."

මෙහි සිටින ඉන්දියානුවන් ඒ විදියට කටයුතු කරනවාදැයි මම අහන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]

චීන අගමැතිට මේ ප්‍රශ්නය ඉදිරිපත් කළ අවස්ථාවේදී ඒ රටේ සිටින චීන ජාතිකයින්ට චීනයට එන්න ඉඩ හැරියා. දැන් මෙරට සිටින ඉන්දියානුවන් පිළිබඳව තීරණයකට බැස තිබෙන නිසා මම ඉන්දියාවට දොස් පවරන්නේ නැහැ. ඉන්දිය අගමැති ශාස්ත්‍රී මහතා ඒ ප්‍රශ්නය ඉතා සාමදානයෙන් හා සාධාරණව විසඳීම ගැන අපි එතුමාට ප්‍රශංසා කරනවා.

1962 අගෝස්තු 31 වන දින හැන්සාඩ් වාර්තාවේ සඳහන් වන අයුරු මෙරට සිටින ඉන්දියානුවන් බෙදී ගොස් ඇති ආකාරය දෙස බලමු. ඔවුන් බෙදී ගොස් ඇති අන්දමට ටික කලක් ඔවුන් විශේෂ කොටසක් හැටියට ලියාපදිංචි කර ඒ අයගේ මන්ත්‍රීවරුන් තෝරා ගැනීම වරදක් නැහැ. මෙන්න මේ විදියටයි, ඔවුන් බෙදී ගොස් ඇත්තේ :

| | | | |
|---|---|---|---|
| මැද කොළඹ | ... | ... | 56,000 |
| මාතලේ | ... | ... | 28,000 |
| මිනිපේ | ... | ... | 35,000 |
| ගලගෙදර | ... | ... | 25,000 |
| ගම්පොල | ... | ... | 40,000 |
| මතුරට | ... | ... | 31,000 |
| නුවරඑළිය | ... | ... | 70,000 |
| තලවාකැලේ | ... | ... | 92,000 |
| නාවලපිටිය | ... | ... | 49,000 |
| කොටගල | ... | ... | 49,000 |
| මස්කෙළිය | ... | ... | 72,000 |
| හපුතලේ | ... | ... | 39,000 |
| දෙනියාය | ... | ... | 10,000 |
| අළුත් නුවර | ... | ... | 16,000 |
| බදුල්ල | ... | ... | 86,000 |
| බණ්ඩාරවෙල | ... | ... | 22,000 |
| වැලිමඩ | ... | ... | 15,000 |
| රුවන්වැල්ල | ... | ... | 20,000 |
| දෙහිඕවිට | ... | ... | 21,000 |
| නිවිතිගල | ... | ... | 22,000 |
| බලන්ගොඩ | ... | ... | 65,000 |
| අගලවත්ත | ... | ... | 15,000 |
| මතුගම | ... | ... | 17,000 |
| වත්තේගම | ... | ... | 12,000 |
| නුවර | ... | ... | 14,000 |
| මන්නාරම | ... | ... | 12,000 |
| කිරිඇල්ල | ... | ... | 11,000 |
| දඹුල්ල | ... | ... | 18,000 |

මේ අනුව බලන විට නුවර එළියේ පුරවැසියන් 37,000 කට ඉන්දියානුවන් 70,000ක් සිටින බව පෙනෙනවා. තලවාකැලේ පුරවැසියන් 10,000ට ඉන්දියානුවන් 92,000ක් ද, කොටගල පුරවැසියන් 21,000කට ඉන්දියානුවන් 49,000ක් ද, නාවලපිටියේ පුරවැසියන් 31,000කට ඉන්දියානුවන් 49,000ක් ද, මස්කෙළියේ පුරවැසියන් 27,000කට ඉන්දියානුවන් 72,000ක් ද, හපුතලේ පුරවැසියන් 25,000කට ඉන්දියානුවන් 39,000ක් ද වශයෙන් සිටින බව පෙනෙනවා. ඒ නිසයි, මේ රට පිළිබඳ හැඟීමක් ඔවුන් තුළ ඇති වන තුරු ඔවුන් වෙනම කොටස් කර විශේෂ ලැයිස්තුවක ලියාපදිංචි කර, ඔවුන්ගේ මන්ත්‍රීවරුන් තෝරාගෙන සහයෝගයෙන් වැඩ කිරීමේ සැලැස්මක් ඇති කළ යුත්තේ. ඔවුන්ට මේ රට පිළිබඳ හොඳ හැඟීමක් ඇති වුණාට පසු, මෙරට නියම පුරවැසියන් ලෙස සාමයෙන් වැඩ කරන්නට පටන් ගත් පසු සාමාන්‍ය ලේඛනවලට ඇතුළත් කරන තුරු කාලයක් විශේෂ ලේඛනවලට ඇතුළත් කිරීම වරදක් නොවන බව පවසමින් මගේ කථාව අවසන් කරනවා.

පූ. භා. 10.30

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.** (වත්තල)
*(திரு. டீ. ஷெல்டன் ஜயசிங்ஹ—வத்தளை)*
(Mr. D. Shelton Jayasinghe—Wattala)

Mr. Deputy Speaker, before I speak in support of the Amendments moved by the joint leaders of the Opposition I want to make just one reference to the speech made by the hon. Member for Galigomuwa (Mr. Balasuriya). When he commenced his speech yesterday he stated that the hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene) had taken certain portions of the Governor-General's Throne Speech out of their context and interpolated into them arguments for and against the Press Bill.

I would like to point out to the hon. Member that there are three things specifically mentioned in the Throne Speech. The first is that, Buddhism will be given its proper place in the country as the religion of the majority. The second is the implementation of the agreement between the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Prime Minister of India and the Prime Minister of Ceylon. The third matter is that the lapsed Bills of the previous Session and other necessary progressive measures will be placed before the House.

As regards the proper place for Buddhism we have to wait and see how the Government intends to proceed in this direction. We will have to see what legislation it contemplates and the enactments that will follow.

On the question of the registration of Indians I must say this. The leader of our party, the United National Party, has in no uncertain terms offered his entire support to your Government. We will be only too happy if the Hon. Prime Minister can successfully settle this problem. But there is one great danger. Whilst these talks are going on and whilst negotiations are being made for certain adjustments to be carried out, if we attempt to air our independent views here then we will be causing the greatest possible damage to this agreement. The hon. Member has already spoken about separate registers ; the Prime Minister herself has been talking about these adjustments. What is going to be the position that you will be placing this country and the Government in if you attempt to discuss this matter ? This is a national issue which is far above party politics. It is, therefore, my humble submission that the less said about it the better.

I want to take another very important matter next, and that is the question of the Bills that have lapsed. This is why Parliament was prorogued. This is the first issue that was put before the House. What were the Bills that were presented during the last Session that had lapsed ? They were the Press Bills. Parliament was prorogued because the Government was unable to successfully pilot the Press Bills in the last Session. They have now taken the opportunity to re-present those Bills and they are now contemplating to debate them next week.

The Government is in its last term of office as a Parliament elected in 1960. Soon it has to face the people and elections. The charge made by the people against this Government is one of gross neglect of the needs of the people. That is the main charge. There are also charges of violation of the fundamental rights of the people, of a trend towards dictatorship and of steps already taken to implement a dictatorship, as I will show you in no mistakable fashion. As there are many hon. Members who are anxious to contribute to this Debate, I shall not attempt to digress.

I should like to remind the House that when the Coalition Government was formed on 13th June, 1964, statements were made by both coalescing parties that the Coalition Government would solve the problems of the country. The L. S. S. P. leaders stated that they would bring down the cost of living within one month. The Hon. Minister of Internal and External Trade and Supply, who had been responsible for placing import restrictions in the past two years in conjunction with the Hon. Minister of Finance, made a statement on the Floor of the House. The Hon. Minister of Finance said that he was working on a plan in consultation with the Hon. Minister of Internal and External Trade to permit free imports into this country, and he assured us that there would be no short supply of consumer goods. The present position, however, is that not only is there a grave shortage of consumer goods but there is a graver shortage of essential foodstuffs.

The Hon. Minister of Finance said, " I shall implement a programme of work, it will be a month to month programme ". When other Ministers of Finance tried to implement a programme for a year, two years or three years, this Minister of Finance, the wizard with the golden brains, promised to implement a month to month programme. He added, " I will answer for it on the Floor of the House and I will tell you the progress ". Six months have gone by.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

The Hon. Minister of Finance is ill; he is not here. The progress that he promised is also not here. I am sorry to say that no progress has been made in the implementation of any working plan by the Coalition Government.

In the course of my speech on the Budget I referred to the economic situation and made the charge against the Hon. Minister of Finance that he had wrecked the economy of this country. I showed how agricultural progress was jeopardized, how industry was being brought to a standstill, and how the ranks of the unemployed were increasing. On that occasion I also mentioned—I believe I was the only speaker who made that direct charge—that any attempt to implement the toddy proposal would be vehemently opposed by the entire *Sangha*. I was laughed at on that occasion. Subsequent events have proved me right, and the toddy proposal has been withdrawn in deference to the wishes of the *Sangha*.

It it difficult to give a summary of the acts of omission and commission of this Government in a matter of half an hour. I shall try to be as brief as possible. I want to ask the Ministers—there is only one Minister here today—what has happened to the Budget. Where are these Budget proposals? Where is the Finance Bill? The Government is carrying on without a planned programme of work.

Let us consider the question of import restrictions. In 1961, the import of luxury items was banned. In 1962, the import of semi-essential goods was prohibited. In 1963 there was imposed a cut on essential goods and in the second half of 1964 there was a total ban of imports. In respect of 1965 the Hon. Minister of Internal and External Trade and Supply has issued a quota of 30 per cent. of imports, of which only 10 per cent. can be imported. For almost 12 months in the year, from June 1964 to the end of June 1965, you are going to permit this country only 10 per cent. of all its imports. Can you wonder that there is a rise in the prices of articles? Can you wonder that there is blackmarketing? Can you wonder that people in employment are now going to be retrenched?

The Hon. Minister of Finance has gone out to collect funds. He failed in Japan, he has failed in the U. K., and now I understand that his comrade, the hon. Second Member for Colombo South (Mr. Bernard Soysa), is in Canada asking for gift money. I will come to that in a minute.

The position of the tea market is such that the Ministers promised to give relief to the low-country tea plantations. I asked them to give a subsidy on an acreage basis to the smallholders, but that has not been forthcoming; we asked for a rebate on the duties, but that has not been forthcoming, with the result that today many of the estates are on the verge of closing down.

There is an import restriction on fertilizer. There is an import restriction on essential fungicides. Treatment on some estates is now not possible because there is a shortage of fungicides. Whole areas of tea and rubber plantations will be wiped out if this is not remedied immediately, and now the Government finds it cannot remedy it.

The Hon. Minister of Finance made a statement on the Floor of the House regarding the acreage tax and replanting. He said that the moneys spent on replanting will not be taxed and he said, "I have explained this a number of times; Members of the House cannot understand me". We challenged his statement. I have the Report of the Central Bank issued in September 1964 and at page 13 this is what the Central Bank says about the replanting subsidy. You will remember that the Minister of Finance said that we were incorrect in saying that the replanting subsidy was being taxed. The Central Bank says this at page 13:

"It is proposed to withdraw the provision of exemption of replanting subsidy from the taxable income. The gain to revenue from this measure is estimated to be Rs. 6 million."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The Hon. Minister of Finance said, "No, we are not taxing this replanting subsidy". Here is the Central Bank Report which says not only that you are taxing the replanting subsidy but also how much you are going to gain—Rs. 6 million additional revenue. When the hon. Member for Weligama (Mr. Montague Jayewickreme) protested and said it was incorrect and gave figures, the Minister of Finance tried to laugh him down. He misrepresented facts on the Floor of this House. This was not the first occasion that he had done so. Quite apart from the fact that he is unable to implement his Budget proposals, he has withdrawn the proposed toddy tapping scheme. It is a very ambiguous situation. I read in the newspapers that in a speech made by the hon. Member for Balapitiya (Mr. Lakshman de Silva) he had said that the toddy proposal should be implemented and will be implemented, and that the country accepts it. He had made a very long speech. But the very next day I read in the papers that the hon. Prime Minister in consultation with the Cabinet, in deference to the wishes of the *Sangha*, had dropped the proposal for toddy tapping.

The hon. Member for Wellawatta-Galkissa in a group meeting——

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (දෙහිවල-ගල්කිස්ස)**
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா—தெகிவலை-கல்கிசை)*
(Dr. Colvin R. de Silva—Dehiwala-Mt. Lavinia)

There is no such Member.

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

I am sorry—the hon. Member for Dehiwala-Mt. Lavinia—I stand corrected. Not that the name matters much the personality is sufficiently well known.

The hon. Member in a group meeting objected when the Hon. Minister of Finance said that he was not very anxious to pursue this proposal. He said on that occasion that if he dropped it he would have to resign. He has mentioned it even in public speeches.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

Now that I happen to be present, it is my duty to say that that report is a fabrication, an utmost falsehood.

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

I am prepared to accept it.

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

That is why I say that one should not rely on these liars of the press.

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

I am happy the hon. Member is here. I would not have spoken if he was not here. Now that he is here, I stand corrected. But this has been done : he has made public utterances throughout the length and breadth of the country extolling the virtues of the toddy tapping proposal.

Now what is the position ? I say we are on the verge of a dictatorship because the Hon. Minister of Finance is acting in his own way. The Hon. Prime Minister is acting independently of this House. Budget proposals brought here are being amended and mended without any reference to this House, and without any reference apparently even to the Parliamentary Group because, as I showed you, there were Members who were for the proposal. It was suddenly dropped without any notice to them.

On the question of the moratorium, the hon. Member for Dehiwala-Mt. Lavinia applauded when the Hon. Minister of Finance said he was going to defer the repatriation of pensions. What has happened ?

The Hon. Minister of Finance has permitted these monies to be remitted. There was a reference in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]

the U. K. House of Comons to this. I ask Members of the Cabinet whether they were consulted. Was the hon. Member for Dehiwala-Mt. Lavinia consulted ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

About what ?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

About the repatriation of pensions on which there was a moratorium.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

How much is being allowed to be repatriated ?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I do not know. I am asking you.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

If you do not know, why ask me ?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

But this is the charge. I have got to ask somebody.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

No, Sir. This is a way of getting into the headlines all kinds of falsehoods, the very falsehoods they themselves have created. An hon. Member comes into the House and repeats the newspaper falsehood, and they publish it as though it is said with authority. Why waste our time on this ?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

The question was raised in the House of Commons.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I am not denying that it was raised in the House of Commons, but the rest of the thing is all untrue.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Why do you not make a statement to the press ?

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Do you think I can spend my life every morning telling the papers that they are lying about me ? I prefer to let them lie.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Then we take it for granted that that is not the position, that the moratorium still stands and that pensions are not to be remitted. That is what the hon. Member for Dehiwala-Mt. Lavinia says. If you say so I will accept it.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I say nothing on finance. You will be told by the proper source.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

If you say, " nothing, " keep silent. [*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

There is a Finance Minister in this country——

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

I have to ask the Hon. Minister——

**ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

I am sorry to have changed the whole trend of your speech.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

කරුණා කර නිශ්ශබ්ද වෙන්න. තව මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු කථා කරන්ට බලාපොරොත්තුව සිටින නිසා කථාව කෙටි කරනවා නම් හොඳයි.

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

Sir, I also want to refer to the assurances given by this Government regarding the question of the cost of living. We were assured that the cost of living would be brought down. There was an assurance given by a certain Hon. Minister that he would bring down the cost of living within one month and it was confirmed by the hon. Members of the L. S. S. P. too. For this purpose legislation was rushed through this House; the Control of Prices Bill and various other legislative measures were enacted in an effort to bring down the cost of living. Sir, today, in October 1964, the cost of living index is 113.2, the highest on record. We have not only to make reference to the cost of living but also to the non-availability of essential food items; the stockpiles that would have lasted eight weeks are now sufficient for only six weeks. Take the case of potatoes and Bombay onions. They say that they are expecting shipments. The onions are sold at Rs. 1.20 per pound today. There is a scarcity of these items.

Take the question of the supply of flour. Are we having a shortage of flour? We are told that traders are hoarding stocks of essential food items. Now, Sir, flour is essential for the loaf of bread and *rotti*, the poor man's meal. The Hon. Minister has little or no stocks of this. He had to take refuge under the CARE organisation for this commodity. In fact, he had asked for a loan of 10,000 tons of flour. I do not know whether he will get the 10,000 tons asked for and they in turn have asked for relief under the PL 480 Agreement.

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක (කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—விவசாய, உணவு, கடற்றொழில் அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. F. R. Dias Bandaranaike—Minister of Agriculture, Food and Fisheries and Parliamentary Secretary to the Minister of Defence and External Affairs)

Are you personally aware of any particular area in the country where there is the slightest difficulty in obtaining stocks of bread or flour? I would like you to give me any particular area where there is a shortage. I am not aware of any such area. As far as I am concerned, the daily issue of flour has not changed at all and supplies have been maintained. I do not know whether the hon. Member is trying to create a shortage. I am not aware of any single area where there is a shortage nor have I received any complaints from any part of the Island. If you have a complaint to make I can understand, but please do not try to create problems when there are no problems.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසිංහ මයා.
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

If the Hon. Minister thinks that we cannot voice our opinions on a matter, he is sadly mistaken.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)

I do not say so.

ජයසිංහ මයා.
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

I am asking the Hon. Minister, what is the situation? Is he aware that onions are being sold at Rs. 1.20 per pound?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டார நாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)

I am not talking of onions, but I am talking of flour. The simple answer is this: I told the House once before that the position in relation to onions would be brought to normal before the second week of December. I guaranteed that everything possible would be done to bring the situation to normal. Today is only the 3rd of December and it looks as though we would not have to wait till the second week of December before the position is brought to normal. I am not in control of weather conditions and crop conditions in other parts of the world, but so far as it is humanly possible to do so it will be done and, what is more, I have kept to my promise.

So far as flour is concerned, there may be problems of administration here and there, but is there one case of a baker or shopkeeper who has been compelled not to supply bread or flour owing to any shortage? If so, I am not aware of it and I would request the hon. Member to bring such a case to my notice. But merely to create conditions of fear that there might be a shortage in the future, built up on talk of this type—[*Interruption*]. If I may say so with respect I do not think that was not the intention of the Hon. Member, and while he has the undoubted right to voice his opinions, I should make it equally clear that, so far as I am aware, there is no shortage of flour in any area.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
*(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)*
(Dr. Colvin R. de Silva)

This morning's "Daily News", their own newspaper, says that Bombay onions are available at 35 cents per pound.

ජයසිංහ මයා.
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

I am not prepared to enter into an argument. I am not giving way.

වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාදන් (නල්ලූර්)
*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*
(Dr. E. M. V. Naganathan—Nallur)

The daily newspapers say that the co-operative stores are full of this and full of that. Are we to believe the papers, because according to the Government the papers tell lies?

ජයසිංහ මයා.
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)

If the Hon. Minister wants to reply he can do so later. The position is that the cost of living has reached a peak which we have never known before. By your import restrictions you are adding to the problem of unemployment.

Every day the ranks of the unemployed are swelling. One of the ways in which the problem should be tackled in the rural areas is by the alienation of land, but both the schemes put up by the Hon. Minister of Lands were not approved by the Cabinet.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

With the formation of the Coalition Government, every problem has been aggravated. The L. S. S. P. said that they would solve the financial problems and the Hon. Minister of Finance said that he will not print any Treasury Bills, but now for current consumption we are chasing after loans from foreign countries. If you want to take over Lake House to print Treasury Bills. I will be the first to give my vote. It is better to print Treasury Bills than to borrow money from foreign sources on heavy interest.

I remember the Hon. Minister of Agriculture told us, "Judge us by our results in 1965." What can you show so far? Has the cost of living come down? Have you solved the unemployment problem? Have you provided houses for the people? What is the agricultural development? Have you reached your targets? You were one of those who said: "We don't want architects; we want foremen". Have you delivered the goods?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

But you rejected my Budget.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

Not I, your own Cabinet and your Government rejected your Budget. Your own Cabinet cut your throat.

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)
(The Hon. F. R. Dias Bandaranaike)

How did you vote?

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

I voted against it because I knew that you could not fulfill what you promised. I knew you were blind to the true state of affairs. I knew that you were not able to deliver the goods, that your Government had not the ability to do it. You should be the first to vote against this Address of Thanks. You should be the first person to vote for our amendment. It was you who said "Judge us by our results in 1965."

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

It is not yet 1965.

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

The hon. Member for Dehiwala-Mt. Lavinia is always living in a world of hope. For 25 years there was hope ever before him. I will never attempt to dissuade him from having hope. I do not want anybody to go away from this world in despair. You can go on living in your own world of hope. —[*Interruption*]. But hopes will not fill the stomachs of the people; hope will not give shelter to people without houses; hope will not increase production; hope will not bring development to our country. Hope alone is not sufficient.

For you always to say that the next year is going to be better, that the Coalition Government is going to deliver the goods, that you have got the golden brains, that you know the requirement s of the people, is not sufficient. The naked truth is that you cannot deliver the goods, that you are utterly incompetent. You are trying to cover up all these shortcomings—staking all on a single throw—by taking over the press. The Government is trying to cover its hideous nakedness by grabbing the press which is a first step to dictatorship. When you have failed by democratic methods you must resort to undemocratic means if you want to remain in the seats of power. To expect people

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසිංහ මයා.]
who have sacrified principles of 25 years to willingly give up the seats of power is wishful thinking.

Mr. Deputy Speaker, as you have reminded me time and again that there are other hon. Members to speak I will stop now. I thank you for giving me a few more minutes.

පූ. භා. 11.3

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජාසන කථාව පිළිබඳව මේ කෙරෙන විවාදයේදී මාත් වචන කීපයක් ප්‍රකාශ කරන්ට අදහස් කරනවා. මා පළමුවෙන් මතක් කරන්ට ඕනෑ, මට ප්‍රථමයෙන් කථා කළ වත්තල ගරු මන්ත්‍රීතුමා (සී. ෂෙල්ටන් ජයසිංහ මයා.) කවදත් පුරුදු විලාශයෙන්—අපට හැමදාම කියන බණ වලින්—අදත් අනුශාසනයක් කළ බව. මට නම් පෙනුනෙ නැහැ, ඒ කථාවේ කිසිම හරබර ගතියක් හෝ අපට පිළිගන්ට පුළුවන් දෙයක් හෝ තිබෙනවාය කියා. එතුමා කවදත් කියන දේ අපට අදත් කිව්වා. එක්සත් ජාතික පක්ෂය මේ රටේ අවුරුදු ගණනාවක් ආණ්ඩු කළා. 1956 වන තුරුත්, ඊට පසුව දවස් 33 කුත් ඒ උදවිය ආණ්ඩු කළා. ඒ කාලය තුළ මේ රටේ තිබුණු එකම ප්‍රශ්නයක්වත් ඒ උදවිය විසඳුවාදැයි මා අහනවා. එකම ප්‍රශ්නයක්වත් නොවිසඳා ඒ හැම දෙයක්ම පස්සට තල්ලු කරමින්, අධිරාජ්‍යවාදීන් සතුටු කරවන්ට මේ රටේ ප්‍රතිගාමීන් සතුටු කරවන්ට ක්‍රියා කළා.

මේවර රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා, ඉන්දියානු ප්‍රශ්නය ගැන. මේ රටේ තිබුණු ප්‍රධානම ප්‍රශ්නය ඉන්දියානු ප්‍රශ්නය යයි මා කල්පනා කරනවා. ඊට වඩා ලොකු වෙනත් ප්‍රශ්නයක් මේ රටේ තිබුණේ නැහැ. අගමැතිවරුන් 5 දෙනකු පමණ මේ ප්‍රශ්නය ගැන කථා කළා. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු කාලයේදී මේ ප්‍රශ්නය විසඳන්ට අවංකව ක්‍රියා කළාදැයි මා අහනවා. වත්තල ගරු මන්ත්‍රීතුමා අහනවා, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්ට මේ රජය මොකක්ද කළේ කියා. වත්තල මන්ත්‍රීතුමා සභාවෙන් පිට වී යනවා. මා එතුමාට උත්තර දෙන්ටයි, ලැහැස්ති වුණේ. උත්තර දෙන්නම්. ඉන්දියානු ප්‍රශ්නය උඩරට මන්ත්‍රීවරුන්ට බල පාන වැදගත් ප්‍රශ්නයක්. රාජාසන කථාවේ ඉන්දියානු ප්‍රශ්නය ගැනත්, බෞද්ධාගමට මුල් තැනක් දීම ගැනත් කරුණු කීපයක් අඩංගු වී තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කළ කාලයේදී මේ රටේ පැවති භාෂා ප්‍රශ්නය, ඉන්දියානු ප්‍රශ්නය, කර්මාන්ත පිළිබඳ ප්‍රශ්නය ආදි එකම ප්‍රශ්නයක්වත් විසඳීමට එම ආණ්ඩුව ක්‍රියා කළේ නැහැ. ඒ උදවිය කළා නම් කළේ, හාල් මිල ටිකක් වැඩි කිරීමත්, පාසැල් ළමයින්ට ලැබුණු බනිස් ගෙඩිය හා කිරි ටිකට තට්ටු කිරීමත් වගේ වැඩයි. ඒ හැර මේ රටේ වෙන මොනම ප්‍රශ්නයක්වත් විසඳුවෙ නැහැ. එතුමන්ලා මේ රට ආණ්ඩු කරන කාලයේ දී ආරම්භ කළ කර්මාන්ත මොනවාදැයි මා අහනවා. මේ රටේ කෘෂිකර්මාන්තය දියුණු කරන්ට එතුමන්ලා ගෙන ගිය වැඩ පිළිවෙළ මොකක්ද? මේ රටේ භාෂා ප්‍රශ්නය විසඳුවාද? මේ රටේ ඉන්දියානු ප්‍රශ්නය විසඳුවාද?

ඉන්දියානු ප්‍රශ්නය තමයි මේ රටේ ඉතාම වැදගත් ප්‍රශ්නය. මා පුදුම වෙනවා, මේ රටේ ඉතාමත් වැදගත් ප්‍රශ්නය වන ඉන්දියානු ප්‍රශ්නය විසඳීමෙන් පසුව එය හොඳ විසඳුමක් යයි කියන්ට තරම් ආත්ම ශක්තියක් මේ රටේ දේශපාලනයේ යෙදී සිටින ඇතැම් පුද්ගලයින්ට නැති වීම ගැන. මෙය ඉතා භාරදූර ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය ගැන කවුරුත් වගේ වේදිකාවල කෑ ගසනවා. කවුරුත් මහජනයා ඉදිරිපිට දී පොරොන්දු වෙනවා, මේ ප්‍රශ්නය විසඳනවාය කියා. මේ ප්‍රශ්නය විසඳන්ට ඕනෑ යයි කියන ඒ කවුරුවත් අවංකව මේ ප්‍රශ්නය විසඳන්ට උත්සාහ කළාදැයි මා අහනවා. අපේ අගමැතිනිය එක්සත් ජාතික පක්ෂය පුදුමයට පත් කරවමින් මේ රටේ අවුරුදු 25 ක් තිස්සේ පැවැති ඉන්දියානු ප්‍රශ්නය විසඳා ඉන්දියානුවන් 5,25,000 ක් මේ රටෙන් යවන්ට ගිවිසුම් අත්සන් කර ඉවරයි. වත්තල ගරු මන්ත්‍රීතුමා කිව්වා, උන්නැහෙ සතුටු වෙනවාය කියා, මේක අගමැතිනියට කරන්ට පුළුවන් නම්. මම අහනවා මොකද බැරි කියා? කරල ඉවරයි. ගිවිසුම අත්සන් කරල ඉවරයි. දැන් තිබෙන්නෙ ක්‍රියාත්මක කරන්ටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ පිළිබඳවත් දැන් වැඩ කටයුතු කරගෙන යනව. මේ රට අධිරාජ්‍යවාදීන්ගේ බලයට යට වුණාට පසු ඔවුන් විසින් මේ රටට දෙන ලද දෑවැද්දක් තමයි, මේ ඉන්දියානු ප්‍රශ්නය. ලක්ෂ ගණන් ඉන්දියානුවන් උඩරට ප්‍රදේශයන්හි වතුවල සේවය කර නවා. වත්තල ගරු මන්ත්‍රීතුමාට (ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.) මේ ගැන හැඟීමක් නැහැ. ඉන්දියානු ප්‍රශ්නය නිසා අප නියෝජනය කරන ප්‍රදේශවල මහ ජනයාට විශාල කරදරයක්, හිරිහැරයක්, ඇති වී තිබෙනවා. අපේ ගම්බද මහජනයාට රැකීරක්ෂා නැති වී ගොස් තිබෙන්නේ ඉන්දියානුකාරයන් නිසයි. වෛද්‍ය පහසු කම්, නිවාස පහසුකම් ආදී වූ හැම පහසු කමක්ම ඉන්දියානුකාරයන්ට ඇතත් ස්ව දේශිකයන්ට නැහැ. එක්සත් ජාතික පක්ෂ යේ උන්නැහේලාට මේවා තේරෙනවා අඩුයි. ධනපති පංතිය ගැන මිසක් සාමාන්‍ය ජනතාව ගැන එක්සත් ජාතික පක්ෂයේ උදවියට හැඟීමක් නැහැ. නමුත් අපේ ප්‍රදේශවල ගම්බද මහජනයාට තිබෙන අමාරුකම් ගැන අප හොඳින් දන්නවා. ජීවත් වීමට ක්‍රමයක් නැතිකම නිසා, රැකී රක්ෂා නැතිකම නිසා, උඩරට ප්‍රදේශවල මහජනයා ඉතාමත්ම අවාසනාවන්ත ජීවිත ගත කරනවා. ඔවුන්ට යන එන මං නැහැ. ඒ නිසා ඉන්දියානු ප්‍රශ්නය විසඳා උඩරට ප්‍රදේශවල ජනතාවට සහනයක් සැලසීමටයි, මේ ආණ්ඩුව හැම විටම උත් සාහ කෙළේ.

දැන් ඉන්දියානුකාරයන් 5,25,000 ක් ඉන්දියාවට යවන්නට ගිවිසුම් අත්සන් කොට තිබෙනවා. මෙසේ කිරීම නිසා ඒ තරම් වූ ස්වදේශිකයන් පිරිසකගේ රැකී රක්ෂා ප්‍රශ්නය විසඳෙනවා. මෙය අමතක කළ හැකි කාරණයක් නොවෙයි. නමුත් අවංකව තමන්ගේ අදහස් ප්‍රකාශ කරන් නට බැරි සමහර පුද්ගලයන් මේ වැඩේ හොඳ නැතැයි වැලිමඩ මන්ත්‍රීවරයා (කේ. එම්. පී. රාජරත්න මයා.) වැනි අය දැන් කෑගසනවා. නියම කරගෙන තිබෙන ගණන් හිලව්වලට වඩා බොහෝ ගණනක් ඉන්දියානුකාරයන් මේ රටේ ඉන්නවාලු. ඒ වැලිමඩ ගරු මන්ත්‍රීවරයාගේ වත්තේ ඉන්න අයත් සමග වන්නට ඇති. මේ විධියට හැමදාම මහජනයා මුළා කරන්නට ලැබෙන එකක් නැහැ. මේ ප්‍රශ්නය ඇදගෙන මහජනයා මුළා කරන් නට හදන අය ළඟදීම මුළා වෙනවා ඇති. කෙසේ වෙතත් තමන්ගේ පෞද්ගලික වාසියම බලාගෙන මහජනයා මුළා කිරීමට නැත් කිරීම සම්පූර්ණයෙන්ම වැරදි ක්‍රියා වක්. ඉන්දියානු ප්‍රශ්නයේ ඇති බරපතළ කම සලකා ගෙන ඒ ප්‍රශ්නය විසඳා ගැනී මට ආධාර දීම, ඒ ප්‍රශ්නය විසඳා මේ රටේ ජනතාවට සෙතක් සලසා දීම, සෑම පුර වැසියෙකුගේම යුතුකමයි ; වගකීමයි. දැන් මේ ප්‍රශ්නය විසඳා තිබෙන අවස්ථාවේදී මේ රටේ ස්වදේශික මහජනතාව සිරිමා බණ්ඩාරනායක අගමැතිනියට ණයගැතියි. සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ මේ උදාර සේවය ගැන මේ රටේ ජනතාව එතුමි යට කෘතඥ විය යුතුයි. නමුත් මේව පත්‍ර කාරයින්ගෙ පත්‍රවල පළ වෙන්නෙ නැහැ. මේ ගැන කර්තෘ වාක්‍ය ලියනව නම් තුන් මාසයක් තුළ කර්තෘ වාක්‍ය ලිවිය යුතුය කියා මා සිතනව. නමුත් අද පත්‍රවල මොන වද තියෙන්නෙ ? මේක වැරදියි. මේ වැඩේ හරි නැහැ. මේ රටේ ඉතාම සුළු කොටසක ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නට, ප්‍රතිගාමීන් දෙතුන් දෙනෙකු ආරක්ෂා කරන්නට, අධිරාජ්‍යවාදී පන්දම්කාර ධන පතීන් දෙතුන් දෙනෙකු ආරක්ෂා කරන්ට, මේ රටේ සමහර දේශපාලන පක්ෂ විශේෂ යෙන්ම එක්සත් ජාතික පක්ෂය, වැලි මඩ ගරු මන්ත්‍රීතුමාගේ පක්ෂය, අවිස්සා වේල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) පක්ෂය ආදී පක්ෂ ඉදිරිපත් වී ක්‍රියා කිරීම ඉතාම නින්දා සහගතයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මට එක් ආරංචියක් ලැබුණා. මට ඒ ගැන කණගාටුයි. එක්සත් ජාතික පක්ෂයේ ප්‍රගතිශීලීය කියා ගන්නා ඔය ප්‍රතිගාමීන් ඇතුළු සමහර අයගේ දැන් අළුත් සූදුනමක් තිබෙනවාලු මේ රාජාසන කථා විවාදයේදී රජය පරදවන්න ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රීවරයකුට රුපියල් 50,000 බැගින් පගාව දෙන්න. ඔය විධියේ ආරංචියක් මට අද උදේ ලැබුණා. මේ විධියේ කැත, නින් දිත, නිගීන වැඩ කරන්නට පවා ඔවුන් ඉදිරිපත්වීම ගැන ඇත්ත වශයෙන්ම අපි කණගාටු වෙනව. මහජනයාගේ කැමැත්ත උඩ මේ රටේ ආණ්ඩුවක් ගෙන යනවා වෙනුවට මුදල් බලය සොදා ප්‍රතිගාමීන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

දෙතුන් දෙනෙකු ආරක්ෂා කරන්නට සම හර අය ක්‍රියා කරනවා නම් ඒක ඉතාමත් නින්දිත වැඩක්.

ඇත්ත වශයෙන්ම අද මොකක්ද වෙලා තියෙන්නෙ? මේ රටේ අපට නියම ඇත්තක් දැන ගන්නට ලැබෙනවාද? මේ රටේ පත්‍රවල තියෙන්නෙ සම්පූර්ණයෙන්ම බොරු. මගේ කොට්ඨාශයේ සිදුවූ එක්තරා කුඩා සිද්ධියක් ගැන මේ අවසථාවේදී සඳහන් කරන්න කැමතියි. බදුල්ලේ ආරෝග්‍යශාලාව අසල මාර ගහකට හෙණයක් වැදීමෙන් ඒ ගහෙන් පොත්තක් කඩා වැටුණා. ඒ ගහ මුල කපුටු පිහාට්ට කුත් වැටිල තිබුණා. දවස් දෙකකට පසු පත්‍රයේ පොල් ගෙඩි අකුරෙන් තිබෙනව, "බදුල්ලේ ආරෝග්‍යශාලාව අසල මාර ගහකට හෙණ වදී; කපුටන් දහස් ගණනින් මැරී සිටී; හෙදියන් ගණනාවක් ක්ලාන්ත වෙති" කියා. මහජනයා කලබල වී එන්න පටන් ගත්තා. නමුත් මොකක්ද වී තිබුණේ? මාර ගහේ පොත්තක් කඩා වැටී තිබුණා. ගහ මුල කපුටෙකුගෙ පිහාට්ට කුත් තිබුණා. මෙන්න මේ විධියේ මහ ජනයා අවුස්සන වුවමනා නැති බොරු බේගල් තමයි මේ රටේ පත්‍රවල තියෙන්නෙ. මේ රටේ මිනී මරණ මනුෂ්‍යයාට දඬුවමක් තිබෙනවා නම්, හොරකම් කරන මනුෂ්‍යයාට දඬුවමක් තිබෙනවා නම් පත්‍රකාරයින් බොරු කියන විටත් දඬුවම් කරන්න නීතියෙන් ඉඩක් තියෙන්න ඕනෑ නේද? ඒ වගේම මේ පසුගිය දවස්වල ඇමතිවරුන්ට බෙන්ස් කාර් 15 ක් ගෙන්වන වාය යන ප්‍රවෘත්තියක් පත්‍රවල පළවුණා. නමුත් බෙන්ස් කාර් එකක්වත් ගෙන්නුවෙ නැහැ. ගෙන්වන්නෙත් නැහැ. නමුත් පත්‍රයෙ තිබුණා බෙන්ස් කාර් 15ක් ගෙනෙනවාය කියා. මේවා බොරු කියා කියන්න අපට අයිතිවාසිකමක් තිබෙනවා නොවේද?

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

බෙන්ස් කාර් ගෙන්නුවෙ නැද්ද?

**බණ්ඩාර මයා.**

*(திரு. பண்டார)*

(Mr. Bandara)

ගෙන්නුවෙ නැහැ. ගරු මන්ත්‍රීතුමා පුළුවන් නම් ගෙන්නුවාය කියා ඔප්පු කරන්න. මෙන්න මේ විධියේ බොරු බේගල් කියන විට ඒ විධියට බොරු කියන්න එපාය කියා කියන්න අපට නීතියෙන් ඉඩක් තිබෙන්න ඕනෑ නේද? සම හරු කියනව මේක වැරදිලු; නිදහස නැති කරනවලු. මම කණගාටු වෙනව අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) වැනි කෙනෙකුත්—පැරණි, ප්‍රගතිශීලී අදහස් තිබෙන කෙනෙකුත්—අද එක්සත් ජාතික පක්ෂයත් සමග එක ජීප් රථයේ නැඟී ප්‍රතිගාමීන් ආරක්ෂා කරන්නට පෙළපාලි යාම ගැන. ඇත්ත වශයෙන්ම මෙවැනි අවාසනාවන්ත තත්ත්වයකට අද එතුමා පත්වී සිටීම ගැන අපි කණගාටු වෙනව.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් රටේ මහ ජන මතයක් නැහැ. පත්‍රකාරයින් ඇතුළු කවදත් ආණ්ඩුවට විරුද්ධ කොටස් මේ ප්‍රශ්නය උඩත් ආණ්ඩුවට විරුද්ධව කට යුතු කරනවා මිස මේ රටේ කිසිම මහජන මතයක් නැහැ. පත්‍ර පනත ගැන මගේ කොට්ඨාශයේ ගැමියෙකුගෙන් මා ප්‍රශ්න කළා. "ඔය පත්තර මකබෑ වුණත් අපට මොකද මන්ත්‍රීතුමනි", කියා ඔහු කිව්වෙ. ඇත්ත වශයෙන්ම ඒ ජනතාව තුළ මේ ගැන කිසිම හැඟීමක් නැහැ. නමුත් මහ ජන මතයක් තිබෙනවාය කියා පෙන්වන්න පත්‍රවලින් උත්සාහ කරනව. මෙවැනි තත්ත්වයක් රටේ ඇති කිරීම ගැන අපි කණගාටු වෙනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාල වේලාව නොමැතිකම නිසා මා මේ ප්‍රශ්නය ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට අද හස් කරන්නෙ නැහැ. මා මුළින් කීවා වගේ අර ඉන්දියානු ප්‍රශ්නය මේ රාජාසන කථාවට ඇතුළත් ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. ඒ වාගේම ආණ්ඩු ක්‍රම පනතේ 29 වැනි වගන්තිය සංශෝධනය කිරීමෙන් මේ රටේ වැඩි දෙනාගේ ආගම වන බෞද්ධාගමට නීතියෙන් නියම තැනක් දෙනවාය කියාත් මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ බහුතර ජනතාවගේ ආගම වන බෞද්ධාගමට නියම තැන දෙන්නට මේ රාජාසන කථාවෙන් ප්‍රතිඥා දී තිබීම ඇත්ත වශයෙන්ම මේ රටේ මහජනතාව කාලයක් තිස්සේ පුල පුලා සිටි ස්වකීය අභිමතාර්ථයක් මුදුන්පත් වීමේ වැදගත් අවස්ථාවක් බව විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනව. එහෙත් මේ රටේ පත්තරකාරයින්ට පන්දම් අල්ලන භික්ෂූන් වහන්සේලා ස්වල්ප දෙනෙකුවත් ඉන්න එක ගැන අප කනගාටු වෙනව. බෞද්ධාගමට නියම තැන දෙන එකත් හොඳ නැතිලු. කාටද මේවා කියන්නෙ? කවුද මේවා විශ්වාස කරන්නෙ? හිතට එකඟව මෙහෙම දෙයක් කියන්න පුළුවන්ද? භික්ෂූන් වහන්සේලා දෙනමකගේ අත්වලට මාංචු දමා ඇති ආකාරයට අඳින ලද පෝස්ටර් වගයක් ගමක් ගානේ නගරයක් ගානේ දමල තිබෙන බව තමුන්නාන්සෙ දන්නව. මෙවැනි දේ කරන්නෙ මොන කාරණයක් නිසාදැයි මම අහනව.

බෞද්ධාගමට නියම තැන මේ ආණ්ඩුව මගින් ලබා දෙනු ඇතැයි මේ රටේ මහජනතාව බලාපොරොත්තු වුණා. ඒ සමගම මේ රටේ වෙනත් වැදගත් ප්‍රශ්නවලට නිසි විසඳුමක් මේ ආණ්ඩුවෙන් ලබා දෙනු ඇතැයි මේ රටේ මහජනතාව බලාපොරොත්තු වුණා. මේ රටේ වැඩි දෙනාගේ භාෂාව රාජ්‍ය භාෂාව කිරීම සහ මේ රටේ වැඩි දෙනා අදහන ආගම වන බෞද්ධාගමට නියම තැන දීම දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් අයින් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීමේදීම මේ රටට දුන් වැදගත් ප්‍රතිඥාවන් බව තමුන්නාන්සේ දන්නව. ඒ අතර මේ රටේ වැඩි දෙනා ප්‍රයෝජනයට ගන්න ජාතික වෛද්‍ය ක්‍රමයට ලැබිය යුතු නියම තැන ලබා දීමටත් මහජනයා ඉදිරියේ දිවංගත අගමැතිතුමා පොරොන්දු වුණා. මෙවැනි කරුණුවලට මුල් තැන දෙන්නට එදා දුන් පොරොන්දු දැන් ක්‍රම ක්‍රමයෙන් ඉෂ්ට වෙගන යනව.

සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරන බවට දිවංගත ගරු අගමැතිතුමා දුන් පොරොන්දුව කාටත් මතකයි. දැන් සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කර ඉවරයි. ජාතික වෛද්‍ය ක්‍රමයට තැන දීලා ඉවරයි. ඉන්දියානු ප්‍රශ්නය විසඳීම සම්බන්ධයෙන් කාලයක් තිස්සේ මත භේද පැවතුණා. මේ ආණ්ඩුව දැන් ඒ ප්‍රශ්නයත් විසඳන තැනට කරුණු සකස් කර අවසානයි. ඊළඟට කළ යුතුව තිබෙන වැදගත් දෙය නම් බෞද්ධාගමට ලැබිය යුතු නියම තැන නීතියෙන්ම ලබා දීමයි. බෞද්ධාගම වෙනුවෙන් කළ යුතු නොයෙක් දේවල් තිබෙනව. බෞද්ධාගම වෙනුවෙන් කළ දේත් රාශියක් තිබෙනව. එහෙත් වැඩි දෙනාගේ ආගම වන බෞද්ධාගමට මේ රජයෙන් තරම් තැනක් දුන් එකම රජයක්වත් මේ තාක් මේ රටේ ඇති වුණේත් නැහැ, ඉදිරියට ඇති වෙන්නෙත් නැහැ.

බෞද්ධ භික්ෂූන් වහන්සේලාට මේ රටේ අද උසස් තැනක් හිමි වී තිබීම ගැන අප කවුරුත් සන්තෝෂ වෙන්න ඕනැ. දිවංගත අගමැතිතුමාට කහ සිවුරක් පෙරවා ගත් එක්තරා පුද්ගලයෙකු වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් පුවත්පත්වල නොයෙක් විධියට කතීඃ වාක්‍ය පවා ලිව්වා. කහ සිවුරක් පොරවා ගත් පුද්ගලයෙක් අගමැතිතුමාට වෙඩි තියල මැරුවය කියල පුවත්පත්වලින් ප්‍රකාශ වුණාට පස්සෙ එදා මේ රටේ භයානක තත්ත්වයක් ඇති වුණු බව අප කාටත් මතකයි. මහජනයා ලවා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට තළ වන්න වගේ ඒ කතීඃ වාක්‍යවල කරුණු ඇතුළත් වුණා. බෞද්ධ භික්ෂූන් වහන්සේලා එදා මුහුණ පෑ භයානක තත්ත්වයෙන් මුදා ගැනීමට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය සමත් වුණා. එදා එතුමිය මහා සංඝ රත්නය ආරක්ෂා කර ගත්තා. කලබල නොකර ඉන්න ලෙසත්, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ අවමංගල්‍ය කටයුතුවලට සහභාගි වන්නට බලාපොරොත්තු වන කාටවත් ඊට බාධා නොකරන ලෙසත් එදා එතුමිය ඉල්ලා සිටියා. එදා එතුමිය ඒ ආකාරයට නොකිව්වා නම් ඇති වෙන්න තිබුණු තත්ත්වය මොකක්ද? එදා මේ රටේ භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කළේ අන් කිසිවෙක් නොව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. එහෙත් අද එය අමතක වෙලා තිබෙනව. ඒ ගැන මා කනගාටු වෙනව. එතුමිය ඉදිරියටත් සංඝ රත්නයත් බෞද්ධාගමත් ආරක්ෂා කරනවා. ඒ ගැන සැකයක් නැහැ.

බෞද්ධාගමට නියම වශයෙන් ලැබිය යුතු තැන දීමටත්, බෞද්ධ අයිතිවාසිකම් ආදිය ආරක්ෂා කිරීමටත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් බොහෝ දේ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

තිබෙනව. ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේදී සංස්කෘතික දෙපාර්තමේන්තුවක් පවා ඇති කර බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවට කටයුතු කර තිබෙනව. ඉදිරියටත් ඒ කටයුතු කර ගෙන යනව. බෞද්ධාගමට නියම තැන දීමටත් බෞද්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටත් ක්‍රියා කළේ එක්සත් ජාතික පක්ෂයද, එහෙම නැත්නම් බණ්ඩාරනායක අගමැතිනියගෙ නායකත්වයෙන් තිබෙන මේ ආණ්ඩුවද, කියා මම ප්‍රශ්න කරන්න කැමතියි. මේ රටේ විද්‍යෝදය විශ්ව විද්‍යාලයත් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයත් ඇති කළේ කවුද? බෞද්ධ භික්ෂූන් වහන්සේලාට උසස් අධ්‍යාපනයක් ලබා දීමට ක්‍රියා කළේ වෙන කවුද? මේ රටේ බෞද්ධාගම වෙනුවෙන් කර තිබෙන්නෙ එපමණක් නොවෙයි. තවත් බොහෝ දේවල් කර තිබෙනවා. දැන් අවසාන වශයෙන් කළ යුතුව තිබෙන්නෙ බෞද්ධාගමට ලැබිය යුතු නියම තැන නීතියෙන්ම ලබා දීම සඳහා 29 වන වගන්තිය සංශෝධනය කිරීමයි. මේ රටේ වැඩි දෙනාගේ ආගම වන බෞද්ධාගමට නියම තැන දීමට රජය දෙන ප්‍රතිඥව මේ රාජාසන කථාවේ සඳහන් වෙලා තිබෙනව. මේ හොඳ වැඩ කරන විට සමහර උදවිය අපට විරුද්ධත්වය දැක්වීම ගැනයි අප කනගාටු වන්නෙ. මේවා නොකරන විට ඒ උදවිය වේදිකාවට නැග බෞද්ධාගමට නියම තැන නොදෙන්නෙ ඇයි කියා කෑ ගහනව. රටේ නොයෙකුත් තැන්වල, පිට්ටනි ගානෙ, කෑ ගහනව. අපි කළාම, ඒක හොඳ නැතිලු. ඒකයි, පුදුමෙ. කවුරු කොහොම කීවත්, මේ රටේ ජනතාව බුද්ධිමත් ජනතාවක් බව මා කියන්න කැමතියි. මහජනයා තුළ රජය කෙරෙහි විරුද්ධත්වයක් ඇති කරවන්න පත්‍ර කාරයින් කොතරම් උත්සාහ කළත් මේ රටේ බුද්ධිමත් ජනතාව තමන් ගන්නා හරි ක්‍රියා මාර්ගය කුමක්ද කියා තීරණය කර ඉවරයි. මේ රටේ පැන නැගී තිබුණු ප්‍රශ්න මොනවාද කියා ඔවුන් දන්නව. භාෂා ප්‍රශ්නය විසඳා, ඉන්දියානු ප්‍රශ්නය විසඳා, ආගම් ප්‍රශ්නය විසඳා, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳා සමාජවාදී ගමන යන මෙම රජය කෙරෙහි මේ රටේ ජනතාව පැහැදී අවසානයි. මේ රජයේ වැඩ පිළිවෙළට සහයෝගය දිය යුතුය කියා ඔවුන් පිළිගෙන අවසානයි.

මා එක්සත් ජාතික පක්ෂයෙන් අහනව, ඒ අය ආණ්ඩු කළ කාලෙ මොනවද මේ රටේ ආරම්භ කළ කර්මාන්ත කියා. අපි මේ රටේ කර්මාන්ත 500 ගණනක් ආරම්භ කළා. මෙරට නිපදවන බඩුයි, අද වැඩි වශයෙන් ගන්න ලැබෙන්නෙ. සූට්කේස් එකක් ගත්තත්, සපත්තු කුට්ටමක් ගත්තත්, මැෂින් එකක් ගත්තත්, වී මෝලක් ගත්තත් එය හදා තිබෙන්නෙ මේ රටේයි. ඇයි තමුන්නාන්සෙල ආණ්ඩු කළ කාලෙ ඔය එකක්වත් නොකළෙ? මෙරට කර්මාන්ත වැඩි දියුණු කරන්ට, රැකිරක්ෂා ප්‍රශ්නය විසඳන්ට, ජාතික ධනය පිටරට ඇදී යාම වළක්වන්ට අපි මේ කරන වැඩ වැරදිද? ඉන්දියානු ප්‍රශ්නය විසඳීම වැරදිද? කවුරු කෙසේ කීවත් අපි යන පාර හරි බව මේ රටේ මහජනතාව හොඳාකාර දන්නව. පත්‍ර මාර්ගයෙන් රජයට විරුද්ධව කොතරම් කතිඃ වාක්‍ය ලීවත් මහජන මතයක් ඇති වුණේ නැහැ. ඇතැම් ස්වාමීන් වහන්සේලා මා හමු වී කීවා, උන්වහන්සේලාට ඇති වූ බලපෑම් ගැන. බදුල්ලෙ, මුතියංගන විහාරෙ ස්වාමීන් වහන්සෙ හමු වෙන්න පත්‍ර කාරයින් ගිහින් තියෙනව. උන්වහන්සෙ මා සමග කීව මෙම සිද්ධිය පාර්ලිමේන්තුවෙන් ප්‍රකාශ කරන්නය කියා. උන්වහන්සෙ ළඟට පත්‍ර කාරයින් ගිහින් කියා තිබෙනව, පත්‍ර පණත ගැන යමක් කියන්න කියා. ඒ පාර උන්වහන්සෙ කියා තිබෙනව, "මේක තනිකර හොඳ වැඩක්" කියා. නමුත් එම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම වැරදි විදියටයි, පත්‍රවල පළ වුණේ. මේ පත්‍ර පණත ඉතා නරක වැඩක් ලෙස උන් වහන්සේ ප්‍රකාශ කළ හැටියට පෙන්වමින් පත්‍ර කාරයින්ට ඕනෑ අන්දමට ප්‍රකාශයන් පළ කර තිබුණ. එම ප්‍රකාශ වැරදි බව දන්වා උන්වහන්සෙ පත්‍රවලටත් ලියා යවා තිබෙනව. මටත් ඒ බව වහාම දැනුම් දුන්න. මෙවැනි බොරු වැඩ නේද කරන්නෙ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා යමක් කියන්න යන්නෙ නැහැ. සුළුවෙන්වුණත් මෙම රාජාසන කථාවෙ ඉතා වැදගත් කරුණු ගණනාවක් සඳහන් කර තිබෙනව. ඉන්දියානු ප්‍රශ්නය විසඳීම, බෞද්ධාගමට නියම තැන දීම යනාදී වැදගත් කරුණු කීපයක් සඳහන් වී තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙම රාජාසන කථාව පිළිබඳව අපේ ප්‍රීතිය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අව සාන කරනව.

පූ. භා. 11.27

**ටී. සිවසිතම්පරම් මයා. (වවුනියාව)**
*(திரு. ரி. சிவசிதம்பரம்—வவுனியா)*
**(Mr. T. Sivasithamparam—Vavuniya)**

கௌரவ உப சபாநாயகரவர்களே, ஐந்தாவது பாராளுமன்றத்தின் ஆருவது கூட்டத் தொடரை உருவாக்கி, சிம்மாசனப் பிரசங்கத்தில் நாட்டினுடைய சரியான நிலையைப் பற்றிப் பேசுவதற்கு எங்களுக்கு ஏற்ற சந்தர்ப்பத்தை உருவாக்கித் தந்தமைக்காக முதலிலே ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கத்துக்கு எங்களுடைய நன்றியறிதலைத் தெரிவித்துக் கொள்ளுகின்றேன். சிம்மாசனப் பிரசங்கத்துக்கு நன்றி தெரிவிக்குமுகமாக அரசாங்கக் கட்சியைச் சேர்ந்த பிரதிநிதிகளிலே முதலாவதாக கௌரவ நுவரெலியாப் பிரதிநிதி (திரு. வில்லியம் பெர்னுண்டோ) அவர்கள் பேசினுர்கள். சாதாரண ஒரு தொழிலாளி, பாராளுமன்றத்திலே ஒரு தொகுதியின் பிரதிநிதியாக வந்து சிம்மாசனப் பிரசங்கத்துக்கு நன்றி தெரிவிக்கும் முகமாகப் பேசும் பேச்சுக்கு முதலிடத்தைத் தந்தமை ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கம் எவ்வளவு தூரம் சாதாரண விவசாயிகளுக்கு, தொழிலாளர்களுக்கு, நாட்டு மக்களுக்கு முதலிடம் கொடுக்கிறது என்பதைத் தெளிவாகக் காட்டுகிறது என்று அவர் குறிப்பிட்டார்.

இன்றைய நாட்டினுடைய நிலையில், சகோதரர்களாக இருந்தாலென்ன, எந்தச் சமயத்தை, சமூகத்தைச் சேர்ந்தவராக இருந்தாலென்ன, நாட்டு மக்களின் பொதுப் பிரச்சனைகள் என்ன என்பதைப் பற்றிச் சற்று ஆராய வேண்டும். 'பத்திரிகைகளை அரசாங்கம் எடுக்க வேண்டும், அல்லது தனிச் சிங்களம் அரசகரும மொழியாக வர வேண்டும் அல்லது பௌத்த மதம் அரசாங்க மதமாக மாற வேண்டும் என்பதல்ல இன்று பொது மக்கள் எதிர்பார்ப்பது. உண்ண உணவு, உடுக்க உடை, சீவிப்பதற்காக, சீவனுேபாயத்துக்கு ஏற்ற அரசாங்க உதவி; இவற்றைத் தான் பொதுமக்கள் இன்று எதிர்பார்க்கிருர்கள்.

இந்தச் சிம்மாசனப் பிரசங்கத்திலே நாட்டு மக்களுடைய முக்கிய தேவைகளை நிறைவேற்ற அரசாங்கம் எவ்வளவு தூரம் முயற்சி செய்கின்றது என்பதைப் பற்றி நாங்கள் ஆராய்ந்து பார்ப்போம். வாழ்க்கைச் செலவின் புள்ளி விபரங்கள் சரித்திரத்திலே இல்லாத அளவுக்கு உச்ச நிலையை அடைந்து விட்டது. வேலையில்லாத் திண்டாட்டமும் அதே விதமாக உச்சத்தை அடைந்துவிட்டது. அதாவது வேலையில்லாத் திண்டாட்டத்தினுல் அல்லற்படும் மக்கள் தொகை எவ்வளவோ தூரம் அதிகரித்து விட்டது. வேலையில்லாத் திண்டாட்டத்தைப் பற்றிப் பேசும்பொழுது 161 ஆயிரம் என்று புள்ளிவிபரப்படி இருக்கும் மக்களுக்கு அரசாங்கம் உத்தியோகம் வழங்க வேண்டும் என்பதல்ல நாம் கேட்பது —அவர்கள் கோருவது. குறிப்பாகக் கூறினுல், 'நாட்டிலே தாராளமாகக் காணி நிலம் உண்டு, எங்களுக்கு நிலம் தாருங்கள், எங்கள் வேலையில்லாத் திண்டாட்டத்தை நீக்கி நாங்கள் வேலை செய்ய வழி செய்து தாருங்கள்' என்று கேட்கும் பொழுது 1963 ஆம் ஆண்டு கௌரவ காணி அமைச்சரால் அங்கீகரிக்கப்பட்ட திட்டம் என்னவாயிற்று என்று தெரியாமலிருக்கின்றது. வவுனியாத் தொகுதியிலே காணி கேட்பவர்களுக்கு, காணி இல்லாதவர்களுக்குக் காணி கொடுக்க வேண்டும் என்ற திட்டம் கௌரவ காணி அமைச்சரால் 1963 ஆம் ஆண்டிலே அங்கீகரிக்கப்பட்டது. இத் திட்டம் அங்கீகரிக்கப் பட்டு இப்பொழுது ஒருவருட காலமாகி விட்டது. இதுவரை ஆரம்ப நடவடிக்கைகள் கூட எடுக்கப்படவில்லை. இந்த நிலைமையைப் பார்க்கும் பொழுதே அரசாங்கம் வேலையில்லாத் திண்டாட்டத்தை நீக்க எத்தகைய நடவடிக்கைகளைக் கையாளுகின்றது என்பது நன்ருகத் தெரிகின்றது.

விவசாயிகளாக இருந்தாலென்ன, கைத் தொழில் செய்பவர்களாக இருந்தாலென்ன, கடற்றொழில் செய்பவர்களாக இருந்தாலென்ன, இவர்கள் தாம் இன்று இலங்கையில் பெரும்பான்மையானவர்கள். இவர்கள் தங்கள் தங்கள் தொழில்களைச் சரிவரச் செய்வதற்கு தேவையான உபகரணங்களை வழங்க முடியாத நிலையில் அரசாங்கம் இன்று இருக்கின்றது. காரணம் வெளிநாட்டு மூலதனம் குறைந்து விட்டதேயாகும். இதுவரை சரித்திரத்திலேயே இல்லாத அளவுக்கு வெளிநாட்டு மூலதனம் குறைந்துவிட்டது. மக்களுடைய தேவைகள் இந்தவிதமாக இருக்கும் பொழுது அரசாங்கத்தினுடைய ஐந்தாவது

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ වී. සිවසිතම්පරම් මයා.]

பாராளுமன்றத் தொடரிலே, ஆருவது கூட்டத் தொடரின் சிம்மாசனப் பிரசங்கத்திலே என்ன இருக்கிறது என்று நாங்கள் அவதானித்துப் பார்த்தால், இருப்பன இரண்டேயிரண்டு விஷயங்கள் என்பது புலப்படும். ஒன்று இலங்கை இந்திய பிரச்சினையை நாங்கள் தீர்த்து விட்டோமென்று வீரப்பறை சாற்றிச் செய்தியைப் பகிரங்கப் படுத்தும் செயல். இரண்டாவது, இலங்கையிலே பௌத்த மதத்துக்கு உரிய இடங்கொடுப்பதற்கு எங்களுடைய அரசாங்கம் நடவடிக்கையெடுக்கின்றது என்பது. இவற்றைவிட வேறெதனையும் சிம்மாசனப் பிரசங்கத்திலே காணேம். முதலாவது, இந்தியர் பிரச்சினை. இப்பிரச்சினை பற்றி எனக்கு முன் அரசாங்கத் தரப்பு உறுப்பினர் பேசியவற்றை நான் கேட்டேன். வெறுங் காடாக, வளமின்றி, வருமானமின்றிக் கிடந்த இந்நாட்டை வளங்கொழிக்கும் நாடாக்கிய, தம்மில் ஆயிரக் கணக்கானேர்களுடைய உயிர்களைப் பலி கொடுத்து இந்நாட்டின் அறுபது சத வீத வருமானத்துக்கு வழிவகுத்த இந்தியத் தொழிலாளர்களை இந்தியாவுக்கு இவ்வளவு இலேசாகத் திருப்புவதில் வெற்றிகண்டுவிட்டோம் என்று பறை சாற்றுகிறர்கள். இந்திய அரசாங்கத்துக்கும் இலங்கை அரசாங்கத்துக்குமிடையே ஒப்பந்தம் உருவாகலாம். ஆனல், ஒப்பந்தம், இந்தியர்களை இந்தியாவுக்குத் திருப்பியனுப்பிவிடமாட்டா தென்பதை நான் இங்கு திட்டவட்டமாகக் கூறிவைக்க விரும்புகின்றேன்.

அடுத்தாக பௌத்த சமயத்துக்குத் தகுந்த இடங்கொடுப்பதைப் பற்றியது. இலங்கையிலுள்ள பெரும்பான்மையான மக்கள் பௌத்தர். இலங்கை அரசாங்கம் பௌத்த மதத்தவர்களுடைய கையிலிருக்கின்றது. அரசியலமைப்புச் சட்டத்தில் 29 ஆம் சரத்தின்படி எந்தச் சமயத்துக்கும் அரசாங்கத்தினுல் இடையூறு செய்ய முடியாத நிலை இருக்கின்றது. இதன்படி அரசாங்கம் தனது அரசியற் சட்டத்தில் பௌத்த மதத்துக்குத் தகுந்த இடங்கொடுக்கவில்லையா? அல்லது ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்க அமைச்சர்கள் பௌத்த மதத்துக்கு உரிய இடங்கொடுக்கவில்லையா என்பதுதான் இன்றையக் கேள்வி. பௌத்த மதமல்லாதார், வேறு மதத்தவர்கள், பௌத்த சாசனம், பௌத்த குருமார்கள் வணக்கத்துக்குத் தகுதியற்றவர்கள் என்று சொல்லவில்லை; நீர்கொழும்பிலே செத்த வீட்டில் மார்படிக்கும் பெண்களைப் போன்றவர்கள் என்று சொல்லவில்லை; "லேக் ஹவுஸ்" ஸின் கைப் பொம்மைகளாகக் கூலிக்கு மார் படிப்பவர்கள் இவர்கள் என்று கூறவில்லை. இவ்வாறெல்லாம் சொல்லுகின்ற ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கத்தின் அமைச்சர்கள்தாம் பௌத்த குருமாருக்கு, பௌத்த மதத்துக்குத் தகுந்த இடங் கொடுக்க வேண்டுமா அல்லது அரசியற் சட்டம் தகுந்த இடங் கொடுக்க வேண்டுமா என்று சிந்தித்துப் பார்க்க வேண்டும். சிம்மாசனப் பிரசங்கத்தில் எவ்வளவு இனிப்பூட்டக் கூடிய முறையில், எவ்வளவுதான் சிறப்பாக பௌத்த மதத்தை அரசாங்க மதமாக்க நடவடிக்கை யெடுக்கிறேம் என்று கூறியிருந்தாலும் பொதுமக்கள், பௌத்தர்கள், இந்துக்கள், கிறிஸ்தவர்கள், இஸ்லாமியர் அனைவரும் இதன் உண்மை நிலையை உணராமல் இருக்க மாட்டார்கள்.

நாட்டு வளத்துக்கு பிரயோசனப் படக் கூடிய முறையில் செலவழிக்க வேண்டிய மாசக் கணக்காகக் காலத்தை வீணகச் செலவழித்து, பாராளுமன்ற அங்கத்தவர்களுக்குப் படியாகக் கொடுக்கும் இலட்சக்கணக்கான ரூபாயைச் செலவழித்து "லேக் கவுஸை", அதாவது பத்திரிகைகளை தம் கையில் எடுக்க வேண்டுமென்று இந்த அரசாங்கம் முயன்று மசோதாக்களைக் கொண்டு வந்திருக்கின்றது. எத்தனையோ அரசியற் பண்டிதர்கள், மேதைகள் முயன்று இம்மசோதாக்களைத் தயாரித்தார்கள். ஈற்றிலே இம்மசோதாக்களைச் சமர்ப்பிப்பதில் இரண்டுமுறை தோல்வி கண்டார்கள். இவற்றை இன்னெரு முறை கொண்டு வந்து நிறைவேற்ற வேண்டுமென்ற அந்த ஒரேயொரு நோக்கந்தான் கடந்த பாராளுமன்றக் கூட்டத் தொடரைக் கலைத்ததும், புதிய சிம்மாசனப் பிரசங்கமொன்றைத் தந்ததும் அதனை நாங்கள் இங்கு விவாதிக்கும் சந்தர்ப்பத்தை யேற்படுத்தியதும் என்பதில் சந்தேகமில்லை.

இந்தியர்களை இந்நாட்டிலிருந்து அனுப்புவதற்கு அரசாங்கம் ஒழுங்கு செய்துவிட்டது; பௌத்த மதத்துக்கு உரிய இடங்கொடுப்பதற்கு அரசாங்கம் ஆலோசனை செய்கிறது என்று இவை இரண்டையும் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கம் கூறியது, இலங்கையிலுள்ள சிங்களச் சகோதரர்களுடைய,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அதுவும் சிங்களப் பௌத்தர்களுடைய நல்லெண்ணத்தைப் பெற்று தங்களுடைய இலட்சியத்தை, அதாவது பத்திரிகைகளைத் தாங்கள் எடுக்கும் இலட்சியத்தை யடையத் தான். ஆனால், நடந்தது என்ன? இன்று ஏற்பட்டிருக்கும் விளைவு என்ன? இந்த சிம்மாசனப் பிரசங்கத்திலே கூறப்பட்டுள்ள இரண்டு பெரிய நோக்கங்களின் விளைவு என்ன? பௌத்த மதத்துக்கு உரிய இடம் கொடுக்கப்படும் என்று கூறிய வுடன் பௌத்த சாசனமும் குருமாரும் உங்களுக்குப்பின் "ஆம்" என்றுகூறி வழி நடக்கத் தொடங்கி விட்டார்களா? அல்லது இந்தியத் தொழிலாளர்களை இலங்கையி லிருந்து அகற்றுவதற்கு ஏற்ற உடன்படிக்கை செய்துவிட்டோம்; சிலருக்கு தனி இடாப்புத் தயாரிக்கப் போகிறோம் என்று கூறியவுடன் சிங்கள மக்கள் உங்களைப் பின்பற்றி விட்டார் களா என்ற கேள்விகளுக்கு நான் பதிற் கூற வேண்டிய அவசியமில்லை; அதைப்பற்றி உங்களுக்கு நன்றாகத் தெரியும்.

இலங்கையிலிருக்கின்ற சிறுபான்மைச் சமூ கங்கள், தமது மிக முக்கியமான பிரச்சினை களைத் தீர்க்க வேண்டுமென்று கடந்த எத் தனையோ ஆண்டுகளாக சாத்விகமான முறை யிலே பாராளுமன்றத்திலும் வெளியிலும் போராடி வந்திருக்கிறார்கள். சிறுபான்மைச் சமூகத்துக்கு உரிய உரிமைகளைத் தாருங்கள் என்று நாங்கள் பலவாறு கேட்டும் அதைப் பற்றி எதுவித நடவடிக்கையும் எடுக்கப்பட வில்லை.

அது மாத்திரமல்ல. இன்று அரசாங்கம் பத்திரிகையை எடுப்பதைப் பௌத்த மக் களின் முழு ஆதாரவுடன் செய்வதற்காக பௌத்த மதத்துக்குச் சரியான இடம் கொடுக்கப்படும் என்று கூடுதலாக இந்த சிம் மாசனப் பிரசங்கத்திலே கூறியிருக்கின்றது. ஆனால் சிறுபான்மை மக்களின் மதம், உரிமை ஆகிய எதைப்பற்றியும் சொல்லாமல் இருப் பது ஒரு குற்றம். மற்றது, அவர்களின் இரத் தத்திலே தசையிலே அரசாங்கம் இதனை செய்ய முயற்சிக்கும் இச்செயலைக் கண்டு சிறு பான்மை மக்கள் சும்மா இருக்க முடியாது. இதுவரை மொழி பிரச்சினை சம்பந்தமாகத் தீர்வு காணும் பொருட்டு அரசாங்கம் ஏதா வது நடவடிக்கை எடுத்திருக்கின்றதா? இன்று தமிழ் அரசாங்க ஊழியர்கள் ஒரு நாளைக்கு ஒரு விதமாக திண்டாட்டத்துக் குள்ளாக்கப்படுகின்றார்கள். இனிமேல் அவர் கட்குக் கட்டாய ஓய்வு அறிவித்தல் கொடுக்கப் பட மாட்டாது என்று உயர் அதிகாரிகள் கூறுவதாகப் பத்திரிகைகளிற் படித்தேன். எனினும் சிலருக்குக் கட்டாய ஓய்வுக் கட் டளைகள் அனுப்பப்படுகின்றன. தமிழ் பேசும் சமூகத்தைப் பொறுத்த வரையிலே மொழிப் பிரச்சினை, அரசாங்க சேவைப் பிரச்சினை, காணிக் குடியேற்றத்திட்டப் பிரச்சினை ஆகிய பிரச்சினைகள் இருந்து வருகின்றன. இவை களுக்கு எதுவிதமான பரிகாரமும் தேட அர சாங்கம் முயற்சிக்கவில்லை.

அரசாங்கம் இந்தப் பத்திரிகை மசோ தாவை நிறைவேற்ற வேண்டுமென்று நினைத் திருக்கும் இந்தக் கட்டத்திலே நாட்டிலே என்ன நடந்திருக்கின்றது என்பது பற்றி ஆராய வேண்டும். முதலாவது வாழ்க்கைச் செலவு அதிகரித்ததனால் பொது மக்களின் மனம் கசந்து அரசாங்கத்தின் மீது வெறுப்பு ஏற்பட்டிருக்கின்றது. வேலையில்லாத் திண் டாட்டத்தினால் எத்தனையோ ஆயிரம் பேர் வேதனைப்பட்டுக்கொண்டிருக்கின்றார்கள். விவ சாயம், மீன்பிடித் தொழில், சிறு கைத் தொழில் ஆகியன செய்து சீவனோபாயத்தை நடத்த ஏற்ற வழிவகைகளை அரசாங்கம் செய்து கொடுக்காததனால் பொது மக்கள் அர சாங்கத்தை நொந்து கொண்டிருக்கின்றார்கள். தங்கள் உரிமைகளைத் தாருங்கள் என்று சிறு பான்மைச் சமூகத்தினர் அரசாங்கத்தைக் கேட்கும் போதெல்லாம் அந்த முயற்சிகளை அரசாங்கம் நிராகரித்து வந்ததனால் சிறுபான் மைச் சமூகம் அரசாங்கத்தின் மீது மன வேதனைப்பட்டு அரசாங்கத்தை எதிர்த்துக் கொண்டிருக்கின்றார்கள். இவைகள் அத்தனை யையும் விட்டு, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி இன்று பெரும் பான்மைக் கட்சி என்ற வகை யிலே அதன் ஆணி வேராக, அஸ்திவாரமாக இருந்த பௌத்த சாசனத்தினர் இன்று ஆயிரக்கணக்கில் அரசாங்கத்தை எதிர்க்கத் தொடங்கிவிட்டார்கள். இந்நாட்டின் மூல தனச் செல்வத்தை உருவாக்கிய இந்தியத் தமிழருக்கு அநீதி செய்யும் இலங்கை இந்திய ஒப்பந்தத்தால் மனம் கசந்துள்ள தொழிலா ளர்களும் அரசாங்கத்தை எதிர்க்கிறார்கள். இவை மாத்திரமல்ல. அரசாங்கக் கட்சியி னுள்ளும் தங்களுடைய சொந்த அபிப்பிரா யத்தைத் தெரிவிக்குமுகமாக எத்தனையோ பிளவுகள் ஏற்பட்டுக் கொண்டிருக்கின்றன. இவற்றை நாங்களும் அறிவோம். ஸ்ரீ லங்கா

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. සිවසිතම්පරම් මයා.]

சுதந்திரக் கட்சியின் மேலிடமும் அறியும். அரசாங்கக் கட்சியிலுள்ளேயே இப்படியான எதிர்ப்புக்கள் ஏற்பட்டுக் கொண்டிருக்கின்ற நேரத்திலே, கௌரவ அவிசாவலைப் பிரதிநிதி (திரு. டீ. பி. ஆர். குணவர்தன) கௌரவ வெலிமடைப் பிரதிநிதி (திரு. கே. எம். பீ. ராஜரத்ன), கௌரவ நல்லூர்ப் பிரதிநிதி (வைத்தியகலாநிதி ஈ. எம். வீ. நாகநாதன்) ஆகியோர் உட்பட எதிர்க்கட்சியினரெல்லாம் ஒன்றாக இணைந்து பத்திரிகைகளை எடுப்பதை தடுக்க வேண்டும் என்று எதிர்ப்புத் தெரிவித்துக் கொண்டு இருக்கிறார்கள். அரசாங்கம் இவற்றையெல்லாம் பொருட்படுத்தாமல், கட்சியினுள்ளேயே பிளவுகள் ஏற்பட்டுக் கொண்டிருக்கும் நேரத்திலே பத்திரிகைகளை எடுத்துத் தான் தீர வேண்டும் என்றிருப்பதில் அர்த்தங்கள் சில இருக்கத்தான் வேண்டும். அதை உணராமல், எனக்கு முன் பேசிய அரசாங்க தரப்பைச் சேர்ந்த கௌரவ அங்கத்தவர்கள் தாங்கள் ஐ. தே. கட்சியினரைவிட எத்தனை அதிகப்படி வாக்குகளைப் பெற்று வந்தோம் என்பது போன்ற கணக்கு விபரங்களைக் கூறினார்கள். அதே நேரத்தில் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் கொள்கை வெளியீட்டில் பத்திரிகைகளை எடுக்கப் போகிறோம் என்று பொது மக்களுக்குத் தேர்தல் வாக்குறுதி கொடுத்திருக்கிறார்களா என்பதை அவதானித்துப் பார்க்கத் தவறி விட்டார்கள். பொது மக்கள் வெறுப்பைக் காட்டிக் கொண்டிருக்கும் வேளையிலே, பௌத்த சாசனங்கள் அன்புடன் இம் மசோதாக்கள் பிழையானவை, கை வைக்க வேண்டாம் என்று புத்திமதி கூறிக்கொண்டிருக்கும் நேரத்திலே, அரசாங்கம் இவற்றையெல்லாம் பொருட்படுத்தாமல், தன்னுடைய எண்ணப்படி நடந்து கொண்டிருப்பதற்கு ஒரு காரணம் உண்டு. அது நாமறியாத காரணமல்ல. ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினுடைய கால எல்லை அடுத்த ஜூன் மாதத்தோடு முடிகிறது. அடுத்த ஜூன் மாதத்தோடு பாராளுமன்றம் கலைக்கப்பட வேண்டும். இவ்வளவு எதிர்ப்புக்களுனுள்ளும் பத்திரிகையை ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி அரசாங்கம் எடுத்தால், அடுத்த தேர்தலில் பெரும்பான்மையைப் பெறுமோ அல்லவோ என்பது அவர்களுக்குத் தெரியும். இவ்வளவு கஷ்டப்பட்டு, இவ்வளவு எதிர்ப்புக்களினுள்ளும் பத்திரிகைகளை எடுத்து, இனி வரும் அரசாங்கம், இன்றைய எதிர்க்கட்சியிலிருக்கும் அரசாங்கம் நாளை ஆளும் பீடத்தில் அமர்வதற்கு ஏற்ற வழிகளை வகுத்துக் கொண்டிருக்கிறார்களோ என்றால், அதுவும் இல்லை. அண்மையிலே கடந்த ஒரு வார காலத்துக்குள் வடக்கு மாகாணத்திலே நடைபெற்றுக் கொண்டிருக்கும் சில நிகழ்ச்சிகள் அரசாங்கத்தினுடைய எண்ணத்தை என்ன திட்டத்துடன் அவர்கள் வேலை செய்கிறார்கள் என்பதை நன்றாக எடுத்துக் காட்டுகின்றது.

Mr. Deputy Speaker, within a period of one week the developments in strengthening the military units which are already existing in the Northern Province are in themselves clear proof to the entire country of the aim and theme in the heart of the S. L. F. P.

This honourable House would have heard of the acts of tyranny and aggression that were inflicted on the ordinary poor people who are living in the North by the personnel in the military camps which have been established at Palaly and Thalayady. Representations have been made to the Prime Minister and to our respected friend, Mr. N. Q. Dias, how his military boys were trying to play the fool and how they are trying to molest even women in the Northern Province.

There are naval centres within Kilinochchi area, within Poonakari area and at Iyakkachchi under the guise that they were sent there to arrest illicit immigrants in the North. Now at Iyakkachchi, Thalayady, Samankundu, Veravil and Malaipal the navy boys in these naval centres are asked to go out and military detachments, army detachments, are sent there. Within these last four or five days they have been sent there and their position is now strengthened. Let us leave that aside.

Yesterday an army detachment has been sent to Mullaitivu—I received telegrams from my constituents—and they are pitching their camp there. What is all this for? Why all this? I shall come out with the answer in a moment. Why are they pitching their camp at Mullaitivu? The hospital visitors, the town councillors and the public have sent protests to the Prime Minister

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that they are pitching their camp in front of the hospital, by the side of the rural court, by the side of the main road junction where hundreds of women folk sit and wait. They are there looking after the patients who are in hospital and attending the rural court and that is the place where, day and night, hundreds of womenfolk stay, that they are pitching their camp. Let us know for what reason this is ?

If it is the motive of the Government to open more and more military centres in the North and the rest of the country and make arrangements to declare a state of emergency very soon, it is quite clear that the *Maha Sangha* is not going to keep quiet without taking any action. Even if the Government passes legislation in this House, with all their difficulties they are not going to allow the S. L. F. P. to take over Lake House easily. The whole Opposition on the Floor of this House is not going to keep quiet and there is sure to be a commotion on this issue very soon and an emergency is going to be imposed.—[*Interruption*]. Even the anti-Sri campaign—today you would have read in the papers that we are withdrawing that. We do not want to create a chance for you to declare an emergency in Ceylon. We do not want to do it. This is the ultimate aim of the Government.

I ask you, what was the necessity for the Government to station a military detachment in Mullaitivu ? What happened there ? Are illicit immigrants coming to Mullaitivu or is smuggling going on there ? Why do you want to take away the navy men from the naval centres there and replace them with military personnel ? Let us face it. When the entire country faces it, let us also face it. Let me thank the Government for what they have done. They have united us. The entire Opposition on the Floor of this House, whether it be the J. V. P., the Federal Party, the U. N. P. or the Independents, the whole Opposition is now together. The Government had created the situation for all of us to come together. That is not all. Speaking on behalf of the Tamil-speaking people and their representatives, we, who were so far independent from one another and had differences of opinion among us, have joined hands to be together no sooner the Government showed signs of symptoms of interfering its religion, and there will be one voice from now on. We will be together and we will face your aggression together.

On this question of aggression there is only one thing that I would like to say on the Floor of this House. Our Prime Minister, a woman Prime Minister, who has been praised in all the foreign countries for her sympathy, mercy and all that, has started an aggression on these women-folk in Mullaitivu who visit their patients in the hospital, who go to attend the rural court, because from yesterday the army has started pitching their camps in that place. We can tolerate the aggression, the havoc, which we have seen in the North displayed by the army personnel. I would request the Hon. Prime Minister, being a woman, to think of these poor women and to place herself in the position of these people who are going to suffer this aggression. Let the Government have an army unit in Mullaitivu, not one but even ten, and we are prepared to face them but let them not have an army detachment placed at that particular spot ; let them not start harassing those people.

I think I have taken too much of your time. Very soon we will have the next Throne Speech on the Floor of this House. Let us study that carefully and decide whether we are to support the Government or oppose it.

පූ. භා. 11.54

**ඩබ්ලිව්. පී. ජී. ආරියදාස මයා. (සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டபிள்யூ. பீ. ஜீ. ஆரியதாச—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. W. P. G. Ariyadasa—Parliamentary Secretary to the Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 5 වැනි පාර්ලිමේන්තු වාරයේ 6 වැනි රාජාසන කථාවෙන් ඉදිරිපත් කරන ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

කරුණු පිළිබඳව ඇති වන මේ විවාදයේදී කරුණු සවල්පයක් කථා කරන්නට අවස්ථාව ලබාදීම සම්බන්ධව මගේ කෘතඥතාවය මේ අවස්ථාවේදී පළ කළ යුතුයි. මා මගේ කථාව පටන් ගන්නට පෙර වව්නියාවේ ගරු මන්ත්‍රීතුමාගේ (ටී. සිවසිතම්පරම් මයා.) කථාවෙන් මතු වූ කරුණු සවල්පයක් ගැන මේ අවස්ථාවේදී සඳහන් කළ යුතුය කියා අදහස් කරනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දින කීපයකට පෙර උතුරට ශ්‍රී බස් රථ යැවීම පිළිබඳව හා තවත් දේවල් රාශියක් උඩ පෙඩරල් පක්ෂය විසින් ඇති කරන්නට බලාපොරොත්තු වුණු විප්ලවය පිළිබඳව එතුමා සඳහන් කළා. ඒ විප්ලවය මේ අවස්ථාවේදී කරන්නේ නැත කියන අදහසක් එතුමා ප්‍රකාශ කළා. "සන්" පත්‍රයෙත් මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කර තිබුණා. මා හිතනවා දැන් පෙඩරල් පක්ෂයට අවබෝධ වී ගෙන යනවා මේ විධියේ ව්‍යාපාරයක්—

**ටී. සිවසිතම්පරම් මයා.**
*(திரு. ரி. சிவசிதம்பரம்)*
(Mr. T. Sivasithamparam)

තමුන්නාන්සේලාට චාන්ස්එක දෙන්නෙ නැතිව කටයුතු කරන්නයි, අපි එහෙම කළේ.

**ආර්. එස්. පෙරේරා මයා. (තැපැල් හා විදුලි පණිවුඩ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஆர். எஸ். பெரேரா—தபால், தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. R. S. Perera—Parliamentary Secretary to the Minister of Posts and Telecommunications)

මොකක්ද ඒ චාන්ස් එක ?

**ටී. සිවසිතම්පරම් මයා.**
*(திரு. ரி. சிவசிதம்பரம்)*
(Mr. T. Sivasithamparam)

එමජන්සි එකකට.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

පෙඩරල් පක්ෂයට දැන් අවබෝධ වී ගෙන යනවා— Reasonable use of Sinhala. I am very glad . [බාධාකිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

Order, please !

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

මගේ මිත්‍ර වවුනියාවේ ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී සිංහලෙන් වචන සවල්ප යක් කථා කිරීම සම්බන්ධව මා ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙනව.

**ටී. සිවසිතම්පරම් මයා.**
*(திரு. ரி. சிவசிதம்பரம்)*
(Mr. T. Sivasithamparam)

අපට පුළුවන් සිංහලෙන් කථා කරන්න. අවස්ථාවක් ආවොත් සිංහලෙන් කථා කරන්න අපට පුළුවන්.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ඇත්ත වශයෙන්ම මා සන්තෝෂ වෙනව එතුමා මගේ මිත්‍රයෙක් නිසා. නමුත් මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න අදහස් කළේ ඒක නොවෙයි. පෙඩරල් පක්ෂය මේ විධියේ කරදර කිරීම නිසා උතුරේ මහජනතාවට ඇති වූ කරදර සියල්ලක්ම පෙඩරල් පක්ෂය විසින්ම ඒ ජනතාවට ඇති කරන්න යෙදුණු ඒවා බව මේ අවස්ථාවේදී ඒ මහජනතාව කියාවිය කියා පෙඩරල් පක්ෂයට අවබෝධ වී අවසානය කියා මා හිතනව. යම්කිසි විධියකින් මේ බස් යැවීම නිසා මේ විප්ලවය ඇති කිරීමට නැවත වරක් පෙඩරල් පක්ෂය අදහස් කරනවා නම් එසේ කරන්නේ පෙඩරල් පක්ෂයේ අදහස් මුදුන්පත් කර ගැනීමට බව උතුරේ ජනතාවට අවබෝධ වී අවසානයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යාපනේ ප්‍රදේශයේ මගේත් මිත්‍රයින් රාශියක් සිටිනවා. එමෙන්ම ඒ මිත්‍රයින් ගෙන් අපට දැනගන්නට ලැබී තිබෙනව අද උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල තිබෙන තත්ත්වය කුමක්ද කියා. මේ විධියේ කලබලකාරී ව්‍යාපාරවලින් බලා පොරොත්තු වන්නේ ඔවුන්ගේ අදහස් මුදුන්පත් කර ගැනීමටත් ඔවුන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීමටත් නොවෙයි. පෙඩරල් පක්ෂය වීර්යය කරන්නේ මේ විධියේ කරදර ඇති කර සාමාන්‍යයෙන් ඒ ප්‍රදේශවල දේශපාලන තත්ත්වයක් ඇති කර ඒ මගින් පෙඩරල් පක්ෂය බලයට ඒමටය කියා අද මහජනතාවට අවබෝධ වී ඉවරයි. මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ එයයි. පෙඩරල් පක්ෂය මේ ගෙන යන ව්‍යාපාරය නිසා අපට විශාල කරදරයක් ඇති වී තිබෙනව. එමෙන්ම එය අපි මේ අවස්ථාවේදී මේ විධියෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. පෙඩරල් පක්ෂයේ නායකයාට සමහර අවස්ථාවලදී මා ඉතාමත් ගෞරව කරනව. වයෝවෘද්ධ, එමෙන්ම වැදගත්, කවුරුත් සලකන පෙඩරල් පක්ෂයේ නායකතුමා එදා තාර ව්‍යාපාරයක් පටන් ගත්තේ නැත්නම් ඔය විධියේ කරදරයක් ඇති වෙනවාද කියා මා මේ අවස්ථාවේදී ප්‍රශ්න කරන්න කැමතියි. [බාධා කිරීමක්..] I am replying to my Friend. [*Interruption.*] You did not mention anything, I quite agree, but he said he would ask the Tamils to revolt.

**ටී. සිවසිතම්පරම් මයා.**
*(திரு. ரி. சிவசிதம்பரம்)*
(Mr. T. Sivasithamparam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ මේ මන්ත්‍රීතුමා කියනවා මා කී දේවලට පිළිතුරු දෙනවාය කියා. එහෙම නම්, මටත් අවස්ථාවක් දෙන්න ඕනෑ කථා කරන්න.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

I quite agree with you.

මා කියන්නේ මේ අවස්ථාවේදී තමුන්නාන්සේලා මේ විප්ලවය අත්හැර දමනවාය කී එක ගැනයි. තමුන්නාන්සේලාට මේ විප්ලවය අත්හැර දමන්නේ නැතිව මේ අවස්ථාවේදී වෙන කරන්න දෙයක් නැහැ. තමුන්නාන්සේලා යම්කිසි විධියකින් ඔය විප්ලවය ගෙනයෑමට අදහස් කළොත් උතුරේ මහජනතාව තමුන්නාන්සේලාට හොඳ පාඩමක් උගන්වනවාට කිසිම සැකයක් නැහැ.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

Heil Hitler! Sinhala Hitler! Pocket imperialists!

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

My hon. Friend is like a jack in the box. When you open the box, he jumps up. මේ සම්බන්ධව මා කථා කරන්නේ එපමණයි. මේ සම්බන්ධව වැඩි පුර කථා කරන්න ගියොත් ඉදිරිපත් කරන්නට මා අදහස් කරන දේවලට කාලය අඩු වන නිසා මගේ මිත්‍ර පෙඩරල් පාක්ෂිකයින් සම්බන්ධව මේ අවස්ථාවේදී මා කියන්නේ මෙපමණයි. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

Are you coming on to a new point?

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

Yes.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

The Sitting is suspended until 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி.ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.

***Sitting accordingly suspended till 2 p.m., and then resumed.***

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආරියදාස මයා.
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තු වාරයේ රාජාසන කථා 5 ක් ඉදිරිපත් කිරීමෙන් පසු ඉදිරිපත් කරන ලද 6 වන රාජාසනයේ කථාව ගැනයි, අප සාකච්ඡා කරන්නෙ. මීට කලින් ඉදිරිපත් කරන ලද රාජාසන කථා පගේ නොයෙක් කරුණු පිළිබඳ විස්තර ඇතුළත් වී තිබුණා නමුත් මේ වර ඉදිරිපත් කරන ලද රාජාසන කථාව ඉතා කෙටි එකක් බව තමුන්නාන්සේ දන්නවා. නමුත් මගේ හැඟීමේ හැටියට මෙතෙක් මේ රටේ ඉදිරිපත් වූ රාජාසන කථාවල ඉදිරිපත් වූ කරුණු ගැන කල්පනා කර බලන විට මේ වර රාජාසන කථාවෙන් ඉදිරිපත් වූ කරුණු දෙක ඉතාම වැදගත්. මේ වර රාජාසන කථාවේ සඳහන් වී තිබෙන්නේ ඉන්දියානු ප්‍රශ්නය විසඳීම ගැන සහ බෞද්ධාගමට සාධාරණ තැන දීම සඳහා කට යුතු කිරීම ගැන හෙවත් බෞද්ධාගම රාජ්‍යාගම කිරීම ගැනයි.

ඉන්දියානු ප්‍රශ්නය නිසා අපට මේ රටේ විශාල කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව අපි කවුරුත් දන්නවා. මේ අවස්ථාවේදී මා මේ කරන්නේ ඉන්දියානුන්ට විරුඬව කථා කිරීමක් නොවෙයි. මේ රටේ සිටින ඉන්දියානු ජනතාව නිසා සමහර ප්‍රදේශවල කොයි තරම් කරදර වලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවද යන්න ගලිගමුවේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. බාලසූරිය මයා.) පෙන්වා දුන්නා. ඒ සම්බන්ධව මා දන්න කරුණු සියල්ලම කියන්න ගියොත් මගේ කථාව දික්ගැස්සෙන්නට ඉඩ තියෙනවා. ඒ නිසා මම ඉතා කෙටියෙන් ඒ ගැන කියන්නට අදහස් කරනවා. මගේ ඡන්ද දායක කොට්ඨාශයේ සිටින සිංහල ජනතාව 25,000 කටත් වඩා අඩුයි; නමුත් ද්‍රවිඩ ජනතාව නොහොත් ඉන්දියානු ජනතාව 40,000 කට වැඩි ගණනක් ඒ කොට්ඨාශයේ ඉන්නවා. ඒ වගේම ලංකාවේ තවත් නොයෙක් ප්‍රදේශවල ඔය විධියේ භයානක ප්‍රශ්නයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. සමහර ඡන්දදායක කොට්ඨාශවල මේ ප්‍රශ්නය මගේ කොට්ඨාශයේ තියෙන වට්ටත් වඩා බරපතළ තත්ත්වයක තිබෙන බව කියන්නට කනගාටුයි.

මේ කාරණය ගැන සඳහන් කරන විට, නුවරඑළියේ ගරු මන්ත්‍රීතුමා (වී. විලියම් ප්‍රනාන්දු මයා.) මේ කාරණය ගැන සම්පූර්ණ සැලකිල්ල දක්වා විශාල උත්සාහයක් දරා මේ ප්‍රශ්නය සතුටුදායක අයුරින් අවසාන වශයෙන්ම විසඳා ගැනීමට උනන්දුවෙන් ක්‍රියා කරන බව මතක් කළ යුතුව තිබෙනවා. මේ රාජාසන කථාවට ස්තුති යෝජනාව ඉදිරිපත් කරමින් උන්නැහේ කළ කථාවේදි කර තිබෙන එක්තරා ප්‍රකාශයකට මට එකඟ වන්න බැරි බව මම මේ අවස්ථාවේදි ප්‍රකාශ කරන්න කැමතියි. ඒ බව ප්‍රකාශ කරන්නටයි, මම විශේෂයෙන් ඒ ගරු මන්ත්‍රීතුමාගේ කථාව ගැන සඳහන් කළේ. ඒ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදි මෙන්න මෙහෙම කියනවා:

"ඒ වගේම විරුඬ පක්ෂයේ නායකතුමාගේ ක්‍රියා කලාපය කෙරෙහිත් මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. අගමැතිනිය ආරාධනා කර තිබියදීත් මේ ප්‍රශ්නය විසඳීමට ඉන්දියාවට නොගොස් පිට පැනීම ගැන එතුමාට මේ සභාවේම බලවත් කණගාටුව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා" [නිල වාර්තාව; 1964 නොවැම්බර් 20; කා. 59; තී. 14]

මේ ප්‍රකාශය ගැන මම නුවරඑළියේ මන්ත්‍රීතුමා සමග එකඟ වන්නේ නැත්තෙ මේ හේතුව නිසයි. දකුණු කොළඹ පළමු වන මන්ත්‍රීතුමා මේ විධියට ප්‍රකාශ කර තිබෙන බව අද "ලංකාදීප" පත්‍රයේ තියෙනවා:

"පුවත්පත් රජයට ගැනීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙයි. මහජන හඬ සඳහටම නැති වෙයි. නොයෙක් මත ඉදිරිපත් කිරීමේ අවස්ථාව රටට තිබිය යුතුය. අගමැතිනියගේ මහ ජයක් ලෙස අඬ බෙර ගසා කියන ඉන්දු ලංකා ගිවිසුම මේ රටේ ජනතාවගෙන් ලක්ෂ දහයකට හානිකර දෙයකි. එය මේ රටේ ලක්ෂ 10 ක ඉන්දියානුන්ගේ අයිතිවාසිකම් උදුරා ගැනීමකි. මේ රටින් ජනයා පිටුවහල් කිරීමට අගමැතිණිය මේ ගිවිසුමෙන් උත්සාහ කර ඇත."

ඔවුන්ගේ අදහස මෙය නම් විරුඬ පාර්ශ්වයේ නායකතුමා මේ සාකච්ඡාවට සහභාගි නොවීම ලංකාවට වූ හොඳක් බව මගේ හැඟීමයි. දකුණු කොළඹ පළමුවන මන්ත්‍රීතුමාගේ (ජේ. ආර්. ජයවර්ධන මයා.) අදහස මෙය නම් විරුඬ පාර්ශ්වයේ නායකතුමාගේ අදහස ඊට හාත්පසින්ම විරුඬ වූවක්යයි අපට කියන්න බැහැ. තත්ත්වය මෙසේ නම් විරුඬ පාර්ශ්වයේ නායකතුමාට මේ සාකච්ඡාවට සහභාගි වීමට අවස්ථාව ලැබුණා නම් සමහර විට ගිවිසුමක් ඇති කරගැනීමටත් ඉඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොලැබෙන්න පුළුවනි. ඒ නිසයි, නුවර එළියේ ගරු මන්ත්‍රීතුමාගේ (විලියම් ප්‍රනාන්දු මයා.) ඒ අදහසට මට එකඟ වන්න නුපුළුවනැයි මා කියන්නේ.

මේ රාජාසන කථාවට විරුඬ වීමට පුළුවන් තරම් ශක්තියක් ඇති එකද ලක්වැසියකුවත් සිටියයි කීමට මට පුලුවන්කමක් නැහැ. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) රාජාසන කථාවට ස්තුති යෝජනාව අනුමත කරමින් කථා කරද්දී දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) ගත් පියවර ගැන ස්තුති කළා. එතුමා ඒ අවස්ථාවේදී කිව්වා, ඒ මන්ත්‍රීතුමාට ඊට වඩා ස්තුති කරන්නේ ඊළඟට ගන්නා පියවර අනුවය කියා. අද "දවස" පත්‍රයේ දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා මේ විදියේ ප්‍රකාශයක් කර ඇති බව සඳහන් වෙනවා :

"වහාම මහජන මන්ත්‍රී මණ්ඩලය විසුරුවා හැරිය යුතුයයි දැන් සමහරුන් උද්ඝෝෂණය කරතත්, ලංකා රටවැසිකම ලැබී ඇති ඉන්දියානුවන්ගේ ඡන්ද ලේඛන වෙන වෙනම සකස් කිරීමට පෙර මහා මැතිවරණයක් පැවැත්වීම අනුවණකමක් යයි පොල්ගහවෙල වදාකඩ මහා විද්‍යාලයේ නව ගොඩනැඟිල්ල විවෘත කිරීම සඳහා කුරුණෑගල සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ජී. එච්. බී. ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති උත්සවයේදී දඹදෙනියේ මහජන මන්ත්‍රී ආර්. ජී. සේනානායක මහතා කීය."

**එල්. බී. දසනායක මයා.** (ගම්පොළ)
*(திரு. எல். பி. தஸநாயக்க—கம்பளை)*
(Mr. L. B. Dassanayake—Gampola)

නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා පත්‍රයකින් කොටසක් කියවමින් ඊයේ තොංඩමන් මන්ත්‍රීතුමා විසින් කියන ලද කථාවක් දකුණු කොළඹ පළමුවන මන්ත්‍රීතුමා කී හැටියට මෙහිදී ප්‍රකාශ කළා. එය වැරදීමක්. ඒ ප්‍රකාශය කර ඇත්තේ දකුණු කොළඹ පළමුවන මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) නොවෙයි; පත් කරන ලද මන්ත්‍රී තොංඩමන් මහත්මයායි.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

එහෙම නම් මම එය අස් කර ගන්නම්. දඹදෙනියේ ගරු මන්ත්‍රීතුමා මේ පියවර ගැනීම ගැන මම එතුමාට අපේ හෘදයංගම ස්තුතිය පුද කරනවා. එතුමාගේ ඒ අදහස ප්‍රඥාගෝචර එකක්.

මේ රාජාසන කථාවට විරුඬ වීමට ෆෙඩරල් පක්ෂයට නම් යම් හේතුවක් තිබෙන්න පුළුවනි. මම ඒ අයට ඒ සඳහා දොස් කියන්නේ නැහැ. ඒ වාගේම පත් කරන ලද මන්ත්‍රී තොංඩමන් මහතාටත් මීට විරුද්ධ වීමට හේතුවක් තිබෙන්න පුළුවනි. නමුත් මේ ගරු සභාවේ සිටින සෙසු මන්ත්‍රීතුමන්ලාට මීට විරුඬ වීමට හේතුවක් ඇත්තේ නැහැ. අපි දන්නවා එක් අවස්ථාවකදී රාත් පත්‍රත් යන දෙකම එකට සම්බන්ධ කරගෙන උද්ඝෝෂණයක් කළා. ඒක දක්ෂකමක්. දැන් මේ රාජාසන කථාවත් පත්‍රත් දෙකම සම්බන්ධ කරගෙන ව්‍යාපාරයක් ගෙන යනවා. මේ රාජාසන කථාවේ සඳහන් කර තිබෙන්නේ කලින් න්‍යාය පත්‍රයේ තිබුණු යෝජනා නැවතත් ඉදිරිපත් කරනවාය කියා පමණයි. පත්‍ර පණත් ගැන විරුඬ වීමට ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් තිබෙනවා නම් ඊට අවස්ථාව මෙය නොවෙයි. මේ රාජාසන කථාවේ සඳහන්ව තිබෙන්නේ ඉන්දියානු ප්‍රශ්නය නිරාකරණය කරන බවත්, බෞඬාගමට නිසි තැන දෙන බවත් පමණයි. මගේ මිත්‍ර වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) එක්තරා අවස්ථාවකදී ප්‍රකාශ කර තිබුණා. මේ රටේ අවසානයට ඉතුරු වන ඉන්දියානුවාගේ හමෙන් පාවහන් පිළියෙළ කරගෙන ඒ පාවහන් පැළඳීමට අවස්ථාවක් ලැබුණොත් එය ඔහුගේ ජීවිතයේ උසස්ම අවසථාවය කියා.

**ආර්. එස්. පෙරේරා මයා.** (තැපැල් හා විදුලි පණිවුඩ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. ஆர். எஸ். பெரேரா—தபால், தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. R. S. Perera—Parliamentary Secretary to the Minister of Posts and Telecommunications)

එයාගෙම හම.

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ඉන්දියානුවන් 5,25,000 ක් මේ රටෙන් යැවීම සඳහා තීරණාත්මක වැඩ පිළිවෙළක් සකස් කරගෙන තිබෙනව. යටත්පිරිසෙයින් අපි එක් ඉන්දියානුවෙක්වත් මේ රටෙන් පිටමං කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළ හොත් වැලිමඩ ගරු මන්ත්‍රීතුමා එය අත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

පොළසත් මධ්‍යයේ පිළිගනිවි යයි මා විශ්වාස කළා. නමුත් මේ වැඩ පිළිවෙළ ගැන නොයෙක් විධියේ මතභේද තිබෙනව. ඒවා මා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්ට යන්නෙ නැහැ. ඒ මන්ත්‍රීතුමාගෙ මතයක් තිබෙනව, මේ රටේ සිටින ඉන්දියානුවන්ගෙ සංඛ්‍යාව 10,00,000 කට වැඩියි කියා. යම්කිසි සංඛ්‍යා ලේඛනයක් අනුවයි. මෙරට සිටින ඉන්දියානුවන්ගේ සංඛ්‍යාව 10,00,000 ක් ලෙස සලකා තිබෙන්නෙ. ඒ මන්ත්‍රීතුමා ඊට වැඩියයි අදහස් කරන්නේ මොන කරුණක් නිසාදැයි මා දන්නෙ නැහැ. 5,25,000 ක් නොවෙයි, 100 ක්, 50ක් 25 ක්, යටත් පිරිසෙයින් එක් අයෙක්වත් මේ බැරුරුම් ප්‍රශ්නය පවතින අවස්ථාවේදී රටින් පිටමං කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කළා නම් එය ඉතා සන්තෝෂයෙන් පිළිගනිවි යයි මා විශ්වාස කළා. මා කලින් කිව්වා වගේ යම් කිසි හේතුවක් නිසා පෙඩරල් පක්ෂයට නම් පුළුවන්කමක් නැහැ, මේකට පක්ෂවන්ට. ඒ වගේම පත් කරන ලද මන්ත්‍රී තොණ්ඩමන් මහත්මයාට පුළුවන්කමක් නැහැ. එහෙත් සිංහල මන්ත්‍රීතුමන්ලාට මීට පක්ෂවීමට නොයෙක් යුතුකම් තිබෙනව. ඊට හේතුව මෙය ලංකාවේ පවතින ඉතා භයානක ප්‍රශ්නයක් නිසයි. දස ලක්ෂයක් පමණ වන මේ ඉන්දියානුවන්ගේ ප්‍රශ්නය ක්‍රමානුකූලව නිරාකරණය නොකළහොත් මේ රටට මහා භයානක තත්ත්වයකට මුහුණ පාන්ට සිදුවන බව ප්‍රකාශ කළ යුතුයි. ඒ වගේම ඉන්දියානුවැසියන් මේ රටේ තබාගෙන ඒ උදවියට මේ රටේ පුරවැසිකම් ලබා දීමත් අප ඒ ජනතාවට කරන උදව්වක් නොවෙයි. ඒ අයට පුරවැසිකම් දී තබා ගැනීමට තරම් අපේ රටේ ආර්ථික තත්ත්වය දියුණු නැහැ. එයින් සිදු වන්නේ ඔවුන්ට ඒ රටේ පුරවැසිකම් ලබා ගන්ටත් බැරිව ගොසින් මේ රටේ පුරවැසිකමත් නොලැබී යාමයි. ඔවුන්ගේ අනාගතය පිළිබඳව මේ අවස්ථාවේදී කලපනා කර බැලුවොත්, ඒ ජනතාව වුණත් පිළිගන්නවා ඇති, මේ රටේ පුරවැසිකම් ලබා දීම ඔවුන්ට කරන යහපතක් නොවන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවෙනි කරුණ වශයෙන් රාජාසන කථාවේ සඳහන් කර තිබෙන්නෙ, බෞද්ධාගමට සාධාරණ තැනක් ලබා දෙන අදහසින් බෞද්ධාගම රාජ්‍ය ආගම කරනවා කියන එකයි. මට හිතන්ට පුළුවන් කමක් නැහැ, යම් කෙනෙකුට ඊට විරුද්ධ වන්ට පුළුවන්කමක් තිබෙනව කියා. වලගම්බා, දුටුගැමුණු ආදී රජවරුන් මේ රට ආණ්ඩු කරන කාලයේ දී රාජ්‍ය ආගම බුද්ධාගම වශයෙන් පිළිගෙන නොතිබුණා නම් අනුරාධපුරය, පොළොන්නරුව ආදි සිද්ධස්ථාන අපට දකින්නට පුළුවන් කමක් ලැබෙන එකක් නැහැ. කෙසේ හෝ වේවා අභාග්‍ය සම්පන්න යුගයකට ලංකාවාසීන්ට මුහුණ පාන්ට සිදුවීමෙන් ඉංග්‍රීසීන්, පෘතුගීසීන්, ලන්දේසීන් ආදි පිටරටියන් මෙරටට පැමිණීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ රටේ බෞද්ධාගමට තිබුණු ස්ථානය ඔවුන්ගේ ආගමට ලැබුණා. නිදහස ලැබීමෙන් පසු ඒවා ක්‍රමක්‍රමයෙන් නැති කර දමා "නිදහස" කියන වචනයේ නියම අර්ථය පිළිගෙන ඒ අනුව කටයුතු කරගෙන යන මේ අවස්ථාවේදී අපට පුළුවන්කමක් නැහැ, රජයක් හැටියට බෞද්ධාගමට මේ රටේ නිසි තැන නොදී සිටීමට. අපි පත්‍ර කියවන විට පෙනී යනව. මේ ආණ්ඩුව බෞද්ධාගම විනාශ කිරීමට කටයුතු කරනවා යයි නොයෙක් දෙනා ප්‍රකාශ කර තිබෙන බව. ඒ වගේම මේ රජය අනුගමනය කරන්නෙ බණ්ඩාරනායක ප්‍රතිපත්ති නොව සර් ජෝන් කොතලාවල ප්‍රතිපත්ති යයි ඇතැම් මන්ත්‍රීවරු ප්‍රකාශ කරනව. නමුත් මේ රජය ඒ විධියේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා යයි හිතන්නට ඉඩක් නැහැ. මේ පිළිබඳව නොයෙකුත් අවස්ථාවලදී ඕනෑකමින් කල්පනා කර බලද්දී අපට පෙනී ගියේ මේ රජය බණ්ඩාරනායක පිළිවෙත දිගටම පවත්වාගෙන යන බවයි. බණ්ඩාරනායක මැතිතුමාට වෙඩි තැබූ අවස්ථාවේදී පවා මේ රටේ මහා සංඝයා වහන්සේට කරදරයක් නොවන අන්දමට, කහ සිවුරක් පොරවා ගත් පුද්ගලයකු තමාට වෙඩි තැබූ බව එතුමා ප්‍රකාශ කළා. බණ්ඩාරනායක ඝාතනය සිදු වූ විට මේ රටේ යම් යම් කලබල ඇති වන්නට පටන් ගත්තා. ඒ අවස්ථාවේදී බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් වී ක්‍රියා කළ බව කාටත් මතක ඇති එක පුද්ගලයකු කළ වරදක් නිසා සංඝ රත්නයට කරදර වන හැටියට ක්‍රියා කිරීම ගැන තමා අනුමත නොකරන බව ඇය ප්‍රකාශ කළා. සංඝයා වහන්සේලාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරදරයක් විය හැකි අන්දමට වචනයක් පවා පාවිච්චි කිරීම අයෝග්‍ය බව එතුමිය ප්‍රකාශ කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මාක්ස්වාදීන් සමග එකතු වී බුද්ධාගම නැත්තටම නැති කරන්නට හදනවා යයි සමහරුන් කියනවා. නමුත් එහි කිසිම සත්‍යයක් නැහැ. 1956 ඇති කර ගන්නා ලද ජයග්‍රහණයට නැත්නම් ආණ්ඩු පෙරළියට සමසමාජ පක්ෂයේ සම්පූර්ණ සහයෝගය ලැබුනා. 1960 මාර්තු මැතිවරණයේදී අප අතර සුළු සුළු සට්ටන ඇති වුනා, 1960 ජූලි මැතිවරණයේදී සමසමාජ පක්ෂයේ සම්පූර්ණ සහයෝගය නිසා නැවත වතාවක් අපට රජයක් පිහිටුවන්නට පුළුවන් වුණා. මේ අන්දමට සභාග ආණ්ඩුවක් පිහිටුවීම සඳහා මහජනතාවගෙන් අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය යයි සමහරුන් කියනවා ; නමුත් එවැනි සභාග ආණ්ඩුවක් පිහිටුවීම සඳහා නැවත වරක් රට ඉදිරියට යා යුතුය කියනවා නම් අපට ඒක පිළිගන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු වාරය කල් දැමීම හේතුකොට ගෙන න්‍යාය පත්‍රයේ සඳහන් වී තිබුණු වැදගත් පනත් කෙටුම්පත් ආදිය ප්‍රමාද වීම ගැන නොයෙකුත් ගරු මන්ත්‍රීවරුන් කථා කළා. මේ ගැන කියන්නට තිබෙන්නේ, යම්කිසි ප්‍රමාදයක් වුණා නම් ඒ ගැන ආණ්ඩු පක්ෂයට සම්පූර්ණයෙන්ම දොස් නැඟීම නුසුදුසු බවයි. පත්තර මණ්ඩල පනත මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී අප හිතවත් තිස්සමහාරාමයේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂමන් රාජපක්ෂ මයා.) විසින් අදූරදර්ශී ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ නිසා සමහර විට මේ අභාග්‍ය සම්පන්න තත්ත්වයට අපට මුහුණ පාන්නට සිදු වුණා යයි කියන්නට පුළුවනි.

අ.භා. 2.18

**නියෝජ්‍ය කථානායකතුමා**
*(பிரதிச் சபாநாயகர்)*
(Mr. Deputy Speaker)

කරුණා කර නිශ්ශබ්ද වන්න. කාරක-සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපති තැන්පත් අයි. ඒ. කාදර් මයා. මූලාසනාරූඪ විය.**

[*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. I. A. CADER, DEPUTY-CHAIRMAN OF COMMITTEES *took the Chair.*]

**ආරියදාස මයා.**
*(திரு. ஆரியதாச)*
(Mr. Ariyadasa)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් පනත් රාශියක් න්‍යාය පත්‍රයේ තිබුණු බව ඇත්තයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කෙටියෙන් තර්ක ඉදිරිපත් කොට කෙටියෙන් අදහස් ඉදිරිපත් කොට වැඩ කරගෙන යන්නට අදහස් කළා නම් න්‍යාය පත්‍රයේ තිබුණු වැඩ කටයුතු රාශියක් අවසන් කරන්නට පුළුවන්කම තිබුණු බව සඳහන් කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කලින් ප්‍රකාශ කළා පත්‍ර පණත සම්බන්ධව මේ රාජාසන කථාවේ කෙළින්ම කිසිම සටහනක් කර නොතිබෙන නිසා මේ විවාදයේදී පත්‍ර පණත සම්බන්ධව කථා කිරීම මගේ හැඟීමේ හැටියට යෝග්‍ය දෙයක් නොවේය කියා. සමහර අවස්ථාවලදී ගරු මන්ත්‍රීන් ප්‍රකාශ කළා පත්‍ර ගැනීමට වුවමනාම නම් ඒ ප්‍රශ්නය උඩ රටට ගොස් රටේ මහජනතාවගේ අදහස් ගැන දැන ගන්න ඉඩ තිබුණාය කියා. නමුත් මට මතකයි, 1960 මැතිවරණයේදී මගේ ඡන්ද කොට්ඨාශයේ නොයෙක් තැන්වලට ගොස් මා ප්‍රකාශ කළා, මේ රටේ පත්‍ර ඒකාධිකාරීත්වයක් තිබෙනවාය, නැවත වරක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බලය ලැබුණොත් ඒ ඒකාධිකාරය නැති කරනවාය කියා. මගේ පෞද්ගලික අදහසක් අනුව කළ ප්‍රකාශයක් නොවෙයි ඒ. එවැනි වැඩ පිළිවෙළක් යොදනවාය කියා අපේ පක්ෂයේ ප්‍රකාශනයේ සඳහන් කර තිබුණා. ඊට හේතු රාශියක් තිබෙනවා. ඒ හේතු රාශියම මේ අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරන්නට පුළුවන්කමක් නැති බව මා මතක් කරනවා. පත්‍ර ගැන අපේ මැතිවරණ ප්‍රකාශනවල සඳහන් කර තිබුණු නිසා අපි රටට ගොස් කිව්වා පත්‍ර ඒකාධිකාරීත්වය නැති කරනවාය කියා. ඒ අනුව කොමිෂන් සභාවක් පත් කළා. ඒ කොමිෂන් සභාවේ නිර්දේශ අනුව අද වැඩ පිළිවෙළක් අරන්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආරියදාස මයා.]

තිබෙනවා නම්, මොන හේතුවක් උඩද නැවතත් අපි රටට යා යුත්තේ, කියා මා ප්‍රශ්න කරන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ මාතර ගරු මන්ත්‍රීතුමා (එම්. සමරවීර මයා.) මේ පැත්තේ සිට කථාවක් කළා. ඒ අවස්ථාවේදී එතුමා සඳහන් කළෙත් ඒකයි. අපට මීළඟට කරන්නට තියෙන්නෙ රටට ගොස් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් රටේ තත්ත්වය සොයා බැලීමය කියායි එතුමා කිව්වේ. ඒ ගරු මන්ත්‍රීතුමා එබඳු පියවරක් ගැනීම සම්බන්ධයෙන් මා ඇත්ත වශයෙන්ම කනගාටු වෙනව. සමහර විට අද මගේ කථාව නිසා මගේ හිතවත් ඒ ගරු මන්ත්‍රීතුමාගේ සිතට වේගයක් ඇති වුණොත් ඒ ගැනත් මා කනගාටු වෙනව. නමුත් මේ අවස්ථාවේදී එතුමාගේ අදහස් පිළිබඳව මා දන්නා දේවල් නොකියාම බැහැ. පත්‍ර ගැනීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම විරුද්ධය කියා උන් නැහෙ කියනව. නමුත් අපි දන්නව— සමහර විට අපේ අදක්ෂකම වෙන්න පුළු වනි—මීට පෙර පත්‍ර පණත් 12ක් ඉදිරිපත් කර තිබෙනව. මා සිතන්නෙ ඒ පත්‍ර පණත් 12 ඉදිරිපත් කරන අවස්ථාවේදී මාතර ගරු මන්ත්‍රීතුමා ඇමති මණ්ඩලයේ සාමාජික යෙක් ; ඇමතිවරයෙක්. පත්‍ර ගැනීම සම්බන්ධයෙන් අප නැවත වරක් රටට යා යුතුය කියා එතුමා අදහස් කරනවා නම්, නැත්නම් පත්‍ර ගැනීම හොඳ නැත කියා එතුමා අදහස් කරනවා නම්, ඒ පත්‍ර පණත් 12 ඉදිරිපත් කළ අවස්ථාවලදී ඒවා පිළිබඳව එතුමාගේ අදහස් ප්‍රකාශ නොකළේ මන්ද? එතුමා ඒ අවස්ථාවේදී ඇමතිවරයෙක්. ඒ නිසා, මා මේවාට විරුද්ධයි කියන්ට පුළු වන්කමක් එතුමාට තිබුණේ නැහැ.

ඊළඟට තවත් වැදගත් කාරණයක් තිබෙනව. මේ ප්‍රශ්නය ගැනම සාකච්ඡා කිරීමේදී සභාග රජයට විරුද්ධවත් එතුමා කථා කරනව. එතුමා කෙළින්ම කියනව. එතුමාට යාමට සිදු වූ හේතුව මේ සභාග රජය පිහිටවීමය කියා. විධායක කාරක සභාවක බලතල ගැන අපි දන්නව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ විධායක කාරක සභාව රැස්වී ඒ ප්‍රශ්නය ගැන බොහෝදුරට සාකච්ඡා කළා. ඒ අවස්ථාවලදී මාතර ගරු මන්ත්‍රීතුමා තම අදහස් නැත්නම් විරුද්ධ තාව විධායක කාරක සභාවට ප්‍රකාශ කළේ නැහැ. එපමණක් නොවෙයි. උන්නැහේ නිශ්ශබ්දව සිටියා පමණක් නොවෙයි, මා සිතන හැටියට සභාග ආණ්ඩුවේ ඇමති මණ්ඩලය පිළියෙළ කළාට පසු එහි ඇමති වරයකු වශයෙන් මාතර ගරු මන්ත්‍රීතුමාත් දිවුරුම් දුන්නා. ලංකා සමසමාජ පක්ෂය නිසා යම්කිසි කරදරයකට මුහුණපාන්නට සිද්ධ වුණාය කියන්ට මාතර ගරු මන්ත්‍රී තුමාට පුළුවන්කමක් තිබෙනවාය කියා මා සිතන්නෙ නැහැ. සමහර අවස්ථාවලදී එතුමාටත් එහි ප්‍රයෝජනය ලැබී තිබෙනව. එසේ නොලැබුණා නම් මාර්තු මැතිවරණ යේදී එතුමාට වූ සිද්ධිය ජූලි මැතිවරණයේ දීත් වෙනවාට කිසිම අඩමානයක් නැත කියා මා සිතනව. නොයෙක් නොයෙක් දේශපාලන පක්ෂ තරඟ කරන සමහර අවස්ථාවලදී අපටත් අභාග්‍යසම්පන්න අවස්ථාවලට මුහුණපාන්නට සිද්ධ වෙනව. එබඳු අවස්ථාවලදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ යේ ප්‍රගතිශීලී වැඩ පිළිවෙළ දිගටම ගෙන යාම සඳහා ලංකා සමසමාජ පක්ෂය දුන් ආධාර අප ඉතා අගය කොට සළකන බව මේ අවස්ථාවේදී කෙළින්ම කියන්නට සතුටුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බලා පොරොත්තු වුණාට වැඩි වෙලාවක් මා කථා කළා නම් ඒ ගැන මා කනගාටු වෙනව. ඒ නිසා තවත් විනාඩි පහකට වැඩි වේලාවක් කථා කරන්න මා බලාපොරොත්තු වන්නෙ නැහැ. ඊටත් වඩා සුළු වෙලාවකින් මම මගේ කථාව අවසන් කරන්නට උත්සාහ කරන්නම්. මේ රාජාසන කථාව ඉතා මත් කෙටි එකක් වුවත් එහි සඳහන් වෙලා තිබෙන්නෙ ලංකාවට බල පාන ඉතා වැදගත් ප්‍රශ්න දෙකක් බව අවසාන වශයෙන් මතක් කරන්න කැමතියි. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රී තුමන්ලා වෙත පමණක් නොව මගේ හිත වත් හැම ගරු මන්ත්‍රීවරයෙකු වෙතම මා සඳහන් කරන්නේ, සඳහන් කරමින් ඉල්ලා සිටින්නේ, මුළු ලංකාවටම ඉතාම තදින් බල පාන වැදගත් ප්‍රශ්නයක් හැටි යට සලකනු ලබන ඉන්දියානුවන් පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කළ අවස්ථාවේ ඒ හා සම්බන්ධ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණ සහ යෝගය දෙන ලෙසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මට මේ කාරණය ඉතාම සතුටින් පෙන්නුම් කරන්න විශේෂ හේතුවක් තිබෙනවා. ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධව සාකච්ඡා කිරීමට නොයෙක් නොයෙක් අවස්ථාවල මැති ඇමතිවරුන් ගණනාවක්ම පිටරට ගොස් තිබෙන බව අපි දන්නවා. මෙතෙක් මේ රටේ හිටපු අගමැතිවරුන් පස් දෙනෙකුට නිරාකරණය කර ගන්න බැරි වුණු ප්‍රශ්නයක් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වා මේ ගරු අගමැතිනිය එය නිරාකරණය කරන්න යාම නිසා ඒ අනුව සමහර විට ඇතැමුන් ඒ අනුව දොස් කියනවාත් වෙන්න පුළුවනි. මිනිසුන් 5,25,000 ක් ය කියන්නෙ ඉතා සුළු සංඛ්‍යාවක් නොවෙයි. එය සැලකිය යුතු විශාල සංඛ්‍යාවක් බව කවුරුත් පිළිගන්නවා ඇති. සමහර විට ඉන්දියානුන් පිටරට යැවීමේ ක්‍රමය හැටියට දැනට සකස් කර තිබෙන්නෙ අවුරුද්දකට 40,000ක් යැවීමේ ක්‍රියා මාර්ගයක් වෙන්න ඇත කියා මා හිතනවා. ඒ අනුව ගණින් බලන විට එක් අවුරුද්දකට 40,000 ක් බැගින් අවුරුදු දෙක හමාරකදී එක් ලක්ෂයක් දෙනාට පිටරට යන්න සිදු වෙනවා ඇති.

මෙහිදී තවත් වැදගත් ප්‍රශ්නයක් මතු වෙනවා. මොකක්ද ඒ වැදගත් ප්‍රශ්නය? එය ඇත්ත වශයෙන්ම අපේ රටේ ආර්ථික තත්ත්වය හා සම්බන්ධ වූ ප්‍රශ්නයක්. මේ රටේ ආර්ථික තත්ත්වය ආරක්ෂා කර ගැනීමට වුවමනා කරනවා නම් වතුපිටිවල වැඩ කටයුතු හරියාකාර පවත්වාගෙන යා යුතු බව අමුතුවෙන් මා සඳහන් කරන්න වුවමනා කරන දෙයක් නොවෙයි. දැනට ලංකාවේ වතුපිටි ආදිය පාලනය කරන සුදු කොම්පැනිකාර මහත්වරුන්ගෙන් ප්‍රශ්නයක් මතු වෙන්න පුළුවනි. වතුවල වැඩ කරමින් හිටපු ඉන්දියානුවන් දැන් මේ රටේ නැති නිසා තමන්ට දැන් ඒ වතුපිටි ආදිය පාලනය කරගෙන යන්න බැරිය කියා ඒවා එක්කෝ ආණ්ඩුවට ගෙන පාලනය කළ යුතුය කියාත් එසේ නැත්නම් වෙනත් සුදුසු වැඩ පිළිවෙළක් යෙදිය යුතුය කියාත් කියා සිටින්න පුළුවනි. එවැනි ප්‍රශ්නයක් මතු වුණු දවසට ඊට මුහුණ පාන්න සිදු වෙනවා. එතකොට සමුපකාර ක්‍රමයට හෝ වෙනත් යම්කිසි සුදුසු ක්‍රමයකට මේ වතුපිටි පාලනය හා සම්බන්ධ වැඩ කටයුතු අප විසින් පවත්වාගෙන යා යුතු වෙනවා. ඒ සඳහා සුපිරින්ටෙන්ඩන්ට්වරුන්, කොන්දොස්තරවරුන්, ටී මේකර්වරුන්, කන්ගානිවරුන් සහ වෙනත් නොයෙක් තරාතිරමේ සේවකයන් සොයා යන්න සිදු වෙනවා. මේ රටේ පුරවැසියන් ලක්ෂයකට පමණ රක්ෂාවල් නැති කමේ ප්‍රශ්නය විසඳා ගැනීමේ මාර්ගයක් ඒ අනුව තවත් අවුරුදු දෙක හමාරක් ඉකුත් වන විට පෑදෙනවා ඇති. මේ ආදි වශයෙන් කල්පනාකර බලන විට මෙහි ඇති වැදගත්කම පැහැදිලි ලෙස පෙනෙනවා ඇති.

මගේ කථාව මා මුලදී බලාපොරොත්තු වුණාටත් වඩා දිග්ගැස්සීගෙන යන බවයි පෙනෙන්නෙ. ඒ නිසා තව දුරටත් කථා කරන්න මා අදහස් කරන්නෙ නැහැ. මගේ කෘතඥතාව හෙවත් සම්පූර්ණ සහයෝගය මෙවැනි වැදගත් කරුණු දෙකක් අඩංගු වූ රාජාසන කථාවක් ඉදිරිපත් කිරීම ගැන මේ ආණ්ඩුව වෙත පිරිනමන බව සඳහන් කරන අතරම මගේ කථාවට ඇහුම් කන් දුන් ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනාටත් තමුන්නාන්සේටත් පුද කරමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

අ. භා. 2.28

එම්. බාලසුන්දරම් මයා. (කෝපායි)
*(திரு. எம். பாலசுந்தரம்—கோப்பாய்)*
(Mr. M. Balasunderam—Kopai)

Sir, I shall be as brief as the Speech from the Throne. This is, perhaps, the briefest Speech from the Throne ever delivered in this House or in the House of Commons. It is as brief as a certain kind of bathing suit which is designed to conceal as little as possible and to reveal much more than the eye can take in.

Those who commented on the Indo-Ceylon agreement—those who praised it as well as those who condemned it—failed to advert to a special aspect of it. They had not considered whether the agreement was *ultra vires* the Constitution. The proposal to have a separate electoral register for persons of Indian origin is *ultra vires* the Constitution. If one studies the Constitution, particularly Section 11, one will find that this House can only consist of representatives elected for the various electoral districts. The election is territorial. The various electoral districts have been demarcated by

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසුන්දරම් මයා.]

the Delimitation Commission. So that the elected representatives of this House can only be from the various electoral districts. You cannot have persons elected to the House on the basis of a special electoral register because they will not represent any electoral districts.

So, I should like to say at the outset that those who entered into this agreement did not realize that by placing these persons of Indian origin on a special electoral register they are conferring nothing at all on them. They cannot elect any representative to this House. Even if they do, such election will be null and void. The question will also arise whether Parliament composed partly of such Members is properly constituted. The question also arises whether the House can amend the Constitution by two-thirds of its Members voting. My contention is that such a piece of legislation will be in direct conflict with Section 29 (2) (*a*), (*b*) and (*c*) of the Constitution, which, of course, contains unalterable provisions of the Constitution. In order to make myself clear on this issue, I shall refer to this section and its sub-sections.

Section 29 (2) reads as follows :

"No such law shall—

(*a*) prohibit or restrict the free exercise of any religion ; or

(*b*) make persons of any community or religion liable to disabilities or restrictions to which persons of other communities or religions are not made liable ; or

(*c*) confer on persons of any community or religion any privilege or advantage which is not conferred on persons of other communities or religions ;"

Sub-section (*d*) does not apply. These four sub-sections are entrenched because Section 29 (3) says :

"Any law made in contravention of sub-section (2) of this Section shall, to the extent of such contravention, be void."

There are sub-sections (*a*), (*b*), (*c*) and (*d*). Any law which comes into being against any of those provisions shall be void. Sub-section 3 then places an absolute bar on any kind of legislation which might be passed in contravention of these provisions. Now, this exactly is the view of the Privy Council in the case Bribery Commissioner *vs.* Ranasinghe reported in the 66th volume of the New Law Reports, page 73, at page 78. Their Lordships having quoted Section 29 (2) (*a*) proceeded to state as follows :—

"There follow (*b*), (*c*) and (*d*) which set out further entrenched religious and racial matters which shall not be the subject of legislation."—

I would like you to mark the words "which shall not be the subject of legislation". This is very important.

—"They represent the solemn balance of rights between the citizens of Ceylon, the fundamental conditions on which *inter se*, they accepted the Constitution, and these are therefore unalterable under the Constitution."

Their Lordships go further and say that these sub-sections represent the rights *inter se* between the various religious and racial communities and the conditions under which the Constitution was established. So, then, a separate electoral register cannot be created even with a two-thirds majority because it restricts, or places certain disadvantages on, persons of a certain community, and therefore it comes into conflict with sub-section 29 (*b*) of the Constitution.

I wish to give this warning to those who entered into this agreement. True, during the U. N. P. regime, Sir John Kotelawala and Nehru entered into such an agreement. Nehru could not have had the time to look into our Constitution and Sir John, even if he looked into it, would not have understood it. Thereafter, the late Prime Minister, Mr. Bandaranaike, restored the original position knowing probably the constitutional implications of the separate register of voters.

Now, various critics on this side of the House quoted copiously from the speeches of our Leftist friends. But I do not think they were justified in doing so, for did not an American philosopher say : "A foolish consistency is the hobgoblin of little minds"? The

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

great minds of the L. S. S. P. can change—they could be inconsistent, undependable and even dishonest. After all, consistency, dependability and intellectual honesty are the virtues of the *petite bourgeoisie* like ourselves or the capitalists. These progressives, of course, can deny, can repudiate, everything they had said ; otherwise they cannot progress. It is only sticks-in-the-mud that will be consistent ; to be progressive it is necessary to be as changeable as a weathercock and as undependable as the wind.

When a great advocate of the Coalition Government was taxed with the inconsistency of some of the socialists in the Government benches being enormously rich, he said, " What nonsense are you talking ? The great Engels himself was a mill owner, owned mansions and had two beautiful women as mistresses. " Mills, mansions and mistresses, he said, do not go against the progressives of the socialist parties. They probably are the necessary adjuncts of the leaders of such parties.

In this situation, Members of this House sometimes find it difficult to understand the speeches made by the now vociferous Member for Dehiwala-Mt. Lavinia (Dr. Colvin R. de Silva). On this side of the House he was a very cultured, urbane gentleman, whose courteous retorts it was a delight to listen to, but when he moved over to the other side he spoke of smashing of heads, squeezing of necks, cutting of throats and thrusting some things down throats. Some of us find it difficult to understand this. A great many admirers are still bewildered by his recent utterances and the bewilderment can perhaps be expressed in the form of a verse :

> Oh Colvin ! Colvin, give us an answer do,
> We were once half-crazy for you.
> What's all this talk
> To frighten us simple folk,
> Of Castro and castration ?
> Oh ! it's a botheration
> To understand your grim joke.
> You are now a strange sort of bloke
> In the L. S. S. P. *cum* S. L. F. P. cloak.

I shall leave it at that.

Our great progressives are progressing—repudiating everything they had stood for—towards socialism of the Cuban type. I think it was the hon. Member for Dehiwala-Mt. Lavinia who said that he wanted a feminine counterpart of Fidel Castro. I suppose when they have a Fidela Castra, the feminine form of Fidel Castro, they would all live happily ever after.

I shall now refer to the proposal to give Buddhism its rightful place, by legislation. It is rather a very cryptic sentence that we find in the Throne Speech, but if it is meant to confer any special benefit on the followers of Buddhism, then I say that that kind of legislation would come into conflict with the entrenched provision of the Constitution, namely, Section 29 (2) (c) and that such legislation cannot be passed even if 99 per cent. of the Members vote for it. What is behind all this we do not know. Is it not the fact that Buddhism occupies a pre-eminent place in the affairs of this country ? Large sums of money have been given to the pirivenas. No hon. Member of any other religion ever protested against or objected to it. Special advantages have been given to certain Buddhists. No important function of the Government begins without some sort of Buddhist ceremony being performed. The Buddhist holidays have increased in number and they threaten to increase further. What is the meaning of this ? The only answer is that Buddhism is the religion of the majority, therefore, it is occupying a predominant place.

In India today at Sarnath, the place where Lord Buddha preached his first sermon, are gathered together Buddhist representatives from all the countries in the world and no less a person than the President of the Indian Republic opened that conference and made a speech. Supposing the Hindus wanted to have a conference in Ceylon of a similar type, do you think that this Government would have extended even a fraction of the hospitality that the Indian Government has extended ? For all I know, the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බැලසුන් දරම් මයා.]

Permanent Secretary to the Ministry of Defence and External Affairs, might not even grant a visa !

The Eucharistic Congress is being held in Bombay. All arrangements have been made by the Indian Government for the comfort and convenience of all those who wished to go there, and the Pope himself is being received by the representatives of the Indian Government with all the honour due to him. Not a single Hindu in the whole of India—although the vast majority in India are Hindus—had ever said that rightful place should be given to Hinduism because it is the religion of the majority. What is the purpose ?

Some people suggested amendments to the Constitution, for instance the hon. Member for Welimada and his new-found ally, the hon. Member for Avissawella. The history of the hon. Member for Avissawella is one of the greatest political tragi-comedies of this country. His decline has been such that he could find comfort nowhere except in the arms of the hon. Member for Welimada. And what is it that they want ? They want the Prime Minister, the Governor-General and all the Members of the Cabinet to be Buddhists. They stopped short of the Members of this House. Probably they will say it soon—that only Buddhists should be Members of this House.

They want the Commanders of the Army, the Navy, the Air Force, Permanent Secretaries, Heads of Departments and Heads of Schools to be Buddhists. They stopped short of the officers of the armed services and the students and teachers in schools. But they will say it soon ! Is this your Cuban socialism to which the great progressives of the L. S. S. P. are marching forward irrespective of the consequences.

There is one more matter which I want to deal with, namely, the take-over of the Lake House. On the last occasion I said that that could not be done unless one amended the Constitution. Let me briefly explain my reasons. Section 29 (1) of the Constitution empowers Parliament to make laws for the peace, order and good government of the country. As I said before the meaning of "law" here is that it should not apply to a particular person, whether to a particular person, whether a human being or juristic person ; it should apply to persons in general or to a class. Generality of application is the essence of "law".

There is another requirement. It implies a prohibition and a sanction. Now, for example, there is provision against stealing—the sanction is punshment. Judged by these standards the Bill to take over the Lake House does not come within the definition of "law". Therefore, it is *ultra vires* the Constitution. But Section 29 (1) of the Constitution can be altered impliedly if the Bill is passed by a two-third majority. So unless the House has two-thirds of its Members voting for that Bill that Bill would be *ultra-vires*. But the great advocate of the new policies of this Government, the hon. Member for Dehiwala-Mt. Lavinia said that whether it was *ultra vires* or not they were going to take over the press because—he says—they publish lies.

I think it was Pilate who asked the question : "What is truth ?" and did not wait for an answer. As far as the Coalitionists of the S. L. F. P. are concerned we know what their variety of truth is. They want to have in place of the Lake House a "News Fake House" to lie on behalf of themselves and their friends.

Sir, my time is limited. I would only say that we are going towards a kind of socialism, Castrian socialism, for which so many people on the other side have longed. But I would say the hand that wrote the doom of ancient Babylon on its walls did not foretell a greater disaster than that that is going to befall this Island as a result of the purblind policy of this Coalition Government.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

අ. භා. 2.51

**විජයබාහු විජයසිංහ මයා. (මීරිගම)**

*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ—மீரிகம)*

(Mr. Wijayabahu Wijayasinha—Mirigama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින මගේ දේශපාලන ගමනේ විශේෂ වෙනස් වීමක් සිදු වන දිනයක් හැටියට ප්‍රථම යෙන්ම ප්‍රකාශ කරන්න කැමතියි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භයේ පටන් එහි හිටපු සාමාජිකයකු හැටියට මට දැන් කන ගාටු වෙන්න සිදු වී තිබෙනව, අද දින මට කරන්නට සිදු වී තිබෙන ප්‍රකාශන පිළිබඳ ව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භ කර න්නට උදව් කළ අයකු හැටියටත්, දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා සමග බොහෝ කලක පටන්—කුඩා කල පටන්—ආශ්‍රය කළ අයකු හැටියටත්, එතුමාගේ ගම් ප්‍රදේශයෙන් සියනෑ කෝරළෙන් පැමිණි අයකු හැටියටත් එතුමා බිහි කළ පක්ෂය අතහැර යන්ට සිදු වී තිබීම ගැන මට විශේෂයෙන්ම කනගාටුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම ආණ්ඩුවේ පාර්ලිමේන්තු වාර 5 ක් තිබුණා. පසුගිය අවුරුදු 4½ තුළ රාජාසන කථා 6කට කන් දෙන්න අපට සිදු වුණා. මෙම 6 වන රාජාසන කථාව මගින්වත්, දැන් මුහුණ පාන්න සිදු වී තිබෙන ප්‍රශ්න විසඳන්න මේ ආණ්ඩුවට පුළුවන් වේය කියා මට නම් සිතෙන්නෙ නැහැ. මෙම රාජාසන කථාවට අනුව ක්‍රියාවෙ යොදවන්න යන කරුණු වලින් රට තුළ පැන නැගී තිබෙන අවුල් තව දුරටත් අවුල් වෙනවාට කිසිම අනුමානයක් නැති බව මගේ සිතට වැටහෙන ව.

මැතිවරණ කීපයක් ගැන මා දන්නව. මා විශේෂයෙන් 1956 මැතිවරණයෙදි දිවංගත ගරු බණ්ඩාරනායක අගමැති තුමාත් සමග ලංකාවෙ අස්සක් මුල්ලක් නැර ගිය කෙනෙක් බව තමුන්නාන්සෙල කවුරුත් දන්නා කාරණයක්. එවේලේ එතුමාට මා තුළ තිබුණු විශෙෂ ගෞරවය නිසාත්, එතුමාගේ ප්‍රතිපත්තිවලට මා දැක්වූ ගෞරවය නිසාත් යථෝක්ත විප්ලවය එම අවස්ථාවේදී ඇති කරන්ට මා එතුමාට විශෙෂයෙන් ආධාර දුන් කෙනෙක් බව කියන්ට ඕනෑ. නමුත් අද මෙවැනි තත්ත්වයකට අපේ පක්ෂය පැමිණ තිබීම ගැන මා කනගාටු වෙනව.

1960 මාර්තු මැතිවරණයේදී අපේ පක්ෂයෙන් අම්පාරේ ආසනයට ඉදිරිපත් වෙන්නය කියා මට කීව. මගේ වැදගත් රැකියාව, රාජකාරි කටයුතු සෑම දෙයක්ම අත හැර දමා මා එම අවස්ථාවෙ අම්පාරෙ ආසනයට ඉදිරිපත් වී ජයග්‍රහණය කළා. ඒවගේම 1960 ජූලි මැතිවරණයේදී මීරිගම ආසනයට ඉදිරිපත් වන ලෙස මගේ පක්ෂයෙන් මට කීව. ඒ අවස්ථාවේදී මීරිගම ආසනයට ඉදිරිපත් වී මම ජය ගත්ත. නමුත් වැඩි කලක් යන්ට ප්‍රථම ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රීවරයකු හැටියට පක්ෂය තුළ ඉඳගෙනම ආණ්ඩුව ගෙනයන වැඩ පිළිවෙළට විරුද්ධව සටන් කරන්නට මට සිදු වුණා. ඒවගේම පාර්ලිමේන්තුව තුළ දීත්, ඉන් පිටතදීත්, ආණ්ඩුව විවේචනය කරන්ට සිදු වුණා. කෙසේ වෙතත් මා මෙපමණ කලක් ඉවසිල්ලෙන් බලා සිටියෙ, යම් කිසි ශාන්තියක් ඇති වේය කියන හැඟීමෙනුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1960 දී මොකක්ද සිදු වුණේ ? මේ රට දින 700 ක් පමණ කාලයක් හදිසි නීතිය යටතෙ ආණ්ඩු කළ බව තමුන්නාන්සෙලට මතක ඇති. මඩකලපුව ප්‍රදේශයේත් යාපනය ප්‍රදේශයේත් අපේ ද්‍රවිඩ සහෝදරයින්ට මිලිටරිය දමා නොයෙක් විට හිරිහැර කළ බව අප පිළිගත යුතු කාරණාවක්. මිලිටරිය දමා, පොලිසිය දමා, අපේ ලක්වැසි සුළු ජාතියකට එසේ පීඩා කිරීම ගැන මා සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා. ඒ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයටත් ගරු අගමැතිනියටත් මා මතක් කළා, මේවා බණ්ඩාරනායකතුමාගේ අදහසුත් නොවෙයි, ප්‍රතිපත්තිත් නොවෙයි කියා. එතුමාගේ කථා 500 කටත් වැඩි ගණනකට කන් දුන් කෙනෙක් හැටියට මට එකක් කියන්න පුළුවන්. බණ්ඩාරනායක අගමැතිතුමා කීවේ "සිංහලයන්ගේ අයිතිවාසිකම් රකින අතර මේ රටේ සුළු ජාතීන්ට මස් කටුවක් වීසි කරන්නේ නැත, ඔවුන් මුහුදට තල්ලු කරන්න බැරිය. ඒ අයටත් තැනක් දෙන්නට ඕනෑය" කියායි. මේ ආණ්ඩුව ඒ ප්‍රතිපත්ති කිසිවක් නොතකා මේ රටේ අවුල් ඇති කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයබාහු විජයසිංහ මයා.]

ඊට පසුව මොකක්ද කළේ? ඊට පසු මේ රටේ ආර්ථික සංවර්ධන කටයුතුවලට අත ගහන්නේ නැතිව මේ රටේ නොයෙක් විප්ලව ඇති කළා. ආගම් බේදය, ජාති බේදය, කුල බේදය ඇති වන අන්දමට කට යුතු කළා. සමාජවාදය හෝ වෙන යම් ප්‍රති පත්තියක් හෝ පිළිපදිනවා නම්, රටවැසි යාගේ සමගිය කඩා රටක් දියුණුව කරා ගමන් කරන්නේ කෙසේද? සිංහලයන් අතර රංඩු ඇති කිරීමට දැන් කටයුතු කර තිබෙනව, ක්‍රිස්තියානි සිංහලයා බෞද්ධ සිංහලයා කියා. කලින් ජාති බේදය ඇති කළා; භාෂා බේදය ඇති කළා. දැන් සිංහ ලයන් සිංහලයන් අතරම පොර කන පිළිවෙළට වැඩ පිළිවෙළවල් ඇති කරගෙන යනව. ඕවා බණ්ඩාරනායක ප්‍රතිපත්ති නොවෙයි කියා එතුමාගේ ගෝලයෙක් හැටියට මට ප්‍රකාශ කරන්න පුළුවන්. ඕවාට මා විරුද්ධ වුණා. නමුත් මා කල්පනා කළේ මේ අවුරුදු 5 ඇතුළත මේ යන පිළිවෙළ හරි නැත කියා මේ පාලක පක්ෂයට තේරේවිය කියලයි.

අපේ විදේශ ප්‍රතිපත්තිය කුමක්ද? බණ්ඩාරනායක අගමැතිතුමා කීවේ මේ රට කොයි රටවලුත් සමග සමගියෙන්, එක කඳවුරකටවත් අදින්නේ නැතිව, කටයුතු කරනවාය කියලයි. නමුත් මට කියන්නත් කනගාටුයි, අපේ ගරු අගමැතිනිය චීනයට ගොස් කීවේ මොකක්ද? බටහිර රටවල් මංකොල්ලකාරයින්ය කියා කිව්වා. යූ. ආර්. ඒ. එකට ගිය අවස්ථාවේ තවත් එකක් කියනවා. එක්සත් ජාතීන්ගේ සම්මේලන යේදී අපේ වෙළඳ ගිවිසුමක් තිබියදීත් දකුණු අප්‍රිකාවට විරුද්ධව ඡන්දය දුන්නා. දකුණු අප්‍රිකාව ගෙන යන වැඩ පිළිවෙළ හරිය කියා මා පිළිගන්නේ නැහැ. නමුත් අපේ වෙළඳ ගිවිසුමක් තිබියදී එවැන්නක් කිරීමේදී කල්පනාකාරී වන්නට ඕනෑ. කෝටි 8 ක් පමණ වටිනා මේ රටේ තේ ඒ රට ගන්නවා. තව පොඩ්ඩෙන් අපේ තේ ටිකත් විකුණා ගන්න බැරි වෙනව.

ත්‍රිකුණාමලේ වරායට ගිවිසුමක් ඇති කර ගෙන තිබෙන බව අපි හොඳින්ම දන්නවා. එවැනි ගිවිසුම් අනික් රටවල් සම ගත් ඇති කර නොගන්නේ ඇයි?

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.** (අවිස්සාවේල්ල)

*(திரு. டீ. பீ. ஆர். குணவர்தன—அவிசாவெல)*

(Mr. D. P. R. Gunawardena—Avissawella)

කවුරු සමගද ගිවිසුම?

**විජයබාහු විජයසිංහ මයා.**

*(திரு. விஜயபாஹு விஜயசிங்ஹ)*

(Mr. Wijayabahu Wijayasinha)

චීන ආණ්ඩුව සමග. වෙළඳ ගිවිසුමක්ය කියා තිබෙනව.

එහෙමනම් අනික් රටවල් සමගත් එවැනි ගිවිසුම් ඇති කර ගන්නට ඕනෑ. කොයි රටවලිනුත් අපට විශේෂයෙන්ම ආධාර ගන්නට පුළුවන්. ලංකාව දුප්පත් රටක් බව අපි පිළිගන්නව. අපි එංගලන්තය, ඇමෙරිකාව ආදි ඒ වටිනා රටවල් සමග හැප්පෙන්න ගිහින් ඒ රටවලින් ලබා ගන්න පුළුවන් ආධාර සම්පූර්ණයෙන්ම නැති කර ගත්තා. අද අපේ රැකී රක්ෂා ප්‍රශ්නය කො සිතරම් උග්‍රද? අපි ගමට ගියාම ගම්වල තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් සෑමදාම අපෙන් රක්ෂාව ඉල්ලන්නට එනව. මගේ කොට්ඨාශයේ හාරපන් සියයකට මම උදව් කර තිබෙනව. නමුත් තව දහස් ගණනක් ඉන්නව. ඔය ප්‍රශ්නවලට මේ ආණ්ඩුව මුහුණ පෑවද? සියළුම ප්‍රශ්න අවුලෙන් අවුලට පත් කරල දැන් අළුත් අවුලක් හදාගෙන තියෙනව මිසක් වෙන මොනවද කළේ? වුවමනා නැති වැඩ කරමින්, මහා සංඝ රත්නයට දොස් කියමින් ප්‍රශ්න අවුල් කරනව. මම මල්වතු මහා විහාරයේ දායකයෙක්. මගේ පියත් එහි දායකයෙක්. මල්වතු මහා විහාරයට මා කවදත් ගරු කරනව. මල්වතු මහා විහාරයේ මහා නායක ස්වාමීන් වහන්සෙට මා කවදත් ගරු කරනව. මහා සංඝ රත්නයට දෝෂාරෝපණය කර, අපේ රටේ ජාතික සුළු වෙළෙන්දන් නැති කර, පෞද්ගලික ජාතික ව්‍යාපාර සියල්ලටම පහර ගසා වැඩ කරන්නට බණ්ඩාරනායක අගමැතිතුමාගෙ කිසිම අදහසක් තිබුණේ නැති බව මම හොඳින් දන්නව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ජීවන අංකය කොයි තරම් ඉහළ නැගලද? ශත 10 ට 12 ට තිබුණු ලූනු රාත්තල දැන් 1.20 යි. යුද්ධ කාලයේදිවත් මහජනයාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ තරම් අමාරුවකට මුහුණ පාන්න සිදු වුනේ නැහැ. දැන් අවුරුද්දකට ටයර් 2ක් දෙනවලු. සැම ආහාර ද්‍රව්‍යයක්ම දැන් හිඟයි. සිමෙන්ති කොට්ටයක් රුපියල් 18යි, 19යි, 20 යි. අද ගම්බද දුප්පත් මිනිහකුට සිමෙන්ති කොට්ටයක් ගන්න නැහැ. මොනවද මේ කරන්නෙ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවංගත අගමැතිතුමා කෙරෙහි එදත් මගේ ගෞරවයක් තිබුන; අදත් ගෞරවයක් තියෙනව. පෞද්ගලික වශයෙන් ගරු අගමැතිනිය කෙරෙහිත් මගේ ගෞරවයක් තියෙනව. නමුත් මේ රටට මම එතුමීට වඩාආදරය කරනව. ඒ පරමාර්ථය අනුවයි, මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුණේ. මම බොහෝ කලක් රුකිරක්ෂා වල යෙදිල මේ රටට සේවයක් කරන්න පුළුවන් අවස්ථාවේදී මේ ගරු සභාවට ඇතුළු වුණා. මහජන සේවයක් කරන්නයි, මා මේ ගරු සභාවට ඇතුළු වුනේ. අපේ පළාත්වලත් අපි එසේ සේවය කරල තියෙනව. ඒ පරමාර්ථය ඇතිව මේ ගරු සභාවට ඇවිත් මට කවදාවත් ඒ අදහසට පහර ගසා, මගේ හෘදය සාක්ෂියට විරුද්ධව මේ මහත්වරුන් කීප දෙනකුගේ බලය වැඩි කිරීම සඳහා කටයුතු කිරීමට ඉඩ දෙන්නට බැරි නිසා අද මම ආණ්ඩු පක්ෂයෙන් ඉල්ලා අස් වෙනව.

**විවියන් ගුණවර්ධන මිය. (පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விவியன் குணவர்தன—உள்ளூராட்சி, உள்நாட்டு விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Vivienne Goonewardene—Parliamentary Secretary to the Minister of Local Government and Home Affairs)

ආසනයෙනුත් ඉල්ලා අස් වෙන්න.

අ. භා. 3.5

**ටී. බී. එම්. හේරත් මයා. (ග්‍රාම හා කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ரீ. பி. எம். ஹேரத்—கிராம, கைத்தொழில் அபிவிருத்தி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. T. B. M. Herath—Parliamentary Secretary to the Minister of Rural and Industrial Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීරිගම ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු මට කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සදාකාලිකව ජලයෙන් වැසුණු, මඩවලින් පිරුණු මහා විලක, සාමාන්‍යයෙන් ගොඩ වැවෙන ධාන්‍ය වර්ගයක් වවන්නට අපි කල්පනා කරනව නම් කවදාවත් එය ඉෂ්ට වන්නෙ නැති බව අපට පැහැදිලිව තේරුම් ගන්නට පුළුවන් කම තිබෙනව.

නියෝජ්‍ය සභාපතිතුමනි, ධනපති රාමුව තුළ හැදුණු වැඩුනු, ධනපතීන් ආශ්‍රය කළ, ධනපති සිතුම් පැතුම් ඔස්සේ ගමන් කළ, අධිරාජ්‍යවාදීන්ගේ අදහස්වලින් වෙළුනු විජේබාහු විජයසිංහ මන්ත්‍රීතුමා වැනි උදවියගෙන් මේ රටේ සමාජවාදයක් බලාපොරොත්තු වෙනවා නම්, සමාජවාදී වැඩ පිළිවෙලක් ඇති කරන්න අදහස් කරනවා නම්, එය කවදාවත් කරන්න පුළුවන් නොවන දෙයක් බව මට කියන්න පුළුවනි. [බාධාකිරීම්]

කොච්චර කෑගැහුවත් ඔය කටවලින් මා බය කරන්න පුළුවන් වන්නේ නැහැ. නිකම් නරි වාගේ කෑගැහුවාට අපි බය වෙන්නේ නැහැ. වලපනේ කොට්ඨාශයේ කැලෑවල ඔය වගේ නරි කෑගහනවා අපි ඕන තරම් අහලා තිබෙනවා. ඔය නරින්ට අපි ඉඩ දෙන්නේ නැහැ. මහත්වරු වාගේ කථා කරනවා නම් ඒ විදියට කථා කිරීමට අපිත් ලෑස්තියි. [බාධාකිරීම්] ගිනිපෙට්ටි විකුණා අපි බලයට ආවේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

මිනීමරුවො.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මිනීමරුවෝ තමුන්නාන්සෙලා. යුද්ධ හමුදාවේ මිනී මැරුවේ තමුන්නාන්සෙ. මහියංගන මන්ත්‍රීතුමා (සී. පී. ජේ. සෙනෙවිරත්න මයා.) මිනීමරුවා. උසාවියේ සැක පිට සිටින මන්ත්‍රීවරයකුට මිනීමරුවායයි කීමට තමුන්නාන්සේට පුළුවන්කමක් නැහැ. ඒ කථාව වහාම ඉල්ලා අස් කරගත යුතුයි. එය උසාවියට කරන අපහාසයක්. ඇයි ඔය ලොකු ගණන්කාරයා පැනල එළියට ගියේ ? වචනයක් කියන්න ඕන, අද හසක් ඇතිව. මම තමුන්නාන්සේලාට පෞද්ගලිකව නින්දා කිරීමට සූදානම් නැහැ. මම තමුන්නාන්සේලාට එකක් කියන්නම්. අද තමුන්නාන්සේලා අත්පොලසන් දුන්නේ බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ට භික්ෂුවක් වෙඩි තැබූ අවස්ථාවේදී ඉස්සරහ කාමරය ඇතුළේ මේසේ යටට රිංගාගත් පුද්ගලයකුටයි. අපි ඒ වාගේ වනචර අත්පොලසන් ගැහීමට සූදානම් නැහැ. මහත්වරු වාගේ වැඩ කරන උදවියට කොයි පැත්තේ සිටියත් අපි සල කනවා. මීරිගම මන්ත්‍රීතුමා (විජයබාහු විජයසිංහ මයා.) 1960 සිට 1964 මේ මොහොත දක්වා අප පක්ෂය තුළ වැඩ කළ ආකාරය තමුන්නාන්සේලාට වඩා හොඳින් දන්නේ අපයි. ඒ මන්ත්‍රීතුමා මේ සභාවේදී කථා කිරීමට නැඟිටි සෑම අවස්ථාවකදීම වාගේ තමුන්නාන්සේලා පවා උන්නැහේට අත්පොඩි ගැහුවා, ඔහු හාස්‍යයට ලක් කරමින් ; උපහාසයට ලක් කරමින්. ඇයි එසේ කළේ ? ඒ මන්ත්‍රීතුමා ඇමරිකන් නාස් ලනුවට අනුව ගමන් කළ නිසයි. මේ පක්ෂයේ සිට විජේබාහු විජයසිංහ මන්ත්‍රීතුමා එළියට ගියා නම් මේ රටේ සමාජවාදයේ ඉදිරි ගමනට රුකුලක් දුන්නායයි අපි කල්පනා කරනවා. ඒ නිසා ඒ වාගේ පුද්ගලයෙක් පක්ෂයෙන් එළියට යාම ගැන අපි කොහෙත්ම කම්පා වන්නේ නැහැ.

ඒ මන්ත්‍රීතුමා මේ සභාවේදී ප්‍රකාශ කළ අදහස් අපි හොඳින් පැහැදිලිව තේරුම් ගන්න ඕන. එතුමා කිව්වා, සිංහලයින්යයි කියා අපට තනිවම ජීවත් වන්න බැරිය කියා. අනික් ජාතීන්ටත් අයිතිවාසිකම් දෙන්න වුවමනායයි කිව්වා. බෞද්ධයින් යයි කියා තනියම ජීවත් වන්නට බැරි යයි කිව්වා. අනික් ආගමිකයින්ටත් අයිතිවාසිකම් දෙන්න වුවමනායි කිව්වා. මම විරුද්ධ පාර්ශ්වයේ සිටින සිංහල බෞද්ධ සමාජවාදීන්ගෙන් අහනවා, ඒ මන්ත්‍රීවරයා යන්නේ කොහේදැයි දන්නවාද කියා. ඔහු කොයි යනවාද කියා අපට නම් හොඳ හැටිම පැහැදිලියි. උන්නැහේ එදත් අදත් ඉදිරියටත් පන්දම් අල්ලුවේ, අල්ලන්නේ එක්සත් ජාතික පක්ෂයටයි. [බාධා කිරීමක්]

දෙහිවල-ගල්කිස්ස මන්ත්‍රීතුමා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) කවදාවත් එක්සත් ජාතික පක්ෂයට හේත්තු නොවන බව—ජීවිතය තිබෙන තුරු ඒ පක්ෂයට හේත්තු නොවන බව—මට එකහෙලාම කියන්න පුළුවනි.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

He has come to defend you—the best Criminal Lawyer! We do not want a Criminal Lawyer.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කරුණා කර මට අවහිර නොකර මගේ කථාවෙන් පසුව කථා කරන්න. තමුන්නාන්සේ වාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්—වෛද්‍යාචාර්යවරයෙක්—තේරුම් ගන්න ඕන, මේ සභාවේ සම්ප්‍රදායයන්. තමුන්නාන්සේගේ මොලේ නරක් වී තිබෙන බව මම දන්නවා. ලෙඩ්ඩු හුඟක් මරා තිබෙන බවත් අපි දන්නවා. මට බාධා කළොත් මාත් කියනවා. කරුණා කර ලෙඩ්ඩු මරන කාලයට මේ කණිෂ්ඨ මන්ත්‍රීවරුනුත් මරන්න හදන්නේ නැතිව ඇහුන් කන් දෙන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීරිගම ගරු මන්ත්‍රීතුමා බොහෝම භයානක ප්‍රකාශයන් කීපයක් කළා. එතුමාලු, 1956 දී දිවංගත අගමැතිතුමාට ජයග්‍රහණය ලබා දුන්න පුද්ගලයා. ඔව්, දැන් සිටින අගමැතිනියත්, හිටපු අගමැතිතුමාත් පිටිපස්සෙ ගමන් කළ බත් බැලයො ටිකක් හිටිය. අගමැතිතුමා හෝ අගමැතිනිය කොහෙද යන්නෙ,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ උදවිය හැමතැනම පිටිපස්සෙන් යනව. ඒ අයගෙන් කෙනෙක් තමයි, මීරිගම මන්ත්‍රීතුමා. ඒ පුද්ගලයො හේත්තු වුණේ මේ ආණ්ඩුවට යම් යම් බිස්නස් කරල සල්ලි හම්බ කරගන්ට පමණයි. යම්කිසි පුද්ගලයන් පිරිසක් සිටිය, එතුමාගේ බලය විකුණා සල්ලි හම්බ කරගන්ට කල්පනා කළ. ඒ පිරිසට යම් යම් අමාරුකම් ඇති වුණා. ඒ අමාරුකම් ඇති වීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි, එතුමාට පිස්තෝලයෙන් වෙඩි තබා එතුමාගෙන් පලි ගන්ට මහන්සි ගත්තෙ. මම එය භය නැතුව කියනව.

බිස්නස් කිරීමේ බලාපොරොත්තුවෙන් අගමැතිතුමාට පන්දම් අල්ලමින් පිටුපසින් ගමන් කළ උදවියගෙන් කෙනෙක් තමයි, මීරිගම ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] එදා වෙඩි තියද්දිත් ඇඳ යට රිංගුවා පමණක් නොවෙයි, ඊට වඩා වැඩ ගත් දේවල් කර තිබෙනව. ඒව අපි කියන්නෙ නැහැ, මේ සභාවේ. අපි ඒව දන්නව. ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදී අපි මේව කිව්ව. අද නොවෙයි ඒ දවස්වලම අපි කිව්ව. 1960 සිට 1964 දක්වාම අපි මීරිගම මන්ත්‍රීතුමාට කිව්ව යන්න කියා. ගියේ නැහැ. ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදි අපි කෙලින්ම කිව්ව, එතුමාට ඇමරිකාවට යන්ට කියා. අද ඇමරිකාවට ගිහින් තිබෙනව. දකුණු කොළඹ ගරු පළමුවෙනි මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) අද බොහොම සන්තෝෂ වෙනව ඇති උන්නැහේගෙ කුඩුවට තවත් උදවිය ඇවිත් සිටීම ගැන. හෙට අනිද්දා වෙන කොට තවත් එන්ට බැරිකමක් නැහැ. අද හැන්දෑවන කොටත් කියන්ට බැහැ. [බාධා කිරීමක්] වෙන්ට පුළුවනි. 1960 මාර්තු මැතිවරණයේදී තමුන්නාන්සේ ලාට අත්වුණු ඉරණම සමහරවිට අපටත් අත් කර දෙන්ට තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනව ඇති. තමුන්නාන්සේ ඒක හොඳ හැටි දන්නෙ මොන විධියකින් දැයි මා දන්නෙ නැහැ. ඔළු හාරා බැලුවදැයි මා දන්නෙ නැහැ. එසේ නැතිව වෙන යම් ක්‍රමයකින් දැන ගත්තදැයි මා දන්නෙ නැහැ. හූනියම් කළාදැයි මා දන්නෙ නැහැ. මතුරලදැයි මා දන්නෙ නැහැ. එසේ නැත් නම් සල්ලි දීල හෝ මොකක් හෝ ක්‍රමයකින් මේගොල්ල අල්ලගෙන සිටිනවදැයි මා දන්නෙ නැහැ. තමුන්නාන්සෙ දන්නව ඇති. කොහොම හරි තමුන්නාන්සෙ දන්නව. නමුත් අපටත් එළිවෙයි, කළාට පස්සෙ. අපට පේන කියන්ට බැහැ. අපට ශාස්ත්‍ර කියන්ට බැහැ. මහජනයා විසිදාහ, තිස්දාහ පනස්දාහ නියෝජනය කරන මන්ත්‍රීවරුන් එක පාරටම ඔය පැත්තට එනවා කියා ප්‍රකාශ කරන්ට හෝ මේ පැත්තට එනවා කියා ප්‍රකාශ කරන්ට හෝ ඒ ගොල්ලන්ගෙ ප්‍රතිපත්ති පාවා දෙනවා යයි කියන්ට හෝ මා ලැහැස්ති නැහැ. තමුන්නාන්සේ ලැහැස්ති වුණාට මම ලැහැස්ති නැහැ. තමුන්නාන්සේ එවැනි එඩිතර ප්‍රකාශයක් කරනව. ඒකෙ මොකක් හෝ රහසක් තිබෙනව. ඒ රහස ලේක්හවුස් එකේ සල්ලි වන්ට බැරිකමක් නැහැ. ලේක්හවුස් සල්ලි වන්ටත් පුළුවන් ; ඩොනල්ඩ් රණවීර මහත්මයාගෙ සල්ලි වන්ටත් පුළුවන් ; ගුණසේන මහත්මයාගේ සල්ලි වන්ටත් බැරිකමක් නැහැ. එවැනි ප්‍රකාශයක් කරන්ට ගරු මන්ත්‍රීතුමා ස්ථිරව දන්නෙ කොහොමද ? මේ රටේ තත්ත්වය ඒක නම් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන්, මේ රටේ නිදහස බලාපොරොත්තු වන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හැමදෙනාම විකක් භයානක අනතුරු හැඟීමකින් යුතුව කල්පනා කරන්ට ඕනෑ, මේ රටේ ප්‍රතිගාමී කොටස මීට කලින් ක්‍රියා කළ අන්දමත්, ඉදිරියට ක්‍රියා කරන්ට ලැහැස්ති වන අන්දමත් ගැන.

1960 මාර්තු මැතිවරණය හොඳ නිදර්ශනයක්. මේ රටේ ප්‍රගතිශීලි කණ්ඩායම් එකතු වෙලා ඒ අවස්ථාවේදී ධනපති බලය බිඳ දැම්ම. එහි ප්‍රතිඵලයක් හැටියටයි, මේ ආණ්ඩුව බිහි වුණේ. එදා මාර්තු මැතිවරණයේදී බලයට පත්වුණු ස්වල්ප කාලය තුළදී කරන්ට පුළුවන් හැම දූෂණයක්ම කර මන්ත්‍රීවරුන් අල්ලා ගැනීමට එක්සත් ජාතික පක්ෂය මහන්සි ගත් හැටි අපි දන්නව. ඒ පරණ පුරුද්ද තව දුරටත් ක්‍රියාවේ යොදනවා වන්ට ඇති. ඒ නිසා වන්ට පුළුවන්, නිකවැරටියේ මන්ත්‍රීතුමා (කේ. හේරත් මයා.) කියන්නෙ "ඔව්, අපේ පැත්තට එනවා" කියා. අපි දන්නෙ නැහැ, තමුන්නාන්සෙලාගේ සල්ලි ක්‍රමයක් තිබෙනවාද කියා. අපි අහනව, මීරිගම ගරු මන්ත්‍රීතුමා (විජයබාහු විජයසිංහ මයා.) ඒ ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් ආවද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

ඒ ප්‍රශ්නය අහන්ට සිදුවී තිබෙනවා. ඔය ඇම කැවාදැයි මීරිගම ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්නට කැමතියි.

ගිවිසුමක් යටතේ ත්‍රිකුණාමල වරාය චීනයට භාර දී තිබෙන බවත් මීරිගම ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මේක අමූලික පට්ටපල් බොරුවක්. මේ බොරුව ගැන වගකිවයුතු ඇමතිවරුන් පසුව පිළිතුරු දෙනවා ඇති. මේ වගේ දෙයක් එතුමාට දැන ගන්නට තිබුණා නම් ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදී ඒ ගැන කථා නොකෙළේ ඇයි? ආණ්ඩු පක්ෂයේ රැස්වීමකදී කවදාවත් ඒ ගැන ප්‍රශ්න කෙළේ නැහැ. අද දින එතුමා ඒ ගැන කියන තුරු මෙතෙක් අප ඒ ගැන ඇහුවේ නැහැ. යන්න ලෑස්ති වෙලා කරන මෙවැනි අයුතු ප්‍රකාශ හෙළා දකින බව මතක් කරන්න කැමතියි.

රැකී රක්ෂා ප්‍රශ්නය ගැනත් එතුමා සඳහන් කළා. එතුමාම සමහරුන්ට රක්ෂා සපයා දුන්නාලු, නමුත් රක්ෂා නැති හුඟක් දෙනකු තවමත් ඉන්නවාලු. මේ ආණ්ඩුව රැකීරක්ෂා නැති ප්‍රශ්නය සියයට සියයකින් විසඳා තිබෙනවා යයි කියන්නට ලෑස්ති නැහැ. නමුත් එතුමා පන්දම් අල්ලන එක්සත් ජාතික පක්ෂයේ පාලන කාලයේදී මේ සම්බන්ධයෙන් කරන ලද කටයුතු අප දන්නවා. ඒ කාලයේදී කරන ලද කටයුතු වලට වඩා මේ කාලයේදී අප කටයුතු කර තිබෙනවා. ලොකු කර්මාන්ත 400 ක් ඇති කළා. කුඩා කර්මාන්ත 800 ක් ඇති කළා. මේ මඟින් 40,000 කට රක්ෂා ලබා දෙන්නට පුළුවන් වුණා. මේ ගැන පැහැදිලිව ගරු කර්මාන්ත ඇමතිතුමා මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. මීරිගම, කැළණිය, මහර, ගම්පහ, ආදි කෝට්ඨාශවල විශාල කර්මාන්ත ශාලා ආරම්භ කිරීම නිසා ඒ ප්‍රදේශවාසීන් බොහෝ දෙනකුට රක්ෂා ලැබී තිබෙනවා. මීරිගම ගරු මන්ත්‍රීතුමා මේ රජයේ ක්‍රියා මාර්ගය යටතේ තම ප්‍රදේශයේ වැසියන් බොහෝ දෙනකුට රක්ෂා ලබා දී තිබෙනවා. නමුත් එතුමා අනික් පැත්තට යන්නට ලෑස්තිව කියන්නේ මේ ආණ්ඩුව රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට ක්‍රියා කර නැති බවයි. මේක අමූලික බොරුවක්. මෙවැනි අමූලික බොරු ප්‍රකාශ කිරීම ගැන බොහොම කනගාටුයි.

බොහෝ කලක සිටම මීරිගම ගරු මන්ත්‍රීතුමා ගැන මා දන්නවා. 1956 ට පෙර සිටම මා එතුමා ගැන දන්නවා. "හඟුරන්කෙත ගෲප්" එකේ සුපිරින්ටෙන්ඩන්ට් වශයෙන් සිටි කාලයේදී පවා මා එතුමා ගැන දන්නවා. ඒ කාලයේ එතුමාගේ ධනපති ක්‍රියා කලාපය, ගතිගුණ, දෛනික ජීවිතය, හැසිරීම, ආදී කොයිවත් ගැන මා දන්නවා. එතුමා වගේ ධනපති ක්‍රමය අනුව හැඩ ගැසුණු, හැමදාම ධනපතියකු හැටියට ජීවත් වුණු හා ජීවත් වන, විස්කි වෙනුවෙන් දිනකට රුපියල් තුන් හාර සියයක් වියදම් කරන කෙනකුගෙන් සාමාන්‍ය ජනතාවට ප්‍රයෝජනයක් ලබා ගන්න බැරි බව දැන් මීරිගම ජනතාව පිළිගෙන ඉවරයි. මා කොළඹ එන්නේ මීරිගම ආසනය මැදිනුයි. අද උදේ මා කොළඹ එන ගමන් මීරිගමදී මගේ මෝටර් රථය නවත්වා වැසියන් කීප දෙනකු සමඟ කථා කළා. මීරිගම ගරු මන්ත්‍රීතුමා අද ආණ්ඩුවට විරුද්ධව ඡන්දය දෙන බව මා ඒ අයට කී විට, එසේ නම් මොන පක්ෂයෙන් තරඟ කළත් ඊළඟ වතාවේදී එතුමාට මීරිගම ආසනය ලබා නොදෙන බව ඒ අය ප්‍රකාශ කළා. මැතිවරණය කවදා තැබුවත් ඒ මැතිවරණයේදී මීරිගම ගරු මන්ත්‍රීතුමා පරාජයට පත් වෙනවා ඇති. මා මේ කියන දෙයෙහි සත්‍යතාව ඡන්ද ගණන් කර අවසන් වූවාට පසු පෙනී යනවා ඇති. ඒ නිසා දැන්ම මේ ගැන කෝලාහල කරන්නට වුවමනාවක් නැහැ.

මා ෆෙඩරල් පක්ෂයේ ගරු මන්ත්‍රීවරයකුගේ කථාවකට ඇහුම්කන් දුන්නා. ඒ ගරු මන්ත්‍රීතුමා කරුණු තුනක් ගැන සඳහන් කළා. බුද්ධාගමට නීත්‍යානුකූලව උසස් තැනක් දීම අයුක්ති සහගත බව ඒ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. 1956 දී මහජන එක්සත් පෙරමුණු රජය බලයට පත් කෙළේ මේ රටේ බෞද්ධ ජනතාව විසින් ඉල්ලන ලද පරිදි, භික්ෂූන් වහන්සේලා විසින් ඉල්ලන ලද පරිදි, බෞද්ධ කොමිසන් සභා වාර්තාව පිළිගැනීම නිසයි. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ඒ වාර්තාව පිළිගත්තා. පිළිඅරගෙන එය ක්‍රියාවේ යොදවන බවට ප්‍රතිඥා දුන්නා. ඒ වාර්තාවේ සඳහන් කර තිබෙන කාරණයක් තමයි බුද්ධාගමට මේ රටේ හිමි තත්ත්වය ලබා දීම. මා සිතන්නේ ඊටත් වඩා පළල් ලෙසයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වාර්තාවෙ මේ ගැන සඳහන් වෙන්නෙ. බුද්ධාගම රාජ්‍යාගම කරන්නට කියායි එහි සඳහන් වෙන්නෙ.

බුද්ධාගම රාජ්‍යාගම කිරීම ඉතාමත් උසස් දෙයක්. බුද්ධාගම රාජ්‍යාගම නො කළ යුතුය කියා මා කියන්නෙ නැහැ. නමුත් බුද්ධාගමට හිමි තත්ත්වය දීම බුද්ධාගම රාජ්‍යාගම කරන තරම් උසස් දෙයක් නොවන බව මා පිළිගන්නව. ඒ ආකාරයට බුද්ධාගමට හිමි තත්ත්වය ලබා දෙන්න යන මෙවැනි අවස්ථාවකදී බුද්ධාගමට සැලකිල්ලක් නොදක්වන දේශපාලන පක්ෂයක ගරු මන්ත්‍රීවරයකු විරුද්ධත්වය ප්‍රකාශ කිරීම ගැන මා පුදුම වන්නෙ නැහැ. නමුත් අපි ඊට වඩා පුදුම විය යුතු කරුණක් තිබෙනව. බුද්ධාගමට හිමි තැන දෙනවාය කියන, මේ අවස්ථාවාදීන් එදා බුද්ධාගමට හිමි තැන දෙනවාය කියා රාජාසන කථාව කියවන්නට සූදානම් වන විටම සභා ගර්භ යෙන් නැගිට ගියා. එදා ඒ ක්‍රියාව සමහර ගරු මන්ත්‍රීන් දැනුවත්ව කළාද, නොදැනු වත්ව කළාද කියා මා දන්නෙ නැහැ. මට දැනගන්නට ලැබී තිබෙන හැටියට නම් කතෝලික පල්ලියේ යම්කිසි නියෝගයක් අනුවයි එදා විරුද්ධ පාර්ශ්වයේ නායක තුමා ඇතුළු එක්සත් ජාතික පක්ෂය ක්‍රියා කළේ. මා දන්නෙ නැහැ ඒක ඇත්තද නැද්ද කියා. [බාධාකිරීමක්] සිනහ වෙන්නට වුවමනාවක් නැහැ. තමුන් නාන්සේලා මේ වගේ දේවල් ඕනෑ තරම් කර තිබෙනව. පාසැල් රජයට ගන්නා අවස්ථාවේ කතෝලික පල්ලියේ සම්පූර්ණ ආධාරකාරයා වශයෙන් වැඩ කළේ එක්සත් ජාතික පක්ෂයයි. තමුන්නාන් සේලා එදා කම්බි වැටවල් ගැසුවා. මුර කළා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය නිර්දෝෂී පක්ෂයක්ය කියා අපිට කොහෙත්ම පිළිගන්නට බැහැ. එක්සත් ජාතික පක්ෂය කවදත් ක්‍රියා කළේ කතෝලික ආගමට පක්ෂවය කියා අපට පැහැදිලි වශයෙන්ම කියන්නට පුළුවන්. අර පුවත්පත් කොමිසමේ වාර්තාව අර ගෙන බලන්න. 1955 ඔක්තෝබර් 1 වැනිදා "සැරය" නම් පත්‍රයේ පළවූ ලිපිය බලන්න. එදා ආණ්ඩු කළේ තමුන්නාන් සේලයි. "සැරය" පත්‍රයෙ තිබුණේ මෙහෙමයි :

"මහින්ද භික්ෂුව තවත් පන්දහසකට අධික පිරිවරක් සහිතව ලංකාවට ආයේය. මේ මිහිඳු පිරිවර ඔවුන් ඔතාගෙන ආ කහ රෙද්ද පැත්තකින් තබා ලංකාවේ රූපත් ගැහැණුන් දැක උන් කෙරෙහි සිත් උපදවා උන් රා රති සැප වින්දහ."

මේ වගේ දෙයක් පත්‍රයක පළ කරද්දී එදා නිදා ගෙන සිටි එක්සත් ජාතික පක්ෂ යට අද කිසිසේත් කියන්නට බැහැ තමන් බුද්ධාගමේ ගැළවුම්කාරයින්ය කියා. එදා ආණ්ඩු බලය තිබුණු කාලයේදී, අපි අනු බුදු පියාණන් හැටියට සළකන මිහිඳු මහ රහතන් වහන්සේ ඇතුළු පිරිස කහ රෙද්ද පැත්තකින් තබා ලංකාවේ ලස්සන ගැහැණුන් දැක ඒ අය සමග විවාහ සැප වින්දාය කියද්දී කට වසා ගෙන සිටි ආණ්ඩුවක ඇමතිවරයකු අද මා කතෝලික පල්ලිය ගැන කථා කරන විට සිනහවීම ගැන ලජ්ජා වෙන්න ඕනෑ. තමුන්නාන් සේලාට හිනහ වෙන්න නොවෙයි අඬන්නයි තියෙන්නෙ. මේ වගේ දේවල් ප්‍රකාශ කරද්දී එදා නිදා ගෙන සිටි ඇමති වරුන් හැටියට තමුන්නාන්සේලාට අද අඬන්නයි තියෙන්නෙ. එපමණක් නො වෙයි.

1954 ඔක්තෝබර් මස 13 වැනි දින "සිලෝන් ඩේලි නිව්ස්" පත්‍රයේ කරණීය මෙත්ත සූත්‍රය ලියා තිබුණු හැටි මා කිය වන්නම්. බෞද්ධයන් හැටියට අද බුද්ධා ගම වැළඳ ගෙන බුද්ධාගම ආරක්ෂා කරන්න මහන්සි ගන්න, භික්ෂූන් වහන්සේලා පිරිවරා ගෙන බුද්ධාගම ආරක්ෂා කරන්න ගම් නගර සැරිසරන, තමුන්නාන්සේලා තමයි එදා මේ රට ආණ්ඩු කළේ. ඒ කාලයේදී "ඩේලි නිව්ස්" පත්‍රයේ කරණීය මෙත්ත සූත්‍රය පළවුණේ මෙහෙමයි :

"අපි මෛත්‍රී කළා වැඩියි.
නිර්භය වෙමු. ගිනි තියමු.
බිඳ හෙළමු, කොල්ලකමු.
මරා දමමු, (ක්‍රිස්තියානි, හින්දු, මුස්ලිම් යන මොවුන් හැර)"

මරා දමන්නෙ කව්ද, බෞද්ධයනුයි. "සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා" කියා ඊළඟට මෙහි සඳහන් කර තිබෙනව. මේ අන්දමේ රචනාවක් එදා "ඩේලි නිව්ස්" පත්‍රයේ පළ කරද්දී නිදා ගෙන සිටි එක්සත් ජාතික පක්ෂය අද ඇවිත් බුද්ධාගම ආරක්ෂා කරන්න මහන්සි



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

ගැනීම ගැන අපට කොහෙත්ම විශ්වාසයක් තබන්න පුළුවන්කමක් නැහැ. එදත් අදත් කවදත් බුද්ධාගම ගැන එකසේ මහන්සි ගත් ගරු මන්ත්‍රීතුමන්ලා එක්සත් ජාතික පක්ෂයේ සිටින බව අපි පිළිගන්නව. ඒ උදවිය මේ ප්‍රකාශය කරනවා නම් අපි කොහෙත්ම කනගාටු වෙන්නෙ නැහැ. ඒක අපි පිළිගන්න ලෑස්තියි. තමන් බලයේ ඉන්න කාලේ කතෝලික පල්ලියට වුවමනා හැටියට වැඩ කළා. බෞද්ධයින්ටත් බෞද්ධාගමටත් නිර්දය ලෙස, ඉතා පහත් ලෙස, පහර ගසමින් අගෞරව කරද්දී නිදාගෙන හිටියා. එහෙම නිහඬව හිටපු එක්සත් ජාතික පක්ෂය අද බෞද්ධාගම ආරක්ෂා කිරීමට සටන් කරනවය කියන එක ගැන අපට සන්තෝෂ වෙන්න පුළුවන්කමක් නැහැ. ෆෙඩරල් පක්ෂය වෙනත් ආගමික යන් වැඩි වශයෙන් සිටින පක්ෂයක් වන නිසා ඒ උදවිය මේක ගැන විරුද්ධ වීම එක් අතකින් කල්පනා කර බලන විට වැරද්දක් නොවේය කියන්නත් ඉඩ තියෙනව. ඒ කොයි හැටි වෙතත් එක්සත් ජාතික පක්ෂය ගැන ඒ විධියට කියන්න පුළුවන් කමක් නැහැ. එක්සත් ජාතික පක්ෂය වැඩි වශයෙන් බෞද්ධ මන්ත්‍රී වරුන් ඉන්න පක්ෂයක්. එපමණක් නොව, වැඩි වශයෙන්ම බෞද්ධ මහජන යාගේ ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රීවරුන් විශාල සංඛ්‍යාවක් සිටින පක්ෂයක්. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය මෙවැනි කටයුතු කිරීම ගැන අපට කොහෙත්ම පුදුම නොවී ඉන්න ඉඩක් නැති බව තමුන්නාන්සේට මතක් කරන්න කැමතියි.

එතුමා ඊළඟට පෙන්නුම් කළා, මා හිතන්නෙ, පත්තර පණත ගැන. මේ ගරු සභාවට පත්තර පණතක් ඉදිරිපත් කර තිබෙනව. ඒ පත්තර පණත සම්මත කර ගන්න ඉඩ දෙන්නෙ නැතෙයි කියන තර්ජනය දැන් දැන් අපට එක් එක් පැත්තෙන් ඇහෙනව. එක් පැත්තකින් එවැනි තර්ජනයක් ගැන අපට අහන්නට ලැබෙන අතර තවත් පැත්තකින් අහන්නට ලැබෙන තර්ජනය නම් ඒ පණත මේ ගරු සභාවෙන් සම්මත වුණත් එය ක්‍රියාවේ යොදන්න ඉඩ දෙන්නෙ නැහැ කියන එකයි. ඔය විධියෙ තර්ජන තවත් පැත්තකින් එනව. අපට තවත් ආරංචියක් ලැබී තිබෙනවා. ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. සමහර විට දකුණු කොළඹ පළමු වන ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) එතුමගෙ කථාවෙදි ඒ ප්‍රකාශය කළේ ඒ ආරංචියේ ඇත්තක් තිබෙන නිසා වෙන්නත් පුළුවනි. පත්තර පණත සම්මත කළත් පත්තර ආයතනය ගන්න ඉඩ දෙන්නෙ නැතෙයි කිව්වෙ සමහර විට ඒ විධියෙ දෙයක් නිසා වෙන්නත් බැරි නැහැ. අපට ආරංචියක් ලැබී තිබෙනව ලේක් හවුස් මන්දිරය මහ සඟනට පූජා කරන්න සූදානමක් තිබෙනවය කියල. ඒක එහෙම නම් අපිත් බොහොම සන්තෝෂ වෙනව. රජයට ගැනීම එක් අතකින් මහජනයා සන්තක කිරීමක්. ඊටත් වඩා මේ ආයතනය මහා සංඝයා වහන්සේට දන් දෙනවා නම් සමහර විට ඒක රටේ ඊටත් වඩා උසස් පින්කමක් වෙන්න පුළුවනි. ඒ කොයි හැටි වෙතත් එයින් රටේ මහජනයාගේ අවශ්‍යතාවන් නැති කරන්න උත්සාහ කරනවා නම් ඒක කවදාවත් කරන්න ලැබෙන්නෙ නැහැ. පැරණි රජදරුවන් විසින් ඉඩකඩම් ස්වල්පයක් නොවෙයි මුළු මහත් ලක්දිවයිනම පවා පූජා කර තිබෙනව. මුළු රටම සංඝ රත්නයට පූජා කර තිබෙන නමුත් ඒ හේතුව නිසාම මේ රටේ මිනිසුන් සියලු දෙනාම මේ රට අත් හැර දමා වෙනත් රටකට ගියේ නැහැ. මුළු ලංකාවම සංඝ රත්නයට පූජා කළත් මේ රටේ මිනිසුන් මේ රටේම නතර වී තමන්ගේ අවශ්‍යතාවන් මේ රටෙන්ම ලබා ගන්න ඕනෑ. ඒ නිසා ලේක් හවුස් මණ්ඩලයම, ලේක් හවුස් පුවත්පත් ආයතනයම, සඟ සතු කළත් එයින් ගත යුතු ප්‍රයෝජනය මහජනයා එයින් ලබා ගන්න බවට කිසිම අනුමානයක් නැහැ. කතෝලික පල්ලියේ නාස් ලනුව අනුව ක්‍රියා කරන පුවත්පත් සඟසතු කළොත් ඊට පස්සෙ බෞද්ධ යන්ගෙ පැත්ත අරන් වැඩ කරනවා ඇති. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රී වරුන්ට සාංඝික කළ ලේක් හවුස් ආයතනයෙන් මීට වඩා හොඳක් සිදු වෙනවා ඇති. මා එසේ හිතන්නෙ එක්සත් ජාතික පක්ෂයේ බෞද්ධ මන්ත්‍රී වරුන්ට එතකොට බෞද්ධාගම ඉගෙන ගන්න පුළුවන් වන නිසයි. උන්නැහේලා බෞද්ධාගම ඉගෙන ගත්තට පස්සෙ බෞද්ධාගම කුමක් ද කියාත්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රිස්තියානි ආගම කුමක්ද කියාත් පැහැදිලි ලෙස දැන ගන්නවා ඇති. එතකොට දැන් වගේ එක පැත්තකින් පල්ලියට ඇදිලා අනෙක් පැත්තෙන් පන්සලට ඇදිලා කරන දේවල් නතර වෙනවා ඇති. බෞද්ධාගම ගැන නියම අවබෝධයක් දුන්නොත් එදාට බෞද්ධාගම ගැන කථා කරන දේ පිළිගන්න පුළුවන් වේවි. දැන් කථා කරන ඒවා නම් පිළිගන්න පුළුවන් කමක් නැහැ. කතෝලික පල්ලිය අදින ලනු අනුව දුවන නිසා කියනව, පුවත් පත් ගැනීම බොහොම ලොකු ජාතික විපතක්ය කියල. ඒක නවතන්න ඕනලු. ඒ වෙනුවෙන් සටන් කරනවලු, බොහොම තදින්. මේ රටේ දේශපාලන ඉතිහාසය ගැන සලකා බලන විට කතෝලිකයින්ට මේ පත්තර සටන අයිති නැද්ද? ඒ අය ඇයි දැන් නිශ්ශබ්දව ඉන්නෙ? ඊට හේතුවක් නැද්ද? ඊට හේතුවක් තිබෙනවද නැද්ද කියන එක ගැන ටිකක් සොයා බලන්න ඕනෑ. එය එක්සත් ජාතික පක්ෂයෙ මන්ත්‍රීවරු දන්නව. ඒ උදවිය දැන් හදන්නෙ බෞද්ධයන් දෙකට කඩන්නයි. ඒ විධියට බෞද්ධයන් දෙකට කැඩුණොත් ඊට පස්සෙ කතෝලික කොටස එක්සත් ජාතික පක්ෂයට පක්ෂ වෙලා, දෙකට කැඩුණු බෞද්ධ කණ්ඩායමත් සමග එකතු වෙලා මේ රටේ ආණ්ඩු බලය අල්ලා ගන්න පුළුවන් වේය යන සූක්ෂම දර්ශනය මේ උදවියට දැන් පහළ වෙලා තියෙනව. ඒ අනුව තමයි දැන් මේ උදවිය ඔය විධියට මේ රටේ බෞද්ධයන් කොටවන්නෙ. දැන් අවස්ථාව එන තුරු ඉන්නව. මැතිවරණය එන තුරු බලාගෙන ඉන්නව. මැතිවරණය එන විට නැවතත් කතෝලික පල්ලිය දේශනා කරන්න පටන් ගන්නව. "අලියට ඡන්දය දුන්නෙ නැති නම් අපාගත වෙනව, පාපතරයකු වෙනව" යනාදි ප්‍රකාශ කරන්න කිසි විධියකින් පසුබට වෙන්නෙ නැහැ. ඒ අය ඒක කරනව. එම නිසා ආගමකට මුවා වී ගෙන යන එක්සත් ජාතික පක්ෂයෙ මෙම කුමන්ත්‍රණයෙන් කවුරුත් ප්‍රවේසම් වෙන්න අවස්ථාව දැන් පැමිණ තිබෙනව. එක පැත්තකින් සම්පූර්ණයෙන්ම කතෝලිකයන් තමන්ට අවනත කරගෙන අනික් පැත්තෙන් බෞද්ධයන්ගෙන් කොටසක් කඩා ගැනීමට දරන මෙම ප්‍රයත්නය ඉතාම නින්ද-

නීය බව මෙම ගරු සභාවෙදී මතක් කරන්න ඕනෑ. ඔය කියන න්‍යාය සාර්ථක වෙලා ආණ්ඩුවක් එහෙම පිහිටෙව්වොත එදාට බෞද්ධයාත්, බෞද්ධයාගේ ගම නත්, සමාජවාදයත් අවසාන බව හැම දෙනාම මතක තබා ගන්න ඕනෑ. අද රජයට පහර ගැසීමෙ න්‍යායෙන් විරුද්ධ පාර්ශ්වයෙ අනිකුත් පක්ෂත් එකතු කර ගෙන සිටිනව. නමුත් එසේ එක්සත් වී සිටින විරුද්ධ පාර්ශ්වයෙ ගරු මන්ත්‍රීන්ගෙ සැලකිල්ල යොමු කරවන්න කැමතියි, මෙම කාරණයට: කතෝලිකයන් නිශ්ශබ්දව සිටින අතර බෞද්ධයන් දෙකට කැඩීමට මේ අය ගන්න ව්‍යාපාරයෙ කෙළවර කුමක්ද යන්න ටිකක් පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ කියන එකයි, එම කාරණය. පළපුරුදු දේශපාලනඥයන් හුඟ දෙනෙක් සිටිනව, විරුද්ධ පාර්ශ්වයෙ. එම කාරණය ගැන කල්පනා කර බලන ලෙස මා මෙම අවස්ථාවෙදී ඒ අයගෙන් ඉල්ලා සිටිනව.

ප්‍රවෘත්ති පත්‍ර රජයේ සංස්ථාවකට ගැනීම සම්පූර්ණයෙන්ම නීති විරෝධියි කියා එක් ගරු මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා. මා දන්නෙ නැහැ, නීතිය පිළිබඳව, නීතිය පිළිබඳ දක්ෂතාවයක් මට නැහැ. නමුත් එක කාරණයක් දෙකක් කියන්න පුළුවනි. මේ රටේ නිදහස් පණතේ හැටියට ප්‍රවෘත්ති පත්‍ර ගන්න කෙසේවත් ඉඩක් නැති නම්, අනිකුත් ජනසතු ව්‍යාපාර කරගෙන යාමත් නීති විරෝධි වෙන්න ඕනෑ කියන එකයි, මගෙ කල්පනාව. ඒ විධියට බලනකොට, බස් ගැනීමත් නීති විරෝධියි; රක්ෂණ සමාගම් ගැනීමත් නීති විරෝධියි; පෙට්‍රල් සමාගම් ගැනීමත් නීති විරෝධියි. ඔය කියන එක ඇත්තක් නම්, එය එසේම වෙන්න ඕනෑ. ඒ ආකාරයට නම් කවදාවත් මේ රටේ ජනසතු ව්‍යාපාරයක් ඇති වෙන්න බැහැ. උන්නැහෙල බලයට පත් වුණොත් කියාවි, "මේ ඔක්කොම ජනසතු ව්‍යාපාර අසුවල් නීතියෙ හැටියට නීත්‍යානුකූල නැහැ; එම නිසා ඒව ආපසු දෙන්න ඕනෑ" කියා. එසේ කියන්න බැරිකමක් නැහැ, අර ප්‍රකාශයෙ ඇත්තක් තියෙනව නම්. මා දන්නෙ නැහැ, නීතිය ගැන. නමුත් එම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම නීත්‍යානුකූල ප්‍රකාශයක් නොවේය යන්නයි, මගෙ කල්පනාව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

මගෙ කතාව වැඩිය දික් කරන්න යන්නෙ නැහැ. නමුත් තව වචනයක් දෙකක් කියන්න ඕනෑ. බෞද්ධ භික්ෂූන්ට විරුද්ධව මේ රජය ක්‍රියා කරනවය කියන ප්‍රකාශය කෙරී තිබෙන නිසා එය සම්පූර්ණයෙන්ම වැරදි බව ප්‍රකාශ කිරීමටයි, මා තව වචන කීපයක් ප්‍රකාශ කරන්නෙ. බුද්ධාගමට නැතිනම් බෞද්ධ භික්ෂූන් වහන්සේලාට මේ රටේ තැනක් ලැබුණා නම් ලැබුණෙ 1956 න් පසුවය කියා මම නිර්භයව ප්‍රකාශ කරන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය තිබුණු කාලෙ දහම් පාසැල් පොතක් පවා සැපයුවෙ නැහැ. නමුත් මේ ආණ්ඩුවෙන් තමයි, දහම් පාසැල්වලට නොමිලයෙ පොත් දුන්නෙ. පණ්ඩිත උපාධි ලබා ගත් බෞද්ධ භික්ෂූන්ට ජ්‍යෙෂ්ඨ සමතුන්ට කරන සැලකිල්ලවත් එක්සත් ජාතික පක්ෂයෙ අය දක්වුවෙ නැහැ. ඒ අයට කිසිම පත්වීමක් දුන්නෙ නැහැ. පණ්ඩිත උපාධිය දරන අයට ඉස්සර වෙලාම උපාධිධාරීන්ට දෙන වැටුප අනුව පත් වීම් දුන්නෙ ආණ්ඩුවයි. අද විරුද්ධ පාර්ශ්වයෙ සිටියත් ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමාට (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) මා මෙම අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනව, එතුම එදා ඒ වෙනුවෙන් ගත් එඩිතර ක්‍රියා මාර්ගය ගැන. පිරිවෙන් අධ්‍යාපනයට පමණක් සීමා වී සිටි භික්ෂූන් වහන්සේලාට විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලබා දෙන්නට මේ ආණ්ඩුවට පුළුවන් වුණා, විද්‍යෝදය සහ විද්‍යාලංකාර විශ්ව විද්‍යාල බිහි කළාට පසුව.

සිංහල රජ දරුවන්ගෙ කාලයෙන් පසු කෙළින්ම වෙහෙර විහාර දාගැබ් යනාදියට රජයේ ආධාර දුන්නෙ 1956 න් පසුවයි. මගෙ ආසනයෙ වෙහෙර විහාරවලටත් ආධාර ලැබුණෙ 1956 න් පසුවයි. මගෙ ආසනයෙ ස්ථාන දෙකකට ආධාර ලැබුණ, 1960 න් පසු. 1815 න් පසුව රටේ මහජන මුදල්වලින් එවැනි කටයුතු සඳහා ආධාරයක් ලැබුණ නම් ලැබුණෙ 1956 න් පසුවයි. අද බුද්ධාගම ගැන බොහොම ලොකුවට කතා කරන අයට 1956 න් පෙර බෞද්ධ විහාරාරාමයකට මුදලක් දෙන්නවත්, බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය දියුණු කරන්නවත්, දහම් පාසැල් පොත් නොමිලයේ බෙදා දෙන්නවත්, පන්සල්වල පුස්තකාලවලට පොත් ටිකක් බෙදා දෙන්නවත් පුළුවන් වුණේ නැහැ. ශාසනාරක්ෂක මණ්ඩලයකට ආධාරයක් දෙන්න එදා ඒ අයට පුළුවන් වුණේ නැහැ. අද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ආධාරය අරගෙන බුද්ධාගම රකින්න මහන්සි ගන්න එක්සත් ජාතික පක්ෂයෙ අයගෙ පසුගිය ඉතිහාසය ගැන කල්පනා කළාම, ඉතා දුක් වන්න සිදු වෙනවාට කිසි අඩමානයක් නැහැ. එදා ආගමට සැලකුවේ ඉතාම දුර්වල තත්ත්වයකින්. අපේ ඇමතිවරුන් අද ආගමට නින්දා කරනවාය, භික්ෂූන් වහන්සේලාට නින්දා කරනවාය, බණිනවාය, කියා මේ ගරු සභාවේ කියවුණා. ඔව්, අපි දන්නව, එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායකයාට, හරකෙක් පුලුස්සා ගෙන කෑමේ පින්තූරයක් නිසා මේ රටේ බෞද්ධ ජනතාව විරුද්ධ වූ බව. එය ඒ උදවිය දන්නවා. ඒ හරකෙක් පිළිස්සීමේ පින්තූරය මේ රටේ හැම තැනම බොහොම ක්‍රියා කළා. ඒ උදවිය අදත් කල්පනා කරනවා, මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන් භික්ෂූන් වහන්සේලාට බැන්නා කියා පාවිච්චි කර ඒ මගින් බලයට පත් වන්නට බැරිකමක් නැහැ කියා. මගේ ඉදිරිපිට සිටින මේ ගරු ඇමතිතුමා (ගරු ටී. බී. ඉලංගරත්න) හෝ ආණ්ඩු පක්ෂයේ කිසිම ගරු ඇමතිවරයෙක් හෝ මන්ත්‍රීවරයෙක් භික්ෂූන් වහන්සේලාට නින්දා කරන අදහසින් කවදාවත් කථා කර නැත කියා මා මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනවා. මට එහෙම විශ්වාසයක් තිබෙනවා; මම එය දන්නවා. ගරු ඇමතිතුමා යම්කිසි ප්‍රකාශයක් කළාද නොකළාද කියා මා දන්නේ නැහැ. සමහර විට එතුමා කියන්න පුළුවන්, මේ ගරු මල්වත්තේ මහා නායක ස්වාමීන් වහන්සේ පුවත්පත් කොමිසමට දී තිබෙන ලියවිල්ල අනුව, ඒ කියන්නේ, එතුමා කෙලින්ම කියා තිබෙනවා මේ පුවත්පත් ජාති විරෝධියි, සංස්කෘති විරෝධියි, දූෂණවලින් පිරිලාය, මේවා විනාශ කරන්නට ඕනෑය, මේ විධියේ පාලනයක් ඇති කරන්න ඕනෑය, කියා. එහෙම ප්‍රකාශ කර තිබෙනවා නම්, අද එහෙම කරන්න එපා කියාත් කියනවා නම්, ඒ දෙකෙන් එකක් බොරු වන්නට ඕනෑ. එක්කෝ එදා කී ප්‍රකාශය බොරු; නැත්නම් පසුව කළ ප්‍රකාශය බොරු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ටී. බී. ඉලංගරත්න (අභ්‍යන්තර සහ බාහිර වෙළඳාම හා සැපයීම් කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ரீ. பி. இலங்கரத்ன—உள்நாட்டு, வெளிநாட்டு வியாபார, விநியோக அமைச்சர்)*

(The Hon. T. B. Ilangaratne—Minister of Internal and External, Trade and Supply)

On a point of personal explanation —[*Interruption*]

මේ සම්බන්ධව මගේ නම සඳහන් වී තිබෙන නිසා—

**ඒ. සී. එස්. හමීඩ් මයා.** (අකුරණ දෙවන මන්ත්‍රී)

*(ஜனாப் ஏ. ஸீ. எஸ். ஹமீத்—அக்குறணை இரண்டாம் அங்கத்தவர்)*

(Mr. A. C. S. Hameed—Second Akurana)

If the Hon. Minister is making a statement, it cannot be allowed.

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

I want to make a personal explanation because my name has been mentioned.

**හමීඩ් මයා.**

*(ஜனாப் ஹமீத்)*

(Mr. Hameed)

He cannot make a statement now. He can do so after the hon. Member has finished.

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

No. This is a personal explanation and my hon. Friend has given way.

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.** (බුලත්සිංහල)

*(திரு. எட்மன் சமரக்கொடி—புளத்சிங்ஹள)*

(Mr. Edmund Samarakkody—Bulathsinhala)

The hon. last speaker on his feet did not make any mention of the Hon. Minister for him to make a personal explanation. It is quite irrelevant.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**

*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*

(Mr. Deputy Chairman of Committees)

He did make a reference.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரீ. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

මා ප්‍රකාශ කළා ගරු ඇමතිතුමා මහා නායක හාමුදුරුවන්ට බැන්නා කියා ප්‍රකාශ වී තිබෙනවාය කියා.

**ගරු ඉලංගරත්න**

*(கௌரவ இலங்கரத்ன)*

(The Hon. Ilangaratne)

I want to certify that.

ගරු කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව නොයෙක් විවේචන මේ සභා ගර්භයේ ඇති වී තිබෙනව. නමුත් ඇත්ත ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ ඇත්ත ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. මේ පත්තර ගිහි පැවිදි බේදය ඇති කරන්නත්, විශේෂයෙන්ම මේ ඇමතිවරුන් කෙරෙහි සංඝයා වහන්සේලා කල කිරවන්නත් නොයෙක් අවස්ථා අරගෙන පාවිච්චි කර තිබෙනව. නමුත් මා කළ හැම කථාවකදීම විග්‍රහ කළේ මේකයි: අපේ ස්වාමීන් වහන්සේලා පුවත්පත් කොමිෂන් සභාව ඉදිරිපිට ප්‍රකාශ කර තිබෙනවා, මෙන්න මේ විධියේ ප්‍රකාශ පත්තරවල පළ වෙනවාය, ඒවා බෞද්ධ විරෝධිය කියා. මල්වත්තේ අමුණුගම විපස්සී මහා නායක ස්වාමීන් වහන්සේ සාක්ෂි දෙන අවස්ථාවේදී මෙහෙම ප්‍රකාශ කර තිබෙනවා :

> "පුවත් පත් වලින් සෑම විටම බෞද්ධ කටයුතු බෞද්ධ විහාරවලට අපහාස වන අන්දමේ පුවත් පළ කරනු ලැබේ. පන්සලක් ළඟ කෝලාහලයක් ඇති වුවත් ඒ පන්සල හා සම්බන්ධ එකක් හෝ පන්සලේ දායක මහතුන් සම්බන්ධ වූවක් ලෙස ප්‍රසිඛ කරනු ලැබේ. පල්ලියක් අසල හෝ පල්ලියක් සම්බන්ධව එයට දරුණු දෙයක් වුවද කිසි දිනක පළ කරනු නො ලැබේ."

මා මේ කියෙව්වේ ගරු අමුණුගම විපස්සී මහා නායක ස්වාමීන් වහන්සේ කොමිෂන් සභාව ඉදිරිපිට දුන් සාක්ෂියයි. මගේ කථාවලදී මම මෙය පෙන්නුවා. මගේ කථාවේදී පැහැදිලි කර පෙන්නුවා, මෙන්න මේ විධියට අපේ අමුණුගම විපස්සී මහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉලංගරත්න]

නායක ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කර තිබෙනවාය, ඒ වාගේම මේවා බෞද්ධ විරෝධී පුවත්පත් හැටියට කොමිෂන් සභාව නිගමනය කර තිබෙනවාය කියා.

"ලේක් හවුස් සහ ටයිම්ස් ඔෆ් සිලෝන් යන ආයතනවලට අයත් පුවත් පත් නිතරම බෞද්ධ විරෝධී හා ජාති විරෝධී ලෙස කටයුතු කර ගෙන යන බව අවුරුදු ගණනාවක් තිස්සේම වගකිවයුතු බෞද්ධ නායකයෝ කියා සිටියහ."

මේ විධියට මේ බෞද්ධ විරෝධී පුවත් පත් මේ වැඩ කරගෙන යනවාය කියා ප්‍රකාශ කර තිබෙනවා; සාක්ෂි දී තිබෙනවා. ඒ නිසා ඒ රැස්වීමේදී කියා සිටියේ බෞද්ධ විරෝධී පුවත්පත් වලට ඒ විදියටම බෞද්ධ විරෝධී කටයුතු කර ගෙන යෑමට ඉඩ දීම බෞද්ධ විරෝධී ක්‍රියාවක්ය කියායි. ඔපමණයි මා කියා හිටියේය.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
අබෞද්ධ ක්‍රියාවක්.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)
බෞද්ධ විරෝධී ක්‍රියාවක්.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
අබෞද්ධ ක්‍රියාවක්. ඒක ඊට වඩා සැරයි.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)
මම කීවෙ බෞද්ධ විරෝධී ක්‍රියාවක් කියායි. තමුන්නාන්සෙලා මොනවා කීවත් මට කමක් නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr T. B. M. Herath)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තව මිනිත්තු පහකින් මගේ කථාව අවසාන කරන්න බලාපොරොත්තු වෙනවා. මා මේ ගරු සභාවට පැහැදිලි කළේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාත්, ආණ්ඩුවත් අතර ගැටුමක් ඇති කරන්නට ප්‍රවෘත්ති පත්‍ර විශාල මහන්සියක් ගත්ත බවයි. ප්‍රවෘත්ති පත්‍ර බෞද්ධ විරෝධී බව පුවත්පත් කොමිෂන් සභාව පිළිගෙන තිබෙනවා. ප්‍රවෘත්ති පත්‍ර බෞද්ධ විරෝධී පමණක් නොව සමාජ විරෝධී බවත් අපට කියන්නට පුළුවන්. වැදගත් ප්‍රශ්නයක් පැනනැගුණු සෑම අවස්ථාවකදීම ප්‍රවෘත්ති පත්‍ර සමාජ විරෝධී විධියටයි, කටයුතු කළේ. බස් ජනසතු කරන අවස්ථාවේදී හෝ වේවා, තුඹුරු පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී හෝ වේවා, රක්ෂණ සංස්ථාව ඇති කරන අවස්ථාවේදී හෝ වේවා, තෙල් කොම්පැණි රජයට ගන්නා අවස්ථාවේදී හෝ වේවා සෑම සමාජවාදී පියවරක් ගන්න අවස්ථාවේදීම ප්‍රවෘත්ති පත්‍ර රටටත්, ජනතාවටත් ද්‍රෝහිව ක්‍රියා කළා. ඒ නිසා මේ ප්‍රවෘත්ති පත්‍ර බෞද්ධ විරෝධී බව මහා නායක ස්වාමීන් වහන්සේගේ වචන වලින් කියන අතරම සමාජ විරෝධී බවත් කියන්න කැමතියි. මේ බෞද්ධ විරෝධී පත්‍ර, සමාජ විරෝධී පත්‍ර රජයට ගන්න අවස්ථාවේදී යම් කෙනෙක් එයට විරුද්ධ වෙනව නම් ඒ අයටත් ඒ වචනවලින්ම සංග්‍රහ කරන්නට අපි කොහෙත්ම මැළි වන්නෙ නැහැ. ප්‍රවෘත්ති පත්‍ර බෞද්ධ විරෝධී නම් ප්‍රවෘත්ති පත්‍ර ආරක්ෂා කරන අයත් බෞද්ධ විරෝධියි. ප්‍රවෘත්ති පත්‍ර සමාජ විරෝධී නම් ප්‍රවෘත්ති පත්‍ර ආරක්ෂා කරන අයත් සමාජ විරෝධියි. එක්සත් ජාතික පක්ෂය සමාජ විරෝධී බව ඔප්පු කරන්නට අපට ඒ තරම් සාක්ෂි වුවමනා නැහැ. සමාජවාදී සෑම පියවරක් ගන්න අවස්ථාවේදීම එක්සත් ජාතික පක්ෂය ඊට විරුද්ධව ක්‍රියා කළා. ප්‍රවෘත්ති පත්‍ර බෞද්ධ විරෝධී වගේම එක්සත් ජාතික පක්ෂයත් බෞද්ධ විරෝධියි. ප්‍රවෘත්ති පත්‍ර සමාජ විරෝධී වගේම එක්සත් ජාතික පක්ෂයත් සමාජ විරෝධියි. එක්සත් ජාතික පක්ෂය බෞද්ධ විරෝධී බව මම ඔප්පු කළා. ඒ පක්ෂය බෞද්ධ විරෝධී නොවෙයි නම් මිහිඳු මහ රහතන් වහන්සේට අර වගේ නින්දාවක් කරද්දී නිදාගෙන සිටින්නෙ නැහැ. කරණීය මෙත්ත සූත්‍රය අතික් අතට විග්‍රහ කරල පළ කරද්දි නිදාගෙන සිටින්නෙ නැහැ. බෞද්ධ භික්ෂුවකට තැනක් නුදුන් එක්සත් ජාතික පක්ෂය බෞද්ධ විරෝධී බව කියන්නට මම මැළි වන්නෙ නැහැ. අනික් පක්ෂ ගැන යමක් කියන්න මම අදහස් කරන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මීරිගම මන්ත්‍රීතුමා (විජයබාහු විජයසිංහ මයා.) වැනි ධනපති කොවුලක් ධනපති වාදයට හේත්තු වීම ගැන අපි කොහෙත්ම පුදුම වන්නෙ නැහැ. එය මීට කලින් සිදු විය යුතුව තිබුණු දෙයක්. කවදා හෝ සිදු විය යුතු දෙයක් අද සිදු වුනේ. ඒ මන්ත්‍රීතුමාගෙ ක්‍රියාවෙ කිසිම වැරද්දක් නැහැ. ආණ්ඩුවට සහයෝගය දෙන්න සූදානමින් සිටින සමහර සමාජවාදී උදවියට එසේ සහයෝගය දෙන්න අපහසුවක් වී තිබෙනව, ධනපති කොවුල් ටිකක් ආණ්ඩු පක්ෂය ඇතුලේ සිටීම. ඒ ධනපති කොවුල් ටිකත් ඉවත් වෙනව නම් සම්පූර්ණයෙන්ම සමාජවාදී පක්ෂවලට එකතු වී මේ ආණ්ඩුව ඉදිරියට ගෙන යාමට පුළුවන් වෙනවාට කිසිම අනුමානයක් නැහැ. මේ විධියේ ගමන් ඔතනින් නොනවතින්නට පුළුවන්. ලේක්හවුස් එකේ සල්ලි තවත් තැන්වලට ගිහින් තියෙන්නට බැරි නැහැ. ඡන්දය විමසන අවස්ථාව වෙන විට තවත් වෙනස්වීම් ඇති වන්නට බැරි නැහැ. නිකවැරටියේ මන්ත්‍රීතුමා (කේ. හේරත් මයා.) ඒ ගැන කී නිසයි, මම කියන්නෙ. තවත් අය එනවය කියා ඒ මන්ත්‍රීතුමා කීව. මම ඒ ගැන දන්නෙ නැහැ. ඒ මන්ත්‍රීතුමාට නම් ඒ ගැන අවබෝධයක් තියෙනව. කෙසේ වුවත් මම එකක් කියන්නට කැමතියි. සමාජවාදී සංවර්ධනයක් ඇතිව, බෞද්ධ සංවර්ධනයක් ඇතිව ඉදිරියට යන මේ රජය කඩාකප්පල් කිරීමට කව්රුන් මොන විධියේ යටිකූට්ටු වැඩ කළත්, මොන විධියේ කුමන්ත්‍රණ කළත් සමාජවාදී ජනතාව නැවත වරක් ධනපති ආණ්ඩුවක් පිහිටුවීමට නම් කොහෙත්ම ඉඩ දෙන්නෙ නැහැ. එය කවදාවත් සිදු වන්නෙ නැති බව සථිර වශයෙන්ම ප්‍රකාශ කරමින් මේ රාජාසනයේ කථාවට ඉදිරිපත් කර තිබෙන ස්තුති යෝජනාවට අපගේ පක්ෂපාතිත්වය ප්‍රකාශ කරමින් මේ සමාජවාදී රජයේ ඉදිරි ගමන සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 3.46

**ඊ. විජේසූරිය මයා.** (මස්කෙළිය)

*(திரு. ஈ. விஜேசூரிய—மஸ்கெலிய)*

**(Mr. E. Wijesuriya—Maskeliya)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී දීර්ඝ කථාවක් කරන්නට මම බලාපොරොත්තු වන්නෙ නැහැ. මේ රාජාසනයේ කථාවට ඉදිරිපත් කර තිබෙන ස්තුති යෝජනාවට නිශ්ශබ්දව ඡන්දයක් දෙන්නට මට කොහෙත්ම පුළුවන්කමක් නැහැ.

ඒ නිසා වචන කීපයක් ප්‍රකාශ කිරීමට මම අදහස් කළා. රාජාසන කථාවේ මොනවා ගැබ් වී තිබෙතත්, මොනවා ලියා තිබෙතත්, මොනවා කියා තිබෙතත්, මෙහි තිබෙන්නේ පත්‍ර පණත ගැනය කියායි, මගේ ඒකාන්ත විශ්වාසය. අද අපි විවාද කරන්නේ මේ පාර්ලිමේන්තුවේ හය වන රාජාසන කථාවයි. හය වන රාජාසන කථාව ඇතිවීමට හේතුව කුමක්ද කියා අපි ටිකක් කල්පනා කර බලන්න ඕන. මේ පාර්ලිමේන්තුවේ කාල සීමාව පස්වන රාජාසන කථාවෙන් අවසන් වන්නයි තිබුණේ. නමුත් පත්‍ර පණත කාණු පල්ලේ යනවා දැක එය නැවතත් එළියට ගන්න හය වන රාජාසන කථාවක් ඉදිරිපත් කළා. 14 වන පත්‍ර පණතත් කාණු පල්ලේ යනවා පෙනෙන විට පාර්ලිමේන්තු සැසි වාරය කල් දැම්මා. ඒ නිසයි, මම හය නැතිව කියන්නේ, මේ රාජාසන කථාවේ පත්‍ර පණත මිස වෙන කිසිවක් නැත කියා.

මම පත්‍ර පණතට මුල සිටම විරුද්ධ වූ කෙනෙක්. 12 වන පණත ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම තුළ ඉදිරිපත් වූ අවස්ථාවේදී ගරු අගමැතිනිය ඉදිරියේදී මම ප්‍රකාශ කළා, පත්‍රයේ මොනවා කිව්වත් මේ රටේ ජනතාවට අත්‍යවශ්‍ය දේ අපි ඉටු කළොත් ඔවුන් නැවත වරක් අප බලයට පත් කරාවිය කියා. මගේ ඒ අදහස් අදත් අබ මල් රේණුවක තරම්වත් වෙනස් වී නැහැ. අද අපට පෙනෙනවා, ජීවන වියදම අහසට නැඟ තිබෙන බව. රැකී රක්ෂා ප්‍රශ්නය ඉතාමත්ම උග්‍රව පවතිනවා. ඒ විදියේ ඉතා උග්‍ර ප්‍රශ්න තිබියදී, ඒවා විසඳන්නේ නැතිව මේ පත්‍ර ගැනීමට යන්නේ මන්දැයි මට නම් තේරුම් ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේසූරිය මයා.]

අමාරුයි. මට නම් තේරුම් යන්නේ අපෙන් සිදු වූ අඩුපාඩුකම් වසා ගැනීම සඳහා පත්‍ර ගැනීමට යන බවයි.

මේ පාර්ලිමේන්තුවට අවුරුදු හතරහමාරක් වී තිබෙනවා. මැතිවරණයක් තැබීම සඳහා තව තිබෙන්නේ හය මාසයයි. මැතිවරණයට හය මාසයක් තියා ඇයි පත්‍ර ගැනීමට උත්සාහ කරන්නේ? අවුරුදු හතරහමාරක් පත්‍ර ගන්නේ නැතිව අපට කටයුතු කරගෙන යාමට පුළුවන් වුනා නම් මේ හය මාසයත් වැඩ කර අළුත් ආණ්ඩුවක් පිහිටු වීමේදී එවැන්නක් වුවමනා නම්, ඒ ගැන කල්පනා කරන්නයි, තිබුනේ. එසේ කරන්නේ නැතිව දැන් මේ පත්‍ර පනත ගෙනෙන්න යන්නේ අපේ තිබෙන අඩුපාඩුකම් වසාගෙන මැතිවරණයක් කරන්න බවයි, අපේ අදහස.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කවුද ඔය ගොන් කථාව කිව්වේ?

**විජේසූරිය මයා.**
*(திரு. விஜேசூரிய)*
(Mr. Wijesuriya)

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමා කරුණා කර නිශ්ශබ්දව සිටින්න. වුවමනා නම් මගේ කථාවට පසුව කියන්න තිබෙන දේ කියන්න. තමුන්නාන්සේ කථා කරන විට මම වචන මාත්‍රයකින්වත් තමුන්නාන්සේට අවහිර කළේ නැහැ. ඒ නිසා කරුණා කර මගේ අදහස් ප්‍රකාශ කිරීමට—මේ ගරු සභාවෙන් මට ලැබී ඇති වරප්‍රසාදය භුක්ති විඳීමට—මට ඉඩ දෙන්න. ඒ වරප්‍රසාදය නැති කිරීමට බදුල්ලේ මන්ත්‍රීවරයාට හෝ වෙන කිසිවකුට හෝ පුළුවන් කමක් නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමනි, මීට ප්‍රථමත් මම මේ ගරු සභාවේදී මගේ හෘද සාක්ෂියට එකඟව කටයුතු කර තිබෙනවා. විරුඬ පාර්ශ්වයේ නායකතුමා අල්ලස් ගැනීම ගැන වැරදිකරුවන් වූ අයට ඡන්ද බලය අහිමි කිරීම සඳහා ගෙනා යෝජනාවට මම මගේ හෘද සාක්ෂියට අනුව ඡන්දය දුන් බව තමුන්නාන්සේට මතක ඇති. අල්ලස් කොමිෂන් සභාව වරදකරුවන් යයි තීරණය කළ උදවියට දඬුවම් පැමිණ විය යුතුය කියා විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා විසින් ගෙනා යෝජනාවට මා එදා මගේ හෘදය සාක්ෂියට අනුව පක්ෂව ඡන්දය දුන්න බව මට භය නැතුව ප්‍රකාශ කරන්ට පුළුවන්. එදා ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී ගරු අගමැතිනිය ඉදිරියේදී මම කිව්ව, විරුද්ධ පක්ෂයෙ නායකතුමා හෝ වෙන යම්කිසිවෙක් හෝ හොඳ දෙයක් ඉදිරිපත් කළොත් මගේ සම්පූර්ණ සහයෝගය ඊට දෙනවා කියා. ඒ යෝජනාවට පක්ෂව මගේ ඡන්දය දෙන්ට ලැබීම ගැන මා ආඩම්බර වෙනව. එපමණක් නොවෙයි හිටපු කථානායකතුමාට විරුද්ධව ගෙනාව විශ්වාස භංග යෝජනාවටත් පක්ෂව මගේ ඡන්දය දුන්න බව ප්‍රකාශ කරන්ට කැමතියි. අදත් අපේ ගරු අගමැතිනිය ප්‍රකාශ කළා,—

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

ලජ්ජ නැති අයට මොනව කරන්ට බැරිද?

**විජේසූරිය මයා.**
*(திரு. விஜேசூரிய)*
(Mr. Wijesuriya)

—එතුමිය තමාගේ හෘදය සාක්ෂියට අනුවය ක්‍රියා කරන්නෙ කියා. (බාධා කිරීමක්) මමත් සැම වෙලාවෙම මගේ හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කළා. ඉදිරියටත් එසේ ක්‍රියා කරනවා.

අනික් කාරණය මගේ කොට්ඨාශයේ ඡන්දදායක දායිකාවන් ප්‍රජාතන්ත්‍රවාදයටත් ඒ වගේම නිදහස් ඡන්දයටත් ඉතාමත් ගරු කරන කොටසක් බව මේ සභාවෙදි කියන්ට ඕනෑ. ඒ නිසා ඒ නිදහස් ඡන්දයත් ප්‍රජාතන්ත්‍රවාදයත් ආරක්ෂා කිරීමට යම් දෙයක් මට කරන්ට පුළුවන් නම්, මම සැම වෙලාවෙදීම එය කරන්ට ඉදිරිපත් වෙනව. [බාධා කිරීමක්] මගේ හිතේ ලොකු බියක් තිබෙනව—[බාධා කිරීමක්] කරුණා කරල අහගෙන ඉන්න. පත්‍ර අරගෙන ප්‍රජාතන්ත්‍රවායටත් නිදහස් ඡන්දයටත් පයින් ගසා ආඥාදායක ඒකාධිපති ආණ්ඩුවක් ගෙන යන්නට ආණ්ඩුව අදහස් කරනවා කියා. එය මගේ ඒකාන්ත විශ්වාසයයි. ඒ නිසා මට කොහෙත්ම පුළුවන්කමක් නැහැ, නිශ්ශබ්දව සිටින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නටවත්, ඊට පක්ෂව ඡන්දය දෙන්ටවත්. ඒ නිසයි, මා අදහස් කළේ වචන සවල්පයක් කථා කරන්ට.

**බණ්ඩාර මයා.**
*(திரு. பண்டார)*
(Mr. Bandara)

නව පත්‍ර පනත ආවෙ නැහැ.

**විජේසූරිය මයා.**
*(திரு. விஜேசூரிய)*
(Mr. Wijesuriya)

බදුල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙන් (බී. එච්. බණ්ඩාර මයා.) උපදෙස් ලබාගෙන නොවෙයි මම මෙතෙක් කල් ක්‍රියා කළේ. [බාධා කිරීමක්] මගේ හෘදය සාක්ෂියට අනුව මම එදත් අදත් ක්‍රියා කළා කියා මේ ගරු සභාවේදී ප්‍රකාශ කරනව.

**රෝයි රාජපක්ෂ මයා.** (හක්මන)
*(திரு. ரோய் ராஜபக்ஸ—ஹக்மனை)*
(Mr. Roy Rajapakse—Hakmana)

ඔහේල යන එකමයි, හොඳ. යූ. එන්. පී. අදහස් තියෙන උදවිය.

**විජේසූරිය මයා.**
*(திரு. விஜேசூரிய)*
(Mr. Wijesuriya)

මම මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්ට යන්නෙ නැහැ. මා කලින් කීවා වගේ, මේ රාජාසන කථාවේ වෙන යම්කිසි දෙයක් නොවෙයි තිබෙන්නෙ, පත්‍ර පනතයි. මේ පත්‍ර පනතට විරුද්ධව, මේ රාජාසන කථාවට විරුද්ධව, මගේ ඡන්දය පාවිච්චි කරන බව මම මේ ගරු සභාවෙදි ප්‍රකාශ කරන්ට කැමතියි. [බාධා කිරීමක්] මේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කරනව, මාස ගණනක සිට දන්නවා කියා. නැවත වතාවක් මේ පනතට විරුද්ධව මා ඡන්දය දෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව නවත්වනව.

අ. භා. 3.58

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

Mr. Deputy Chairman, at a time when hon. Members of the Government Party are deserting their ranks speaking against their own Government using very convincing arguments, it is hardly necessary for us from this side to speak at length. Nevertheless it is necessary to make some relevant observations on behalf of my party on this occasion.

The hon. Member for Moratuwa (Mr. Meryl Fernando) moved his Amendment and it was duly seconded. You are aware that my party from the very outset had taken a very categorical position in relation to this Government. When the Coalition Government was formed we had no hesitation in this House and outside to tell the people of this country what we thought about this Coalition Government. We stated to the country that the character of the Sri Lanka Freedom Party which we had earlier characterized as a *bourgeois* capitalist party, could not change and had not changed. We also stated that the policies of the new Government, or the Coalition Government, would be the continuation of the policies of the Sri Lanka Freedom Party Government.

What we stated on that occasion would perhaps not have been clear to most people. On that occasion a large section of the working class of this country and others, people who knew us individually and personally, shook their heads and told us, "Do you think you are right ? Is it the correct step to take ? Is it not possible for this Government now with a section of your former party within their ranks, if not to achieve socialism, to be able to, at least, push the Government in that direction ? " Those were the sentiments expressed by most people at that time.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please ! The Sitting is suspended till 4.30 p.m. On resumption Mr. Speaker will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி.ப. 4.30 வரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. சபாநாயகர் அவர்கள் [கௌரவ ஹியூ பெர்ணண்டோ] தலைமை தாங்கினார்கள்.*

*Sitting accordingly suspended till 4.30 p.m. and then resumed,* MR. SPEAKER [THE HON. HUGH FERNANDO] *in the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.**
*(திரு. எட்மன் சமரக்கொடி)*
(Mr. Edmund Samarakkody)

Mr. Speaker, you are aware that as a result of the party leaders' meeting and our decision to cut down the time that is to be allotted to speakers, I have to confine myself to the time allotted to me. I do not propose therefore to take more time than is necessary. In the circumstances, I am compelled to summarize what I have to say.

I had stated before the suspension for tea that there were hopes and expectations from this Government. By and large, apart from the question of fundamentals, the supporters of the Government and those who felt that they might try out this Coalition thought that, step by step, however slowly, there will be some progress made in the correct direction. That was the position.

You are aware that in relation to the pressing problems of the people which have been mentioned over and over again by hon. Members in this House, the problems of the working class would be solved. It is not necessary for me to dwell at length on this, but over the last several years there has been a state of expectation that tomorrow or the day after something will happen. When the Coalition Government was formed the expectation of the working class was that if not the 21 demands, at least a few of these demands would be granted. But what has happened today? The elementary right to form a union is the subject matter of struggle. Apart from the question of demands which have been for long overdue, the elementary right of workers to form a union is now in question; workers cannot decide to enforce the right they thought they had. They find themselves up against the Government and the police of the Government. I do not need to go into details. We all know what is happening in the case of one strike, the one at Velona.

Then, with regard to the other matters pertaining to the working class, we know how hon. Members who joined the Government from my party to form the Coalition, far from having any consciousness of what they stood for these last thirty years, have been the foremost in every attempt to thwart the efforts of the workers from winning their pressing demands. I do not want to dwell on that matter. So much so, not only have they blocked the path of the working class, but they have also sown confusion among the working class. Fortunately, they are not in control of the working class movement of this country. To the extent that they have been able to influence the workers they have been successful in bringing about confusion.

With regard to the peasants, yes, I come from an area where there are peasants, poor smallholders, it is not necessary for me to speak at length on that matter. There is nobody in this country who expects the situation to change overnight or within the next six months. But could this Government say that there has been a measure of progress with regard to the poor peasantry! In whatever direction you move, with regard to whatever problems they have, it is a question of the problems becoming worse and worse, and more and more complicated. I do not know how the people in the rural areas could live. It is a surprize that they are existing.

Then, with regard to the daily necessities of life too, nobody expected things to fall from the skies. But the Government talked of reducing the cost of living, of bringing down the prices of impotred goods, and so on and so forth. What is the use of making a long speech on that matter? Today, the situation is much worse than it was a couple of months ago.

Then, in this situation one would expect the Government to be in a state of crisis. A state of crisis is not altogether surprising or altogether a situation from which one must run away. Governments face crises, but the question is in what direction do

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

you propose to solve that crisis ? As we expected, this Government has decided to get over the crisis in regard to the economic and financial situation by moving, not to the left, but to the right. It has been a tradition with all *bourgeois* Governments that they have resorted to the usual tricks to deceive the people whenever they could not face the people or solve their pressing problems. They try to cloud the issue by bringing up questions of religion, communalism, and so on.

One would have thought that the influence of certain people, who were members of a party that stood for minority rights, that stood for the rights of oppressed sections and various racial groupings, that stood for the religious freedom of all religious groups in this country, that stood for secular governments, would have been nothing but good on the Government which they joined. But what has happened ? We told this House and the country that these people had given up what they stood for. We have seen how, far from pressurizing the Government and moving in the correct direction, they have been pressurized themselves into giving up what little principle they had. They said that they wanted to join the Government to save the country from reaction and from the U. N. P. Members of the U.N.P. and I are personal friends, but as a party I consider them as our class enemy. My erstwhile colleagues told the country that they wanted to save the country from the U.N.P. and the forces of reaction. I ask them whether they can say that now.

One could expect a Government to yield to pressure when it comes from the correct direction. That is how Governments should function ; they must yield to pressure from the correct direction. If they yielded to the pressure of the working class, if, in case they were unable to grant the 21 demands they made some concessions to the working class, one could have said that they were moving in the correct direction. If, in order to give a measure of relief to the minorities of this country, the Government took steps to solve the long-standing problems of the Tamils and other minority groups, if the Government was able to bring about a certain amount of communal harmony by granting some concessions, then one could say that the Government was yielding to pressure from the correct direction.

What do we actually find ? Do we find that concessions have been made on those grounds ? Do we find that the Government has yielded to pressures from the correct direction ? No. On the contrary, we have seen that the Government is not amenable to any pressures from the working class. They have built a high wall between themselves and the forces that are capable of pushing this country along the path of progress. They have been pressurized in the wrong direction ; they have reacted to certain other pressures. They told the country and the people, " Do not worry ; step by step, if not at once, we will strike at the capitalist class ". They also told the peasants and the workers, " We will obtain revenue from the tax on tea estates ; we will obtain revenue by taxing the great house owners. " These were their proposals. What has happened to these proposals ? Please tell us and the country. Is it not true that you have withdrawn these proposals as a result of various pressures brought to bear on you ?

You gave the small man certain hopes. You made certain promises. You promised to lower prices. You told the poor man, " You are also a human being with the same rights as the rich. You have the right to drink. If you want to drink, we will give you the right to tap for toddy."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.]

Let us not discuss the *pros* and *cons* of taking alcohol. You in your wisdom, you, your party, made a decision. It may be convenient for certain people who are pursuing certain political manoeuvres and who are conducting certain campaigns to refer to a section of your party. You are a Government and we have to ask you to answer as a Government.

Both sections of the Government, the Prime Minister included, made a decision with regard to issuing licences for tapping toddy. You said from your platforms that this is the way to fight the *kasippu* menace. There may be disagreements on this matter, but on behalf of my party we told you that it is correct, go ahead and permit tapping. That was what the small man expected. You said from house tops, "Whatever the forces of opposition, we will not bend". But what have you done? You postponed it from day to day, month to month, when the forces of reaction started to move under cover of religion, under cover of safeguarding Buddhism. We know how dark forces always use slogans of religion—our country, our religion, our race. Those are the classic slogans of those who are moving under cover of reaction. You have yielded to those forces and you have abandoned the proposal about toddy. You are bending to pressure. Your Prime Minister has said in so many words, "I am yielding, I am withdrawing this proposal at the request of the *Maha Sangha*".

I ask you, hon. Members of this House, what exactly that means. It is not worshipping at the feet of the Lord Buddha. When the Hon. Finance Minister and other co-leaders went with a *mal wattiya* to the Temple of the Tooth Relic, do not think that they worshipped at the feet of the Buddha. They worshipped at the feet of the dark forces that want to kill and destroy the social unity of this country. That is what you have done; you are yielding to the so-called request of the *Sangha;* you are yielding to the laws of the darkest forces in this country.

One step leads to another. You say you are fighting forces of reaction. The reactionaries say "make Buddhism the State religion". You say, "Do not fear, we have always been for religion; look, who can say we are against Buddhism? Look, we want to bring legislation to give Buddhism its rightful place". Look at the consequences of that act. I am not going to debate it as hon. Members of other parties have done.

Here is an amendment of this nature placed for the first time in an Order Paper of this honourable House. One amendment on the Order Paper states as follows:

> "that Buddhism be given its rightful place by adoption of the following measures:—
>
> (*a*) making Buddhism the state religion;
>
> (*b*) declaring Sunday to be a working day and declaring all four poya days to be holidays instead;
>
> (*c*) legislating that the Governor-General, Prime Minister, Cabinet Ministers, Heads of Departments, Staff Officers, Officers of the Armed Forces and Heads of Schools should be Buddhists;
>
> (*d*) legislating for complete prohibition;
>
> (*e*) legislating that Buddha Dhamma should be taught in schools only by the Maha Sanga;
>
> (*f*) maintaining all places of worship . . . . ."

Do you think the forces who want this type of thing are anxious to safeguard religion? Buddhism or any other religion need no legislation to safeguard it. Only its inherent force can keep any doctrine alive.

The Marxist movement has gone underground. Parties of the working class and the revolutionary movement were illegalized. It is anathema to

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the *bourgeois* Government. But Marxism will survive, and it survives today. Several great countries of the world are socialist today. So, do not think that you are protecting your religion. You are doing the greatest harm to your own religion, by opening the doors of reaction. This is the result of your giving in to pressures from the wrong direction. This is only the beginning of communalism. When elections are drawing nigh you cannot talk on the unemployment problem, how to solve it and so on. This is the normal slogan of the *bourgeois* Government. You cannot solve the unemployment problem and therefore you must chase the plantation workers, the Indian workers, the stateless persons. Your Prime Minister waited till six months before the elections and went to India, and in a conspiracy with Shastri, the Prime Minister of India, the *bourgeois* Prime Minister, agreed to a horse deal behind the backs of the people of this country who have a right to remain in this country. Under this agreement the Government of India has agreed to take back 525,000 people from this country, whether they like it or not. That is the announcement you have made, and what is the result ? In the same amendment it is stated that 16 lakhs of plantation workers should be repatriated. When you grant one concession you open the flood gates.

You have not taken the slightest step to grant the rights of the Tamil people, their language rights and so on. For a couple of months even the Federal Party was silent ; they thought that something good might come out of the Coalition but they too were deceived. When today the occasion for an election is drawing nigh, and when the forces of reaction are raising their voice, you react to those forces. And in what way ? You implement the language policy in the most devastating manner, destroying whatever good feeling there was between the Tamils and the Tamil and the Sinhalese.

Sir, I have not the time to say much more.—[*Interruption*] I will not take much time of the House but in this situation I say that so far as my party is concerned there is no question about our position. We have absolutely agreed to oppose this Government and tell the people of this country not to tolerate this *bourgeois* Government. This Government is opening the doors of reaction, and let the people be convinced today, if not from our mouths, from the actions and speeches and resignations from Government side. Let them be convinced in that way. The time has come for the hon. Members of the Government to realize—better late than never—that they must make the decision to get out of the Government.

I say that in this situation, which has been created by the Press Bill, those who are against the press takeover quite rightly—have weakened their case by linking their struggle with their fight against Marxism, the theory of Marxism, and socialism in this country. They have only deceived themselves by this in their fight against the press take-over. The workers and poor people of this country may not know what Marxist theory is, but, by and large, they are convinced that Marvism is something that will do them good. In that situation I warn the working class from the Floor of this House that they must now intervene and that they cannot be silent ; they must intervene, otherwise these dark forces of reaction let loose by this Government, in combination with this Government, will triumph. I am convinced that if the working class intervenes that will not happen.

So far as my party is concerned, we will fight reaction from whatever quarter it comes. That is all I have to say on behalf of my party. I do not propose to speak any further and I commend by amendment to those in the Government party and ask them even at this late hour to make their decision to get out and to be with the people.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ද සිල්වා මයා.** (බලපිටිය)
*(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. Lakshman de Silva—Balapitiya)
ගරු කථානායකතුමනි,

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
කරුණා කර නිශ්ශබ්ද වන්න. අද කථා කරන ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවට බලපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ නම ඇතුළත් වී නැහැ. වෙනත් ගරු මන්ත්‍රීවරයකුගේ කාලයෙන් කොටසක් බලපිටියේ ගරු මන්ත්‍රීතුමාට දෙන්නට කැමති වෙනවා නම්, ඒ ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න පුළුවනි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)
මට වෙන් කර ඇති කාලයෙන් විනාඩි 5 ක් දෙන්නට කැමතියි.

අ. භා. 4.50

**ලක්ෂ්මන් ද සිල්වා මයා.**
*(திரு. லக்ஷ்மன் டி சில்வா)*
(Mr. Lakshman de Silva)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ඉතිහාසයේ මෙතෙක් කවරදාකවත් නොවූ අන්දමට හා නොකර ඇති අන්දමට මේ වර 6 වැනි වතාවටත් රාජාසන කථාවක් පැවැත්වීමෙන් අතුරු සම්ප්‍රදායක් ගොඩ නගා තිබෙන බව මුලින්ම ප්‍රකාශ කරන්නට කැමතියි. මේ අවස්ථාවේදී බෞද්ධයකු හැටියට බෞද්ධ ප්‍රතිපත්ති අනුව හිතට එකඟව ක්‍රියා කරන්නට මට සිදු වී තිබෙනවා. මට පාඨශාලාවේදී ඉගැන්වූ ස්වාමීන් වහන්සේලා ප්‍රකාශ කර ඇති කරුණු අනුව කල්පනා කර බලන විට, මේ රාජාසන කථාව ඉදිරිපත් කර තිබෙන්නේ අවංක ප්‍රතිපත්තියක් උඩ නොවන බව, හිතුවක්කාර ප්‍රතිපත්තියක් උඩ බව, මට පෙනී යනවා. මේ රාජාසන කථාවේ පරමාර්ථය මොකක්ද කියන එක මේ රටේ බෞද්ධ ජනතාවට හොඳ හැටි පෙනී යනවා. මේ රාජාසන කථාව ඉදිරිපත් කර තිබෙන්නේ හොඳ පරමාර්ථයකින් නොවෙයි. හොඳ චේතනාවකින් නොවෙයි. මේ රාජාසන කථාව අනුව මේ රජය ගමන් කරන අත හොඳ හැටි පෙනී යනවා. කාලය නැති නිසා මේ ගැන විස්තර වශයෙන් කියන්නට විධියක් නැහැ. පලිගැනීමේ චේතනාවක් ඇතිව, ඒකාධිපති ආණ්ඩුවක් පිහිටුවීමේ බලාපොරොත්තුවක් ඇතිව, ආණ්ඩුව කටයුතු කරන බව මේ රාජාසන කථාව නිසා අපට පෙනී යනවා. එම නිසා මේ අවස්ථාවේදී බෞද්ධයකු හැටියට මගේ ඡන්දය හිතට එකඟව පාවිච්චි කරන්නට සිදු වී තිබෙනවා.

බලපිටි ජනතාව මා මේ ගරු සභාවට පත් කර එව්වේ හොරකම් කිරීමට හෝ අල්ලස් ගැනීමට හෝ කපටිකම් කිරීමට හෝ නොව අවංකව වැඩ කිරීමටයි. ඒ බලපිටි ජනතාවගේ අවංක භාවය නියම අන්දමින් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන බව බලපිටි කොල්ලකු වශයෙන් ප්‍රකාශ කරන්න කැමතියි. මගේ ඡන්දය නියම අන්දමට පාවිච්චි කරන බව ප්‍රීතියෙන් ප්‍රකාශ කරනවා. කවුරුන් මොනවා කිව්වත්, මගේ හිතට එකඟව මිස වෙනත් පිළිවෙළකට මා වැඩ කරන්නේ නැහැ.

මේ ආණ්ඩුවේ තව දුරටත් රැඳී සිටිය හොත් පඤ්චානන්තරිය කර්මයට මා අසු වෙනවා. බුදුරජාණන් වහන්සේගේ ලේ හෙලවීම, රහතන් වහන්සේගේ ලේ සෙලවීම, සංඝයා භේද කිරීම, මව්පියන් මැරීම පඤ්චානන්තරිය කර්මයයි. නාලන්දා මහා විද්‍යාලයේදී හීනටියන ගරු ධම්මාලෝක නායක ස්වාමින් වහන්සේගෙන් ඉගෙන ගත් කෙනකු හැටියටත්, එතුමා මට ඉගැන්වූ ධර්මයේ හැටියටත් මේ පව් පහෙන් එකකට අසු වුණොත් නරකයට යන බව දන්නවා. මා මේ ආණ්ඩුවේ තව දුරටත් රැඳී සිටියහොත් පඤ්චානන්තරිය කර්මයෙන් එකකට අහු වෙනවා. අද මේ ආණ්ඩුව සංඝයා භේද කරගෙන යනවා. සංඝයා භේද කිරීම මට නම් උහුලා ගන්න බැහැ.

මා නම් බෞද්ධ ප්‍රතිපත්ති අනුව මිස ඊට වෙනස්ව කවදාවත් කටයුතු කරන්නේ නැහැ. මා මේ දක්වා මත්පැන් පාවිච්චි කර නැහැ. මා පස් පවින් වැළකී සිටින කෙනෙක්. නමුත් මේ ස්ථානයේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා රා යෝජනාවට පක්ෂව කථා කළා. එසේ කථා කළේ මා නියෝජනය කරන ප්‍රදේශයේ දුප්පත් ජනතාවට එයින් ප්‍රයෝජනයක් වෙනවා ඇත කියන අදහස අනුවයි. අපේ ලොකුවට බෙරලියන්තු මොල තිබෙන ආචාර්ය එන්. එම්. පෙරේරා මුදල් ඇමතිතුමා රා පනතක් ඉදිරිපත් කළ බව කවුරුත් දන්නවා ඇති. මා බෞද්ධයකු වුවත් ඒ කාරණය නිසා මගේ පිරිසිදු ඡන්දය මගේ හිතට එකඟව එදා මේ පාර්ලිමේන්තුවේදී ඒ පණත ක්‍රියාත්මක කිරීමට දුන්නා. ඊට පස්සෙ අපේ කුණ්ඩසාලෙ ගරු මන්ත්‍රීතුමා (යූ. පී. වයි. ජිනදාස මයා.) ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම වෙත ඒ සම්බන්ධයෙන් යෝජනාවක් ගෙන ඒම ගැන මා සන්තෝෂ වෙනව.

කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ වෙනුවෙන් වෙන් කර තිබෙන වේලාවෙන් මට තවත් ටික වේලාවක් දෙන ලෙස මා තමුන්නාන්සේගෙන් ඉතා ගෞරවයෙන් සහ ආදරයෙන් ඉල්ලා සිටිනවා. මගේ ඉල්ලීමට ඉඩ දීම ගැන මා එතුමාට ඉතාම කෘතඥ වෙනවා. කුණ්ඩසාලේ ගරු මන්ත්‍රීතුමා ඉන්නෙ මගෙ දකුණු අත පැත්තෙන්. එදා එතුමා ආණ්ඩුවට ඉදිරිපත් කළ ඒ යෝජනාව ස්ථිර කළේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් සහ කොලොන්නාවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩී. එස්. සමරසිංහ මහතා විසිනුයි. මගේ මතකයේ හැටියට නම් එදා ආණ්ඩු පක්ෂයට මේ රා පනත අස්කරන්නෙයි කියා ඡන්දය දුන්නෙ ගරු මන්ත්‍රීවරුන් දෙන්නයි නැත්නම් තුන් දෙනයි. එදා දෙහිවල-ගල්කිස්ස කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරයා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) මහ ලොකුවට කෑ ගැහුවා. කෑ ගහල කිව්ව එහෙම නම් එන්. එම්. පෙරේරා සහෝදරයා අස්වෙන්න ඕනෑ කියල. එදා උන්නැහේ ආණ්ඩු පක්ෂයෙදි කිව්වෙ එහෙමයි. අද උන්නැහෙල නිහඬව ඉන්නෙ මොකද? රා පනත අස් කළාට පස්සෙ මොකද දුන් උන්නැහෙලගෙ කටවල් වැහිලද? අද උන්නැහෙලගෙ යතුරෙන් උන්නැහෙලගෙ කටවල් වැහිලද කියන එක මට නම් තේරෙන්නෙ නැහැ. කොහොම උනත් අද උන්නැහෙල නිශ්ශබ්දව ඉන්නව.

අපි ඔක්කොම නිදා ගෙන සිටියදී ගරු අගමැතිනිය කැබිනට් මණ්ඩලයෙ රැස්වීම කදි ඒ ගැන තීරණය කරල රා පනත පත්තරෙනුයි අහෝසි කළේ. පාර්ලිමේන්තුවට ඒ පනත ඉදිරිපත් කර අපේ ඡන්දය විමසුවෙවත්, පාර්ලිමේන්තු කණ්ඩායමේ සාකච්ඡාවක් ඇති කර අදහස් විමසුවෙවත් නැතුවයි රා පනත අස් කළේ. ඒ නිසා තව දුරටත් එවැනි විශ්වාසයක් මේ අගමැතිනිය කෙරෙහිවත්, මේ කැබිනට් මණ්ඩලය කෙරෙහිවත්, බලපිටියෙ කොල්ලෙක් හැටියට මා තුළ තිබෙන්න ඉඩක් නැහැ. ඒ නිසා මට තව දුරටත් මේ ආණ්ඩුවේ රැදී ඉන්න—රඳා හිටින්න—බැහැ. මන්ත්‍රීවරුන් හැටියට මහජනයා විසිනුයි අප මේ පාර්ලිමේන්තුවට එවා තිබෙන්නෙ. කැබිනට් මණ්ඩලයෙ ඉන්න ඇමතිවරු වගේ රූකඩ බවට පත් වෙන්න අපිට බැහැ. මා නියෝජනය කරන බලපිටිය කොට්ඨාශය රූකඩ නැටුම්වලටත් බොහොම ලොකු ප්‍රසිද්ධියක් උසුලනවා තමයි. අපේ ගමේ රූකඩවලට මුළු ලංකාවෙම ප්‍රසිද්ධියක් උසුලන, රත්රන් පදක්කම්—ගෝල්ඩ් මෙඩල්—පවා ලබාගෙන සිටින පොඩි සිරිනා මහත්මයත් ඉන්නෙ අපේ ගෙදර ඉස්සරහමයි. උන්නැහෙට හොඳ රූකඩ කණ්ඩායමක් තිබෙනව. උන්නැහෙගෙ රූකඩ කූට්ටම කා අතරත් ප්‍රසිද්ධයි. ඒකට නූල් දමල තියෙනව. එක නූලක් ඇද්දම රූකඩය නටනව. අනෙක් නූල ඇද්දම අතක් උස්සනව. තවත් නූලක් ඇද්දම අනෙක් අතත් උස්සනව. වෙනත් නූලක් ඇද්දම ඒ අත පහත දමනව. ඔය විධියටයි අපේ කැබිනට් මණ්ඩලයත් වැඩ කරන්නෙ. බලපිටියෙ කොල්ලකු හැටියට මට නම් ඒ නූල අදින හැටියට මගේ අත උස්සන්න පුළුවන්කමක් නැති බව මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට ගෞරවයෙන් සහ අවංකව ප්‍රකාශ කරන්න කැමතියි.

අප මේ යෝජනාවට විරුද්ධව ඡන්දය දෙන්නෙ රුපියල් 50,000 ක් පගාව අරන්ය යනාදි වශයෙන් ඇතැම් අය අපට නොයෙක් විධියට නිග්‍රහ කර තිබෙනව. මගේ හිතවත් මිත්‍රයෙකු වන මීරිගම ගරු මන්ත්‍රීවර විජයබාහු විජයසිංහ මහත්මයාටත් අපහස වන අන්දමට ප්‍රකාශ කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්‍ෂමන් ද සිල්වා මයා.]

තිබෙන බව මට දැන ගන්න ලැබුණා. මම අභියෝග කරනව මේ පාර්ලිමේන්තු මන්දිරය ඇතුලේ සිටගෙන ඔය කියන කතාව පුළුවන් නම් ඔප්පු කරන්නෙයි කියල. එවැනි චෝදනාවක් අප වෙත එල්ල කරනව නම් එය ඔප්පු කරන්න කතරගම දෙවියන්ටවත් පුළුවන් කමක් නැති බවත්, අපේ අවංකකම ගැන ඒ විධියට යමක් ඉදිරිපත් කර ඔප්පු කරන්න බැරි බවට මම අභියෝග කරනවා. මේ කථා කරන ලක්ෂ්මන් ද සිල්වා පගා වක් අරගෙන කථා කරනවය කියල ඔප්පු කරන ලෙස මම කතරගම දෙවියන්ට අභියෝග කරනව. මගේ පිරිසිදුකම නිසා මා දෙවියෝ පවා රක්‍ෂා කරන බව මම නිර්භීතව තමුන්නාන්සේ ලාට ඉතාම අවංකව ප්‍රකාශ කරනවා. මෙවැනි දේවලට විරුද්ධව මහජන මන්ත්‍රි වරුන්ගෙ ඡන්ද දුන්නොත් පමණයි මර්දනය කර ගන්න පුළුවන්කම තිබෙන්නෙ. මුදල්වලට තිබෙන කෑදර කමට මන්ත්‍රිකම ආරක්‍ෂා කර ගන්න, ඇමතිකම් ආරක්‍ෂා කර ගන්න, අගමැති කම් ආරක්‍ෂා කර ගන්න, ජනතාව පාවා දෙන්න පුළුවන්කමක් අපට නැති බවත් වුවමනාවක් අපට නැති බවත් මම කිය නවා. අද රජය අවංකව කටයුතු කරනවා නම්, අවංකව මේ රට පාලනය කරනවා නම්, දැන් ඉතින් කළ යුතුව තිබෙන්නෙ අදම මේ පාර්ලිමේන්තුව විසුරුවා හැර මහජන ඡන්දය ලබා ගන්න රට ඉදිරිපිටට යන එකයි. ඒක කරන්න ඕනෑ. මට බොහොම කනගාටුයි අද මෙතනම ඉඳගෙන මෙහෙම කියන්න සිදු වීම ගැන. එහෙත් මම ප්‍රීති වෙනවා, මගේ මරණ මොහොතෙදිවත් දැන් මා කරන මේ කථාව බලා මට සන්තෝෂ වීමට ඉඩක් ලැබීම ගැන. දැන් ඉතින් මගෙ මරණ මොහො තෙදිවත් මගෙ කථාව බලා මට සන්තෝෂ වෙන්න පුළුවනි. මට මේ අවස්ථාවේ කථාවක් කිරීමට වුවමනා කාලය තමන් වෙනුවෙන් වෙන් කරන ලද කාලයෙන් ලබා දීම ගැන බලපිටියෙ ජනතාවගෙන් මගෙත් නොමසුරු ස්තුතිය කොට්ටාවේ ගරු මන්ත්‍රිතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) වෙත ඉතා ආදරයෙන් පුද කරමින්, ඊට ඉඩ දීම ගැන ගරු කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව ඉවර කරනව.

අ. භා. 5

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, රජය පැත්තේ මෙතෙක් කාලයක් සිටි ඇතැම් මන්ත්‍රි තුමන්ලා එඩිතර අවංක කථා කිපයක් පවත්වා මේ රජය හෙළා දකිමින් රාජාසන කථාවට විරුද්ධව ඡන්දය දීමට ඉදිරිපත් වීම ගැන මම ඒ මන්ත්‍රිතුමන්ලාට පළමු කොටම ස්තුති කරනවා. මේ ගරු සභාවට හයවැනි රාජාසන කථාවක් ඉදිරිපත් කළ පළමුවෙනි අවස්ථාවයි මේ. අගමැතිනිය ඡන්ද බලයෙන් ආ කෙනෙක් නොවෙයි. මුල සිටම අපි කියා සිටියා මේ රදළ අම්මට මේකෙ වැඩක් නැහැ කියා.

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—வெலி மடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

අසව්. අසව්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

නමුත් ඒ කීමට බොහෝ දෙනෙක් එදා ගරු කෙළේ නැහැ. නමුත් අද ගරු කර නවා. මේ රදළ අම්මා සහාග රජයත් සමග ගමන් කරන්නේ පැසිස්ට් වාදය කරායි. ධනපති රදළ පදනම් ඉවත් කිරීමට අත තබලවත් නැහැ. මෙතෙක් කාලයක් මේ රජය ගෙන ගිය පගා ගැනීම් දූෂණ රත්රන් ආලේපයෙන් වහගෙන පත්‍ර මර්දනය කරන්නැයි දැන් සූදානම් වුණේ. ඒ වාගේම මේ රටේ කිසිම ප්‍රශ්නයක් විසඳී නැහැ. දිනපතාම බඩු බාහිරාදියේ මිල සීග්‍ර යෙන් ඉහළ නැගගෙන යනවා. දිනපතාම කම්කරුවන් වැඩපළවලින් ඉවත් කරනවා. රදළයනුත් සමග දිනපතාම මේ රජය රදළ අම්මගෙ කරින් පැසිස්ට්වාදය කරා ගමන් කරනව. ගරු මුදල් ඇමතිතුමාත් ඊට පස් සෙන් සිටීමයි මට කනගාටු. දෙහිවල ගල්කිස්ස මන්ත්‍රිතුමත් (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) ඒ පිටිපස්සෙ ඉන්නව. කලින් යම් කිසි පදනමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබුණා. නමුත් ඒ පදනමෙන් පිටවී ගොස් සිටින උදවියගේ මඩියත් ගිරිදර මෝලත්, ගෙවලුත් ආරක්ෂා කිරීමේ සටනයි දැන් ඒ අය ගෙන යන්නෙ. මෙන්න: අංක 25 පෙන්ඩනිස් ඇවනිව්—තක්සේරුව රුපියල් 4,360 යි. අංක 25/1, පෙන්ඩනිස් ඇවනිව්—තක්සේරුව රුපියල් 3,000 යි. අංක 50/7, සිරිපා පාර—තක්සේරුව රුපියල් 3,690 යි. අංක 50/7ඒ, සිරිපා පාර—තක්සේරුව රුපියල් 3,690 යි. අංක 50/7බී, සිරිපා පාර—තක්සේරුව රුපියල් 3,995 යි. සුලෙයිමන් පාරේ තවත් ගෙයක්—තක්සේරුව රුපියල් 6,000 යි.

•

**යූ. බී. වන්නිනායක** (යාපහුව)
*(திரு. யூ. பி. வன்னிநாயக்க—யாப்பஹுவ)*
(Mr. U. B. Wanninayake—Yapahuwa)

ඔය මොනවද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේ දෙහිවල ගල්කිස්ස මන්ත්‍රීතුමා එදා අභියෝග කළා, ඔහුට ඔහුගේ භාර්යාවට හෝ ඔහුගේ දූ දරුවන්ට හෝ ගෙවල් දෙකකට වඩා තිබෙනවා නම් පෙන්වන්නය කියා. ඔන්න දැන් පේනවා නේද තත්ත්වය. අපි පුද්ගලයන්ට පහර ගහන්නේ නැහැ. ධනපති ක්‍රමයට විරුද්ධවයි අපි පහර ගහන්නෙ. රදල ක්‍රමයට විරුද්ධවයි අපි පහර ගහන්නෙ. එම නිසා සම්පූර්ණයෙන්ම මේ රටේ මහජනතාවට පහර වදින පරිදි, මේ රජය ගෙන යන්නේ හිට්ලර් ගෙන ගිය ක්‍රමය අනුවයි. හිට්ලර්ගේ ගොබල්ස් වාගේ අද දෙහිවල-ගල්කිස්සෙ මන්ත්‍රීතුමා අගමැතිනියගේ ගොබල්ස් වෙලා ඉන්නව. මේ රටේ කම්කරුවන් ඉල්ලීම් 21 ක් ඉදිරිපත් කළා. නමුත් ඒ ඉල්ලීම් 21 ඉදිරිපත් කළ සභාවේ මූලාසනයේ සිටි අය අද ඔය පැත්තට යාම හේතුකොට ගෙන කම්කරුවන්ගේ ඒ ඉල්ලීම් යටපත් කරල. ගොවි ජනතාව එහෙන් කෑ ගහනවා, පෝර ටික නැහැ කියා. ලක්ෂ ගණනක් ගොවි ජනතාවට අද ගොවිතැන් කර ගන්න විධියක් නැහැ. ඒ වාගේම රැකී රක්ෂා නැති කම ලක්ෂ ගණනින් ඉහළ ගිහින් තිබෙනව. මේ රට දියුණු කරන්න, සංවර්ධනය කරන්න, ආශාවෙන් ඉන්න තරුණ තරුණියන්ට ඒ සඳහා කිසිම අවස්ථාවක් සලස්වා නැහැ. මේ රජය දිගින් දිගටම කර ගෙන යන නින්දිත වැඩ පිළිවෙළ—අල්ලස් දූෂණ, කම්කරුවන්ට ගසන පහරවල්, මේ ආදී සියලු දේම—වසා ගැනීම සඳහා, මේ රජය පැසිස්ට් ක්‍රමය අනුව ගමන් කරවීම සඳහා, පත්‍ර රජයට ගැනීම පිණිස හයවැනි වතාවටත් මෙම රාජාසන කථාව ඉදිරිපත් කළ බව කියන්න සිදු වී තිබෙනවා. ඒ කාරණය දැන් හොඳටම පැහැදිලියි. එම නිසා මේ කාරණය දන්වත් තේරුම් ගත් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා, මන්ත්‍රීවරුන්ට ආරාධනා කර සිටිනවා, මෙම ක්‍රියා කලාපයට විරුද්ධත්වය දක්වීම සඳහා මේ පැත්තට පැමිණෙන ලෙස. ගරු කථානායකතුමනි, අද දින මම දීර්ඝ වශයෙන් කථා කරන්නට යන්නේ නැහැ. කාරණා රාශියක් ඉදිරිපත් කිරීමට තිබුණත් මගේ කථාව හැකි තරම් සීමා කරනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මෙම රජයේ කැබිනට් මණ්ඩලය මේ කාල සීමාව තුළදී කරන ලද දූෂණ ක්‍රියා යටපත් කිරීමට, රටේ ජනතාවගේ ඇස්වලට වැලි ගසා ඇස් කන කරමින් ඉදිරියට එන ජනතාව මර්දනය කිරීමට කොයි අන්දමේ උත්සාහයක් ගත්තත් එයට කිසිසේත් ඉඩ ලැබෙන්නේ නැති බව මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. මේවා ගිහින් තමුන්නාන්සෙලාගේ අගමැතිනියට—රදල අම්මන්ඩිට—කියන්න. එදා තමන්ගෙ ස්වාමි පුරුෂයා වෙඩි කාල මැරුණ වුණත් අද වන තුරුවත් ඉස්සරහට ඇවිදින් මෙන්න මෙහෙමය වෙඩි තිබ්බෙ කියා කියන්ට බැරි වුණු අම්මණ්ඩි කෙනෙකුට ලැජ්ජ නැතුව අත උස්සන්න, රුකඩ වගේ කියන කියන පැත්තට අත උස්සන්න ගරු මන්ත්‍රීවරුන් රුකඩ වෙලා සිටිනවාද කියා මම අහනවා.

මේ ගඳ ගහන සභාගි ආණ්ඩුව ගිය හැටියේම මොකද කිව්වෙ? බඩු මිල බස්සනවා, කම්කරුවන්ට තැන දෙනවා, කම්කරුවන්ගේ තත්ත්වය උසස් කරනවා, රැකීරක්ෂා ප්‍රශ්නය විසඳනවා, ඔන්න ඔය ආදී දේවල් කිවත් ඔයින් එක ප්‍රශ්නයක්වත් අද වන තුරු විසඳා තිබෙනවාද? නැහැ. එකක්වත් විසඳා නැහැ. ජනතාවගේ එකම ප්‍රශ්නයකටවත් අත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

තබන්නේ නැතුව අතන දමා සිටින එතු මාගේ මාර්ගයෙන් මෙය ඉදිරිපත් කළා. රැකිරක්ෂා රහිත භාවය පිළිබඳ ප්‍රශ්නය, බඩු මිල ඉහළ යාම පිළිබඳ ප්‍රශ්නය හා ප්‍රවෘත්ති පාලනයක් ඇති කිරීම පිළිබඳ ප්‍රශ්නය කියන මෙම කරුණු තුන මුල් කරගෙනයි මෙම රාජාසන කථාවට විරුද්ධව අපි අතුරු යෝජනා ඉදිරිපත් කළේ. මේ කරුණුම ඇති, තමුන්නාන්සෙලාගේ රජය තොලොන්චි වෙලා යන්න. ගරු කථානායකතුමනි, මොනරාගල ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා.) කථා කරනවා නම් මගේ කාලයෙන් විනාඩි කීපයක් ඒ සඳහා ඉඩ දෙන්න පුළුවනි.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

මොන මන්ත්‍රීතුමාගේ කාලයෙන්ද ඉඩ දෙන්නෙ ?

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

මට නියමිත කාලයෙන් විනාඩි පහක් දෙන්න මම කැමතියි.

අ. භා. 5.8

**ඩබ්ලිව්. ජී. එම්. ඇල්බට් සිල්වා මයා.** (මොනරාගල)
*(திரு. டப்ளியு. ஜீ. எம். அல்பேட்—மொனராகல)*
(Mr. W. G. M. Albert Silva—Monaragala)

ගරු කථානායකතුමනි, අද දින රාජාසන කථාව ඡන්ද විමසීමේදී අපට ඡන්දය දෙන්නට සිදු වී තිබෙන්නේ සම්පූර්ණයෙන්ම ආණ්ඩුවට විරුද්ධව බව මතක් කරන්න කැමතියි. මන්ද ? තමුන්නාන්සෙල දන්නවා, අද ලංකාවේ සිටින ජනතාව ප්‍රජාතන්ත්‍ර වාදය ගරු කරන ජනතාවක් බව. එදා බණ්ඩාරනායක මැතිතුමා අගමැතිව සිටියදී එදා සිටි ජනතාවත් ප්‍රජාතන්ත්‍ර වාදය ගරු කළා පමණක් නොවෙයි, දිවංගත ගරු බණ්ඩාරනායකතුමාත් ප්‍රජාතන්ත්‍ර වාදයට අනුකූලව රටේ පාලනය ගෙන ගියා. ඒ වාගේම මගේ ප්‍රදේශයේ—මොනරාගල—ජනතාව සියයට සියයක්ම ප්‍රජාතන්ත්‍ර වාදය ගරු කරන ජනතාවක් බව මේ අවසථාවේදී ප්‍රකාශ කරන්න කැමතියි. එම නිසා මගේ ප්‍රදේශයේ ජනතාව මගෙන් ඉල්ලා සිටියා මෙම යෝජනාවලට පක්ෂව ආණ්ඩුවට ඡන්දය දෙන්න එපා කියා. ගරුතර මහා සංඝ රත්නය මගෙන් ඉල්ලා සිටියා සම්පූර්ණයෙන්ම මෙයට විරුද්ධව ඡන්දය දෙන්නය කියා. ඒ ජනතාවගේ ඉල්ලීම නිසාත්, මහා සංඝ රත්නයේ ඉල්ලීම නිසාත්, විශෙෂයෙන්ම මා ප්‍රජාතන්ත්‍ර වාදය ගරු කරන පුද්ගලයකු නිසාත්, මේ අවසථාවේදී පැසිස්ට් වාදය නැත්නම් ඒකාධිපති වාදය කරා යන ගමනකට කිසි සේත් සහයෝගය දක්වන්නට බැරි බව කියන්න ඕනෑ. එවැන්නකට අපට කිසි සේත් ඉඩ දෙන්න බැහැ.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරුන් භය කරන්ට අද බොරු ප්‍රචාරයක් ඇති කර තිබෙනව මන්ත්‍රීවරුන්ට රුපියල් 50,000 බැගින් දෙනවාය කියා. නමුත් එහෙම භය වෙන මන්ත්‍රීවරු අද මෙතන නැති බව මා මේ අවසථාවේදී ප්‍රකාශ කරන්නට සතුටුයි. 1956 සිටම මොනරාගල මන්ත්‍රී වශයෙන් සිටිමින් මා කටයුතු කරනවා. ඇත්ත වශයෙන්ම දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ ප්‍රතිපත්ති අනුව වැඩ කරමින් ඉතාමත් ඉවසීමෙන් මා සිටි බව තමුන්නාන්සේත් දන්නවා ඇති.

අවසාන වශයෙන් මගේ ඡන්දදායක කොට්ඨාශය වන මොනරාගල ජනතාවගේත් ගරුතර මහා සංඝයා වහන්සේගේත් ඉල්ලීම අනුව මා මේ රාජාසන කථාවට විරුද්ධව ඡන්දය දෙන බව ප්‍රකාශ කරනවා.

**ස්ටැන්ලි තිලකරත්න මයා.** (කෝට්ටේ)
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன—கோட்டே)*
(Mr. Stanley Tillekeratne—Kotte)
*rose*—

**ජේ. ආර්. ජයවර්ධන මයා.** (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)*
(Mr. J. R. Jayewardene—First Colombo South)

He cannot speak——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Minister of Education has allowed fifteen minutes of his time to the Member for Kotte.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

He seconded the Motion on the Address of Thanks.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

On a point of Order, Sir—[*Interruption*].

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

On a point of Order, Sir—[*Interruption*]. I only seconded the Address of Thanks but—[*Interruption*].

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

After seconding, did you speak ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

Yes, for one hour.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

I only seconded the Address of Thanks.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தினர்கள்)*
(Hon. Members

And spoke.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

He did not speak on the amendments at all.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

He seconded the main Motion. Sir, you gave a Ruling at the very beginning—[*Interruption*].

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

There is no such Ruling.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Member for Kotte can speak for fifteen minutes.

අ. භා. 5.13

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

ගරු කථානායකතුමනි, අද මේ සභාවේ විවාදය ඉතාමත් වැදගත් අවස්ථාවකට එළඹ තිබෙන බව අප සියලු දෙනාම පිළිගන්නා කාරණයක්. ඇත්ත වශයෙන්ම 1945, 1946 කාලයේ සිටම මා පාසැල් ශිෂ්‍යයකු වශයෙන් මේ රටේ පොදු මහ ජනතාවගේ සෑම දේශපාලන ව්‍යාපාරයකටමත්, සමාජවාදී ව්‍යාපාරයටත් මගේ ජීවිතය කැප කර වැඩ කටයුතු කළා. ඒ වාගේම, 1956 දී විශිෂ්ඨ ජයග්‍රහණයක් අත් කර ගනිමින්, දිවංගත අගමැතිතුමා විසින් පිහිටුවා ගත් ප්‍රගතිශීලී රජය පටන් ගත්දා සිටම එම රජයේ ප්‍රගතිය කරා ගමන් කිරීමේ සටනට මා සහයෝගය දුන් බව මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනැ. අද කවුරු ගියත්, කවුරු වැටෙන් පැන්නත් ඉතිහාසයේ චක්‍රය නැමැති රෝදය නැවත වරක් කරකැවී මහජන යුගයක් උදා වන බවට මගේ කිසිම සැකයක් නැති බවත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට සතුටුයි.

ගරු කථානායකතුමනි, දිවංගත අගමැතිතුමා පාපතර සාහසිකයකු අතින් මරණයට පත් වුණු අවස්ථාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට නායකත්වයක් දීමට පුද්ගලයකු නැති වූ අවස්ථාවේ අපේ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ජූලි මාසයේදී මහජන එක්සත් පෙරමුණේ ඇපත් කැන්සල් කරමින් ලබාගත් විශිෂ්ඨ ජයග්‍රහණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි තිලකරත්න මයා.]

ගැන අපි ආඩම්බර වෙන්න ඕනැ. මාර්තු මාසයේදී මේ රටේ නායකත්වයට පත් වූණේ ගරු සී. පී. ද සිල්වා මහත්මයයි. නමුත් ඉන්පසුව සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ලංකා සමසමාජ පක්ෂයත්, ලංකා කොමියුනිස්ට් පක්ෂයත් සමග තරඟ වැළැක්වීමේ සම්මුතියක් ඇති කරගෙන ප්‍රගතිය කරා ගෙන ගිය සටන මේ රටේ සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු බලවේගයන් අමතක කරන්නෙ නැත යන්න මා මේ අවස්ථාවේදී මතක් කරනවා. "ලේක් හවුස්" එකේ සල්ලි බෙදෙන කතාව හැම තැනම තිබෙනවා. හෙට අනිද්ද වෙනකොට හොඳට බලා ගන්න පුළුවනි. අපේ ගරු අගමැතිනිය 1960 ජූලිවල එඩිතර නායකත්වයක් දෙමින් මේ රටේ ගොවියාගේත්, කම්කරුවාගේත්, වැඩ කරන ජනතාවගේත් සහනය සලස්වමින් ඉදිරියට පැමිණ, ගතවූ ජූනි 11 වන දා ලංකා සමසමාජ පක්ෂයත් සමග සභාග රජයක් පිහිටුවා ගනිමින් ඉදිරියට ගත් පියවරට ආණ්ඩු පක්ෂයෙ ප්‍රතිගාමීන් කොටසක් විරුද්ධ වී සිටිනව. මෙතන රතු පාට එල්ලගෙන සිටියට, එදා "ටවුන් හෝල්" වේදිකාවෙ හොරිකඩ වැඩ කළ කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) වැනි අයට මම කියනව, මෙවැනි සටන්වලදී අපි පස්සට යන්න සූදනම් වෙන්නෙ නැති බව.

ඊයෙ හැන්දෑවෙ මගේ කොට්ඨාශයෙ එක්සත් ජාතික පක්ෂයට අයිති සමහර අය කුමන්ත්‍රණයක් කළාලු, "අපි සමහර අයට වෙඩි තැබීමටත් ලෑස්තියි" කියා. [බාධාකිරීම්] ගරු කථානායකතුමනි, මම එක කරුණක් කියන්න කැමතියි. මේ රටේ අපි ඉදිරියට ගෙන ගොස් ඇති ව්‍යාපාරය දෙස බලන විට අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) වැනි අය තමන්ගෙ දේශපාලන විලිලජ්ජාව වසා ගෙන සිටින්නෙ කෙසේද කියා මා අහනව. මෙම සභා ශාලාවෙම විරුද්ධ පාර්ශ්වයෙ නායකතුමත් කොතලාවල උන්නැහෙත් කුමන්ත්‍රණයක් කළාය කියන චෝදනාව උඩ, සභාග ආණ්ඩුව පිහිටුවන්න මාසයකට ඉස්සර වෙලා හංවැල්ලෙදි "මේ රටේ යම්කිසි ඒකාධිපති බලයක් ඇති විය යුතුයි; එතැනදි ඩඩ්ලි සේනානායකට මම හොඳට පාඩම් උගන්වන්නම්" කියා ප්‍රකාශ කළා. නමුත් අද ඩඩ්ලි සේනානායක මහතාගේ බෑග් එක ඇතුළට වැටී සිටින එක ගැනයි, අපි කනගාටු වෙන්න ඕනෙ. එහෙම කිව්වෙ නැද්ද? කිව්ව. මේව ගිලගන්න පුළුවන්ද? අවිස්සාවේල්ල කොට්ඨාශයෙත් වීරෝදාර ජනතාවක් සිටිනව. හැමදාම පිඟන් බඩු සාප්පුවෙ ඉන්න මීය වගෙයි, කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා. එයා තමන්ගෙ බඩුත් පොඩි කරගෙන අනික් අයගෙ බඩුත් පොඩි කරගෙන මේ රටේ ප්‍රගතිය කරා ගමන් කරන බලවේග පරාජයට පත් කර අවසානයෙ නැවත වරක් ප්‍රතිගාමී එක්සත් ජාතික පක්ෂය බලයට ගෙන ඒමට සූදානම් වෙනව නම් මා කියනව මේ රටේ මහජනය ඊට සූදානම් නැති බව; ඊට ඉඩ දෙන්නෙ නැති බව.

ගරු කථානායකතුමනි, මෙය වැදගත් අවස්ථාවක්. ඡන්දය අනුව දිනුම පැරදුම ඇති වෙන බව අපි දන්නව. ඒක නොවෙයි, තියෙන්නෙ. නැවත වරක් ජනතාව අතරට යාමෙ අවස්ථාවක් ආවොත්, ගරු සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය යළිත් මේ රටේ අගමැතිනිය වෙනවාට කිසිම සැකයක් නැහැ. අපේ එක හෙව නැලි අගමැති කෙනෙක් විතරයි, "ෂැඩෝ ප්‍රයිම්මිනිස්ටර්" ඩඩ්ලි සේනානායක මහතා විතරයි, තරඟ කළොත් තරඟ කරන්නෙ. තවත් "ටිප්ටොප්" අගමැතිවරු සිටිනව නම්—[බාධාකිරීමක්] අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාට මා කියනව, අන්තිම කාල සීමාවෙදි මේ රටේ ප්‍රගතිශීලි ව්‍යාපාරය පාවා දී දේශපාලන කාලකණ්ණියකු වශයෙන් තමන්ගෙ මිනීවලට යන්න සූදානම් වෙන්න එපාය කියා. ඒවගෙම කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමාට මා කියනව —[බාධා කිරීමක්] මේ අය තමා, මගෙ පරණ ගුරුවරු. ගුරුන්ට අකුරු වැරදී මඬේ එරිලයි ඉන්නෙ. මම කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමතියි, මා දේශපාලන ජීවිතයට බැස්සෙ ආසනයක් බලාපොරොත්තුවෙන් නොවේය කියා. මුලින් 1956 දි ලබා ගත් ජයග්‍රහනයත්, අද මේ රටේ සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය ලබා ගෙන තිබෙන ජයග්‍රහණයත් ආරක්ෂා කරමින් තව දුරටත් ඉදිරියට යාමට සූදානම් වෙමින් මගේ කොට්ඨාශය වෙනුවෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මම එකක් කියනව, එතුමට: මගෙ කොට්ඨාශයට පැන්නොත් ලෙහෙසියෙන් ඉඩ දෙන්නෙ නැහැ. "අත තිබ්බොත් ගෝරි ගොඩයි" කියන එක මේ අවස්ථා වෙදි කියන්න කැමතියි.

අවුරුදු ගණනාවක්ම අපිත් මේ රටේ සටන් කර තිබෙනව. ගඳ සුවඳ දෙක අපට තේරෙනව. ප්‍රතිගාමිත්වය අපට තේරෙ නව. එක්සත් ජාතික පක්ෂය බලයට ආවොත් ඇති වන තත්ත්වයත් අපි දන් නව. පෙඩරල් පක්ෂයෙ අයට ටිකක් කල් පනාවෙන් සිටින ලෙස මා කියනව. අද ඉල්ලීම් දමලයි තියෙන්නෙ. තමුන්නාන් සෙලගෙ අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම, සහමුලින්ම සංසිඳවා නැති කර ඉවර වෙලා—[බාධා කිරීමක්] මේ රටේ මොන විධියෙ ආඥාදායකකමක් ඒවිද කියා මට කියන්න බැහැ. මහ පුදුම ආඥාදායකත්ව යක් වෙන්නෙ.

ඩඩ්ලි සේනානායක මහත්මයට මගෙ ගරුත්වයක් තියෙනව. එතුම, හැමදාම එක්සත් ජාතික පක්ෂයෙ නායකයයි. ප්‍රතිපත්තියක් අනුගමනය කළ නායක යෙක්. පක්ෂයක් වශයෙනුත් ප්‍රතිපත්ති යක් තිබෙන පක්ෂයක්. අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) වගේ අය ගැන මොකටද? කවුද කිව්වා කටින් හිනා වෙන්න බැරි නම් අධෝමුඛයෙන්වත් හිනා වෙන්නය කියා. කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.), වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.)—හාමිනේ ගැන මම යමක් කියන්නෙ නැහැ මගේ දෙසට එරෙව්වත්; මොකද කියතොත් මා එයාට ඔරවන්න අවසථාව තියන්නෙ නැහැ. එරෙව්වාම එයාගෙ රූපය අවලක්ෂණ වන නිසා—මේ අයට ඩොනල්ඩ් රණවීරලාගේ සල්ලි ඊයේ පෙරේදා රුස්වීම් තබන්නට බෙදුවේ නැද්ද කියා මා වැලිමඩ ගරු මන්ත්‍රීතුමාගෙන් අහන්න ලැහැස්තියි. එම නිසා මේ සටනේ අන්තිම සෙබළුන් වශයෙන් සිටින ගරු සිරිමාවෝ බණ්ඩාර නායක රජයේ මන්ත්‍රීවරුන් වන අපි අපේ ජීවිතය පවා මේ මහජන ප්‍රශ්නය මත කැප කරන්නට සූදානම් වෙනව. විලි ලජ්ජා නැති, පිටකොන්ද නැති, පිරිමි භාව යක් නැති, ප්‍රගතිය කරා ගමන් කරන්නට ලැහැස්ති නැති, අය මේ පිළට පැන්නට සටන අවසාන නැහැ. මේ රටේ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක රජය කියන්නේ අපේ සහභාග රජයයි. අපේ මහජන මන්ත්‍රී මණ්ඩලය මොන ආකාරයෙන් තීන්දු දුන් නත්, අපේ සිරිමාවෝ බණ්ඩාරනායක රජය ආරක්ෂා කරන්න පෙරදැරිව ඉදිරියට ගමන් කරන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.22

**ඩී. පී. ආර් ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
ගරු කථානායකතුමනි, මා බලාපො රොත්තු වුණේ ඉස්සරහ පේලියේ සිටින ඇමතිවරයෙක් කථා කරාවිය කියායි.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
තමුසෙට උත්තර දෙන්න ඕනෑ අපි වගේ අයයි. ඇමතිවරුන් නොවෙයි.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
ගැරඩි මරල පව් ගන්න මා කැමති නැත කියා මා කියනව.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)
අපි වැනි අයයි තමුසෙට උත්තර දෙන්න ඕනෑ. [බාධා කිරීමක්].

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The hon. Member for Kotte must please keep silent.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)
ගරු කථානායකතුමනි, අප බලා පොරොත්තු වුණා වගකිය යුතු ඇමති කෙනෙක් පිළිතුරු දේවිය කියා. විරුද්ධ පාර්ශ්වයෙන් මෙපමණ වේලාවක් ආණ්ඩුව වත් ඇමතිවරුන්වත් අගමැතිනියටත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

එල්ල කළ චෝදනාවලට පිළිතුරු දේවිය කියා අපි බලාපොරොත්තු වුණා. නමුත් ඇමති කෙනෙක් කියා හෙවනැල්ලක්වත් මෙතන නැහැ.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillekeratne)

තමුසෙ වැනි පන්දමෙකුට කවුද උත්තර දෙන්නෙ, අප වැනි අය මිසක් ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

This is my last warning to the hon. Member for Kotte. He was given a patient hearing by the whole House.

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

ගරු කථානායකතුමනි, මා ඉතා අමාරුවෙන් පළමුවැනි දවසේ කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා (ස්ටැන්ලි තිලකරත්න මයා.) ස්තුති යෝජනාව ස්ථිර කරන අවස්ථාවේදී අසාගෙන සිටියා. අදවත්, දෙසැරයක් කථා කළාට පසුවවත්, අපට කියන්න තිබෙන දේ කියන්නට ඉඩ දී අසා සිටින්නට බැරි වීම ගැන මා කණගාටු වෙනවා. ගරු කථානායකතුමනි, එක ඇමති කෙනෙක් ඇවිත් දැන් ඉඳගෙන සිටිනවා, නමුත් අපි කථා කරන්න කලින් ඒ ඇමතිතුමා කථා කළා නම් අපි බොහොම කැමතියි. මා නැගිට්ට නිසා දැන් ඉතින් කරන්න දෙයක් නැහැ. මා වැඩි වේලාවක් ගන්නත් අදහස් කරන්නේ නැහැ.

මා තවත් එකක් කියන්නට කැමතියි. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා ස්තුති යෝජනාව ස්ථිර කරන අවස්ථාවේදී එකක් කීවා මට මතකයි. මම ගුරුවරයෙක්ය කියා කිව්වා. නමුත් මා ගුරුවරයෙක් නොවෙයි. මා දේශපාලන බිමේ වැඩ කළ කෙනෙක්. කෝට්ටේ ගරු මන්ත්‍රීතුමාට යම් දෙයක් උගන්වන්න මා උත්සාහ කළේ නැහැ. මක්නිසාද කියතොත්, මා මුල සිටම දැනගෙන හිටියා ඔහු කොයි විධියේ කෙනෙක්ද කියා. ඒ මන්ත්‍රීතුමාට ඕනෑ කර තිබුණේ ඔය විධියට ටිප්ටොප් වගේ ඇඳගෙන මහජනයා මුලා කර සල්ලි ටිකක් හම්බ කරගෙන ඉන්නට මිස රටට සේවයක්වත්, ජාතියට සේවයක්වත්, කම්කරු පංතියට සේවයක්වත්, කරන්න නොවෙයි කියා මා පැහැදිලිවම කියනවා. කසිප්පු කාරයන් වෙනුවෙන් උසාවියේ පෙනී සිට සල්ලි ටිකක් හම්බ කර ගත් පලියට ලොකු කාර් එකක් දෙකක් ගත් පලියට අපව භය ගන්වා නිශ්ශබ්ද කරන්න කෝට්ටේ මන්ත්‍රීතුමා කල්පනා කරනව නම් එසේ කිරීම උගහට බව මම ඒ මන්ත්‍රීතුමාට මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මට මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ වැදගත් අවස්ථාව කටයි. තව එකක් මතක් නොකර බැහැ. ස්තුති යෝජනාව ස්ථිර කරන අවස්ථාවේදී කෝට්ටේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, බලලුන්ට ගස් යන්න ඉගැන්නුවම බහින්ටත් ඉගෙන ගන්නවය කියා; බැහැලා ඇවිත් සමහර විට ඒ උගන්වපු අය මරා දමන්නත් ඉගෙනගෙන තිබෙනවය කියා. සමහර විට බලලුන් ඒ විධියේ වැඩ කළත් උරුලෑවන්ට ඒ තරම් එකක්වත් කරන්න බැරි බව මම කෝට්ටේ මන්ත්‍රීතුමාගේ දැනගැනීම පිණිස විශේෂයෙන් කියන්න කැමතියි. අප අද මුහුණ පා තිබෙන්නේ ඉතාමත් අමාරු අවස්ථාවකටයි. මේ ආණ්ඩුවේ වැරදි නිසා, අදුරදර්ශී වැඩ නිසා, කල්පනා කරන්නෙ නැතිව කරන මෝඩ වැඩ නිසා මේ අවස්ථාව හදා ගත් බව මම කියන්න කැමතියි. 1956 දී ජනතාවගේ ජයග්‍රහණය ලබා ගැනීම සඳහා අපි සැහෙන මහන්සියක් දැරූ බව කියන්නට පුළුවනි. මමත්, ජාතික විමුක්ති පෙරමුණේ නායක වැලිමඩ ගරු මන්ත්‍රීතුමත් (කේ. එම්. පී. රාජරත්න මයා.) ඇතුළු කීප දෙනෙක් බොහොම මහන්සි වෙලයි, ඒ ජයග්‍රහණය ලබා ගෙන බණ්ඩාරනායක මහතා අගමැති හැටියට පත් කරගෙන ඒ දවස්වල ආණ්ඩුව කාලයක් ගෙන ගියේ. අපි මහජනයාට පොරොන්දු වූ අන්දමට වැඩ කටයුතු කරගෙන ගියා. සිංහල භාෂාවට අපි නීතියෙන් තැනක් දුන්න. අපි බෞද්ධාගමට තැනක් දීගෙන වැඩ කරගෙන ආවා. නමුත් කතෝලික කොටස්වල බලපෑම් නිසා විදේශීන්ගේ බලපෑම් නිසා ධනපතීන්ගේ සහ රදළයින්ගේ බලපෑම් නිසා විශේෂයෙන්ම අගමැතිනියගේ රදළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොටස්වල බලපෑම් නිසා මහවල තැන්නෙ රත්වත් තෙලාගේ බලපෑම් නිසා ඒ කටයුතු කර ගන්න බැරි වූ බව මට කිසි සැකයක් නැතිව කියන්නට පුළුවන්. ඒ නිසා ඒ ආණ්ඩුව නැති වෙලා ගියා. අගමැතිතුමාට වෙඩි තබා එතුමා නැති කළා. ඊට පසු ඒ වැඩ පිළිවෙළ ක්‍රියාවේ යොදවනවාය කියා, රට නියම තත්ත්වයට ගෙනෙනවාය කියා, සිංහල භාෂාවට නියම තැන දෙනවාය කියා, බෞද්ධාගමට නියම තැන දෙනවාය කියා, සමාජවාදය කරා රට ගෙන යනවාය කියා 1960 මාර්තුවලදී මැතිවරණයක් තිබ්බ. අගමැතිනිය එදා ඉස්සරහට එන්න කැමති වුණේ නැහැ. පිටිපස්සෙන් ඉඳගෙන කරන්න පුළුවන් සියළුම කුමන්ත්‍රණ කළා. අගමැතිතුමා මැරුණයින් පස්සෙ අත්තනගල්ල ආසනයට ඉදිරිපත් වුණෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයකු හැටියට නොවෙයි; නිදහස් අපේක්ෂිකාවක් හැටියටයි. ඊට පස්සෙ කල්පනා කළා, රටවටේ ගිහින් ඇඬුවොත් මහජනයා කනගාටු වෙන් ඉන්න නිසා රට රවටන්න පුළුවන් වේය කියා. ඒ විධියට රට රවටලයි, කෝට්ටේ මන්ත්‍රීවරයා වැනි උරුලෑවන් ගෙන් ආධාර ඇතිව ජූලි මැතිවරණයේදී ජයග්‍රහණය ලබා ගත්තෙ. සමසමාජ පක්ෂයෙන්, කොමියුනිස්ට් පක්ෂයෙන් ආධාර ඇතිවයි, ඒ රැවටීම, ඒ මුළාව කළේ. ක්‍රියාවේ යොදවන්නට අදහස් කරන්නෙ නැති බොරු පොරොන්දු මහජනයාට දී 1960 ජූලි මාසයේදී රට රැවටුවෙ ඒ විධියටයි. අපි සැම අවස්ථාවකදීම මහජනයාගේ පැත්ත අරගෙන රටේ නිදහස ආරක්ෂා කරන්න කටයුතු කළා. යම් යම් සමාජවාදී පණත් මේ ගරු සභාවට ඉදිරිපත් කළ අවස්ථාවේදී අපි ඒවාට ආධාර කළා. ප්‍රතිගාමී කොටස්වලට අපි යට වුණේ නැහැ. විදේශීන්ගේ බලපෑම්වලට අපි බය වුණේ නැහැ. අපි රදළයින්ගේ ඕනෑකම්වලට කවදාවත් නැමුනේ නැහැ. නමුත් මහජන සුභසිද්ධිය තකා මේ ආණ්ඩුව ආරක්ෂා කිරීම සඳහා අපි කටයුතු කළ අවස්ථා තිබෙනවා. 1962 දී කුමන්ත්‍රණය කියන එකක් පැන නැඟී ආණ්ඩුව බොහොම අබලන් වුණා. ඒ අවස්ථාවේදී අපි පැනල ගියේ නැහැ: අපි ආණ්ඩුවට ආධාර දුන්නා, පණ තිබෙනවා නම් නියම පිළිවෙළට වැඩ කරගෙන යන්නය කියා. නමුත් මේ ආණ්ඩුවට එහෙම වැඩ කරගෙන යන්න බැහැ. අගමැතිණියට එහෙම වැඩ කරගෙන යන්න වුවමනාවක් නැහැ. අගමැතිණියට වුවමනා කරන්නේ මහජනයා රවටා රදළ බලය තහවුරු කරගෙන, සැම දාම අගමැතිණිය වශයෙන් ඉඳගෙන, රදළයින්ගේත්, ධනපතියන්ගේත්, අධිරාජ්‍යවාදීන්ගේත් අයිතිවාසිකම් තහවුරු කරගැනීමේ වැඩ පිළිවෙළක් ගෙන යන්නයි. එවැනි දේ කරන තැන මොන සමාජවාදයක්ද? මල්ලි කෙනෙක් "ලිවර් බ්‍රදර්ස්" සමාගමට දමා ගත්තා. තවත් මල්ලි කෙනෙක් මහා භාරකාරයා වශයෙන් පත් කර ගත්තා. තව මල්ලී කෙනෙක් පත් කර ගත්තා, තමන්ගේ පෞද්ගලික ලේකම් වශයෙන්. එක මල්ලි කෙනෙක් අග්‍රාණ්ඩුකාරවරයාගේ දුව බැඳගත් නිසා ඔහුත් සම්බන්ධ කරගත්තා. මේකද, සමාජවාදයය කියන්නේ? මේකද, ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ? මේවා කරමින්ද, රට බේරා ගන්නටයයි කියන්නේ?

මොන දූෂණයද, නැති කිරීමට මේ ආණ්ඩුව එක ඇඟිල්ලක් ඔසවා තිබෙන්නේ? මොන වැඩක්ද, දක්ෂ අන්දමට කළාය කියන්න පුළුවන්? මහජනයා අමාරුවෙන් අමාරුවට දැම්මා නේද? ජීවන අංකය ඉහළටම නැඟ ගෙන යන බව පෙනෙන්නේ නැද්ද? අවශ්‍ය බඩු ඇත්තේ නැහැ. යන්න එන්න වාහන ඇත්තේ නැහැ. ඒවාට වුවමනා කොටස් ගෙන්වා දෙන්නේ නැහැ. කළාලු, බොහොම දේ? කාටද, කළේ? නෑඇයිත්ටත්, හිතවතුන්ටත්, අනික් රදළ කොටස්වලටත් හොඳ තැන් දී තිබෙනවා. ඒකද, සමාජවාදය කියන්නේ? දෙහිවල-ගල්කිස්සේ ගරු මන්ත්‍රීතුමාගේ (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) දර්ශනයට අනුව නම් එය සමාජවාදය වෙන්න පුළුවනි. නමුත් මම ඉගෙනගත් සමාජවාදය එය නොවෙයි. කෝට්ටේ මන්ත්‍රීවරයාගේ (ස්ටැන්ලි තිලකරත්න මයා.) දර්ශනයට අනුව එය සමාජවාදය වෙන්න පුළුවනි. නමුත් ඒක නොවෙයි, අපි ඉගෙනගත් සමාජවාදය.

අපි හිතුවා, සභාග ආණ්ඩුව පිහිටවූවාට පසුව, මේ "රත්තරං" මොල එහා පැත්තට ගියාට පසු, අවුරුදු 30 ක් තිස්සේ මහජනයා සංවිධානය කළ—ගොවීන්, කම්කරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

වන් හා මධ්‍යම පන්තියේ අනික් උදවිය සංවිධානය කොට ඔවුන්ගේ අයිතිවාසිකම් ලබාගැනීමට වැඩ කළ—කොටස් එහාට ගියාට පසුව, යම් කිසි වෙනසක් ඇතිවේය කියා. නමුත් එවැනි කිසිවක් ඇති වුයේ නැහැ. ඒ කොටස් දූෂණවලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් අන්තයි. ගිරිදර මෝලෙන් ඒවා එළිවෙනවා. තව එළි වෙන්න බොහොම දේවල් තිබෙනවා. අය වැය විවාදයේදී අපි ඉල්ලුවා, මහජන බැංකුව ගැන සොයා බැලීම සඳහා මේ සභාවේ කාරක සභාවක් පත් කරන්නය කියා. මුදල් ඇමතිවරයා අද මෙහි ඇත්තේ නැහැ. මුදල් ඇමතිවරයා කීප වරක්ම පොරොන්දු වුණා, එවැනි කොමිටියක් පත්කරනවාය කියා. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් මාත් කීප වාරයක්ම ඉල්ලුවා, කොමිටියක් පත් කරන්නය කියා. ඇයි, ඒවා වහගෙන ඉන්නේ? කෝ, ඔය වෙළඳ ඇමතිවරයා? ඇයි මෙතැන ඉන්න බැරි? මේ විදියේ වැදගත් විවාදයක් ඇති අවස්ථාවකදී ඇයි වෙළඳ ඇමතිවරයාට මෙහි ඉන්න බැරි? ඒ ඇමතිවරයා පාලනය කරන සියලුම ආයතන දූෂණයෙන් පිරී තිබෙනවා. අල්ලස් වසංගතයෙන් පිරී තිබෙනවා. එක තැනකවත් වැඩක් කෙරෙන්නේ නැහැ. සමුපකාර තොග වෙළඳ ආයතනයට රත්න දේශප්‍රිය සේනානායක කියන කොහෙදෝ පත්‍රයක කුරුටු ගාපු මිනිහෙක් ගෙනගොස් එහි සභාපති හැටියට පත් කර තිබෙනවා. මාත් අවුරුදු දෙකක් තුනක් පමණ එය පිරිසිදු කිරීමට වීර්ය කළ නිසා එහි විනාශය ගැන මට ලොකු කණගාටුවක් තිබෙනවා.

කෝ, ඔය වෙළඳ ඇමතිතුමා? ඔහු මෙතැන නැගිට කිව්වා, මල්වත්තේ මහා නායක ස්වාමින් වහන්සේ අබෞද්ධයෙක් කියා කිව්වේ නැත කියා. බෞද්ධ විරෝධී කියා විතරක්ලු, කිව්වේ. මොකක්ද ඔය දෙකේ වෙනස? සියම් නිකායේ නායක මල්වත්තේ නායක ස්වාමින් වහන්සේ බෞද්ධ විරෝධී නම් කොහොමද, මේ රටේ බුද්ධාගම ආරක්ෂා වන්නේ? ඒ ඇමතිතුමා දන්නේ නැද්ද, මේ විධියේ වැරදි වචන කියන්න වටින්නේ නැති බව? තමන්ට අමාරුවෙන වචන යක් කිව්ව පලියට ගරු සංඝයා වහන්සේලාට මේ අන්දමේ වචන පාවිච්චි කරන්ට නරක බව ඇමතිතුමා දන්නෙ නැද්ද? තවත් කාරණයක්.

පසුගිය සතියේ දූවමොට්ටාවේ අමරවංශ ස්වාමීන් වහන්සේව අස් කළා, උන්වහන සේ දූරු තනතුරකින්. ඇයි? ඇත්ත කිව්ව නිසා. මහජනයාට කරුණු කියා දෙන නිසා; බුද්ධාගම ආරක්ෂා කරන්ට වැඩ කරන නිසා; සංඝයා වහන්සේගේ ගෞරවය රැකීමට රට සෑම තැනම ගිහින් වැඩ කරන නිසා, උන්වහන්සේ සේව යෙන් අස් කළා. උන්වහන්සේ ඉස්කෝලයක උගන්වමින් සිටිය. මෙහෙමද ආගමට තැන දෙන්නෙ කියා මා අහනව. මෙහෙමද සාධාරණ අන්දමට වැඩ කරනව කියන්නෙ.? මේ ආණ්ඩුවෙන් සාධාරණ වැඩක් බලාපොරොත්තුවන්ට පුළුවන්ද? බැහැ. ගුවන් විදුලිය පාවිච්චි කරන අන්දම ගැන කල්පනා කර බැලුවාම පෙනී යනවා, තුච්චු දෙකක් වටින්නෙ නැති කථා උදේ සවස ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරන බව. කොහේ හරි ඉඳගෙන කෙඳිරි ගානව, ඒව අහගෙන ඉන්ට අප්‍රියයි. විරුද්ධ පාර්ශ්වයේ කාටවත් වැදගත් වෙන කරුණක් කීමට ගුවන් විදුලිය ඉඩ නොදෙන්නෙ මොන කාරණයක් නිසාද? පත්‍ර ගත්තාම ඊට වඩා දෙයක් අපට බලාපොරොත්තු වන්ට පුළුවන්ද?

මට සමහරු දෙස් කියනව, විරුද්ධ පාර්ශ්වයේ අනික් කොටස් සමග එකතු වුණා කියා. රටට අනතුරක් වෙන කොට එය වැළැක්වීමට අපගේ එක්වීම කාටවත් නවත්වන්න බැහැ. මේ ආණ්ඩුව පත්‍ර ගත්තොත් ඔය පනත් සථිර වුණොත් ඔවුන් යන්නෙ මොන ගමනද කියා මා හොඳහැටි දන්නව. මම අගමැතිණිය ගේ කල්පනා තරමක් දුරට දන්නව, කොහෙද එතුමිය ගමන් කරන්ට අදහස් කරන්නෙය කියා. මේ පළමුවෙනි අඩියයි. මේක ගත්තායින් පසු ඔය කිව්වු කරගෙන ඉන්න පිළිසඳරශාලාවාදී බෝල්ෂේවික්වරු — දෙහිවල - ගල්කිස්ස මන්ත්‍රීතුමාත්, (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා) යටි යන්තොට කාටත් කුලියට ගන්ට පුළුවන් මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) අනිකුත් සමසමාජ පක්ෂ-මන්ත්‍රීවරුන්—මොන විධියේ වැඩ ද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්ට අදහස් කරන්නේ කියා අපි තරමක් දුරට කල්පනා ඇතිව දැනගෙන ඉන්නව. ඒ නිසා පත්‍ර ගන්ට හදන්නෙ රටට ඇති ආදරයකින් නොවෙයි, තමන්ගේ බලය තහවුරු කර ගැනීම පිණිසයි. මා කවදාවත් පත්‍රවලට ආවැඩුවෙ නැහැ. අද ආවඩන්නෙත් නැහැ. ඉදිරියට ආවඩන්නෙත් නැහැ. මා විතර පත්‍රවලින් පහර කෑ කෙනෙක් මේ රටේ දේශපාලන බිමේ ඉන්නවා යයි කියන්ට අමාරුයි. මා කොයි වෙලාවකවත් පත්‍ර ගන්ටයයි කිව්වෙ නැහැ. සමහරු කියනවලු, මට නින්ද යන්නෙ නැත කියා පත්‍ර ගන්න තෙක්. ඒක කොහෙදි කිව්ව දෙයක්දැයි හිතන්ට අමාරුයි. නමුත් මම පාර්ලිමේන්තුවෙදි 1960 අගෝස්තු 23 ද රාජාසන කථා විවාදයේදී පත්‍ර පිළිබඳව අප පක්ෂය දරණ මතය කිව්ව. එනම් පත්‍ර ගැනීමට අප විරුද්ධය කියා. මට එය කියවන්ට වෙලාවක් නැහැ; 1963 අගෝස්තු මාසයේ 23 වැනිදා හැන්සාඩ් වාර්තාවේ මා කියා තීබෙනව, පත්‍ර ගැනීමට අප විරුද්ධ බව. මා බේරේගෙදර පත්‍ර ගැන හොඳ විවේචන කර තිබෙනව. මේ පාර්ලිමේන්තුවෙත්, මීට කලින් තිබුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවෙත් වෙනත් තැන්වලත් මා කියා තිබෙනව, අප ඒ පත්‍රවල දේපොළ ආරක්ෂා කිරීමට ඉදිරිපත් වන කොටසක් නොවෙයි කියා. ජාතික විමුක්ති පෙරමුණේ රාජරත්න මන්ත්‍රීතුමාත්, මහජන එක්සත් පෙරමුණේ අපිත් පත්‍රවල දේපොළ රකින උදවිය නොවෙයි. එහෙත් ආණ්ඩුවේ බලය පාවිච්චි කර, රටට දරුණු වරදක් කරන්ට යාමේදී විශේෂයෙන්ම විරුද්ධ පාර්ශ්වයේ සියලු දෙනාම එක්වී ඒ කටයුත්ත මැඩපවත්වන්නට ක්‍රියාකරනව. ඒක කියන්න මා භය නැහැ. ඒක කළ යුතු වැඩක්. මා දන්නා සමාජවාදය නම් මේ ආණ්ඩුවේ නැහැ. මේ ආණ්ඩුව පසුගිය අවුරුදු හතර හමාර තුළදී සමාජවාදය දෙස ගමන් කළා යයි කියන්න බැහැ. යම් යම් ආයතන ජනසතු කිරීමට පනත් මේ ගරු සභාවට ඉදිරිපත් කළත් මේ ආණ්ඩුව සමාජවාදය දෙස ගමන් කළා යයි කියන්න පුළුවන්කමක් නැහැ. ඔය එන්නේ වෙළෙඳ ඇමතිවරයා. ඔය ඇමතිවරයා පාලනය කරන සියලුම දෙපාර්තමේන්තු දූෂණවලින් පිරිලා. සංයුක්ත මණ්ඩලවලට පත් කරන්නේ කිසිම අතකින් සුදුසු අය නොවන බව අප දන්නවා. සුදුසුකම් ඇති අය සිය ගණන් ඉන්නවා. නමුත් අයුතු ලෙස එහෙම නැත්නම් නොයෙකුත් බලපෑම් උඩ පත්වීම් කරනවා. මේ පිළිබඳව විස්තර වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න වෙලාවක් නැහැ. කොටින්ම කියනවා නම් මේ ආණ්ඩුව සමාජවාදය දෙසට ගමන් කරන්නේ නැහැ. පසුගිය පාර්ලිමේන්තු වාරය හදිසියේ කල් දමන ලද්දේ පුවත් පත් පනත් දෙක ඉදිරිපත් කිරීමේදී නීත්‍යානුකූලව අවශ්‍ය කටයුතු කරන්න බැරි වුණු නිසයි. නැවත වතාවක් ඒ පනත් දෙක ඉදිරිපත් කිරීමටයි, පාර්ලිමේන්තු වාරය කල් දැම්මේ. නමුත් මේ වාරයේ හෝ එම පනත් දෙක සම්මත කර ගත්තත් ඒවා ක්‍රියාත්මක කරන්න නොලැබෙන බව කියන්න කැමතියි. මාස හතරකට පහකට ඉස්සර නම් මේ රටේ මහජනයා නිදාගෙන වගේ හිටියා. නමුත් අද දින මහජනයා අවදියෙන් ඉන්නවා. මහා සංඝයා වහන්සේලා මේ රටේ මහා ජනතාව අවදි කර තිබෙනවා. මහජනයාගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම ගැන දන් මහජනයාට කරුණු වටහා දී තිබෙනවා. භාෂාව, සංස්කෘතිය, ආගම, ආරක්ෂා කර ගැනීමට ජනතාව අවදි වෙලා. එම නිසා වෙන විධියක ආණ්ඩුවක් පවත්වාගෙන යන්නට අදහස් කරනවා නම්, ඒක කරල බලන ලෙස අප මතක් කරන්න කැමතියි. මහජනයාගේ කැමැත්ත ගන්නේ නැතිව ආණ්ඩුවක් කරල බලන ලෙස මතක් කරනවා. මිලිටරි ආණ්ඩුවක් පිහිටුවීමට අදහස් කර තිබෙනවා නම් එසේ කර බලන්න අද දින මේ ආණ්ඩුව පැරදුණායින් පසුව බාගදා හදිසි නීති පනවන්න පුළුවනි. අද දින මේ ආණ්ඩුව පැරදෙන්නට පුළුවන් බවත් දැන ගන්නට තිබෙනවා. දැනට තිබෙන ආරංචි අනුව ආණ්ඩුව පැරදෙන තත්ත්වයට එනවාට කිසිම සැකයක් නැහැ. මන්ත්‍රීවරුන්ට බොරු පොරොන්දු දෙමින් මේ තරම් කල් ඔය පැත්තේ තබාගෙන සිටියා. තව දුරටත් ඒ බොරු පොරොන්දුවලට රැවටී ඒ අය ඔය පැත්තේ ඉන්න එකක් නැහැ. ඒ අය මේ පැත්තට නැවිත් කොහේ යන්නද? හැමදාම ඔය පැත්තේ ආසනවලට වී ඉන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.]

කියනවද ? හැමදාම ඒ අය රවටන්නට බැහැ. මේ ආණ්ඩුවේ රදළවාදයක් මිසක් සමාජවාදයක් නැහැ. ආගමට නිසි තැන දෙන බව රාජාසන කථාවේ සඳහන් කර තිබෙනවා. යම් යම් වගන්ති වෙනස් කරන්න ඕනෑලු. 1815 අත්සන් කරන ලද ගිවිසුමේ 5 වැනි වගන්තියට අනුව බුද්ධාගමට නිසි තැන දෙන්න ඕනෑ. නමුත් 1818 නොවැම්බර් 21 වැනිදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ බලය මෙහි තහවුරු කිරීම පිණිස ප්‍රකාශයක් කර තිබෙනවා. ඒ ප්‍රකාශය අනුව ඉහත කී 5 වැනි වගන්තියෙන් දෙන ලද දේ අහෝසි කර දමා තිබෙනවා. එපමණක් නොව ඒ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගෙන් ලංකාවට නිදහස ලබා ගැනීමට සටන් කළ වීරයන් පරාජය කිරීමට ආධාර කළ රදළයන්ට තෑගි වශයෙන් ඉඩම් දී තිබෙනවා. ඒවා ලබා ගත් රදළ පවුල් දෙක තමයි රත්වත්තෙ නිලමෙගෙ පවුලත් මහවලතැන්නෙ නිලමෙගෙ පවුලත්. ඒ පවුල් දෙකට ඉඩම් අක්කර දහස් ගණනක් දුන්නා. මේ අයට සාමාන්‍යයෙන් කියන්නෙ ඩොයිලිගෙ රදළයන්ය කියලයි. ගජමන් නෝනා හිටපු කාලේ ජෝන් ඩොයිල්ට යැවූ ලියුම් ආදිය ගැනත් ප්‍රසිද්ධියක් තිබෙනව. ඒ කාලෙ ගජමන් නෝනා ලිපියක් දුන්නෙත් ඔය ඩොයිලිටයි. ඔය කියන ඩොයිලි තමයි මේ රදළයින්ට ඉඩම් එහෙමත් දුන්නෙ. ඒක නිසා තමයි රත්වත්තෙ නිලමේත් ඩොයිල් රදළයෙක්ය කියන්නෙ. සිංහලයින්ගෙ නිදහස නැති කිරීමට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට උදවු කළ නිසා තමයි මේ උදවියට ඔවුන්ගෙන් උදවු උපකාර ලැබුණේ. අනික් පැත්තෙ මහවලතැන්නෙ නිලමේත් ඩොයිල්ගෙ රදළයෙක්. සිංහලයගෙ නිදහස නැති කිරීම පිණිස බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ට උදවු කළ නිසා ඒ නිලමෙටත් නින්දගම් දුන්නා. අගමැතිනිය පැවතගෙන එන්නෙත් ඔය පවුල් වලිනුයි. මව් පාර්ශ්වයෙනුත්, පිය පාර්ශ්වයෙනුත්, මේ රදළ පවුල් දෙකෙන් තමයි අගමැතිනිය පැවත එන්නෙ. ඒ නිසා අපි ඇස්ති නැහැ, මේ ආණ්ඩුවට සමාජවාදී ආණ්ඩුවක්ය කියන්න. අපේ රටේ නිදහස සම්පූර්ණයෙන්ම ආරක්ෂා කරන්න පුළුවන් ආණ්ඩුවක්ය කියන්න පුළුවන්කමක් නැහැ. විදේශීන්ගෙ දේවල් සම්පූර්ණයෙන්ම ගන්න පුළුවන් ආණ්ඩුවක්ය කියන්න පුළුවන්කමක් නැහැ. මේ ලංකාවේ මිනිසුන්ට අයිති දෙයක් තමයි බේරේ ගෙදර පත්තර කණ්ඩායම පවත්වාගෙන යන ආයතනය. ඒකට අත තියන්න ඉස්සර වෙලා විදේශීය බැංකු නවය ගන්න ඕනෑ. ඒ වගේම ඒජන්සි හවුසස් 14 ගන්න ඕනෑ. මේ රට සමාජවාදය කරා ගමන් කරවන්න ඕනෑ නම් ඒවා තමයි කරන්න තියෙන්නෙ. ඒවා කරගෙන ගිහිල්ලා මේ රට සමාජවාදය කරා ගමන් කරවීමෙන් පස්සෙ තමයි විජේවර්ධන පවුලට අත තියන්න, විජේවර්ධන පවුලට අයිති දේවල් මහජනයාට ලබා ගන්න, ඉදිරිපත් වෙන්න තියනේනෙ. ඒක එතකොට කරන්න පුළුවනි.

මීට වඩා යමක් කථා කරන්න මට වෙලාවක් නැති නිසා මම මගේ වචන ස්වල්පය අවසන් කරනව. අපි විශේෂයෙන් මතක් කරන්නෙ, මේ ආණ්ඩුවට අද කිසිම යුතුකමක් නැහැ, බලයක් නැහැ, මේ රටේ පාලනය තව දුරටත් දිගටම කරගෙන යන්න කියන එකයි. දැන් ඉතින් අගමැතිනියගෙන් ඉෂ්ට වෙන්න තියෙන එකම යුතුකම නම් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඡන්දයක් තැබීම පමණයි. [බාධාකිරීම්]

[මේ අවස්ථාවේදී සී. පී. ද සිල්වා මහතා (මින්නේරිය) ආණ්ඩු පක්ෂයෙන් විරුද්ධ පාර්ශ්වයට ගියේය.]

**ලක්ෂ්මන් ද සිල්වා මයා.**
*(திரு. லக்ஷ்மன் டி சில்வா)*
(Mr. Lakshman de Silva)

ජාතිය වෙනුවෙන් වටිනා පරිත්‍යාගයක් කළ වීරවරයාට ජය වේවා.

අ. භා. 5.48

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

*rose*——

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Who is giving time to the hon. Member for Dambadeniya?

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தினர்)*
(Hon. Members)

No one!

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Then I do not think I can allow him to speak. I shall try to give him a few minutes later.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

I gave in my name quite early.

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක**
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)

I will give him a few minutes of my time.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You will get 15 minutes from the Hon. Minister's time.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී වචන ස්වල්පයක්වත් කථා කිරීමට මට ඉඩක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. කොයි කොයි රටවලත් ඒ ඒ රට වල ඉරණම විසඳන ඉතාමත් වැදගත් අවස්ථාවල් කීපයක් වරින් වර ඇති වෙනව. ඒ විධියේ ඉරණම විසඳන අවස්ථාවක් තමයි දැන් අපේ රටටත් ලබා තිබෙන්නෙ. අපි කවුරුත් හැම විටම කල්පනා කරන්න ඕනෑ, ආණ්ඩුවක්ය කියන වර්ගය අද ඇති වෙනවා හෙට නැති වෙනවා කියන සිද්ධාන්තය ගැන. එහෙත් රජය කියන එක හැම කාලයකදිම තිබෙන දෙයක් බව කල්පනා කරන්න ඕනෑ.

මේ රට නිදහස්ව තබා ගැනීමට අවුරුදු දෙදහස් පන්සියයක කාලයක සිට අපේ මුතුන්මිත්තෝ සටන් කළ බව අපි දන්නව. මේ වැදගත් අවසථාවෙත් අප රට සම්බන්ධයෙන් එවැනි තත්ත්වයක් උද්ගත වී තිබෙන බව කල්පනාවට ගන්න අප කාටත් යුතුකමක් තිබෙනව. මෙවැනි අවස්ථාවක අපට තියෙන්නෙ අපේ යම් යම් කෝන්තර පිරිමහන එක නොවෙයි. අපට දැන් සිද්ධ වෙලා තියෙන්නෙ අපේ නිදහස නැති නොවන ආකාරයට අපේ රට වෙනුවෙන් කටයුතු කරන්නයි. මේ ආණ්ඩුවෙත් යම් යම් දුර්වලකම් තිබෙන බව ඇත්තයි. ඒ වුණත් මේ වෙලාවෙ ඒ ගැන තර්ක කරන එක නොවෙයි කළ යුතුව තිබෙන්නෙ. මේ ආණ්ඩුවෙ දුර්වල කම් තිබෙනවය කියන එක ගැන ප්‍රශ්න කරන්න දෙයක් නැහැ. මාත් මේ ආණ්ඩුව වෙත මගේ විවේචන එල්ල කළා මේ පැත්තෙ ඉඳගෙන. ආණ්ඩුව පැත්තෙ ඉඳ ගෙන වුණත් මා මේ ආණ්ඩුව විවේචනය කළා. එසේ කරමින් වැඩ කරගෙන යන අවස්ථාවේ මාත් පන්නා දැමූ බව ඇත්තයි. එසේ කළේ මා ආණ්ඩුව විවේචනය කළ නිසයි. නමුත් පරණ වැරදි ඉදිරිපත් කරමින් මේ අවසථාවේදී මේ ආකාරයට ඡන්දය පාවිච්චි කිරීම යුතුද? අද අප ඉදිරිපිට ඇත්තේ කුමක්ද? අප කල්පනා කළ යුත්තේ කුමක්ද?

අද අප ඉදිරිපිට තිබෙන ප්‍රශ්නය නම් ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති රාජාසන කථාවයි. අද ඡන්දය විමසන්නෙත් ඒ රාජාසන කථාව ගැනයි. කරවල මිල ගණන් ඉහළ ගිහින්ය, මහජනයාට කිසිම වැඩක් කෙළේ නැත, පත්‍ර ගන්න යනවාය ආදි ප්‍රශ්න සැමදම රටේ තිබෙන ප්‍රශ්නයි. නමුත් ඒ ප්‍රශ්න අද ඉප ඉදිරිපිට තිබෙන කාරණයට අදාළ ප්‍රශ්න නොවෙයි. අද අප ඉදිරිපිට තිබෙන්නේ බුද්ධාගමට තැන දීම සහ ඉන්දියානු ප්‍රශ්නය යන ප්‍රශ්න දෙක පමණයි. ඒ කාරණා දෙක උඩ ඡන්දය පාවිච්චි කිරීමයි අද අපේ යුතුකමව තිබෙන්නෙ. පරණ කෝන්තර තිබෙනවා නම් ඒ සම්බන්ධව වෙන පිළිවෙළකිනුයි ක්‍රියා කළ යුත්තෙ. නමුත් මේ අවස්ථාවේදී රට වැසියා බලන්නේ බුද්ධාගම වෙනුවෙන් මේ ආණ්ඩුව ක්‍රියා කෙළේ කෙසේද, ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව ක්‍රියා කෙළේ කෙසේද, ඒ ප්‍රශ්න දෙක වෙනුවෙන් ඡන්දය පාවිච්චි කර ඇත්තේ කෙසේද යන්න පමණයි. ඉන්දියාණ්ඩුවත් ලංකාණ්ඩුවත් ඉන්දියානු ප්‍රශ්නය ගැන ඇති කර ගත් ගිවිසුම සම්බන්ධයෙන් මේ සභාව අද දෙන තීරණය මොකක්ද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

දැන ගැනීමට ඉන්දියාණ්ඩුවේ ශාස්ත්‍රී අගමැතිතුමා බලාගෙන ඉන්නවා. මේ ගිවිසුම මේ තැනට ගෙනැවිත් තිබෙන්නේ ආණ්ඩුවම පමණක් නොවෙයි, විරුද්ධ පක්ෂයේ නායකයනුත් සමගයි. මීට කලින් ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් අනන්ත සට්ඨණ සහ හැප්පිලි ඇති වී තිබෙනවා. නමුත් ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ තරම් සමගියක් ඇතිවුණ යුගයක් ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳව කටයුතු කිරීමේදී කවදාවත් නොතිබුණාය කියන්න පුළුවන්.

ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳව මීට කලින් ආණ්ඩු ගත් සෑම තීරණවලටම ලංකා සමසමාජ පක්ෂය විරුද්ධ වුණා. නමුත් මේ වර ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයට සම්පූර්ණ සහයෝගය දුන්නා. ඒ වාගේම කොමියුනිස්ට් පක්ෂය ආණ්ඩුවට විරුද්ධව මෙපමණ කලක් ක්‍රියා කළත්, මේ ඉන්දියානු ප්‍රශ්නයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සහයෝගය දුන්න. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය—යම් යම් මත භේද තිබෙන ප්‍රශ්න තිබෙන්න පුළුවන්—ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳව මේ ආණ්ඩුවත් සමගය කියා බය නැතිව කියන්න පුළුවන්. ඒ වාගේම යම් යම් විරුද්ධ මත තිබුණත් මහජන එක්සත් පෙරමුණත්, මේ ප්‍රශ්නයේදි ගිවිසුමට පක්ෂපාතිත්වය තිබෙන බව ඒ නායකතුමා කියාවි. ඒ වාගේම ගණන් ඉලක්කම් ගැන යම් යම් විරුද්ධකම් තිබුණත්, අපේ වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) ගිවිසුමට පක්ෂය කියන හැඟීම එතුමාගේ කටින් පිට වුණා. ඒ අනුව පෙඩරල් පක්ෂය හැර අනික් සෑම පක්ෂයක්ම මේ ප්‍රශ්නයේදී පක්ෂපාතව ආධාර උපකාර ඇතිව සතුටු කරගෙන තිබෙන මේ අවස්ථාවෙදී පත්‍ර ගැනීමත්, කරවල ගණන් වැඩිකමත් ආදී ප්‍රශ්න ඉදිරිපත් කරමින් විරුද්ධව ඡන්දය පාවිච්චි කිරීමට යාම සුදුසුද කියා අපි හොඳින් විමසා බලන්න ඕනෑ. සමහර විට යම් යම් මන්ත්‍රීවරු හෙට මේ ගැන තම අදහස් දැක්වීමේදී කියන්න පුළුවන්, මේ රාජාසන කථාවට විරුද්ධව අපි ඡන්දය දුන්නේ, පත්‍ර ගන්න යන නිසාය කියා. තවත් කෙනෙක් කියන්න පුළුවන් රටේ ප්‍රශ්න විසඳා නැති නිසාය අපි විරුද්ධව ඡන්දය දුන්නෙ කියා. ඔය විධියේ කථා අපට අහන්න ලැබේවි. ආණ්ඩුවේ මන්ත්‍රීවරු හතර දෙනෙක් හෝ, පස් දෙනෙක් හෝ දහ දෙනෙක් හෝ විරුඬ පාර්ශ්වයට ගියා නම් ඉන්දියාවට යන පණිවුඩයේ සඳහන් වන්නේ ඒ මන්ත්‍රීවරු ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධව නැගිට ගිය බවයි. එම නිසා මෙවැනි ජාතික ප්‍රශ්නයක් විසඳන්නට පුළුවන්කම ලැබී තිබෙන මේ අවස්ථාවේදී හැම පක්ෂයක්ම, හැම මන්ත්‍රීවරයෙක්ම හැම නායකයෙක්ම හැම සිංහලයෙක්ම එඩිතරව ඊට සහයෝගය දිය යුතුයි. මෙයට විරුද්ධ වුණොත් තමුන්නාන්සේලාට මේ රට සාප කරනවා නොඅනුමාන බව බය නැතිව කියන්න පුළුවන්.

මේ ආණ්ඩුව කළ වැරදි අනන්තයි. මම ආණ්ඩුව වෙනුවෙන් කථා කරනවා නොවෙයි. නමුත් අනිත් ඡන්ද කාලයේදී මෙහි සිටින මන්ත්‍රීවරුන්ට, සමසමාජ පක්ෂයෙන් හෝ වේවා, එක්සත් ජාතික පක්ෂයෙන් හෝ වේවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් හෝ වේවා, තෝන්ඩමන්ගේ අවසරය නැතිව ආසන ඉල්ලන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. මෙපමණ කාලයක් තිස්සේ තිබුණේ මොන විධියේ තත්ත්වයක්ද? ඡන්දයක් ඇතිවන කොට මේ අය තුන් දහසක් හෝ වේවා, හාර දහසක් හෝ වේවා, එහෙම නැත්නම් පන් දහසක් හෝ වේවා සිටිනවා නම්, තමන්ගේ ඡන්දය පාවිච්චි කරන අවස්ථාවේදී ඒ අය හැම දෙනාටම තොන්ඩමන්ගේ අවසරය ලබා ගන්න සිඬ වෙනවා.

ඒ උදවියට පුරවැසි භාවය තිබෙනවා නම්, පුරවැසියන් හැටියට කටයුතු කරනවා නම්, එකම ගොඩකට එක් වී එක අදහසක් අනුව එකම විධියට කටයුතු කරන්නේ මොන කාරණයක් නිසා ද කියා මම ප්‍රශ්න කරනවා. අපත් මේ රටේ පුරවැසියන් නොවෙද? එහෙම නම් මෙරට පුරවැසි භාවය ලබන ඉන්දියානුවන්ටත් තමන්ගේ ඉන්දියානු ගතිය අමතක කර දමා අප වාගේ කටයුතු කරන්නට පුළුවන්කමක් නැද්ද? හැම ප්‍රශ්නයකදීම තොන්ඩමන් කියන ආකාරයට අලුත් පුරවැසිකම් ලබන ඉන්දියානුවන් කටයුතු කරන්න නොවද සූදානම් වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටින්නේ ? මේ දේවල් උරුමයෙන් ආපු දේවල්ද ? නමුත් කථානායකතුමනි, අපේ පුරවැසියන් නම් ළිඳක් කපනවා නම් පාරක් හදනවා නම්, එක්තරා ප්‍රතිපත්තියක් අනුව, නීතියක් තිබෙනවා නම් ඊට අනුකූලව කටයුතු කරනවා. නමුත් මෙරට පුරවැසිකම් ලබන ඉන්දියානුවන් කටයුතු කරන්නේ ඒ ආකාරයෙන් ද? නැහැ.

යම් විධියෙන් මෙසේ පුරවැසිකම් ලබන උදවිය කොටසක් එක මතයක් දරනවා නම්, තවත් කොටසක් තවත් මතයක් දරනවා නම්, තවත් කොටසක් ඊටත් වඩා වෙනස් මතයක් දරනවා නම්, අපට සිතා ගන්න පුළුවනි, මේ උදවිය ඉන්දියානු ගතිය අතහැර, අපේ රටේ පුරවැසිභාවය ලබාගෙන අපේ පුරවැසියන් ලෙස කටයුතු කරනවාය කියා. නමුත් මොන ප්‍රශ්නයක් ආවත් ඉන්දියානු ගොඩට වැටී—මේ රටේ සෑම ආසනයකම විසිරී තිබෙන මෙරට පුරවැසිකම් ලැබූ ඉන්දියානුවන්—ඉන්දියාවට පක්ෂව ඡන්දය දෙනවා නම්, ඉන්දියාවට පක්ෂව කටයුතු කරනවා නම් උදව් දෙන්නට පුළුවනි, නැත්නම් උදව් දෙන්නෙ නැත, යන ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම් කොයි අන්දමින් ද අප ක්‍රියා කරන්නේ කියා මෙහිදී කල්පනා කර බැලිය යුතු දෙයක්.

අපි කොමියුනිස්ට් අදහස්වලට ගරු කරනවා, එම නිසා අප ඒ අයට උදව් කරනවාය කියා කීවොත්, ඒ විධියට වැඩ කළොත්, එහෙම නැත්නම් වෙනත් ප්‍රතිපත්ති දරණ පක්ෂයකට සහයෝගය දුන්නොත්, ඒ පැත්තට කටයුතු කළොත් ඊට වරදක් කියන්නට බැහැ. නමුත් හැම ප්‍රශ්නයකදීම ඒ අන්දමට නොවෙයි මේ අය කටයුතු කරන්නෙ. කොමියුනිස්ට් පක්ෂයට කියනවා නම් "උඹලාට අපි උදව් කරනවා, අපට උදව් කරනවාය, ඉන්දියාවට පක්ෂව කටයුතු කරනවාය කියන පොරොන්දුව පිට"; එහෙම නැත්නම් යු. එන්. පියට කියනවා නම් "ඕනෑම ප්‍රශ්නයකදී ඉන්දියාවට හිස නමනවාය, ඉන්දියාවට පක්ෂව කටයුතු කරනවාය කියා පොරොන්දු වෙනවා නම් උඹලාට උදව් කරනවා" ය කියනවා නම්; එහෙම නැත්නම් ඒ ආකාරයෙන්ම ස්වාධීන කාරයාට කියනවා නම්, ඒ පරමාර්ථය යටතේය උඹලාට උදව් කරන්නෙ, ඡන්දය දෙනවා නම් දෙන්නේ, කියන අදහසක් දක්වනවා නම්, එවැනි කොටසක් සමග එකමුතු වී රටක් පාලනය කළ හැකි ද යන්න කල්පනා කර බැලිය යුතු වැදගත් ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, අප පක්ෂයක් වශයෙන් බෙදෙනවා නම් අපට පක්ෂ ප්‍රතිපත්ති තිබෙන්න ඕනෑ; පක්ෂ සංවිධාන කරන්න ඕනෑ. පක්ෂ පරමාර්ථ තිබෙන්න ඕනෑ. නමුත් මෙය පක්ෂ ප්‍රතිපත්ති හෝ පරමාර්ථ මුල් කරගෙන සෑදුනක් නොවෙයි. ඉන්දියාවට වාසි වෙනවා නම් පමණයි ඒ අයට පක්ෂව අලුත් පුරවැසියන් ඡන්ද පාවිච්චි කරන්නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
(திரு. டி. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)
තමුන්නාන්සෙ මොන පක්ෂයෙ ද?

**ආර්. ජී. සේනානායක මයා.**
(திரு. ஆர். ஜீ. சேனாநாயக்க)
(Mr. R. G. Senanayake)
මට මොන පක්ෂයක්වත් නැහැ. එම නිසා තමයි මට භය නැතුව කථා කරන්න පුළුවන් වෙන්නෙ. පක්ෂයක් තිබුණු කාලයේදී මගේ කට බැඳලා තිබුණු නිසා මගේ හිතට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන්න සිදු වුණු අවස්ථා අනන්තයි. එම නිසයි, මගේ ස්වාධීනත්වය රැකගෙන හිතට එකඟව මට අද දින කථා කරන්නට පුළුවන්කම ලැබී තිබෙන්නෙ. එම නිසා මා තමුන්නාන්සෙලාට කියන්න ඕනෑ, අනික් වර මැතිවරණයකට ඉදිරිපත් වෙන්නට කලින් වෙනම ඡන්ද ලැයිස්තුවක් අපට මේ අවස්ථාවේදී වුව මනා කරන බව. ඉන්දු—ලංකා ගිවිසුමෙන් මේ අන්දමට පොරොන්දු වී තිබෙනවා. අලුත් පුරුවැසියන් ඉන්දියානු ප්‍රශ්නය වෙනස් කර ගෙන අපේ අදහස්වලට එකඟ පිරිසක් වන තුරු, අපේ ප්‍රශ්න ගැන, අපේ කැක්කුම් ගැන, අපේ වේදනා ගැන, අපේ හැඟීම් ගැන අවබෝධයක් ලබාගන්න තුරු, එකම රටක ජීවත්වන සහෝදර පුරවැසියන් වශයෙන් හැඩ ගැසෙන තුරු, ඉන්දියානු ගතිය අමතක කර අපේ රටේම වැසියන් වශයෙන් සකස් වන තුරු, වෙනමම ඡන්ද ලැයිස්තුවක් තබා ගෙන වෙනමම මන්ත්‍රීවරුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

පත් කර ගැනීමට ඉන්දු-ලංකා ගිවිසුමෙන් ඉඩකඩ ලැබී අවසාන බව මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, එක්ලක්ෂ තිස්පත් දහසක පමණ පිරිසකට දැනටමත් ලාංකික පුරවැසිකම් ලැබී තිබෙනවා, ඒ අයගේ නම් ඡන්ද ලැයිස්තුවලට වැටී තිබෙනවා. ඒ අයගේ බලය කොතරම්ද කීවොත් දැනටමත් ආසන 50 ක 60 ක ඉරණම ඒ අයගේ අතේ තිබෙනවා. ඒ පැත්තේ වේවා, මේ පැත්තේ වේවා, එහෙම නැත්නම් වෙනින් පැත්තක වේවා, ඒ අයගේ ඡන්දය ප්‍රකාශ වී තිබෙනවා. ඒ අයගේ බලය දැනටමත් ආසන 50 කට 60 කට විසිරී තිබෙනවා. නමුත් අවාසනාවකට වාගේ ඉන්දියානු ප්‍රශ්නය ගැන කථා කරන්න සිටින්නේ මන්ත්‍රීවරුන් තුන් දෙනකු පමණයි. වැලිමඩ රාජරත්න වීරයා තනියෙන්ම ඒ ප්‍රදේශයේ සටන ගෙන යනවා. තොන්ඩමන්ගේ කවේ ඉඳගෙන සටන් කරන අනික් වීරයා නුවරඑළියේ ගරු මන්ත්‍රීවරයා (වී. විලියම් ප්‍රනාන්දු මයා) යි. හැබැයි ඉන්දියානු බලවේගයක් නැතුව, පිරිසිදු ප්‍රදේශයක,—දඹදෙණියේ—සිට සටන ගෙන යන්නේ මම පමණයි. අපි තුන් දෙනා පමණයි මේ තරම් ලොකු සටනක් ගෙන යන්නෙ. මට නම් ඉන්දියානුන්ගෙ බලපෑමක් නැහැ. නමුත් අපේ වැලිමඩ මන්ත්‍රීතුමාගේ ආසනයටත්, විලියම් ප්‍රනාන්දු මන්ත්‍රීතුමාගේ ආසනයටත් ඉන්දියානුවන්ගේ බලපෑම තිබෙනව. ඇත්ත වශයෙන්ම ඒ දෙදෙනා ගෙන යන සටන පුදුමයි. අප තුන්දෙනාට පමණක්ද මේ ප්‍රශ්නය ගැන කැක්කුමක් තිබෙන්නේ ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

නැහැ, නැහැ.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

කැක්කුමක් තිබෙනවා නම් ඇයි සටන් කරන්නෙ නැත්තෙ ? ඇයි තමුන්නාන්සෙලත් ඉන්දියානුන්ට විරුද්ධව සිංහ හඬක් නංවන්නෙ නැත්තෙ ? සාකච්ඡාව සඳහා ඉන්දියාවට ගිය අවස්ථාවේදී ඉන්දියන් නියෝජිතයන් කියා තිබෙනවාලු ඉන්දියාවට විරුද්ධව ලංකාවේ හැඟීමක් නැත කියා. ඇත්ත වශයෙන්ම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීන් 150 න් තුන් දෙනෙක් පමණක් නොවෙයිද මේ ප්‍රශ්නය ගැන කථා කරන්නෙ ? කෝ අනික් උදවිය.

හොඳයි, මේ එක්ලක්ෂ තිස්පත්දහසකට මේ ආකාරයට අද බලය පෙන්වන්න පුළුවන් නම්, ඒ ගොඩට අළුතෙන් තවත් තුන් ලක්ෂයක් වැටුණොත් අපට යන කල දසාව තමුන්නාන්සේලාට පෙනෙනවා නොවේද ? ඒ නිසයි මා මේ කරුණ ඉදිරිපත් කරන්නෙ. වෙනමම ඡන්ද ලැයිස්තු සාදා ඒ අළුත් පුරවැසියන් ඒ ඡන්ද ලැයිස්තුවලට ඇතුළත් කරමු. මෙපමණ කාලයක් තුළ ඉන්දියානුවන්ට තිබුණු බලය නැති කිරීමෙන් සිංහලයන්ට නිදහස ඇති කර දෙමු. එතකොට නැවත වරක් තමුන්නාන්සේලාට තොන්ඩමන්ගේ පිහිට නැතිව, තොන්ඩමන්ගේ වරම නැතිව, තමුන්නාන්සේලාගේම මන්ත්‍රීන් පත් කර ගන්න අවස්ථාව ලැබෙනවා. ඒ නිසා මොන මොන සට්ටන තිබුණත්, මොන මොන පෞද්ගලික මතභේද කෝලාහල තිබුණත්, මේ රාජාසන කථාවේ සඳහන් ගිවිසුමේ තිබෙන ආකාරයට පුළුවන් තරම් ඉක්මනින් ඉන්දියානුන් සඳහා දෙවන ඡන්ද ලැයිස්තුවක් සාදා ගන්න වුවමනා කරනවා. එසේ ඡන්ද ලැයිස්තුවක් සෑදීමට මේ ආණ්ඩුව විශේෂයෙන් කටයුතු කළයුතු බව මා තරයේම මතක් කරනවා. තමුන්නාන්සේලාට යම් විධියකින් මේ කටයුත්ත කර ගන්න බැරි වුණොත් නැවත වරක් මේ ගිවිසුම අනුව ක්‍රියා කරන්නට වෙන්නේ ඡන්ද විමසීමකින් පසුවයි. එවැනි අවස්ථාවකදී මෙතුමාට මොන විධියේ බලයක් පාවිච්චි කරන්නට පුළුවන්ද කියන්නට අපට බැහැ. ඒ ප්‍රශ්නවලට සටන් කරන්න දැනට රුපියල් එක් කෝටි විසි ලක්ෂයක අරමුදලක් රැස් කර තිබෙනව. එතුමාගේ සංවිධානය එකම යුද්ධ කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කරනව. තොන්ඩමන් මහත්මයාගේ පණිවුඩ යන විට මුළු කඳුකරයේ හැම දෙමළාම නැගී සිට එක විධියට ක්‍රියා කරනවා. එවැනි සංවිධානයක් තිබෙන අතර තමුන්නාන්සේලා නැවත වරක් එක එක මතභේද අනුව හැප්පෙන විට අර සංවිධානයට ඔවුන්ගේ බලය අනුව ව්‍යවස්ථාදායක බලය අල්ලා ගැනීමට පුළුවන් වෙනවා නොවේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලා දන්නවා ඩොනමෝර් කොමිෂන් සභාව මේ උදවියට ඡන්ද බලය දෙන විට මේ රටේ සිටියේ නව ලක්ෂයයි. ඩොනමෝර් කොමසාරිස්වරු දුන් සහනය අනුව දෙලක්ෂ අනූදහසක් ඡන්ද බලය ඉල්ලුවා. නමුත් ඒ දෙලක්ෂ අනූදහස එක රොත්තට වැඩ කළ නිසා මුළු උඩරට ආසන සියල්ලම චේළුපුල්ලෙලාට ලබා ගන්නට පුළුවන් වුණා. ඒ නම් ලැයිස්තුව මා තමුන්නාන්සේලාට කියවීම යුතුයි. රාමනුජම්, සුබ්බයියා, කුමාරවේළු, මෝතා, වේලුපුල්ලෙයි, රාජලිංගම්, තොන්ඩමන් ආදී නුසි අළුත්නුවර, කොටගල, මස්කෙළිය, නුවරඑළිය, තලවකැලේ, නාවලපිටිය, යන ආසන දිනා ගත්තෙ. ඒ නිසා නැවත වරක් මේ උදවියට ඡන්ද බලය දුන්නොත් උඩරට සිංහලයන්ට ආසන දිනා ගන්න පුළුවන්ද කියා අපි කල්පනා කරන්ට ඕනැ. මේ දෙලක්ෂ අනූදහසක ඡන්ද බලය ගත් කොටස කළ හරියයි. අද ඡන්ද ලැයිස්තුවල එක්ලක්ෂ තිස් දහසක් ඉන්නවා. ඒ එක්ලක්ෂ තිස් දහසට තවත් තුන් ලක්ෂයක් වැටුණොත් සිංහලයන්ට උඩරට ආසන ලබා ගැනීමට පුළුවන් වේද කියා කල්පනා කළ යුතුයි. ඒ නිසා විශේෂයෙන්ම තමුන්නාන්සේලා මේ ගරු සභාවේදී තීරණයක් ගැනීමයි කළයුතුව තිබෙන්නෙ. ඉන්දියානු ගිවිසුම හොඳද නරකද යන ප්‍රශ්නය සම්බන්ධවයි— මෙපමණ කාලයක් තුළ කථාකර තිබෙන්නෙ. ඉන්දියානු ගිවිසුම හොඳද නැද්ද යන්නයි, අද තමුන්නාන්සෙලාගෙ සභාව ඉදිරිපිට තිබෙන ලොකුම ප්‍රශ්නය. එය හොඳද ? හොඳ නම්—[බාධා කිරීමක්]. කරවල මිල වැඩි වුණාටවත්, ටයර් නැති වුණාටවත්, පත්‍ර ගැනීම පිළිබඳ පණත නිසාවත් නොවෙයි, මෙම ඉන්දියානු ප්‍රශ්නය විසඳන්ට යන ආකාරය හොඳද ? නැද්ද, දෙවන ඡන්ද ලැයිස්තුවක් වුවමනාද නැද්ද, කියන ප්‍රශ්න උඩම තමුන්නාන්සෙලාගෙ ඡන්දය පාවිච්චි කරන්නය කියන එකයි, මතක් කළ යුත්තෙ. එසේ නොකළොත් දෙවන ඡන්ද ලැයිස්තුවක් මේ රටේ ඉතිහාසය තිබෙන තෙක් සාදාගන්න අවස්ථාවක් නම් ලැබෙන්නෙ නැහැ. මේකයි, ඉරණම විසඳෙන අවස්ථාව. මෙම අවස්ථාවෙ එක්සත් වෙලා කටයුතු නොකළොත් නැවත දෙවන ඡන්ද ලැයිස්තුවක් ඇති කර මෙපමණ කාලයක් පැගී සිටි උඩරට ගැමියා නගා සිටුවීමට අවස්ථාවක් මින් මත්තේදී නම් නොලැබෙනවාය යන්න සිතේ තබාගෙන ඉන්දියානු ප්‍රශ්නය උඩම ඡන්දය පාවිච්චි කරන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය මම අවසාන කරනවා.

අ.භා. 6.7

**ඩී. එස්. සමරසිංහ මයා. (ප්‍රවෘත්ති හා ගුවන් විදුලි කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. எஸ். சமரசிங்ஹ—தகவல், ஒலிபரப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. S. Samarasinghe—Parliamentary Secretary to the Minister of Information and Broadcasting)

මට වචන සවල්පයක් කතා කිරීමට ඉඩ සලසා දීම ගැන ස්තුතිවන්ත වෙනව. මෙම විවාදය පටන් ගත් වෙලේ පටන් නොයෙකුත් මතභේද ඇති වුණා. දෙපැත්තෙන්ම— ආණ්ඩු පක්ෂයෙන් මෙන්ම අනිකුත් පක්ෂවලිනුත්— නොයෙකුත් අදහස් ඉදිරිපත් වෙනවා දකින්ට ලැබුණ. එම නිසා මා විශෙෂයෙන් වචන ස්වල්පයක් කතා කරන්න අදහස් කළා.

ඊයෙ කථා කළ මාතර ගරු මන්ත්‍රීතුමා (එම්. සමරවීර මයා.) පක්ෂයෙ ප්‍රතිපත්තිවලට විරුද්ධව මේ රජය ගමන් කරනවාය කියමින් කරුණු කිපයක් මෙම සභාව ඉදිරිපිට තැබුව. නැසී ගිය ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා සමග ඉතා කුඩා කාලයේ සිට මා ආශ්‍රය කර තිබෙන කෙනෙකු වශයෙනුත් මා එතුමගෙ ඡන්දදායකයකු වශයෙනුත්, පරම්පරාගතව එතුමා ආශ්‍රය කළ පවුලක කෙනෙකු වශයෙනුත්, එතුමා ගිය පාර සියයට සියයක් අනුගමනය කරන කෙනෙකු වශයෙනුත් මෙම අවස්ථාවෙදි කියන්න කැමතියි, එතුමාගේ ප්‍රතිපත්ති එකහෙළා පිළිගනිමින් අපි අපේ ගමන ඉදිරියට ගියාය කියන එක.

සමහර වෙලාවට මගේ කතාව කුමන විධියෙ එකක්ද කියන එක සමහරුන්ට තේරුම් ගන්න බැරි විය හැකියි. අපේ සමහර පාක්ෂිකයන්ගෙත්, සමහර මන්ත්‍රීවරුන්ගෙත් ලොකු බියක් සැකයක් ඇති වී තිබෙන බව පේනව, මේ අවස්ථාවෙදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සමරසිංහ මයා.]

අවුරුදු ගණනාවක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ලේකම්වරයකු ලෙස වැඩ කළ අයකු හැටියට අප වෙත ගලා ආ පැමිණිලි දෝෂාරෝපණ වගේම ප්‍රශංසාත් සසඳා බලන විට පසුගිය කාලය තුළ අපේ දුප්පත් ජනතාව අතර විශාල සැකයක් ඇති වී තිබෙන බව මට පෙනී ගියා, අපේ ඒ අසහාය නායකයගෙ නියම ප්‍රතිපත්ති වලට හානියක් මෙම අවස්ථාවෙදි ඇති වේද කියන ප්‍රශ්නය උඩ. වෘත්තිය සමිති යනාදියෙන් ඒ ගැන අදහස් ඉදිරිපත් වුණා. මා නොයෙකුත් අවස්ථාවලදි කිව, කවුරු නැති වුණත්, තනිවම වුණත්, අපේ අගමැතිතුමාගෙ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යාමට අප සූදානම්ය කියා. ඒ වගේම මේ අවස්ථාවෙදි කියන්න කැමතියි, ඒ ආකාරයෙන් ඉදිරියේදීත් එතුමා ගිය මැද පිළිවෙත අනුව කටයුතු කිරීමට අපි සූදානම්ය කියා. ප්‍රතිපත්තියක් වශයෙන් දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාර නායක අගමැතිතුමා සිටින කාලයේදී මෙන්න මෙහෙමයි අපේ ප්‍රතිපත්ති, කියා ව්‍යවස්ථා මාලාවක් සකස් කර තිබුණා. ඒවායින් කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට මිනිත්තු දෙකක පමණ කාලයක් මට වුවමනා කරනව. ඒවා මෙසේයි :

"ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මයන් වූ විවිධ පෞද්ගලික සහ සාමූහික නිදහස් රැසකි. මේ නිදහස ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යවශ්‍ය අංග ලක්ෂණ යන් සේ අප විසින් සලකනු ලැබේ. උදාහරණයක් වශයෙන් නිදහස්ව කල්පනා කිරීම සහ අදහස් ප්‍රකාශ කිරීම, රැස්වීම් පැවැත්වීම, ආගම් ඇදහීම, චන්ද බලය පාවිච්චි කිරීම යනාදිය පෞද්ගලික නිදහස වශයෙන් අප සලකනු ලැබේ."

"අග හිඟකමින්, බියෙන්, නූගත්කමින් හා රෝග පීඩා ආදියෙන් නිදහස් වීම සාමූහික නිදහස වශයෙන් අප විසින් සලකනු ලැබේ. මහජනයාගේ නිදහස් ඡන්ද බලයෙන් තෝරා ගනු ලබන පාර්ලිමේන්තුවක් මගින් ආණ්ඩු කිරීම, පාලන තන්ත්‍රයෙහි කාර්යක්ෂම භාවය සහ අපක්ෂපාතිත්වයද අධිකරණයෙහි ස්වාධීනත්වයද ප්‍රජාතන්ත්‍රවාදයෙහි මූල ධර්මයන්සේ අප විසින් සලකනු ලැබේ.'' ඒ අපේ ව්‍යවස්ථාවල ප්‍රධාන අංකයට තිබූ දේවල්.

ඊළඟට දෙවැනි අංකය වශයෙන් තව වචන කීපයක් සඳහන් කරන්න කැමතියි. රටේ ජනතාවගේ එල ප්‍රයෝජනය පිණිස රජයේ මුළු ශක්තිය යෙදවීමද සෑම දෙනාටම එක හා සමාන අවස්ථාවක් ලබාදීමද එසේ කිරීමෙන් පංති විරහිත සමාජයක් බිහි කිරීමද සමාජවාදයේ මූල ධර්මයන් සේ අපි පිළිගනිමු. එසේ හෙයින් එක් අතකින් ප්‍රජාතන්ත්‍රවාදීවූ සමාජවාදය මත සමාජවාදය කරා යන ගමන ප්‍රජාතන්ත්‍රවාදි ආයතනයක් යටතේ සිදු වන හෙයින්, ඒකාධිපතිවාදි සමාජවාදි ක්‍රමයන්ට පටහැණි වන අතර එවැනි බල හත්කාරකම්වලින් තොරව මහජනතාව ගේ අදහස් උදහස්වලට එකගව ක්‍රමානුකූලව කෙරෙන බවත්, අනික් අතින් ප්‍රජාතන්ත්‍රවාදි ධනේශ්වරවාදයට පට හැණිව ප්‍රජාතන්ත්‍රවාදයේ නොව ධනේශ්වරවාදයේ ප්‍රතිඵලයක් වශයෙන්වත් වූ ඇතැම් පෞද්ගලික නිදහස් සීමා කළ යුතු බවද අපගේ විශ්වාසයයි.

ඉහත සඳහන් පරිදි මේ අපගේ දෙආකාර වූ සමාජ ප්‍රජාතන්ත්‍රවාදි සිද්ධාන්තයන්ට තුන් වැනි අංග ලක්ෂණයක් අන්තර්ගත කළ යුතුය. එනම්, ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය හා සංවර්ධන යයි.

ඔය අප මූලික වශයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එසේම බණ්ඩාරනායක ප්‍රතිපත්ති වශයෙන් ගෙන ගිය කාරණය කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්නේ අපේ ප්‍රතිපත්ති කුමක්ද කියා නොදන්න අයත් සමහර විට අප අතරේ සිටින්නට පුළුවන්ය කියන හැඟීම උඩයි. එම නිසා අප සෑම අවස්ථාවකදීම මැද පිළිවෙත ගෙන යනවා. මැද පිළිවෙතේ ප්‍රතිඵලයක් වශයෙන් ඉන්දියාවේ අගමැති ශ්‍රී නේරුතුමා සිටියදී පංච සීල ප්‍රතිපත්තිය අපේ බණ්ඩාරනායක අගමැතිතුමා ගෙන ගිය ප්‍රතිපත්තිය අනුගමනය කළාය කියන එක තමුන්නාන්සේලා දන්නවා.

අනික් කාරණාව මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියයි. ලෝකයේ සෑම රටක් සමගම එක හා සමාන මිත්‍රත්වයෙන් සිටීම අපේ මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය වශයෙන් සැලකූ නිසා, සෑම රටක් සමගම මිත්‍රත්වයෙන් මේ කුඩා රට දියුණු කිරීම පිණිස ක්‍රියා කිරීම.

අනික් කාරණාව : සෑම මිනිහෙකුටම උස් පහත් භේදයක් නැතිව ඒ තැනැත්තාගේ මනුෂ්‍ය අයිතිවාසිකම එක හා සමානව පාවිච්චි කිරීමේ අයිතිවාසිකමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනික් කාරණාව: වැඩි ජනතාවවූ සිංහල ජනතාවගේ මූලික භාෂාව සිංහල භාෂාව විය යුතු නිසා, රට පුරා එක හෙළාම සිංහල භාෂාවෙන් කටයුතු කිරීමයි. ඒ එක්කම ප්‍රධාන අංශය වන්නේ අපේ රට පෞරාණික රටක් වශයෙන් ඓතිහාසික රටක් වශයෙන්, ශිෂ්ට රටක් වශයෙන් ලෝකයේ අනික් රටවල් පිළිගත්තේ, බෞද්ධාගම අනුව අවුරුදු 2,500 ක් තිස්සේ හොඳ සුවිනීත ශිෂ්ට අවබෝධයක් ඇති ශාන්ත පිරිසක් මේ රටේ වාසය කළ නිසයි. ඒ කාරණා අනුව තමයි අපේ නායකයා මැද පිළිවෙත කියා මාර්ගයක් ඇති කර, මෙන්න මේ ප්‍රතිපත්ති අනුව ගමන් කළොත් කිසි කෙනෙකුට පීඩාවක් නොවන විධියට මේ රට දියුණු කර ගැනීමට කාගේත් සහයෝගය අරගෙන පළිගැනීම්, ඊර්ෂ්‍යා කිරීම්, ක්‍රෝධ ආදියෙන් තොරව කාටත් එක හා සමාන සැලකිල්ලක් ඇතිව ගෙන යන අතරේදී ජාතියට ඔබින ජාතික අධ්‍යාපන ක්‍රමයක් ගොඩ නැගිය යුතුය කීවේ.

ඔය විධියට බලන විට තමුන්නාන්සේලාට තේරෙනවා මේ මැද පිළිවෙත ගෙනාවේ මොන කාරණයක් උඩද කියා. විශේෂයෙන් සඳහන් කර තිබෙනවා, උස් පහත් බේදය සලකන්නට එපා; කුල බේදය සලකන්නට එපා; උඩරට පහත රට බේදය සලකන්නට එපා; ලාංකිකයා නියම ලාංකිකයා වශයෙන් පිළිගත යුතුයි, කියා. ඔන්න ඔය කාරණා ගැන විශේෂ පැහැදීමක් ඇතිව අපි සමසේ ජීවිත පූජාවෙන් අපේ ධන පරිත්‍යාගයෙන් එදා සිට මේ පක්ෂය ගෙන ගියා. දීර්ඝ කාලයක් පක්ෂයේ ලේකම් වශයෙන් වැඩ කළ කෙනකු හැටියටත්, පළපුරුද්දක් ඇති කෙනකු හැටියටත්, මා වෙත ගලා ආ අදහස්වල හැටියට මේ අවසථාවේදී මා විසින් ඉටු කළ යුතු යුතුකමක් තියෙනව. යම් විධියකින් අපි නියම ප්‍රතිපත්ති ඉදිරියට ගෙන නොගොස් අතරමං වී ඇද්ද, අපි අතරමං වෙයිද, අපේ තත්ත්වය මොකක්ද යන්න දැන ගැනීමට මහජනතාව සතුටින් සිටිනව. යම් කිසි විධියකින් ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරමින් ඒ මාර්ගය ඔස්සේම ඉදිරියට යාමට යම් යම් අපහසුකම් හෝ බාධාවන් තිබෙනවා නම් ඒ කිසිවකට යට නොවී අපේ ඒ අසහාය නායකයා ගෙන ගිය ක්‍රියා පිළිවෙළ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරමින් ඉදිරියට ගෙන යාමට කවුරු නැති වුණත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නාමයෙන් අපත් ඒ ගරු කරන පිරිසත්, අප සමග සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාවත් සමග ක්‍රියා කරන බව මේ අවසථාවේදී ප්‍රකාශ කරමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

අ. භා. 6.17

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක**
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)

On this occasion when I rise to speak I cannot help thinking that what we are witnessing in this House today really is something which, I am sure—if I may say so—is a question of confidence, if not a crisis of confidence. I see around us a number of former Colleagues, hon. Members of this House, who have been in the service of this House for a long while, many of them Colleagues who have served as Ministers of this Government for long periods of time, hon. Members of Parliament who have done distinguished service to this House, raising questions completely unrelated, if I may say so, to the Throne Speech. And, on the basis of these questions, indicating their inability, on this occasion, to vote with the Government, either by their declarations or by their silence—or by the fact that they have moved across and taken seats on the other side.

Let us stop for a moment to examine the facts and ask ourselves what really is the underlying question behind all this, what really is the inspiring factor. My good Friend from Kolonnawa stated a moment ago in immaculate Sinhalese the thoughts contained in the election manifestos of the S.L.F.P. He indicated the emphasis placed upon certain fundamental ideas underlying the very concept of democracy. He talked about the freedom of elections; he talked about the free use of votes; he talked about the independence of the judiciary and he talked about other basic fundamental concepts involved with the very practice of democracy which, indeed, has been practiced in this country right from Independence up to date.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

In this context let us examine carefully where the problem lies. I had the advantage of listening to the speech of my good Friend the hon. Member for Avissawella. I remember the time—not so long ago—when there were other hon. Members of the House who used to fling the taunt of dictatorship right at me and none other. I remember the hon. Member for Avissawella rising in my defence and saying: "I do not think his thoughts are wrong, but I think he is a damned fool to say it". That was what the hon. Member for Avissawella said.

The hon. Member for Avissawella says that this Government has a bad record, that it has no socialist record, that it has ruined this country and that we have made this country go from bad to worse. Economic solutions have to be found says my good Friend the hon. Member for Avissawella in his own inimitable style and language—alternating between the loud tones of wrath and the softness of his indictmnet. But let us examine the text of what he says.

We all know the contemporary history of this country and it is not necessary for me to recount it. I do not have a long political history ranging back to 30 or 35 years unless I start from the day I was born. May I say this? It was not so long ago when many sections of the Members of this House—and I was one of them—who firmly believed that a coalition of all the socialist parties would help to solve the economic and social problems of this land. I believed it then. There were a group of men—some of them in the Opposition, some of them in the Government and some by themselves. And this group of men firmly believed at that time that this Government was capable of a socialist achievement, that this Government was capable of making use of their many and varied talents and that this Government was capable of taking this country further along the progressive and socialist path. What has happened may I ask since then to make the very persons who, at that stage, had confidence that this country had a future under this Government, who at that stage believed that this Government would lead this country in the correct direction, to doubt its very premises?

Is it not true at that stage when our Colleagues of the L. S. S.P. joined this Coalition Government, there were others constituting the then United Left Front, who firmly believed that it was a mistake for the L. S. S. P. to take this step alone, and that it should have been taken in association with the others? And supposing the history of this country had come to be written in a different form, supposing for a moment that those who believed that the coalition of all socialist forces was necessary in this country, had succeeded in their endeavours, would we have then heard the speeches we have heard today indicting this Government with a bad record, a record of failures, a record of having done nothing, a record of having indulged in corruption of the worst order according to hon. Members of this House? No, Mr. Speaker. If they were sincere and honest, would they have ever thought for a moment of coalescing with corruption, would they have thought of joining forces with persons who have no socialist perspective, would they have thought for a moment of working hand in hand with feudalists for the protection of feudalism!

These are, Mr. Speaker, words in Ceylon politics that have many and varied uses. We use them occasionally as terms of endearment, we use them occasionally as terms of abuse, but taken all in all and forgetting for the moment the personal difficulties, the personal problems that arise from time to time, let us make an honest attempt to analyze the political situation from 1960 onwards, and then judge for ourselves what has happened.

In 1960, after the assassination of the late Prime Minister, we know what became of the S. L. F. P. Its forces were scattered. It did not exist.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

No one knew who was to be trusted and was not to be trusted. Nobody was sure. Every honest man in the Sri Lanka Freedom Party was looked upon with doubts. That was the situation then.

My good Friend the hon. Member for Avissawella says the Prime Minister did not even condescend to contest the Attanagalla seat, the seat of her late husband, from the S. L. F. P. That is perfectily true. She sent in her nomination papers as an independent and in the circumstances prevailing, a couple of months after the assassination, is anyone in this House going to blame her for it. Is it unnatural that the widow of the assassinated Prime Minister should have a problem, on the one hand, the loyalty to her husband's people, the people who had made him Prime Minister, elected him their Member of Parliament for a term of thirty years, or to drop them completely merely because she was just not sure what degree of involvement members at that time in the party had. You will recall, at that stage my good Friend the hon. Member for Galle (Mr. W. Dahanayake) was the Prime Minister, Mrs. Vimala Wijewardene was a Cabinet Minister and Mr. Stanley de Zoysa was also a Cabinet Minister. In those circumstances are we going to say that Mrs. Bandaranaike deserted the Sri Lanka Freedom Party ?

On the other hand what actually happened ? Mrs. Bandaranaike did come into politics in January, 1960 ; she came in a very hesitant way ; she came as patron of the party ; she addressed a few meetings here and there. My good Friend the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) says she wept. But I can say that in consequence of our action others had to weep. Be that as it may she came into politics. She did not win the election. My good Friend the hon. Leader of the Opposition won that election. He formed a Government.

There were many of us then who were also in this House who sat together as Colleagues and voted together. We had just one Throne Speech. That was the duration of that Session of Parliament. And during that Session I well recall how many hon. Members of this House were called upon to make very difficult decisions, decisions under the leadership of the hon. Member who now sits in the middle of the back row of the Opposition, my good Friend the Hon. C. P. de Silva. He was our leader and I can assure you that it was a privilege and a pleasure to serve him as Leader of the Opposition. We stood firmly together. We had no doubt we were a poor lot. We did not have money. We did not have the resources to fight other elections. If there are temptations, as people say, floating around today I venture to say that the temptations that floated around in those days were far greater, and yet there were hon. Members whose dignity and confidence in themselves, certainly on the policies they stood for were big enough and good enough to ensure risking their seats on a dissolution of Parliament and a willingness to face the people with confidence come what may. There were two or three of us who did not come back in that Parliament ; there were two or three hon. Members who lost their seats upon that dissolution, who were not returned to this House, members of the Sri Lanka Freedom Party ; I remember them well. I remember them making their speeches here on the Floor of this House declaring their determination to stand steadfast, not for any personal gain or reward. The Sri Lanka Freedom Party had very little to offer ; we still have very little to offer in the way of emoluments or rewards ; but the party had an ideal, an ideal which we believed and felt was well worth defending, and I still believe it is well worth defending to this day.

Nothing has changed to make the principles that the late Prime Minister stood for any the less valuable or valid today than they were on the date when he was struck down when he should have been in this Chamber on his way to Parliament by the cruel hand of an assassin. And it is indeed a tragedy and, I think, my good Friend the Hon. C. P. de Silva would be the first person to grieve

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක]

at the absence of his leadership in the Sri Lanka Freedom Party thereafter.

Mr. Speaker, what did we stand for then and what do we stand for now? The fact of a coalition with another political party, what does it involve and what has it meant? I know that there are many people, particularly when they sat in the Opposition, who believed that there were simple solutions to all problems, who told us the same thing when we held the reins of Government, who smiled politely and said, "If we were in power we know how to do it much better than you". People told me the same thing. I see my hon. Friend the Member for Avissawella smiling, he will recall it. When I was Finance Minister in 1960, 1961 and 1962, I had occasion to make three Budget speeches in this House, and on every one of these occasions every section of this House told me where I was wrong. My good Friend the hon. Leader of the Opposition told me, "Your Budget deficits are recurring year after year. This bodes no good for you. You are going to get into trouble one or these days. Your external assets will fall. You are drawing them down. You are running into trouble. You had better heed my words." My good Friend, the hon. Member for Wattala (Mr. Jayasinghe) read me statistics of the Central Bank to show that we only had money in the kitty to pay for imports in the next two months. My good Friend, the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) tried to show me that a greater socialist orientation was required in regard to some of the measures which I proposed, although he did say at that time that some of the proposals I made were not bad but might have been better. Then there were others who said that every single thing I did was wrong and who told me that from a theoretical point of view I was doomed to disaster.

The same things were said about the Hon. Minister of Internal and External Trade and Supply. It is not peculiar to any one individual. We have all been told what a rotten job we were doing at different times.

What it comes to is this, that when an attempt is made to take action to reduce a Budget deficit, when an attempt is made to take the necessary corrective actions in an economic sphere, you yourselves, who gave us the prescription and told us what should be done, said, "Well, it cannot be done; you are wrong and you must go". And we have gone—we make no bones about it. But there are no quick and speedy solutions. If we have not found immediate solutions, does it mean that we have failed? No, Mr. Speaker, I submit that we have not failed.

In what way does the Coalition Government mark a difference in the principles and policies which we are committed to? As a Coalition we are naturally agreed not to hide ideological differences. It is difficult to talk about differences. It is no good, for example, our entering into dialectic debates as to the merits and demerits of a particular variety or theory of Marxism, as to who is a revisionist and who is not, as to what is right and what is wrong. That serves no purpose. So far as we are concerned, we of the S.L.F.P. are firmly committed to what we believe is the middle path, and whatever anyone else may say, we mean to stick to it and we shall stick to it. So far as others are concerned, they believe that the philosophy of the middle path is not the correct one. It is a genuine and sincere belief and we shall not interfere with it, nor shall we criticize others' beliefs, nor be rude about them, nor enter upon discussions, however much you gentlemen in the Opposition may seek to tempt us into doing exactly that in the hope of creating confusion and differences among us. We shall not fall into that trap.

We have not so far criticised one another. We have refrained from attacking each other's fundamental beliefs in politics because that is not necessary. We are here to do a job of work, a job enshrined in the 14-point programme. I analyzed those 14 points when I wound up

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

the Debate for the Government during the Fifth Session of this Parliament. I analyzed every one of those points. We talked about language, religion, culture. We talked about advisory councils. We talked about every single point in that programme. We even talked about the press.

I refrained personally from speaking about the press in this context merely because I think it would be incorrect etiquette for me to make any comment when I am personally litigating with one of the newspaper companies concerned. That is the only reason why I remained silent on this subject. I have spoken before— I have spoken from 1960 onwards. My views are well known. You can find them in the back numbers of HANSARD. I do not propose to repeat them now.

What is the factor that now creates a crisis? What is there new in the present situation that did not exist earlier? If hon. Members are called upon to think and review the past——

කථානායකතුමා
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

May I know whether the Hon. Minister of Internal and External Trade will give the Hon. Minister of Agriculture ten minutes of his time?

ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)

The Hon. Minister agrees, Sir. I will not take much time. I want to make just one or two further remarks.

What is there in the present situation that makes a difference? So far as I can see, the only circumstance is this. Those days, practically all the parties that are now, as the hon. Member for Avissawella says, uniting to fight a danger of tyranny, a danger of dictatorship, at that stage thought that the danger of dictatorship proceeded from me. The only difference was that and therefore all of you for different reasons and with different arguments sought to say "this man is dangerous". And so I faded away consciously and deliberately. I stepped down in order to ensure that the Party would be able to continue along the middle path and not along any other path, in order to ensure that our Party policies would be proceeded with.

I appreciate that the march to socialism is a slow one especially when one works within a democratic framework. It has to be so. We work upon the action and inter-action of opinions, after consideration, after giving thought to different points of view and seeking to accommodate them and in that process I think when I was a little younger I myself described it as being, might we say, a peaceful co-existence with reaction. But it does not matter. That degree of peaceful co-existence is necessary not merely in international affairs but indeed in the everyday life and work of our Parliament, and it is on that basis that we shall seek to work with you and we seek your understanding and co-operation to work on the same basis. I say this particularly to the hon. Member for Wattala (Mr. Shelton Jayasinghe) who is coughing.

This morning he tried to draw me into an argument calculated to show that this country has no flour. He sought to create a panic in regard to Bombay onions. In other words, he is not particular about the particular item of foodstuff he picks on so long as he can try to create a crisis but he will not succeed in creating either because I think he will agree that the very newspapers which are about to be taken over could hardly be the exponents or advocates for the Government and carrying our propaganda to prove to him that his own figure as to the price of onions is wrong and there is no flour shortage. Surely, those are the circumstances.

We have no reason to be apprehensive of changes. We are committed to the same course as before. We are

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

not afraid of the people's votes but still let it be made clear to all hon. Members from the Floor of this House that this Government opened its first Throne Speech in 1960 by declaring that we were elected by the free votes of the people and we are therefore prepared to submit ourselves at any time to the judgment of the free votes of the people and by that judgment we are not afraid to stand at any time.

I have nearly done. I do not propose to deal in detail with the comments on the Throne Speech because hardly any hon. Member of this House has talked about the Throne Speech.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
You were not here.

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක**
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)
They have talked about various things ; they talked about the newspapers which were not even mentioned in the Throne Speech.

**ජයසිංහ මයා.**
*(திரு. ஜயசிங்ஹ)*
(Mr. Jayasinghe)
Why not ?—[*Interruption*].

**ගරු එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක**
*(கௌரவ எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(The Hon. F. R. Dias Bandaranaike)
We talk about re-introducing lapsed Bills, but you have been debating the Second Reading of the newspaper Bills. I am not going to engage on that.

I propose to make one remark in regard to the Indian question and that is the point raised by the hon. Appointed Member who made a long speech in regard to the question which he sought to raise. I shall not deal with it in detail now because I appreciate that Parliamentary time is short. I only want to say this. I have discussed different aspects of this matter with him in private which he well knows and he himself agrees that there has to be certain adjustments, in view of the Pact between the Prime Minister of India and the Prime Minister of Ceylon, in regard to voting arrangements but the form and manner of those voting arrangements is a matter on which, I think, he holds different ideas. I would like to assure the hon. Appointed Member that the Government will give his point of view every consideration and take decisions thereafter. My good Friend, the Hon. Minister of Trade and Commerce, will speak on that when he winds up the Debate.

Thank you, Mr. Speaker, and thank you all hon. Members of this House.

අ. භා. 6.40

**සී. පී. ද සිල්වා මයා. (මින්නේරිය)**
*(திரு. சீ. பீ. டி சில்வா—மின்னேரிய)*
(Mr. C. P. de Silva—Minneriya)
ගරු කථානායකතුමනි, 1956 අවුරුද්දේ අප්‍රේල් මාසයේ සිට ආරම්භ වුණු යුගය "පරිවර්තන යුගයකැ" යි අපේ දිවංගත අග්‍රාමාත්‍ය ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා විසින් කරන ලද හැඳින්වීම අපේ මව් බිමෙහි ඉතිහාසයට ඇතුළත්ව තිබේ. අපේ හිටපු නායකතුමා කනගාටුදායක අන්දමින් අප අතරින් තුරන් වී ගිය නමුත් එතුමා සමග දුකේදීත් සැපේදීත් උරෙන් උර ගැටී එතුමා සමගම දේශපාලන භූමියේ සිටි අය හැටියට අවුරුදු අටකට පසු අප විසින් අපගෙන්ම ඇසිය යුතු ඉතා වැදගත් ප්‍රශ්නයක් තිබේ. ඒ ප්‍රශ්නය නම් මේ පරිවර්තනය දැන් කොයිබට යන්නෙහිද ? යුතුයි.

සම්පූර්ණ වගකීමෙන් යුක්තවත් කණගාටු සහගතවත් මා විසින් සඳහන් කළ යුතු එක් කරුණක් ඇත. එනම් සභාග ආණ්ඩුව ඇතුළත මා දන්නාවූත්, මා අසා තිබෙන්නාවූත්, මට දකින්නට ලැබී ඇත්තාවූත් කරුණු අනුව සලකන විට අපේ රට මුලුමනින්ම ඇඩි ඒකාධිපතිත්වයක් කරා ගමන් කරමින් පවත්නා බවයි. මේ වනාහි මොනම ව්‍යාජ කථාවකින් හෝ —

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බුද්ධාගමට නියම තැන දෙන බවට සැක සහිත පොරොන්දුවක් දීමෙන් මහජනයාගේ සිත් වෙනත් අතකට යොමු කිරීමේ ව්‍යාජයකින් හෝ—සඟවා තබන්නට බැරි සත්‍යයකි.

කථානායකතුමනි, ඒකාධිපතිවාදය වනාහි අපේ දිවංගත අගමැතිතුමා විසින් ඉතා අගය කොට සලකනු ලැබූ ප්‍රතිපත්තිවලට සම්පූර්ණයෙන්ම විරුද්ධ වූවකි. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා සිය ලුම බාධක මැඩ පවත්වාගෙන සටන් කෙළේ අපේ මහජනතාව බිහිසුණු ඒකාධිපතිවාදයේ දරුණු පාලනයක් යටතට පත් කිරීමට නොවේ. එතුමා ප්‍රජාතන්ත්‍රවාදී අන්දමින් අපේක්ෂා කළ අන්දමට 1956 දී ඉතා ප්‍රබල අන්දමේ මහජන කැමැත්තක් දිනා ගත්තේ මෙවැනි ඒකාධිපතිවාදයකට පාර කැපීමට නොවේ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනගන ලද්දේ දිවංගත බණ්ඩාරනායක මහතා විසින් ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජවාදය කෙරෙහි තබනු ලැබූ සවිර විශ්වාසය නමැති අත්තිවාරම උඩය. එතුමාගේ ශ්‍රේෂ්ඨ නායකත්වය යටතේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගිමේදී දුකත් සැපත් සමසේ බෙදා ගත් අය හැටියට අපි එතුමාගේ උතුම් අරමුණු දැන සිටියෙමු. ප්‍රජාතන්ත්‍ර සමාජවාදි පාලන ක්‍රමයක් ගොඩනැගීම සඳහා ක්‍රියා කිරීමේදී හැම විටම එතුමාගේ සිතේ පැවති අරමුණ වූයේ මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය සියලු ආකාරයෙන්ම ආරක්ෂා විය යුතු බවයි. ප්‍රජාතන්ත්‍රවාදී නිදහසට අබමල් රේණුවක තරමවත් හානියක් වන්නට ඉඩ නොදී රට වැසියාගේ ආගමික, සාමාජික සහ ආර්ථික උවමනාවන් සම්පූර්ණ කෙරෙන අන්දමේ සමාජයක් ගොඩනැංවීම එතුමාගේ අදහස විය. "පරිවර්තන යුගයේ" අවසානයේදී පැවතිය යුතුයැයි එතුමා බලාපොරොත්තු වූයේ එවැනි සමාජයකි. 1959 මැයි 16 වැනිදා කුරුණෑගල පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සම්මේලනයේදී එතුමාගේ කටින් කියැවුණු වචනවලින් තරම් මේ කාරණය පැහැදිලි වූ වෙනත් අවස්ථාවක් තවත් නැති තරම්ය.

දිවංගත අගමැතිතුමා විසින් ඒ පිළිබඳව පළ කළ අදහස් මෙසේයි:

"ප්‍රජාතන්ත්‍රවාදය ඒකාධිපති බලයට, දකුණින් වේවා වමෙන් වේවා, විරුද්ධ දෙයක්. ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් මනුෂ්‍යයකුට ආත්ම ගෞරවය ඇතිව ජීවත් වෙන්න ඉඩක් තිබෙනවා: වහලකු හැටියට නොවේ; ආත්ම ගෞරවයක් ඇතිව. අපි විශ්වාස කරනවා, එම නිසා, මනුෂ්‍යයන්ගේ වැඩි දියුණුව කෙරෙහි ප්‍රජාතන්ත්‍රවාදය බොහෝ වටිනා දෙයක් කියා. ඒක අපේ එක ප්‍රතිපත්තියක්. ආර්ථික කාරණා අතින් අප විශ්වාස කරනවා, විශාල ගණනක් සියයට හැත්තෑවකටත් වැඩි ගණනක් සමහර විට ඉතාම දුකසේ ජීවත් වෙද්දී සමාජවාදී ප්‍රතිපත්තිවලින් පිටස්තරව පුළුවන් වන්නේ නැහැ, සෑහෙන ජීවන තත්ත්වයක් මනුෂ්‍යයින්ට ලබා දෙන්න කියා.

රටක ඉන්න මනුෂ්‍යයින්ට ජීවත් වෙන්න තිබෙන අයිතිවාසිකම් පිළිබඳව මීට ඉස්සෙල්ලා අය සැලකුවේ නැහැ. ජීවත් වෙන්න පුළුවන් අය ජීවත් වෙනවා. අනික් අය ඕනෑ හැටියේ මැරෙනවා. මීට ප්‍රථම සැලකුවේ නැහැ, ඒ ගැන. මේ නව යුගයේදී නොයෙක් නොයෙක් විදියේ නොයෙක් නොයෙක් රටවලට එය පිළිගන්න සිද්ධ වෙලා තිබෙනවා. අන්න අපේ දෙවන ප්‍රතිපත්තිය. තුන්වන ප්‍රතිපත්තිය හැටියට අපි හිතනවා, ආගමක් අවශ්‍යය කියා. මම හිතනවා, ආගම සංස්කෘතිය වගේ දේවල් කොයි මනුෂ්‍ය ජාතියකටත් ඉතා වටිනා දේ බව. ඒ නිසා එයින් පිටස්තරව යම් කිසි පිරිසකට ජීවත් වෙන්න—දියුණු වෙන්න—පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. ඔන්න මුල් කරුණු තුන, අපේ ප්‍රතිපත්ති හැටියට.

එම නිසා අපි එක පැත්තකින් කොමියුනිස්ට් ධර්මයට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අනිත් පැත්තෙන් පැසිස්ට් ධර්මයට අපි සම්පූර්ණයෙන්ම විරුද්ධයි. අනිත් තුන්වැනි පැත්තෙන් ධනපතිවාදයට අපි විරුද්ධයි. තවත් විදියකින් ආගම ආදිය ගැන කිසි සැලකීමක් නැතිව මේ ජීවිතය ගැන පමණක් කල්පනා කරන ඉංග්‍රීසියෙන් "මැටීරියලිසම්" කියන එකටත් අපි විරුද්ධයි."

කථානායකතුමනි, ඒ සඳහන් කරන ලද්දේ මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ බලවත් විශ්වාසයක් දැරුවාවූත්, ප්‍රජාතන්ත්‍රවාදයට ජීවිතය කැප කළාවූත්, උත්තම ජාතික වීරවරයකුගේ වචනයි. මේ වචන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති මාලාවෙහි පැහැදිලි ලෙසම ගැබ් වී ඇත. එහෙත් මෙකී ප්‍රතිපත්ති අද විනාශ වී ගොස් තිබේ. දිවංගත අගමැතිතුමා විසින් අරමුණු කරගන්නා ලද ප්‍රතිපත්තිවලට ඉදුරා වෙනස් තත්ත්වයක් සභාග ප්‍රතිපත්ති සඳහා ඇති කරගෙන තිබෙන බව පෙනේ. සභාග ප්‍රතිපත්ති නිසා ජාතියේ භේදකාරී තත්ත්වයක්ද,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ද සිල්වා]

බිය සැකමුසු බව හා අවිනිශ්චිත බවක්ද පහළව තිබේ. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ උසස් ජීවන තත්ත්වයක් හා හොඳ අනාගතයක් පිළිබඳව අපේ රටේ මහජනතාව දිවංගත බණ්ඩාරනායක මහතා කෙරෙහි තබන ලද බලාපොරොත්තුව පුපුරා ගොස් ඇති අතර ජාතිය ගොඩ නැඟීමේ ඉක්මන් අරමුණ නොසලකා හැර දමා ඇති බවය.

ගරු කථානායකතුමනි, 1956 වර්ෂයේදී දිවංගත බණ්ඩාරනායක මහතා එතුමාගේ පළමුවැනි ඇමති මණ්ඩලයේ ඉඩම් ඇමති පදවියට මා පත් කිරීමෙන් මට මහත් ගෞරවයක් පිරිනැමුව. මේ සභාවේ සභා නායක පදවියටද එතුමා විසින් මා පත් කරනු ලැබූ බව සඳහන් කළ යුතුයි. අවුරුදු අටක් තිස්සේ මේ තනතුරු දෙක මා විසින් උසුලනු ලැබූ අතර, දිවංගත ගෞරවනීය නායකතුමා විසින් පෙන්වා දෙන ලද ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී සීමාවන් ඇතුළත සම්පූර්ණ ශක්ති ප්‍රමාණයෙන් මම සේවය කළා.

කථානායකතුමනි, අපේ මේ ධර්ම ද්වීපයේ ඉතිහාසය කියවා බලන විට අපට ඉතා පැහැදිලිව පෙනී යන්නෙ, අපේ පැරණි නරවීරයන් මේ රට පාලනය කළේ ත්‍රිවිධ රත්නයේ ආරක්ෂාවත්, මහා සංඝ රත්නයේ අවවාද අනුශාසනාවත් ඇතිව බවයි. නමුත් අද සභාග ආණ්ඩුව ඒකාධිපති වාදයේ ආගම් විරෝධී ප්‍රතිපත්ති පිළිගෙන, ත්‍රෛනිකායික මහා සංඝරත්නයේ උපදෙස් නොසලකා හැරීමෙන්, රටේ මහත් නොසන්සුන් තත්ත්වයක් පහළ වී තිබෙනව.

එම නිසා මට අවුරුදු 8 ක කාලයක් තුළ පැවරී තිබුණු ඉඩම් ඇමති පදවියත් සභා නායක පදවියත් ඒ සංඝරත්නය වෙනුවෙනුත්, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ මැද මාවත වෙනුවෙනුත් අත් හැර දමා මේ පැත්තට පැමිණියා. එයින් මා බලාපොරොත්තු වෙන්නෙ අපේ රටේ මහජනතාවට සාමාන්‍ය නිදහස් පුරවැසියන් හැටියට ජීවත් වන්ට පුළුවන් වෙයි කියායි. ඒ නිදහස් මනුෂ්‍යයන් අතරේ මටත් නිදහස් කෙනෙක් හැටියට ඉන්ට පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා. මේ අවස්ථාවේදී ඔබතුමා මට වචන ස්වල්පයක් කථා කරන්ට ඉඩ දීම ගැන ස්තුති කරමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 6.50

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ දෙවන මන්ත්‍රී)
*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)*
(Mr. P. G. B. Keuneman—Second Colombo Central)
*rose*——

**ඩඩ්ලි සේනානායක මයා.** (දැදිගම)
*(திரு. டட்ளி சேனநாயக்க—டெடிகம)*
(Mr. Dudley Senanayake—Dedigama)
Mr. Speaker—

**කෙනමන් මයා.**
*(திரு கெனமன்)*
(Mr. Keuneman)
Sir, I will not take long. Can I have five minutes?

**කථානායකතුමා :**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The party leaders have agreed upon the number of speakers and the time allotted to each speaker. Unless they agree to permit you to speak—

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)
I do not mind giving five minutes from the time allotted to me.

**ඩඩ්ලි සේනානායක මයා.**
*(திரு. டட்ளி சேனநாயக்க)*
(Mr. Dudley Senanayake)
I will give all my time, if necessary.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)
I thank the hon. Members for their generosity. I do not intend to take all their time.

Mr. Speaker, I did not intend to participate in this Debate. We have been witnessing here today not a Debate on the Throne Speech but an expression of a manipulation which does express a class struggle that is going on in the country. We just

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

heard the statement made by the hon Member for Minneriya. I remember Sir—and I was present in this House —when the late Mr. S. W. R. D. Bandaranaike crossed over from the United National Party. That was the beginning of a new development in the political history of this country. Since then there have been many attempts to thwart and to prevent the further development that started in 1951 and again in 1956.

I would recall, Sir, to your notice and to the notice of the House that all those attempts failed when they went to the people. We had since then the assassination of Mr. Bandara naike, the abortive election of March, 1960, the attempted *coup d'etat of* 1962, and today we are witnessing the *coup d'etat* which the Lake House, particularly, has been threatening for a long time.

The hon. Member for Minneriya will recall that those who applauded him so very vigorously today were the very people who combined in 1960 to prevent him from being called upon to form a Government when he had a majority in this House. He is welcome to his lot.

I wish to say this. There are many questions on which I do not agree with this Government, but in this straight class fight where all the reactionary forces have joined together, where certain hon.Members have suddenly started searching their political consciences when the Lake House is in trouble, and when a clear division is taking place between reactionary forces and those opposed to them, the intention of the Communist Party is to vote with the Government. We do that because a very clear line of action is taking place. I am only sorry that some people who have been in the progressive movement, some people who call themselves revolutionaries, have at this moment associated with the United National Party and the Lake House. I am extremely sorry [*Interruption*]. Do hon. Members of the Members of the Federal Party know that they are following the politics of the hon. Member for Welimada? They might please remember that.

I just wanted to make this statement because in this situation there is a clear line of action. As far as our party is concerned we will stand against all those forces that are with the United National Party.

අ. භා. 6.55

**ඩඩ්ලි සේනානායක මයා.**

*(திரு. டட்லி சேனநாயக்க)*

(Mr. Dudley Senanayake)

Mr. Speaker, I do not intend taking more than five minutes. Perhaps this is the shortest speech I am making in this House. I do not want to deprive the Hon. Minister who is to reply on behalf of the Government the valuable time that he needs. Moreover, I do not think there is any particular necessity for a very long speech.

We have been speaking to vast crowds, crowds of an unprecedented nature, crowds that never in such large numbers attended political meetings in the political history of this country.

We have put the case before them. The response to the case that we put before them must be perfectly obvious to hon. Members of this House.

Mr. Speaker, I just want to say a word or two about "reaction" that was referred to by the hon. Member who preceded me. "Reaction" has many meanings. At least, each person tries to interpret "reaction" in the way he choses. To me, any movement or any endeavour to restrict the freedom of the individual is reaction. All our desires, to whatever political party we may belong, is to enlarge the content of individual freedom.

We are fighting a reactionary measure for the suppression of the freedom of speech. That is the issue we are fighting, and it is perfectly obvious in this struggle where is reaction and where is progress and who is fighting for progress.

It is not strange that people of different political views should, at this juncture in the history of the country, come together to prevent the catastrophe of a dictatorship overtaking the country. That is the issue facing us.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලි සේනානායක මයා.]

The Hon. Minister of Agriculture, Food and Fisheries (Hon. F. R. Dias Bandaranaike) criticized some of the speakers who spoke earlier for not touching upon the subjects contained in the Throne Speech. We know that the Throne Speech has been the biggest bluff ever perpetrated on this country. It was necessitated by a number of lapses on the part of the Government in presenting the diabolical measure for the control of the press on the one hand and the legislation for the take-over of sixty per cent of the press on the other. That necessitated the prorogation and the Throne Speech. That is why we walked off during the ceremony for the opening of Parliament. We did that because we felt it was an abuse of the procedure of prorogation. The prorogation was intended to cover up the lapses on the part of the Government.

The Government tried to fool the people by talking of restoring Buddhism to its rightful place. At the end of their term of office, with impending death before them, in their dying hours, they want to fool the people by giving Buddhism its rightful place. The people refuse to be fooled.

The propaganda that they carried out through the radio in an endeavour to stop the meetings which were being held against the take-over of the press, the Government now knows, has proved to be futile. The people are roused; the people realize that this is the first step towards a dictatorship. Why is this dictatorship being thought of? Because the problems of the country have not been solved. Unemployment, the rising cost of living—those are problems to which the public have been looking for solutions. Can any of you deny that since you assumed office those probems have been aggravated? The cost of living: you have established a new record for Ceylon in the Cost of Living Index. It has reached the highest point ever. Unemployment? You have no cure for the unemployment prob'em and you are afraid to face the people.

Therefore, being greedy for power and for remaining in office whatever consequences befall the people, you are contemplating doing away with democracy and the parliamentary system of government. We are aware of all that. The people are aware of all that. Is it surprising that the people of this country who have enjoyed universal franchise for 33 years—and I claim proudly that Ceylon is the country in Asia that has enjoyed universal franchise the longest—are not going to yield that right of choosing the Government that they want? That was the issue before the people; that is the issue today, that is the issue that our amendment to the Throne Speech is posing before hon. Members of this House—[*Interruption*].

The hon. Member says that the hon. Member for Gampaha has said "We do not want a parliamentary system of Government." Others have said that the Prime Minister must be a Castro and that our necks should be cut with a sickle and our heads should be smashed with a hammer. This is all vain talk. Let me warn you that those who want to try those things—as every kite they flew—will end in disaster. Like every scheme they engineered to finish us off, everything will come round on to them. And when they endeavour to have that dictatorship —we are not afraid of our necks being cut—be careful of your own necks! That is the situation.

I am not surprised that many hon. Members on the other side realize that, once a dictatorship is ushered into this country, they will not be needed by the dictatorial regime. They will be asked to go home. Why have a Parliament? It is just a sham once you have a dictatorship. That is why as real patriots of this country they have severed their connections with a party that they helped on from success to success. I acclaim, them as patriots who have come to the rescue of the country, to save this country from the catastrophe that the present regime want to plunge it into.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I do not think any more words are necessary. I know what answer you will get from the people of this country.

අ. භා. 7.5

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratna)

ගරු කථානායකතුමනි, ආණ්ඩුව වෙනුවෙන් මේ විවාදයේදී කථා කිරීමට ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. ඒ වගේම මා ප්‍රීති වෙනව, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාගේ කථාවෙන් පසු මගේ කථාව කරන්ට ලැබීම ගැන. අද එතුමා ප්‍රීති වන දවසක්. බොහොම දුරට එතුමා ජය ග්‍රහණය කර තිබෙන දවසක්. ඒ වගේම පෙඩරල් පක්ෂය ජයග්‍රහණය කර තිබෙන දවසක්. අද එතුමා පිටුපසින් සිටි දේශීය හා විදේශීය සියලුම ප්‍රතිගාමීන් බොහොම නොඉවසිල්ලෙන් බලා සිටින දවසක්. අධිරාජ්‍යවාදී වැඩවසම් වාදී ධනවාදීන් මේ රටෙත් පිටතත් ඉඳගෙන සමහරවිට චීනක්කණ්ණාඩි දමාගෙන, ගුවන් විදුලි යන්ත්‍රවලට ඇහුම්කන් දීගෙන බොහොම නොඉවසිලිවත්ව බලා සිටිනව, අධිරාජ්‍යවාදීන්ගේ නාස් ලණුව බැඳගෙන මේ රටේ සිටින කොටස් මොන විධියේ කටයුතු කරගෙන ඉන්ට හදනවාදැයි කියා.

1956 වන තුරු එක්සත් ජාතික පක්ෂය අධිරාජ්‍යවාදීන්ගේ ධනපතිවාදීන්ගේ සහ වැඩවසම් වාදීන්ගේ රූකඩ ලෙසින් මේ රට ආණ්ඩු කරගෙන ගියා. නාහ ලණුව එහාට දීල මේ අය ඒ අයට වුවමනා විධියට ඇද ඇද හිටිය. නමුත් 1956 දී මහජනතාව දැන ගත්ත, සංස්කෘතික වශයෙන්, දේශපාලන වශයෙන්, හා ආර්ථික වශයෙන් තමන් සිටි තත්ත්වය. ඒ නිසා තමයි, සමාජවාදි සාම විප්ලවයක් ඇති කරගෙන මේ රටේ ආණ්ඩුවක් පවත්වාගෙන යන්ට දිවංගත අගමැතිතුමාට තැන ලබා දුන්නෙ. ඒ අවස්ථාවේදී මේ රටේ සිටි ප්‍රගතිශීලීන් සියලු දෙනාම අත්වැල් බැඳගෙන එතුමාට සහාය දීලයි, ඒ පරිවර්තන යුගයේ ප්‍රාරම්භය ඇති කළේ. එදා සිට අද වන තෙක් කිසිම පැකිලීමක් නැතුව, හෘදය සාක්ෂියට කිසිම විරුද්ධත්වයක් නැතුව මහජනයා අප කෙරෙහි තැබූ විශ්වාසය අනුව අප වැඩ කරගෙන ගිය බව කියන්ට පුළුවන්. සිංහලයට මුල් තැන දී ද්‍රවිඩ භාෂාවට සුදුසු තැන දුන්න. අද අපි වියඹී කරන්නෙ බුද්ධාගමට යථා ස්ථානය දී අනික් ආගම්වලට තැන දීම නීතිගත කරන්ටයි. ඒ වගේම කටුනායක, ත්‍රිකුණාමලය, වැනි අධිරාජ්‍යවාදී ගුවන් තොටුපලවල් අප අතට ගත්තා. සංස්කෘතික දෙපාර්තමේන්තුවක් ඇති කර මේ රටේ සංස්කෘතික අංශවලට තැනක් දුන්නා. සමාජවාදි ගමන සඳහා නොයෙක් පියවරවල් ගත්තා. බස් ජනසතු කළා. වරාය ජනසතු කළා. පෙට්‍රල් සංයුක්ත මණ්ඩලයක් ඇති කර පෙට්‍රල් වෙළඳාම අධිරාජ්‍යවාදීන්ගෙන් කඩා ගත්තා. රක්ෂණ ජනසතු කර ඒ මගින් මේ රටේ ධනය රඳවා ගත්තා. බැංකුවක් පිහිටුවා මහජනයාගේ ශුභසිද්ධියට කටයුතු කළා. එක බැංකුවක් රජයට පවරා ගත්තා. අනික් ඒවා සීමා කරගෙන ගියා. පාඨශාලා රජයට ගෙන ජාතික අධ්‍යාපනයක් ඇති කිරීමට වැඩ කරගෙන ගියා. සාමාන්‍ය ගොවි ජනතාවට තැනක් දීම සඳහා කුඹුරු පනත ඇති කොට කටයුතු කරගෙන ගියා. ගඳ ගසන කරවල වෙළඳාම ජනසතු කළා. ඒ මගින් විදේශීන් අත්පත් කරගෙන සිටි ධනය මෙහි රඳවා ගත්තා. මීට පෙර පිටරට කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය කරන ලද භාණ්ඩයි, මෙහි අලෙවි කෙළේ. නමුත් අපේ ආණ්ඩුව මෙහි කර්මාන්ත 420ක් පමණ ඇති කරගෙන වැඩ කරගෙන යනවා. හුඟක් ස්වාධීන වෙලා මේ රටේ තිබෙන කර්මාන්තශාලාවලින් නිෂ්පාදනය වන භාණ්ඩ නොයෙකුත් රටවල අලෙවි කරගෙන යනවා. මේ අනුව බලන විට සංස්කෘතික අංශයෙනුත්, ආගමික අංශයෙනුත්, භාෂා අංශයෙනුත්, සමාජවාදි අංශයෙනුත්, කර්මාන්ත අංශයෙනුත්, කොටින්ම කියනවා නම් හැම අංශයකින්ම, 1956 දී දෙන ලද පොරොන්දු ඉෂ්ට කරමින් සමාජවාදි ගමන ඉක්මන් කරගෙන යන අවස්ථාවකයි, මේ සිදුවීම් වන්නේ.

ඒ සමාජවාදි ගමනට බාධා කර ප්‍රගතිශීලීන් ලෙස පෙනී සිටින ඇතැමුන්ගේ සහායද, ජාතිවාදීන්ගේ සහායද ඇතිව මේ රටට නොයෙකුත් අන්දමේ විනා කරන පත්තර කාරයන්ගේ සහායද ඇතිව අධිරාජ්‍යවාදීන්ගේ සහායද ඇතිව විරුද්ධ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉලංගරත්න]

පාර්ශ්වයේ නායකයා ධනවාදී, අධිරාජ්‍ය වාදී, වැඩවසම්වාදී ප්‍රතිගාමී රජයක් ඉදි කිරීමේ බලාපොරොත්තුවෙන් හිනා වෙමින් ඉන්නවා. මාක්ස්වාදයේ පියාත් දැන් ඔහුට උල්පන්දම් දෙමින් ඔහු හා අත්වැල් බැඳගෙන සතුටින් ඉන්නවා. කුමක් වෙනවාද කියා එතුමා දන්නේ නැහැ. එතුමාට වන්නේ කුමක්ද කියාත් එතුමා දැනගන්න එකක් නැහැ. ජාතික කැක්කුමකින් බොහොම දුක් විඳින උදවි යත් එක පැත්තකින් ඉඳගෙන ඒ ගොල් ලන්ට රුකුල් දීගෙන ඉන්නවා. පෙඩරල් කාරයන්, කොම්පැනිකාරයන්, විදේශීය අධිරාජ්‍යවාදීන් හිස එසවූ විට මොන විධි යේ පාඩමක් ඉගෙන ගන්න ලැබේද කියා ඒ උදවිය දන්නේ නැහැ. ඒ නිසා විරුඬ පාර්ශ්වයේ නායකතුමා හිනා මූණකින් සිටීම ගැන පුදුමයක් නැහැ.

නමුත් ඔය හිනා මූණ තාවකාලිකයි. 1956 දී ලබා ගත් ජයග්‍රහණය 1960 දීත් අත්පත් කරගෙන කටයුතු කරගෙන ගියා. මේ ඉදිරි ගමන කිසි කලෙක නවත්වන් නට බැරි බව ඒකාන්ත වශයෙන් කියන්න කැමතියි. පිල් දෙක මොකක්ද කියා අද මහජනතාව හොඳ හැටි දන්නවා. මගේ මිත්‍ර මින්නේරියේ ගරු මන්ත්‍රීතුමා 1956 සිට අප සමඟ අත්වැල් බැඳගෙන සිටියා. 1956 සිටම එතුමා ඇමතිවරයකු වශයෙන් ක්‍රියා කළා. නමුත් එදාසිට අද දක්වා පල් වෙවී තිබුණු අමාත්‍යාංශයක් තිබුණා නම් ඒ ඉඩම් අමාත්‍යාංශය බව මතක් කරන්න ඕනෑ. අපි කොයි තරම් වීරිය කළත්, ප්‍රග තිය කරා ගෙන යන්න අපට පුළුවන්කමක් ලැබුණෙ නැහැ. ප්‍රතිගාමීන්ටත්, වැඩවසම් වාදීන්ටත් නම් හොඳින් වැඩ සිද්ධ වෙන්න ඇති. එහෙත් දුප්පත් අයට යම් කිසි සහනයක් ලැබෙන විධියෙ යම් යෝජ නාවක් ඉදිරිපත් කළ හැම අවස්ථාවකදීම පාහේ එය ඉෂ්ට කර ගන්නට බැරි වුණා. තමන් ගැන හැඳින්වීමක් කරමින් එතුමා කියන්න පටන් ගත්තා, තමා දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා සමඟ කාල යක් තිස්සේ අත්වැල් බැඳ ගෙන බොහොම ළඟින් ආශ්‍රය කළ කෙනකු බව. 1956 න් පස්සෙ දහ දෙනෙකුත් සමඟ එකතු වෙලා බණ්ඩාරනායක අගමැතිතුමාට විරුද්ධව නායකත්වයක් ඇති කිරීමට මොන විධියේ විප්ලවයක් ගෙන ගියාද යන්න අපි දන්නව. ඒ වගේම වැඩ පිළි වෙළක් අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) සම්බන්ධ යෙන් ගෙන ගිය බවත් අපි දන්නව. මොන එකක් ගෙනාවත්, ප්‍රගතිශීලි හැම එකකටම හරහට හිටගෙන කටයුතු කළ හැටිත් අපි දන්නව. අන්තිමේදී, සටන් කරලයි හරවා ගන්න පුළුවන් වුණේ. හැබැයි, එක හොඳක් තියෙනව. එක්කෝ අරලියගහ මන්දිරයට, එහෙම නැත්නම් කැබිනට් ශාලාවට ආ වෙලාවක අප කියන දේ හොඳට අහනව. ඒ වුණාට එතනින් පිට වුණාම මොන දෙයක් වෙනවද කියන්න දන්නෙ නැහැ. මොන විධියකින් හරි අවුල් ජාලාවක් වෙලා තමයි ආපසු එළි යට එන්නෙ. අදත් සමහර විට අරලියගහ මන්දිරයේ හෝ කැබිනට් ශාලාවේ හෝ හිටියා නම් මොන විධියෙ සිතුවිලි ඇති වෙන්න ඉඩ තිබුණද කියන්න තේරෙන් නෙ නැහැ. එතුමා මේ අන්දමට අද ගියත්, මේ මොහොතේ සිටම තමන් කළ දේ ගැන පශ්චාත්තාපයට පත් වෙලා නැවතත් අපේ පිළටම එන්ට වීරිය කරන වට කිසිම සැකයක් නැහැ.

1960 මාර්තු මාසයෙ 6 වන දා තමයි මේ විධියෙ තත්ත්වයක් ඇති වෙන්ට ගියෙ. එදා එක්කෙනෙක් බල ලෝභයෙන් පංච මහා බල මණ්ඩලයක් ඇති කරගෙන මේ රටේ ඒකාධිපතිත්වයක් ගෙන යන්ට සූදානම් වුණා. එදා ඒ අවස්ථාවේදී කිව්වෙ මොකක්ද? ඔළු දෙකක් නැත්නම්, පුද් ගලයන් දෙන්නෙක් කැබිනට් මණ්ඩලයෙ නැත්නම් කරගෙන යනවය කියලයි කිව්වෙ. ඒ විධියට හිටපු කෙනකු සමඟ අත්වැල් බැඳගෙනයි අද සටන ගෙන යන්නෙ. විරුද්ධ පාර්ශ්වයේ ගරු නායක තුමා ඒකාධිපතිත්වයට විරුද්ධයි කිව්ව. කොයි අවස්ථාවේදීද අපි ඒකාධිපතිත්ව යක් ගෙන යාමේ ලාංඡනයක් පෙන්නුවෙ. එදා එතුමන්ලගෙ කාලයේදී තමයි ඒකාධි පතිත්වය ගෙන ගියෙ. අද ඒ උදවියත් එක්ක ඉඳගෙන කථා කරනව. මොකක්ද වෙන්න යන්නෙ කියා මම අහන්න කැම තියි. දෙන්නෙක් නැත්නම්, කැබිනට් මණ්ඩලයට ඇතුළු වෙන්න පුළුවන්ය කිව්ව. කවුද ඒ දෙන්නා? අද ප්‍රතිගාමී නැද්ද? අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමා අද මොනවද කියන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பீ. ஆர். குணவர்தன)*
(Mr. D. P. R. Gunawardena)

මොනවද කියන්නෙ, ඇත්ත කියනවා මිසක් ? බොරුකාරයින් කියන දේවල් පෙන්නා දෙනවා මිස වෙන මොනවද කරන්නෙ ? සංඝයා වහන්සේලාට අබෞද්ධයින්ය කියන මිනිසුන්, සී. ඩබ්ලිව්. ඊ. එක නැති කළ මිනිසුන්, දූෂණවලින් පිරුණු මිනිසුන්, තමන්ගෙ නෑදෑයින්ගෙන් රජයේ ආයතන පුරවපු මිනිසුන්, මහජන බැංකුව නාස්ති කළ මිනිසුන් ගැන කිය නවා මිස වෙන මොන දේවල්ද කරන්න තියෙන්නෙ දන් ?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratna)

තවත් මොනවද කියන්න තියෙන්නෙ ?

**එම්. සමරවීර මයා. (මාතර)**
*(திரு. எம். சமரவீர—மாத்தறை)*
(Mr. M. Samaraweera—Matara)

පන්දම්කාරයො අත ළඟම ඇති.

**ස්ටැන්ලි තිලකරත්න මයා.**
*(திரு. ஸ்டான்லி திலக்கரத்ன)*
(Mr. Stanley Tillakaratna)

හොර හරක් මස්වලින් තර වුණු මිනිස්සු.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratna)

ඔන්න ඒකාධිපතිවාදයේ ලකුණු. මට කියන්න සිදු වී තිබෙනව, නොයෙක් විධියේ මත භේද ඇති කරන්න යන බව. පත්තර නිදහස ගැන කතාකළා. පෞද්ගලික නිදහස නැති කරන්න යනවය කිව්ව. විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමා කිය නව මේ රාජාසන කථාවට විරුද්ධව ඡන්දය දෙන්න කියල. මම අහන්න කැමතියි, මොකක්ද අපි කරන්න ගිය අපරාධය කියල. මේ රට වැසියාට ඕනෑකම තිබුණා මේ පත්තර සම්බන්ධයෙන් යමක් කරන්න. මේ පත්තර ඉතාමත් නරක විධියට පවත්වාගෙන යන බවට උද්ඝෝෂණයක් රටේ පැතිරී තිබුණා. ඒ අවස්ථාවේ ප්‍රජාතන්ත්‍රවාදී විධියටයි අපි වැඩ කළේ. අපි කොමිෂන් සභාවක් පත් කළා. ඒකට විරුද්ධව ගියේ නැහැ. මෙත්තානන්ද මහතාත් භික්ෂූන් වහන්සේලාත් කොමිෂන් සභාව ඉදිරියට ගොස් සාක්ෂි දුන්න. මල්වත්තේ මහනායක හිමියනුත් සාක්ෂි දුන්න. ඒ සැම දෙනෙක්ම කියා සිටියේ මේ ප්‍රවෘත්ති පත්‍ර අබෞද්ධ පත්‍රය, බෞද්ධ විරෝධි පත්‍රය, එම නිසා යම් කිසිවක් කළ යුතුය කියායි. ඒ කොමිෂන් සභාව ඊට පසු ස්ථිර නිගමනයකට බැස්සා. එසේ නිග මනයකට බැස අපට උපදෙස් දුන්නා, මෙන්න මේ විධියේ පියවර තුනක් ගත යුතුය කියා. එක පියවරක් පාලන මණ්ඩලයක් ඇති කිරීම. අනික් පියවර නීති මණ්ඩලයක් ඇති කිරීම. අනෙක, එකක් රජයට අරන් අනෙක් ඒවායේ අයිතිවාසිකම් පුළුල් කිරීම. ඒ අනුව ක්‍රියා කිරීම සඳහායි අපි මේ නිගමනයට බැස්සෙ.

මේ පත්‍ර බොහෝමයක්ම අබෞද්ධ පත්‍රය බෞද්ධ විරෝධි පත්‍රය කියා මල්වත්තේ මහනායක හිමියන් වහන්සෙත් කියා සිටිය. ඒ නිසා මා කියා සිටියේ බෞද්ධ විරෝධි පත්‍රවලට ඉඩ දීම බෞද්ධ විරෝධි ක්‍රියාවක් කියායි. නමුත් ප්‍රතිගාමි පත්‍ර දිගට හරහට නොයෙක් විධියට කපා කොටා පළ කළා, මල්වත්තෙ මහනායක හාමුදුරුවො අබෞද්ධයෙක්ය කියා මම කිව්වය කියා. එය සම්පූර්ණ අසත්‍යයක්. මේවා අල්ලා ගෙනයි මේ රටේ නොයෙක් වාද භේද ඇති කරන්නෙ. මෙවැනි දෙයටයි ඒ උදවිය උල් පන්දම් දෙන්නෙ. එම නිසා ඒ ප්‍රතිගාමී කොටස්වලට ආධාර දෙන කොටස්, එහෙම නැත්නම් ප්‍රගතිශීලි මුහුණුවරින් පෙනී සිටින කොටස්, මේ රටේ නැවතත් ප්‍රති ගාමිත්වය ඇති කිරීමට කොපමණ ක්‍රියා කළත් මේ රජයත් සමග අත්වැල් බැඳ ගෙන මෙහි සිටින්නාවූත්, මෙයින් පිටද සිටින්නාවූත්, උදවිය කිසිසේත්ම ඊට ඉඩ දෙන්නෙ නැති බව මම සහතික කොට කියන්න කැමතියි. මෙහි සිටින්නේ බොහෝම දුප්පත් උදවියයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉලංගරත්න]

විරුද්ධ පාර්ශ්ව නායකතුමා නිදහස ගැන කථා කරනවා. එතුමා කියා සිටියා එතුමන්ලා කථා කරන්නෙ පෞද්ගලික නිදහස ගැනය කියා. මොකක්ද ඒ පෞද්ගලික නිදහස? පෞද්ගලික නිදහසය කියන්නේ පවුල් හතරකට පහකට පමණක් සීමා කරමින් ඒ පත්‍ර ඒ විධියටම පවත්වාගෙන යාමට ඉඩ දීමටද? දස ලක්ෂයක් පමණ දෙනෙකුගේ කට වසා පවුල් කීපයක් පමණක් එකතු වී දුවවන පත්‍රවලට නිදහස් පත්‍රය කියන්නෙ කොහොමද? නිදහස් අදහස් ප්‍රකාශ කරන පත්‍රය කියන්නේ කොහොමද? ජේ. ආර්. ජයවර්ධන මහත්මයා එහි විශාල කොටස්කාරයෙක්.

**මොන්ටේගු ජයවික්‍රම මයා.** (වැලිගම)
*(திரு. மொண்டெகு ஜயவிக்ரம—வெலிகம)*
(Mr. Montague Jayewickreme—Weligama)

140 ක් පමණයි.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

කියක් හරි තිබෙනව. එක්සත් ජාතික පක්ෂයේ කෙනෙක් වශයෙන් මෙහිදී කථා කිරීම පුදුමයක් නොවෙයි. "ඔව කරන්න අපි කෝක වෙතත් ඉඩ දෙන්නෙ නැහැ, පත්‍ර ගන්න ගියොත් අපි පණ දෙනව, අපි හිරේ යනවා" ආදී වශයෙන් කියා කථා කිරීම පුදුමයක් නොවෙයි. ඒ වාගේම රක්ෂණ ව්‍යාපාරය ආරක්ෂා කරන්න හොඳට උපයෝගී කර ගෙන ඉන්නවා. විප්ලවවාදී මාක්ස්වාදී මන්ත්‍රීවරයෙකු වන අප හිතවත් බුලත් සිංහල ගරු මන්ත්‍රීතුමාගෙනුත් (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා.) ඒ වාගේම මාක්ස්වාදීන්ගේ පියා වන අවිස්සාවේල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙනුත් (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මම අහන්න කැමතියි, මාක්ස්වාදය හෙළා දකින දකුණු කොළඹ පළමුවෙනි මන්ත්‍රීතුමාට (ජේ. ආර්. ජයවර්ධන මයා.) ඒ දෙදෙනාගේ තිබෙන නෑකම මොකක්ද, කියා. එතුමාගේ සම්පූර්ණ කථාවම පදනම් වී තිබුණේ මේ සභාග ආණ්ඩුවට විරුද්ධවයි. අප කර ඇති දේ නරක නම් මොන විධියෙන්ද ඊ ළඟට කටයුතු කළ යුත්තෙ, කියා ඉදිරිපත් කරන වැඩ පිළිවෙළ මොකක්ද කියා මම අහන්න කැමතියි. ඉන්දියානු ප්‍රශ්නය ගැන වුණත් වෙනත් ප්‍රශ්නයක් ගැන වුණත්, මේ ප්‍රශ්නය විසඳිය යුත්තේ මේ ආකාරයකටය කියා සිටියාද? එක්සත් ජාතික පක්ෂය කිව්වෙ නැහැ; මහජන එක්සත් පෙරමුණ කිව්වෙ නැහැ; ජාතික විමුක්ති පෙරමුණ කිව්වෙ නැහැ. ඒ හැම කෙනෙක්ම කියන්නෙ වැරද්ද පමණයි. එය වැරදිය කියනවා නම්, හරි ක්‍රමය මොකක්ද කියා මම අහන්න කැමතියි. එම නිසා කථානායකතුමනි, ඔය විධියට කථා කිරීමෙන් කවදාවත් රට මුළා කරන්න බැහැ.

නොයෙක් විධියේ ප්‍රචාර කරගෙන පත්‍රවලට පක්ෂවත් විපක්ෂවත් පිල් බෙදා ගෙන මේ ආණ්ඩුවට විරුද්ධව නොයෙක් විධියේ කටයුතු කරගෙන යනවා. මම අහන්න කැමතියි, කතෝලික පල්ලිය කොහේද කියා. කතෝලික පූජකවරුන් මේ ප්‍රශ්නයේදී කටයුතු කරන්නේ කොහොමද කියා. [බාධා කිරීම්] හාමුදුරුවන් වේදිකාවට දමාගෙන පූජකවරුන් පිටිපස්සේ ඉඳගෙන මෙන්න මේ අන්දමටයි වැඩ කටයුතු ගෙන යන්නේ. හාමුදුරුවරුන් වේදිකාවේ නංවාගෙන කතෝලික පූජකවරුන් පිටුපස්සේ ඉඳගෙන කරන යෝජනා මොනවාද? කවදාවත් බුද්ධාගමේ කොයිම තැනකවත් කියා නැහැ, ගිහියන්ට පන්සලට එන්ට දෙන්න එපාය කියා.

